වාර්ෂික වාර්තාව
2020



ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණය සවිබල ගැන්වීම හා ඩිජිටල් පරතරය තුරන් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව



ශ්‍රී ලංකා
විදුලි සංදේශ
නියාමන
කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව 2020

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය



මෙම වසරේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගෙන ඇති ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය, නියාමන ආයතනය විසින් සක්‍රීය කර සවිබල ගන්වා ඇති සමස්ත ජාතික ඩිජිටල්කරණ ඉලක්ක සපුරාලමින් තවදුරටත් වේගවත්ව වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් විශේෂයෙන් රටේ විදුලි සංදේශ සම්බන්ධතා පුළුල් කර විදුලි සංදේශ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම උදෙසා, **“සෞභාග්‍යයේ දැක්ම”** රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව අවශ්‍ය උපායමාර්ගික ක්‍රියාමාර්ග මෙන්ම කාලෝචිත නියාමන ක්‍රියාමාර්ග ද ආරම්භ කර ඇති බව සතුටින් සඳහන් කරමි.

ශක්තිමත් අනාගත ඩිජිටල් ආර්ථිකයක් මගින් සක්‍රීය කරන ලද ඩිජිටල්කරණය අන්තර්ගත ශ්‍රී ලංකාවක් පිළිබඳ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වීය සම්බන්ධතාව සහ දැරිය හැකි අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය ඉතා වැදගත් වේ. මගේ මහපෙන්වීම යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද “Connect Sri Lanka” ව්‍යාපෘතිය ග්‍රාමීය ප්‍රදේශවල විදුලි සංදේශ සම්බන්ධතා සක්‍රීය කිරීමෙහි ලා වැදගත් පියවරක් වනු ඇත.ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ Connect 2030 න්‍යාය පත්‍රයට අනුකූලව, දිවයින පුරා අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය වේගවත් කිරීම පිණිස විදුලි සංදේශ සංවර්ධන අරමුදල් (TDC) ආයෝජනය කිරීම තුළින් මෙය සාක්ෂාත් කරගනු ලැබේ.

ජාතියක් ලෙස ගෝලීය වශයෙන් තරඟකාරීව සිටීම සඳහා, රටේ ආර්ථිකයේ සෑම අංශයක් ඔස්සේම තාක්ෂණය ඒකාබද්ධ කිරීම මෙන්ම සිසුන් තාක්ෂණයට ප්‍රවේශවීම සහතික කරන අධ්‍යාපනයක් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම ද අත්‍යවශ්‍ය වේ.

කෝවිඩ්-19 වසංගතය හමුවේ ජීවිතයේ සෑම අංශයකටම බලපාමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමේ අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස වේගවත් වී ඇත. ජාතික ඩිජිටල් පරිවර්තන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුශංගිකව වැදගත් වන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කළමනාකරණය සක්‍රීය කරන්නකු මෙන්ම වර්ධනය සඳහා උත්ප්‍රේරකයකු බවට පත් කරමින් නියාමන ආයතනයේ සාම්ප්‍රදායික භූමිකාව පරිණාමය වී ඇත . තවද, මෙම ගෝලීය වසංගතය රටවල් තුළ දැවැන්ත ලෙස විදුලි සංදේශ සේවා සැපයීමේ පරතරය ඇති කරලීමට හේතු වී ඇති බව හෙළිදරව් වී ඇති අතර, ඩිජිටල් සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සමග ඒ ආශ්‍රිත සැබෑ ඩිජිටල් අන්තර්ගතයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සේවා ආවරණ ව්‍යාප්තියට සමගාමීව සේවා දැරිය හැකි මිලකට ලබා දීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

පෙර සඳහන් කළ පරිදි විදුලි සංදේශ සේවා ව්‍යාප්ති පරතරය අවම කිරීම සඳහා, අපගේ රජය "Connect Sri Lanka - ගමට සන්නිවේදනය "ජාතික ව්‍යාපෘතිය දියත් කරන ලද අතර එහි මූලික අරමුණ වන්නේ 100% දීප ව්‍යාප්ත 4G/Fiber අධිවේගී අන්තර්ජාල සේවා සම්බන්ධතාව සාක්ෂාත් කිරීමයි. එසේම, අනාගතයේ දී 5G තාක්ෂණය මත පදනම් වූ සුහුරු ශ්‍රී ලංකා (Smart Sri Lanka) සංකල්පයේ ප්‍රධාන අංග සක්‍රීය කිරීම පිණිස කාර්මික ස්වයංක්‍රීයකරණය, සුහුරු නගර සක්‍රීය කිරීම, e-සෞඛ්‍යය ආරක්ෂණය, e-රාජ්‍යය, e-වාණිජ්‍යය මෙන්ම කෘෂි තාක්ෂණික විසඳුම් භාවිතා කිරීම සඳහා IoT තාක්ෂණය උපයෝගී කර ගැනීමට හැකි වන පරිදි 5G තාක්ෂණ එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. එමෙන්ම මෙම වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියලුම ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සමග එක්ව අනාගත 5G වාණිජකරණය කෙරෙහි අවධානය යොමු කරමින් මූලික 5G අත්හදා බැලීම් ආරම්භ කර ඇති බව මම සතුටින් සඳහන් කරමි.

රජයේ පාසල් විසින් භාවිතා කරන විශ්වීය නොමිලේ ප්‍රවේශය විය හැකි e- තක්සලාව විද්‍යුත් ඉගෙනුම් භාවිතය නියාමන ආයතනය විසින් සාර්ථකව හඳුන්වා දී තිබීම ද ප්‍රශංසනීය ය. එමෙන්ම, ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) හරහා රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් භාවිත කරන විද්‍යුත් ඉගෙනුම් පද්ධතියට නොමිලේ ප්‍රවේශ වීම විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සහය සහ දායකත්වය ඇතිව ජාතික අරමුණක් ලෙස යථාර්ථයක් බවට පත් වී ඇත. මෙලෙස නිදහස් අධ්‍යාපන සංකල්පය අන්තර්ජාල ඩිජිටල් විද්‍යුත් ඉගෙනුම් පහසුකම් දක්වා ව්‍යාප්ත කළ පළමු රටවල් අතරට අපි එක් වන්නෙමු.

නියාමන පරිසරයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විදුලි සංදේශ පනත සංශෝධන කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ උපදේශකත්වය ඇතිව සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම සඳහා පුළුල් සැලැස්මක් මෙන්ම නව බලපත්‍ර රාමුවක් සකස් කිරීම; ජංගම විදුලි සංදේශ උපකරණවල අනාගත දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම මෙන්ම විදුලි සංදේශ උපකරණ ආනයනය විධිමත් කිරීම ප්‍රකාරව හිතකර ඩිජිටල් පරිසරයක් සහතික කිරීම සඳහා ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති හඳුන්වාදීම; සහ සේවා තත්ත්ව පිරික්සීම සඳහා නීති රීති නිකුත් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ප්‍රතිපත්තිමය වැඩසටහන් අතර සුවිශේෂී අවස්ථා වේ. මුහුදු සංදාම සබ්මැරීන් කේබල් ප්‍රත්‍යාස්ථතාවක් ආරම්භ කිරීම සහ ගෝලීය සම්බන්ධතාව සපයන රටේ සබ්මැරීන් කේබල් පරිසර පද්ධතියේ

ආරක්ෂාව සහතික කිරීමේ නීති රාමුවක් සකස් කිරීම මෙම වසරේ දී ක්‍රියාත්මක කරන ලද සෙසු ප්‍රතිපත්තිමය වැඩසටහන් සංරචකයන් අතර වේ.

ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) ලියාපදිංචි කිරීම සහ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) සත්‍යාපන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා දැනටමත් ආරම්භ කර ඇති පියවර මහජනතාව සඳහා ආරක්ෂිත පරිසරයක් සහතික කරනු ඇත.

නිපුණතාවයන්ගෙන් හෙබි දේශීය තරුණ තරුණියන්ට විදුලි සංදේශ කර්මාන්තයේ නියැලීම සඳහා විදුලි සංදේශ කුලුනු සම්බන්ධ කාර්මික වැඩසටහනක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහනක් ආරම්භ කිරීම මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා අවශ්‍ය ධාරිතා සංවර්ධනය සවිබල ගන්වනු ඇත.

ශ්‍රී ලාංකීය ප්‍රරවැසියන්ගේ සන්නිවේදන සේවාවන් ඩිජිටල්කරණය කිරීමේ රජයේ දැක්මට අනුකූලව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන ඩිජිටල්කරණ පරිවර්තන වැඩසටහන සම්බන්ධයෙන් මම විශේෂ අවධානය යොමු කරමි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම සේවාවන් මාර්ගගතව සපයන ලද පළමු රාජ්‍ය ආයතනය බවට පත් වෙමින් සිය සියලුම ආයතනික කාර්යයන් සාර්ථකව පරිවර්තනය කර තිබීම ප්‍රශංසනීය ය.

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව උපායමාර්ගික මුලපිරීම් සහ නියාමන කාර්යයන් කෙරෙහි විශේෂයෙන් ජාතික ඩිජිටල් පරිවර්තන සැලැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙන්ම විදුලි සංදේශ සේවා ව්‍යාප්ති පරතරය අවම කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. මෙම මුලපිරීම් මඟින් රට පුරා සිටින ප්‍රජාවන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රය ඔස්සේ සිය සම්බන්ධතා ඇති කර ගැනීමට හැකි වී ඇත.

ඉදිරි වසරවලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශක්තිමත් නියාමන ප්‍රවේශයක් සමඟින් ධනාත්මක ගම්‍යතාව සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ උන්නතිය කෙරෙහි යොමු කරන අවධානය අඛණ්ඩව පවත්වා ගෙන යනු ඇතැයි මා විශ්වාස කරන අතර, ඩිජිටල් තාක්ෂණය අන්තර්ගත ශ්‍රී ලංකාවක් කරා මෙහෙයවීමේ දී මතු වන අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට හැකි වේවා යි ප්‍රාර්ථනා කරමි.

ගෝඨාභය රාජපක්ෂ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

ශ්‍රී ලංකාව ඩිජිටල්කරණයෙන් සවිබලගැනීම සහ විදුලි සංදේශ සේවා සැපයීමේ පරතරය කෙරෙහි අවධානය යොමු කිරීම

විදුලි සංදේශ සේවා සැපයීමේ පරතරය ලෙස සැලකෙන අන්තර්ජාලය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙත ප්‍රවේශ වීමේ අසමානතාවය, වසංගත තත්වය හා නව සාමාන්‍යකරණයට පත්වීමත් සමඟ ගෝලීය වශයෙන්ද ප්‍රධාන ගැටළුවක් බවට පත්වෙමින් තිබේ. එබැවින්, විවිධ සමාජ ආර්ථික මට්ටම්වල / භූගෝලීය ප්‍රදේශවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා ප්‍රවේශය ඇති සහ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාවක් නොමැති ප්‍රජාව අතර විදුලි සංදේශ ව්‍යාප්ති පරතරය අවම කිරීම අත්‍යාවශ්‍ය විය. ප්‍රශස්ථ හා ස්ථාවර ඩිජිටල් පරිවර්තන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සමඟ සුහුරු සමාජයකින් සවිබල ගැන්වුණු ඩිජිටල් ශ්‍රී ලංකාවක දැක්ම අවධාරණය කර ගනිමින් විදුලි සංදේශ සේවා සැපයීමේ පරතරය පිළිබඳ සාකච්ඡා කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විදුලි සංදේශ ක්ෂේත්‍රය සමඟ සහයෝගයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සන්නද්ධවීම ප්‍රවර්ධනය කිරීමත් ජීවිතයේ සෑම අංශයක්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සක්‍රීය කිරීම සඳහා සහාය වී ඇත. අනාගත ඩිජිටල් ආර්ථිකයන් පිළිබඳ සංකල්ප සහ සමාජයන්හි ඩිජිටල් පරිවර්තනය සඳහා සහයෝගය දැක්වීමේ අරමුණින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ “Connect 2030 න්‍යාය පත්‍රය” තුළින් හඳුනාගත් ප්‍රධාන මූලධර්ම හා අරමුණු සඳහා දායක වී සුවිශේෂී අවස්ථාවක් 2020 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරන ලදී. මේ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග අතරම දිවයින් පුරා අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය සහතික කිරීම පිළිබඳ කඩිනම් ව්‍යාප්ති සැලසුම් මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ සඳහා ආවරණය සැපයීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි වැදගත් අංග සඳහා දැරියා හැකි මිලකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවේශය සහතික කිරීම සඳහා වූ පුළුල් ව්‍යාපෘති ඇතුළත් වේ.

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් තොරතුරු හා සන්නිවේධන තාක්ෂණයේ භාවිතය වේගවත් කිරීමේ ප්‍රවේශයක් ඇති කර ඇති හෙයින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන ආයතනය වශයෙන් අප ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණ උපායමාර්ග සක්‍රීය කිරීම සා සවිබල ගැන්වීම සහ රටේ සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසාරභාවය සහතික කර විදුලි සංදේශ සේවා ව්‍යාප්ති පරතරය අවම කිරීමේ නව පියවර ආරම්භ කිරීම කෙරෙහි පැපවී අවධානය යොමු කර ඇත.

මෙම වාර්තාව මාර්ගගතව බැලීමට QR කේතය පරිලෝකනය කරන්න
නැතිනම් පිවිසෙන්න: https://trc.gov.lk/2014-05-13-13-14-26/annual-reports.html

පටුන

01 සභාපතිතුමාගේ පණිවුඩය	02 අප ගැන	06 සභාපතිතුමා සහ කොමිෂන් සභාවේ සමාජිකයින්
10 විධායක නිලධාරීන්	16 ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය	29 COVID-19 හමුවේ ඉදිරි ගමන්මග
31 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කිරීම	36 විදුලි සංදේශ තොරතුරු හා විශේෂාංග	40 බලපත්‍ර කළමණාකරනය අංශය
42 ජාල අංශය	46 සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය	52 තරඟකාරිත්ව අංශය
56 ගමට සන්නිවේදනය “Connect Sri Lanka”	96 ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය	101 අනුකූලතා සහ විමර්ශන අංශය
104 නීති අංශය	105 විශේෂ ව්‍යාපෘති අංශය	132 පාලන,මානව සම්පත්, ආයතනික කටයුතු සහ සැලසුම් අංශය
139 තොරතුරු සහ තාක්ෂණ ඒකකය	142 මූල්‍ය තොරතුරු	147 අභ්‍යන්තර විගණන සහ අභ්‍යන්තර විගණන කමිටු වාර්තා
153 නියාමන කමිටු තොරතුරු	154 මූල්‍ය ප්‍රකාශනය	180 විගණකාධිපතිගේ වාර්තාව

කෙටි යෙදුම් ලැයිස්තුව

ACCIMT	Arthur C Clarke Institute for Modern Technologies නවීන තාක්ෂණය සඳහා ආතර් සී ක්ලාක් ආයතනය
APNIC	Asia Pacific Network Information Center ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය
APT	Asia Pacific Telecommunity ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව
ARPU	Average Revenue Per User පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය
ASMS	Antenna Structure Management System ඇන්ටනා ව්‍යුහ කළමණාකරන පද්ධතිය
ASF	Antenna Structure Farm ඇන්ටනා ව්‍යුහ
BOI	Board of Investment ආයෝජන මණ්ඩලය
CERT	Computer Emergency Readiness Team පරිගණක ආපදාවලට සූදානම්වීමේ සංසදය
CID	Criminal Investigation Department අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව
CSR	Corporate Social Responsibility ආයතනික සමාජ වගකීම්
CTO	Commonwealth Telecommunication Organization පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය
CWG	Council Working Group සංගම් කාර්ය කණ්ඩායම
DOA	Department of Agriculture කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
DTH	Direct to Home සෘජු ගෘහස්ථ
FAO	Food and Agriculture Organization ආහාර හා කෘෂිකර්ම සංවිධානය
GCI	Global Cybersecurity Index ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය
GND	Grama Niladari Division ග්‍රාම නිලධාරී කොට්ඨාශය
GMDSS	Global Maritime Distress Safety System ගෝලීය සමුද්‍ර ආපදා ආරක්ෂණ පද්ධතිය
HFDF	High Frequency Direction Finding අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම

ICT	Information & Communication Technology තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
ICTA	Information and Communication Technology Agency තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
ILAC	International Laboratory Accreditation Cooperation ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව
IMT	Institute Mine Telecom මයින්ස් ටෙලිකොම් ආයතනය
IMEI	International Mobile Equipment Identity ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය
ISP	Internet Service Provide අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්
IT	Information Technology තොරතුරු තාක්ෂණය
ITOL	International Telecommunication Operators Levy ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු
ITU	International Telecommunication Union ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය
JICA	Japan International Corporation Agency ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය
KYC	Know Your Customer ඔබේ පාරිභෝගිකයා දැනගන්න
LT	Lotus Tower නෙළුම් කුලුන
MFR	Master Frequency Register ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය
MOA	Ministry of Agriculture කෘෂිකර්ම අමාත්‍යාංශය
NIA	National Information Agency ජාතික තොරතුරු නියෝජිතායතනය
NAITA	National Apprentice and Industrial Training Authority ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
NFAT	National Frequency Allocation Table ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව
NVQ	National Vocational Qualification ජාතික වෘත්තීය සුදුසුකම්
OLAC	Outgoing Local Access Charges පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු
OTP	One Time Password එක් වරක් ලැබෙන මුරපදය

OTT	Over The Top විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල ඔස්සේ සේවා සැපයීම
PABX	Private Automatic Branch Exchange පොදු ස්වයංක්‍රීය ශාඛා හුවමාරු
PCU	Project Consultancy Unit ව්‍යාපෘති උපදේශන ඒකකය
PPP	Private Public Partnership පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය
PSTN	Public Switching Telephone Network පොදු ස්විචිකරණ දුරකථන ජාල
QOS	Quality of Service සේවා තත්ත්ව
RMC	Regional Monitoring Centers ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන
RMS	Remote Monitoring Stations දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථාන
RTE	Radio Terminal Equipment ගුවන් විදුලි පර්යන්ත උපකරණ
RTTE	Radio and Telecommunication Terminal Equipment ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ
SATRC	South Asian Telecommunications Regulators' Council දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සභාව
SAFIR	South Asian Federation for Infrastructure Regulation යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව
SDG	Sustainable Development Goal තිරසාර සංවර්ධන ඉලක්ක
SED	Small Enterprises Development කුඩා ව්‍යවසාය සංවර්ධන
SIM	Subscriber Identity Module ග්‍රාහක අනන්‍යතා මොඩියුලය
SLBC	Sri Lanka Broadcasting Corporation ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
SLIDA	Sri Lanka Institute of Development Administration ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
SLLRDC	Sri Lanka Land Reclamation and Development Corporation ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
SME	Small and Medium Sized Enterprises කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්
SMS	Short Message Service කෙටි පණිවිඩ සේවාව

TL	Telecommunications Levy විදුලි සංදේශ බදු
TDC	Telecommunication Development Charges විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව
TRCSL	Telecommunications Regulatory Commission of Sri Lanka ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
TSO	Telecommunications System Operators විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන්
TVEC	Tertiary & Vocational Education Commission වෘත්තීය හා තෘතීය අධ්‍යාපනකොමිෂන් සභාව
UDA	Urban Development Authority නාගරික සංවර්ධන අධිකාරිය
URL	Uniform Resource Locator ඒකරූපී සම්පත් නිවේශකය
VAS	Value Added Service අගය එකතු කළ සේවාව
VTC	Vocational Training Centers වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
WTISD	World Telecommunication and Information Society Day ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය

වගු ලැයිස්තුව

වගුව 01: විදුලි සංදේශ අංශයේ සංඛ්‍යාන දළ විශ්ලේෂණය 36
වගුව 02: ජාල අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාල සංඛ්‍යා ලේඛන 44
වගුව 03: රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක 45
වගුව 04:පෞද්ගලික අංශයේ අයතන සඳහා වෙන් රකන ලද කෙටි සංකේත අංක 45
වගුව 05: නිකුත් කරන ලද උපකරණ නිෂ්කාශන හා මාදිලි අනුමැති සංඛ්‍යාව 45
වගුව 06: සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 48
වගුව 07: ලැබුණු පැමිණිලි සහ සිදුකරන ලද විමර්ශන 49
වගුව 08: ලැබුණු පැමිණිලි හා සිදු කරනල ලද විමර්ශන 49
වගුව 09: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව 52
වගුව 10: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU) 53
වගුව 11: ජංගම දුරකථන කුලුනු බදු 54
වගුව 12: 2019 වසරේදී ජංගම කෙටි පණිවුඩ සේවා බදු එක්රැස් කිරීම 54
වගුව 13: ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මිල ප්‍රවණතාවල ශ්‍රී ලංකාව ශ්‍රේණිගතවීම 55
වගුව 14: ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වයන් 100
වගුව 15: කොන්ත්‍රාත්තු සාරාංශය 106
වගුව 16: නෙළුම් කුලුනේ වැඩවල ප්‍රගතිය 106
වගුව 17: කොළඹ නෙළුම් කුලුනේ කාර්යයන්වල සාරාංශය 107
වගුව 18: කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 128
වගුව 19: ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ප්‍රළුල් කිරීමේ ව්‍යාපෘතියේ සාරාංශය 128
වගුව 20: කදිරාන ප්‍රතිසංස්කරණ හා නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය 130
වගුව 21: 2020 වසරේ විදේශීය වැඩසටහන් සඳහා සහභාගීත්වය 134
වගුව 22: 2020 දී සහභාගී වූ දේශීය වැඩසටහන් 135
වගුව 23: කොමිෂන් සභාවේ ආදායම 143
වගුව 24: ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණ 146
වගුව 25: අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් 148

ප්‍රස්ථාර ලැයිස්තුව

ප්‍රස්ථාරය 01: පද්ධති බලපත්‍ර සංඛ්‍යාව 37

ප්‍රස්ථාරය 02: ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා, පටුපරාස හා ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වයන් 37

ප්‍රස්ථාරය 03: දුරකථන ව්‍යාප්තිය 37

ප්‍රස්ථාරය 04: ජංගම සහ ස්ථාවර ග්‍රාහක වර්ධනය 38

ප්‍රස්ථාරය 05: විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන 38

ප්‍රස්ථාරය 06: ජංගම හා ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම 38

ප්‍රස්ථාරය 07: විදුලි සංදේශ බඳුවල වර්ධනය 39

ප්‍රස්ථාරය 08: සෙස් 39

ප්‍රස්ථාරය 09: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ 39

ප්‍රස්ථාරය 10: විදුලි සංදේශ බදු 53

ප්‍රස්ථාරය 11: සෙස් බදු 53

ප්‍රස්ථාරය 12: සැලසුම් කරන ලද හා තථ්‍ය ප්‍රගතිය සහ ඉලක්ක සම්පූර්ණ කරන දිනය රහිතව අඛණ්ඩ ප්‍රගතිය 106

ප්‍රස්ථාරය 13: විදුලි සංදේශ බදු 144

ප්‍රස්ථාරය 14: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු 145

ප්‍රස්ථාරය 15: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම 145

2020 වර්ෂයේ විශේෂිත ප්‍රවේශවීම්

"ගමට සන්නිවේදනය" තාක්ෂණයෙන් බල ගැන්වුණු “Connect ශ්‍රී ලංකාව” ජාතික ව්‍යාපෘතිය ආරම්භ කිරීම

නව බලපත්‍ර රාමුවක් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම ආරම්භ කිරීම

5G අත්හදා බැලීම්, ග්‍රාහකයන්ට ජාල අතර හුවමාරු කිරීමේ හැකියාව, IPV6 ක්‍රියාත්මක කිරීම වැනි නවෝත්පාදන හඳුන්වා දීම

රූපවාහිනී සම්ප්‍රේෂණ ඩිජිටල්කරණය නැවත ආරම්භ කිරීම

ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ රෙගුලාසි හඳුන්වා දීම (RTTE)

හඬ සහ දත්ත බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවන්හි ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා නීති රීති නිකුත් කිරීම

මුහුදු සංදාම කේබල් ප්‍රත්‍යාස්ථිතිය කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම

ග්‍රාහක අනන්‍යතා මොඩියුල පත් (SIM) ලියාපදිංචිය සහ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම

විදුලි සංදේශ කුලුනු කාර්මික වැඩසටහන ආරම්භ කිරීම

දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ආරම්භ කිරීම

පාසල් සහ රාජ්‍ය විශ්ව විද්‍යාල වල නිල ඊ-ඉගෙනුම් පද්ධති සඳහා නොමිලේ ප්‍රවේශවීමට අවස්ථාව ඇති කිරීම.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඩිජිටල් පරිවර්තන මෙහෙයුම් ආරම්භ කිරීම

සභාපතිතුමාගේ පණිවුඩය



2020 වසරේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) වාර්ෂික වාර්තාව වෙනුවෙන් පණිවුඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

සුහුරු ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ රජයේ දැක්ම කෙරෙහි අවධානය යොමු කරමින්, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අංගසම්පූර්ණ සැලැස්මක් සකස් කර ඇති අතර එය අන්තර්ජාතික විදුලි සංදේශ සංගමයේ න්‍යාය පත්‍රය වන "සියලුම දෙනා වඩා ප්‍රශස්ත ලෝකයක් හා සම්බන්ධ කිරීම" සමඟ අනුකූල වේ. වර්ධනය, අන්තර්ග්‍රහණය, තිරසාර බව, නවෝත්පාදන සහ හවුල්කාරිත්වයන් යන උපායමාර්ගික අරමුණු පහ සමඟ මෙම ගෝලීය දැක්ම සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම වසරේදී කොමිෂන් සභාව සිය කාර්යයන් හා වැඩසටහන් වල බොහෝ අංශ සාර්ථක කරගෙන ඇත. වර්ධනය වන විදුලි සංදේශ ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් "ගමට සන්නිවේදනය" නමින් "ශ්‍රී ලංකාවේ සියලුම දෙනාට තොරතුරු හා සන්නිවේදන පහසුකම් ලබාදීමේ" වැදගත් ජාතික ව්‍යාපෘතියක් දියත් කර ඇති අතර එහි මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම 100% ආවරණය වන පරිදි 4G / ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා සම්බන්ධතාවය සැපයීම සාක්ෂාත් කිරීමයි. ඩිජිටල්කරණය පිළිබඳ රජයේ දැක්මෙහි ප්‍රධාන අංග සක්‍රීය කිරීම සඳහා ඉතා වැදගත් වන 5G තාක්ෂණික පෙරළියේ මීළඟ පියවර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තවදුරටත් ක්‍රියාත්මක කර ඇත. සුහුරු ශ්‍රී ලංකාවක් ඔස්සේ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් නිර්මාණය කිරීම මෙයට ඇතුළත් ය. කාර්මික ස්වයංක්‍රියකරණය, සුහුරු නගර සක්‍රීය කිරීම සහ අනාගතයේදී ඊ-සෞඛ්‍යාරක්ෂාව සහ කෘෂි තාක්ෂණය භාවිතා කිරීම සඳහා IoT තාක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී 5G තාක්ෂණය ප්‍රධාන වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියළුම ජංගම දුරකථන ක්‍රියාකරුවන් සම්බන්ධ කර ගනිමින් 2020 පෙබරවාරි මාසයේදී මූලික 5G අත්හදා බැලීම් ආරම්භ කර ඇත. තවද, ශ්‍රී ලංකාවේ වාණිජ 5G සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික 5G වර්ණාවලි ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගයක් සකස් කිරීමට පියවර ගෙන තිබේ.

දැනට භාවිතා කරන ජංගම දුරකථන අංකය වෙනස් නොකර පාරිභෝගිකයින්ට ජාල අතර මාරුවීමේ සේවාව ආරම්භ කිරීමට සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් එකඟ වී ඇත. මේ සම්බන්ධයෙන් තාක්ෂණික සාකච්ඡා සිදු වෙමින් පවතී.

ජාත්‍යන්තර උපකරණ අනන්‍යතා අංක (IMEI) කළමනාකරණ ව්‍යාපෘතිය යනු වෙළඳපොළට ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන (ව්‍යාජ හෝ ජාවාරම් කරන ලද ජංගම උපකරණ ආදිය) ඇතුලුවීම වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලබන තවත් තීරණාත්මක පියවරකි.

එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය දිගුකාලීන සැලසුම් වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සැපයීමේ පරතරය අවම කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ස්ථාපනය කර ඇත. විදුලි සංදේශ කර්මාන්තයේ සහාය ඇතිව COVID අර්බුදය හමුවේ සහ ඉන් ඔබ්බට විශේෂයෙන් රජයේ පාසල් හා විශ්ව විද්‍යාල සඳහා ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) ඔස්සේ මාර්ගගත විද්‍යුත් ඉගෙනුම් භාවිතාවන් (e-තක්සාලාව, විශ්ව විද්‍යාල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය - LMS ආදිය) සැපයීම සඳහා ප්‍රථම වරට නොමිලේ ප්‍රවේශය ලබා දී ඇත.

නියාමකයකුගේ දෘෂ්ටි කෝණයකින් බලන කල, වර්තමාන ව්‍යුහය මගින් විදුලි සංදේශ කර්මාන්තය ඒකාධිකාරී පරිසරයක් කරා තල්ලු නොකළ යුතු හිතකර පරිසරයක් සපයයි. එමෙන්ම කර්මාන්තයේ දෘෂ්ටි කෝණයෙන් බලන කල, වර්තමාන විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ සංයුතියෙන් පාරිභෝගිකයින් සඳහා ප්‍රශස්ත වටිනා අවස්ථා අත්කරලීම සඳහා හිතකර තරඟකාරී වාතාවරණයක් ඇති කිරීමටත් උපරිම වෙළඳපල බලවේගයන් කරා මෙහෙයවීමටත් අපේක්ෂා කෙරේ.

නෙළුම් කුලුන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දිගුකාලීන සැලසුම් වල වැදගත් අංගයක් වනු ඇති අතර එහි වාණිජ මෙහෙයුම් ලබන වසර මුලදී ආරම්භ වේ. නෙළුම් කුලුන "තාක්ෂණයේ කේන්ද්‍රස්ථානයක්" මෙන්ම වෙනත් ආකර්ශනීය සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීමට අපේක්ෂා කෙරේ.

අපේ ජාතිය බලගැන්වීම හා සංවර්ධනය කිරීම කරා මෙහෙයවන සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාර්යයන් සර්වප්‍රකාරයෙන් සාර්ථක කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට මම සුභාශිංසනය කරමි.

ජයන්ත ද සිල්වා
තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්
ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති

අප ගැන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ආරම්භය

විදුලි සංදේශ ක්ෂේත්‍රය මුලදී රාජ්‍ය ව්‍යාපාරයක් වූ අතර 1980 දී තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව දෙඅංශයකට බෙදීමත් සමඟ මෙම අංශය ලිහිල් කිරීම ආරම්භ විය. අනතුරුව විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සංස්ථාවක් බවට පරිවර්තනය වූ අතර 1991 දී නියාමනය හඳුන්වා දෙන ලදී. මේ අනුව 1991 දී පාර්ලිමේන්තුවේ පනතක් මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ අධිකාරිය (SLTA) ස්ථාපනය කරන ලද අතර පසුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බවට පරිවර්තනය කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, හා පසුව සංශෝධනය කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ප්‍රඥප්තිමය පනතට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු මෙහෙයවන රාජ්‍ය බලධරයා වේ. නීතිමය පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල බලධාරියා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු රජයේ බලයලත් ආයතනය වේ. ඒ අනුව කොමිෂන් සභාවට පාරිභෝගිකයින්ගේ සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීමට පනත මගින් බලය පවරා ඇත.

කොමිෂන් සභාව

කොමිෂන් සභාව අයත් වන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වන අතර සාමාජිකයන් පස් දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකුද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.



දර්ශනය

"විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම."



මෙහෙවර

"කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම."

මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරහකාරිත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුලින් සියළුම පරිහරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

- ❖ බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම

  - o පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය.

    පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යාවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

  - o පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය

    විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.

  - o පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර

    පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

- ❖ අයක්‍රම නියාමනය කිරීම

  - o පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යාවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

  - o පනතේ 5(1) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.

- ❖ විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.

- ❖ ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.

- ❖ පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.

  පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය. පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

- ❖ විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.

- ❖ විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.

- ❖ කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම

  ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

- ❖ විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

අන්තර් අංශ සහයෝගීත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් අංශ රැසක් විසින් ඉටු කරන ලදී. 2019 වසරේ කොමිෂන් සභාවේ අදාල අංශවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මතු පරිච්ඡේදවල දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම් කිසියම් අංශයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම් අදාල අංශය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනාගත දිශානතිය

- ➢ පනතේ 17 වන වගන්තියේ බලපත්‍ර මාර්ගෝපදේශ සංශෝධනය කිරීම, නව හා වර්තමාන බලපත්‍ර රාමුව සඳහා සැලැස්මක් සකස් කිරීම, 17 වන වගන්තියේ බලපත්‍රායදුම්පත් අලුත් කිරීම, දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා ජාල අනුමැතිය ලබාදීම සහ බලපත්‍ර ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කිරීම බලපත්‍ර කළමනාකරණය යටතේ සම්පූර්ණ කිරීමට නියමිතය.

- ➢ වර්තමාන විෂමතාවලට විසඳුම් සෙවීම සඳහා පුළුල් කුලුනු ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සලකා බලමින් IPV6 සැලැස්ම සකස් කිරීම, පවතින අංකන සැලැස්ම සමාලෝචනය කිරීම සහ ගාස්තු රහිත අංක සේවා හඳුන්වා දීම, දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, කේබල් රූපවාහිනී සේවා මෙහෙයුම් අධීක්ෂණ ක්‍රියාවලිය ස්ථාපනය කිරීම, ඇන්ටනා කළමනාකරණ ව්‍යුහය වැඩිදියුණු කිරීම ජාල කටයුතු යටතේ සිදු කෙරේ.

- ➢ පවතින ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) පරීක්ෂා කිරීමේ ක්‍රමය යාවත්කාලීන කිරීම, වැඩිදියුණු කරන ලද සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ සහ මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීම, සංඛ්‍යාත වර්ණාවලි සැලැස්ම සහ 5G සංවර්ධනය උපායමාර්ග සකස් කිරීම, ඩිජිටල් විඩියෝ විකාශනය හඳුන්වා දීම සහ සංඛ්‍යාන වර්ණාවලි බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම, රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම, ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) රීති ක්‍රියාත්මක කිරීම සහ ජාතික සංඛ්‍යාන වෙන් කිරීමේ වගුව සකස් කිරීම සංඛ්‍යාත කළමනාකරණය යටතේ අපේක්ෂා කෙරෙන ප්‍රධාන වැඩසටහන් ලෙස කැපී පෙනේ.

- ➢ කොමිෂන් සභාවේ අන්තර් සම්බන්ධතා අනුමැතිය ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍යතා ඇති වූ විට වාණිජ අන්තර් සම්බන්ධතා ගාස්තු තීරණය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම, අන්තර් සම්බන්ධතා ආරවුල් / තරහකාරීත්ව ගැටලු විධිමත් කිරීම, අයබදු නිසි කලට එකතු කිරීම, විදේශීය විශේෂඥයන්/සේවකයන් සඳහා වීසා නිර්දේශ සකස් කිරීම, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංඛ්‍යා ලේඛන එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ දේශීය සහ ජාත්‍යන්තර බලධාරීන් සඳහා සංඛ්‍යාන තොරතුරු ඉදිරිපත් කිරීම, විදුලි සංදේශ කර්මාන්තයේ කාර්යසාධනය විශ්ලේෂණය කිරීම, දේශීය සම්පත් භාවිතය තීව්‍ර කිරීම සඳහා දුරකථන ක්‍රියාකාර ක්‍රියාකරු සමාගම් ප්‍රවර්ධනය කිරීම, නව අයක්‍රම යෝජනා සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම/ අයක්‍රම ආශ්‍රිත කර්මාන්ත ගැටලු වෙහෙයවීම, අයක්‍රම ආශ්‍රිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක සහ මිනුම් අධ්‍යයන ගණනය කිරීම විදුලි සංදේශ කර්මාන්තය සඳහා තීරණ නිකුත් කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය මෙහෙයවීම සහ විදුලි සංදේශ සේවා සැපයීමේ පරතරය අවම කිරීම, විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන තරහකාරීත්ව විෂය ක්ෂේත්‍රය යටතේ සිදු කරන ලදී.

- අනුකූලතා ක්‍රියාකාරකම් ප්‍රකාරව, දුරකථන ක්‍රියාකරු සමාගම් නියම කරන ලද සේවා තත්ත්ව පරාමිතීන් පිළිපැදීම සහතික කිරීම, විධිමත් නව සේවා තත්ත්ව පරාමිතීන් හඳුන්වාදීම, බලපත්‍ර කොන්දේසි පිළිපැදීම පිරික්සීම, අවශ්‍ය නියාමන පියවර ක්‍රියාත්මක කිරීම, මහජනතාව දැනුවත් කිරීම, අනුමතනොකළ අයක්‍රම සහ අනුමත නොකළ උපකරණ පිළිබඳව අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම, ග්‍රාහක අනන්‍යතා මොඩියුලපත් (SIM) ලියාපදිංචි කිරීම පරීක්ෂා කිරීම සහ අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) සක්‍රීය උපකරණ මෙරටට ආනයනය කිරීම විධිමත් කිරීම, පාරිභෝගික පැමිණිලි කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම, අනාගත අවධානයට ලක්විය යුතු ප්‍රධාන කරුණු වේ.
- දේශීය විශ්ව විද්‍යාල සහය ඇතිව විදුලි සංදේශ පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම, විදුලි සංදේශ කර්මාන්තයට ආධාරකරන දේශීය කර්මාන්ත නගා සිඛුවීම සඳා දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සහ කුලුණු කාර්මික ශිල්පී වැඩසටහන් පැවැත්වීම, ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩස්ටහන් ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර සංවිධාන සහ නියාමන ආයතනවල සහයෝගයෙන් සහයෝගිතා කටයුතු සංවිධානය කිරීම, ජාත්‍යන්තර සම්මන්ත්‍රන පැවැත්වීම, විදුලි සංදේශ නියාමන සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම, ජාත්‍යන්තර උසස් පුහුණු කම්ටු සම්බන්ධීකරණය කිරීමට අපේක්ෂිතය. තවද, විදුලි සංදේශ කර්මාන්තයේ ශීඝ්‍ර සංවර්ධනය සපුරාලීම සඳහා සංශෝධන/නව පනතක් සම්පාදනය කිරීමට ද ක්‍රියාකරනු ඇත.
- අනාගත ඩිජිටල් සක්‍රීය කාර්මාන්තයක් සහ ඒ අනුව මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය ආයතනික කටයුතු සහ පරිපාලන කටයුතු වල කොටසක් ලෙස සංවර්ධනය කටයුතු සඳහා නියාමන කොමිෂන් සභාව මෙහෙයවීමේ අවශ්‍ය මූලික නිපුණතාවය සහතික කිරීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය විධිමත් කිරීමට කටයුතු කරනු ලැබේ. තොරතුරු තාක්ෂණය යටතේ, වෙනම තොරතුරු තාක්ෂණ ඒකකයක් නොපැවතීම නිසා විධිමත් තොරතුරු තාක්ෂණ අංශයක් ස්ථාපනය කිරීම, සහ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ධාරිතා වර්ධනය ආරම්භ කිරීම, ආයතනය සඳහා නිසි අයුරින් ප්‍රකාශිත ඩිජිටල් පරිවර්තන උපායමාර්ග ඔස්සේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ ස්වයංක්‍රියකරණ ව්‍යාපෘති ක්‍රියාවලිය ආරම්භ කිරීම, නව පොදු ස්වයංක්‍රිය ශාඛා භූවමාරු (PABX) පද්ධතිය ක්‍රියාත්මක කිරීම, ජාල/සර්වර් මිර්මාණ සඳහා ව්‍යවසායකත්වය ලබාදීම සහ ජංගම උපකරණ මාදිලි අනුමැතිය සහ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) ලියාපදිංචි කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලැබේ. විශේෂ ව්‍යාපෘති ක්ෂේත්‍රය අනුව, කොළඹ නෙළුම් කුලුන වාණිජකරණය කිරීමට සහ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි යටිතල පහසුකම් නිම කිරීමට සැලසුම් කර ඇත.

සභාපතිතුමා සහ කොමිෂන් සභාවේ සමාජිකයින්



ජයන්ත ද සිල්වා මහතා
සභාපති

අනිල් මීගහගේ මහතා
කොමිෂන් සභාවේ සාමාජික

ඕෂද සේනානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්

රුවන්ත කුරේ මහතා
කොමිෂන් සභාවේ සාමාජික

චමින්ද කුමාරසිරි මහතා
කොමිෂන් සභාවේ සාමාජික

ජයන්ත ද සිල්වා මහතා
සභාපති

ගෝලීය වශයෙන් විශාල ව්‍යාපෘතිවල ප්‍රායෝගික අත්දැකීම් සමඟින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සහ කළමනාකරණය පිළිබඳ ආයතනික දැනුම ආශ්‍රිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් සහිත තාක්ෂණික ක්ෂේත්‍රයේ වසර 40කට අධික පළපුරුද්දකින් හෙබි තෘතහස්ත නිලධාරියෙකි.

වර්තමානයේ ශ්‍රී ලංකා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු ලෙස කටයුතු කළේය. ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සමාගම් සංගමයේ (SLASSCOM) නිර්මාතෘ සමාජික සහ හිටපු සභාපති, මෘදුකාංග අපනයනකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති, බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) ශ්‍රී ලංකා සභාපති සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යනායතනයේ පාලන මණ්ඩලයේ සමාජිකයෙකු ලෙසද ක්‍රියා කරන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සැකසීමේ දී ශ්‍රී ලංකා රජයේ උපදේශක මණ්ඩලයේ ද කටයුතු කර ඇත.

එමෙන්ම IFS ශ්‍රී ලංකා සමාගමේහි සම නිර්මාතෘ සහ කළමනාකාර අධ්‍යක්ෂ, IFS ශ්‍රී ලංකා සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි ධුරයේද කටයුතු කරන ලදී. IFS සමාගමේ හොඳම කණ්ඩායම් සාමාජිකයා වශයෙන් දෙවරක් සම්මානයට පාත්‍ර විය.

එසේම ජයන්ත ද සිල්වා මහතා වොෂින්ටන් ඩීසී හි ජාත්‍යන්තර සංඛ්‍යාන වැඩසටහන් මධ්‍යස්ථානයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභියකු; BCS තොරතුරු තාක්ෂණ වරලත් ආයතනයේ සාමාජික (FBCS) , වරලත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු (CITP) ද වේ. 2011 වසරේ ජාතික ගුණාත්මක මෘදුකාංග සම්මාන උළෙලේදී පිරිනමන ලද ICT Lifetime Achievers සම්මානය/ශ්‍රී ලංකාවේ මෘදුකාංග ක්ෂේත්‍රය ආශ්‍රිත සේවාවම් සඳහා පිරිනැමෙන විශිෂ්ටතම දායකත්ව සම්මානයෙන් පිදුම් ලැබීය.

ඕෂද සේනානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්

ඕෂද සේනානායක මහතා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙන්ම සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල්කරණය සඳහා ස්ථාපිත ශ්‍රී ලංකාවේ ඉහළම ආයතන වන තොරතුරු තාක්ෂණ නියෝජිතායනයේ (ICTA) සහ ලංකා හදිසි ප්‍රතිචාර සංසදයේ (CERT) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඕෂද මහතා මීට පෙර විවිධ ව්‍යවසායකත්ව ව්‍යාපෘති වලට නායකත්වය ලබාදුන් අතර එයට තාක්ෂණය, පහසුකම් කළමනාකරණය සහ "Smart Battery" තාක්ෂණය පිළිබඳ පර්යේෂණ වැනි අනෙකුත් ව්‍යාපාරික අවශ්‍යතා අතර මාර්ගගත වෙළඳපල දාමයක් ඇතුළත් විවිධාංගීකරණය වූ තොරාගැනීම් මාලාවක් ඇතුළත් විය.

ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් සේවා සමාගමක් වශයෙන් ඩිජිටල් ක්‍රියාමාර්ග මෙහෙයවන Pyxle සමාගමේ ප්‍රධානියා ලෙස ඕෂද මහතා කටයුතු කර ඇති අතර එම අත්දැකීම් සම්භාරය සමඟ කොමිෂන් සභාවේ සේවයට එක් විය. එමෙන්ම ඔහු ගෝලීය ආයෝජන ආයතනයක් වන Tavistock සමූහය සමඟ සමාගම ඒකාබද්ධ කිරීමේ කාර්යයට මූලික විය. එක්සත් ජනපදයේ සහ යුරෝපයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පෙරමුණේ සිටින ප්‍රධාන ගනුදෙනුකරුවන් 100 දෙනෙකු අත්පත් කර ගැනීම සහ වැඩ කිරීම සම්බන්ධයෙන් මෙන්ම ව්‍යාපාර ආරම්භයේ සිට පරිණතවීම දක්වා ව්‍යාපාර වල වර්ධනය පිළිබඳව තාක්ෂණික ප්‍රවීනතාවය හා කර්මාන්ත අවබෝධය සම්මිශ්‍රණය වූ පුළුල් දැනුමක් ඔහු සතු වේ.

ඕෂද සේනානායක මහතා තම මූලික කුසලතාව ලෙස උපායමාර්ගික සහ හවුල්කාරීත්වය ගොඩනගා ගනිමින් ශ්‍රී ලංකාවේ බැංකු, මූල්‍ය අංශ සහ මාර්ගගත ව්‍යාපාර යන ක්ෂේත්‍ර වල ඉදිරියෙන්ම සිටින බහුවිධි තාක්ෂණ ප්‍රවේශය පදනම් කර ගත් මූලික අවධියේ පවත්නා ව්‍යාපාර සඳහා දේශන සහ උපදේශකත්වය ලබා දෙයි. ඔහු ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර එක්සත් ජනපදයේ සහ එක්සත් රාජධානියේ වාසය කර ඇත.

ඔහුගේ ඇතැම් අධ්‍යාපනික ජයග්‍රහණ අතරට AIB ඕස්ට්‍රේලියා වෙතින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සහ Newcastle හි Northumbria විශ්ව විද්‍යාලයෙන් ලබාගත් උපාධිය ද ඇතුළත් වේ.

Institute of Director's India ආයතනය ඩිජිටල්කරණය කිරීමේ තේමාව සහිත Bombay Stock Exchange Annual Forum – 2018 හි ප්‍රධාන උපදේශක මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට ඔහුට ආරාධනා කරන ලදී. එමෙන්ම 2018 සහ 2020 වසර වල ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාතික තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණයේ කමිටු මණ්ඩල සාමාජිකයෙකු වූ ඕෂද සේනානායක මහතා "අපගේ ඩිජිටල් ජීවිත" යන මැයෙන් ප්‍රධාන දේශනය කරන ලදී.

ඕෂද සේනානායක මහතා පශ්චාත් උපාධි සිසුන් සඳහා Oxford School of Business හි Bedfordshire විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කරන අතර උපායමාර්ගික කළමනාකරණය, ඩිජිටල්

අලෙවිකරණය සහ තොරතුරු තාක්ෂණ පාලනය පිළිබඳ ඔහුගේ දැනුම බෙදා හදා දේ.

තම වෘත්තීය ජීවිතයෙන් ඔබ්බට, ප්‍රජාව සවිබල ගැන්වීමට දැඩි උනන්දුවක් දක්වන ඕෂද සේනානායක මහතා ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට අඛණ්ඩව දිගුකාලීනව ආධාර ලබාදෙන අතර සෙනෙර සිසු සවිය පදනමේ ආරම්භක සාමාජිකයෙකි. මේ අනුව 2020 වසරේ නැවත පාසැල් පැමිණීමට සූදානම් වන ග්‍රාමීය සිසුන් 150 අධික සංඛ්‍යාවක් සඳහා පාසල් උපකරණ ඇසුරුම් ලබාදීම නවතම ව්‍යාපෘතිය විය.

චාමින්ද කුමාරසිරි මහතා
කොමිෂන් සභාවේ සාමාජික

FCA, FCCA, ACMA, FMAAT, MBA, B.Sc. ගණකාධිකරණ (විශේෂ) පළමු වන පන්තියේ ගෞරව.

වරලත් ගණකාධිකාරී, ආයතනික පුහුණුකරු, නායකත්ව පුහුණුකරු, කළමනාකරණ උපදේශක සහ මූල්‍ය උපදේශක මෙන්ම ආයතනික අංශයේ දශක දෙකකට අධික පළපුරුද්ද ඇති චාමින්ද කුමාරසිරි මහතා ප්‍රමුඛපෙළේ දේශීය ව්‍යාපාරික ආයතන මෙන්ම බහුජාතික සමාගම්වල ජ්‍යෙෂ්ඨ තනතුරු දරයි.

වෘත්තීය සහ අධ්‍යාපනික සුදුසුකම් රැසක් ලබා ඇති චාමින්ද මහතා සම්මාන සහ පදක්කම් ලාභියෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය, එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය සංගමයේ සාමාජිකයෙකි. එමෙන්ම ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. චාමින්ද කුමාරසිරි මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේද ගණකාධිකරන (විශේෂ) උපාධිය ප්‍රථම පන්තියේ සාමාර්ථයක් සහිතව සමත් වී ඇති අතර මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ කරන ලදී.

ඔහු දැනට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ජාතික ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස සහ උපදේශ/අධ්‍යක්ෂවරයෙකු ලෙස සමාගම් සහ ජාතික ආයතන කිහිපයකට ද සේවය කරයි. එමෙන්ම ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ, ගිණුම්කරන අධ්‍යාපන ජාත්‍යන්තර මණ්ඩලයේද සාමාජිකයෙකු ලෙස පත් වී ඇති අතර සමස්ථ දකුණු ආසියාවේ එකම නියෝජිතයා ලෙස ඔහු එය නියෝජනය කරයි.

අනිල් මීගහගේ මහතා
කොමිෂන් සභාවේ සාමාජික

අනිල් මීගහගේ මහතා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා කොමිෂන් සභා සමාජිකයෙකු ලෙස පත් කර ඇත.

ඔහු EAP Holdings හි ජ්‍යෙෂ්ඨ විධායක, උප සභාපති / ප්‍රධාන විධායක නිලධාරී සහ එදිරිසිංහ විකාශන රූපවාහිනි/ගුවන් විදුලි/EAP චිත්‍රපට යන අංශවල අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම, 2012 සහ 2013 වසර වලදී ශ්‍රී ලංකාවේ Samsung Mobile හි ප්‍රධානියා විය. අලෙවි, මෙහෙයුම්, බෙදාහැරීම, පාරිභෝගික අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර සහ අලෙවි කළමනාකණ කණ්ඩායම් ක්ෂේත්‍ර පිළිබඳව සෘජුවම ක්‍රියාකර ඇත. අලෙවි කණ්ඩායක් 235ක් සහ බෙදාහරින්නන් 108ක් විකුණුම් කළමනාකරණය යටතේ ඇතුලත් විය.

මීට පෙර දිවයිනේ විශාලතම අලෙවිකරණ සේවා සමූහයක් වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමාන්‍යාධිකාරී ලෙස ශාඛා ජාලය, අලෙවි සහ විකුණුම් මෙන්ම සමස්ථ විකුණුම් කණ්ඩායම් 5000 සහ 1200ක් පමණ වූ කාර්ය මණ්ඩලයක් සම්බන්ධයෙන් ප්‍රධානත්වය ගෙන කටයුතු කළේය.

අනිල් මීගහගේ මහතාට යුනිලීවර් ශ්‍රී ලංකා හි වසර 20කට අධික ආයතනික පළපුරුද්දක් ඇති අතර, 1988 දී යුනිලීවර් හා සම්බන්ධවී, අලෙවි විධායක, අලෙවි පරිපාලන කළමනාකරු, ප්‍රදේශ අලෙවි කළමණාකරු සහ නිවාස හා පුද්ගලික ආරක්ෂණය සම්බන්ධයෙන් සමූහ වෙළඳ කළමණාකරු වශයෙන් ප්‍රධාන තනතුරු රාශියක් දරන ලද අතර ක්‍රියාකාරී කළමනාකරු ලෙස නව වෙළඳ අංශය වෙත ගමන් කළේය.

වියට්නාම යුනිලීවර් ආයතනයේහි සේවය කිරීමෙන් පසුව එම ආයතනයේම නිවාස සහ පුද්ගලික ආරක්ෂණ අංශයේ වැනල් සංවර්ධන සහ වෙළඳ අලෙවි කළමනාකරු හා ෆාමසි සහ රූපලාවන්‍ය නාලිකාවේ ප්‍රධානියාද විය.

වෘත්තීමය වශයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලබාගෙන සිටින අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා පෙනී සිටියි. එමෙන්ම අලෙවිකරණය පිළිබඳ වෘත්තීමය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (DipM MCIM) හදාරා ඇති අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ CIM සහ ICSA සිසුන් සඳහා වසර 12කට අධික කාලයක් දේශකයකු ලෙස කටයුතු කිරීමේ පළපුරුද්ද ඇත.

රුවන්ත කුරේ මහතා
කොමිෂන් සභාවේ සාමාජික

රුවන්ත කුරේ මහතා වෘත්තියෙන් නීතිඥවරයකු වන අතර ඔහු Leicester විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී ගෞරව උපාධිය (LL.B.(Hons)) සහ නීතිවේදියකු වශයෙන් Lincoln's Inn හි කටයුතු කර ඇත.

ඔහු වෙළඳ නීතිය, ගිවිසුම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය යනාදී විවිධ අංශ සම්බන්ධයෙන් පුළුල් පළපුරුද්දක් ඇති අතර නීති වෘත්තිකයකු ලෙස කීර්තිමත් වෘත්තිය පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයකු වශයෙන් ක්‍රියාකාරීව සේවයේ යෙදී සිටී. එමෙන්ම ඔහු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ඩිජිටල්කරණය සහ උසාවි ස්වයංක්‍රියකරනය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ කමිටුවේ නීති උපදේශක සහ කැඳවුම්කරු ලෙස ද කටයුතු කරයි.

නීති ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රවීන නීතිඥයකු වන කුරේ මහතා 2019 දෙසැම්බර් මාසයේදී කොමිෂන් සභා සාමාජිකයකු ලෙස පත් කරන ලදී. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විගණන කමිටුවේ සාමාජිකයෙකි. රුවන්ත කුරේ මහතා කොමිෂන් සභාවේ නීතිමය සහ නියාමන කටයුතු කිහිපයකටම දායක වී ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



හෙළසිරි රණතුංග මහතා
අධ්‍යක්ෂ - ජාල

හෙළසිරි රණතුංග මහතා 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු ගෞරව උපාධිය සහ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) වරලත් ඉංජිනේරුවරයෙකි. 1986 වසරේදී උපාධිය ලබාගැනීමෙන් අනතුරුව ඔහු ස්වාධීන රූපවාහිනී ජාලයට සම්බන්ධ වූ අතර ප්‍රධාන ඉංජිනේරු තනතුර දරා ඇත. ස්වාධීන රූපවාහිනී ජාලයේ වසර 12ක සිය වෘත්තීය ජීවිතය තුළ ඔහු එම විකාශන ආයතනයේ සම්ප්‍රේෂණ පුළුල් කිරීම සහ චිත්‍රාගාර සහ පාලන මැදිරි වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයකට නායකත්වය ලබාදෙන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 22ක ඔහුගේ සේවා කාලයේදී ජ්‍යෙෂ්ඨ තනතුරු කිහිපයක් දරා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගුවන් විදුලි සංඛ්‍යාත කළමනාකරණ සහ පිරික්සුම් පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති කළමනාකරු ලෙස ඉතා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කලේය. ඔහු වසර කිහිපයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරන අංශයට නායකත්වය ලබාදෙන ලදී. ඔහුගේ වර්තමාන තනතුර අධ්‍යක්ෂ ජාල ලෙස වැඩ භාර ගැනීමට පෙර වසර කිහිපයක් බලපත්‍ර කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලදී.

ඔහුගේ වෘත්තීය තුළ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයකට සහභාගී වී විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සංවිධානය කරන ලද ලෝක ගුවන්විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණ සහ අනෙකුත් ගෝලීය විදුලි සංදේශ නියාමන රැස්වීම් කිහිපයක් වෙනුවෙන් ඔහු කොමිෂන් සභාව නියෝජනය කළේය.



එච්.පී. කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ - වර්ණාවලි කළමනාකරණය

එච්.පී. කරුණාරත්න මහතා, 1992 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට පෙර හැදින්වූ විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට ඉංජිනේරුවකු ලෙස සේවයට එක් විය. එමෙන්ම විදුලි සංදේශ නියාමන ආයතයට සම්බන්ධවීමට පෙර ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ දෙපාර්තුමේන්තුවේ වසර 7කට වැඩි කාලයක් සේවය කර ඇත.

ඔහු එක්සත් රාජධානියේ ඉලෙක්ට්‍රොනික හා ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයේ උපාධි සාමාජිකත්වය ලබා 1995 වසරේදී එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු බටහිර ඉන්දීය කොදෙව් විශ්ව විද්‍යාලයෙන් විදුලි සංදේශ ප්‍රතිපත්ති හා නියාමනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 30කට අධික කාලයක් පුරා විහිදුණු සිය වෘත්තීය ජීවිතය තුළ කරුණාරත්න මහතා ඉංජිනේරු, කළමනාකරණ, ජාත්‍යන්තර සබඳතා, විදුලි සංදේශ නියාමනය, බලපත්‍ර සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය යන විවිධ ක්ෂේත්‍ර වල කටයුතු කර ඇත.

එමෙන්ම ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/බලපත්‍ර පරිපාලන, අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ, අධ්‍යක්ෂ/ජාල ඇතුළු ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා ඇත. දැනට කරුණාරත්න මහතා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ තනතුර දරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් විදුලි සන්නිවේදන සේවා කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම ඇත. සිවිල් සහ හමුදා සංඛ්‍යාත භාවිතය පිළිබඳ දත්ත සමුදාය සැලසුම් කිරීම, පැවරීම, අධීක්ෂණය කිරීම, පවත්වාගෙන යාම මෙයට ඇතුළත් වේ. සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ ප්‍රධානියා වන කරුණාරත්න මහතා, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ නව්‍යතාවය සහ කාර්යක්ෂමතාවය සහතික කරමින් ගුවන් විදුලි සංඛ්‍යාන වෙන් කිරීම සහ පැවරීම පිළිබඳ සාධාරණ, සමාන සහ විනිවිද පෙනෙන ක්‍රියාපටිපාටි සහ කොන්දේසි සඳහා වගකියනු ලැබේ.

ඔහු එක්සත් රාජධානියේ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකු වන අතර, එම ආයතනය සඳහා ජාත්‍යන්තර වෘත්තීය ලියාපදිංචි උපදේශකයෙකු ලෙස ද සේවය කරයි.



එම් කේ ජයසේකර මහතා
අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා (විශ්‍රාමික)

ජයසේකර මහතා වර්තමානයේ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) යනුවෙන් හැඳින්වෙන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ වසර හතක සේවයෙන් පසු 1994 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු 2001-2003 දක්වා ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය මඟින් පැවරුමක් මත බහමාස් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ උපදේශකයෙකු ලෙස සේවය කළ වසර දෙක හැර වසර 26 කට අධික කාලයක් නියාමන

ආයතනයේ සේවය කර ඇත. මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යා උපාධිය ලබාගන්නා ලද අතර කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගන්නා ලදී. වරලත් ඉංජිනේරුවකු වන ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සහ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙකි. ජයසේකර මහතා අධිවේගී අන්තර්ජාල සේවා සහ යටිතල පහසුකම් සඳහා වූ උපාය මාර්ග" ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයන මැයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) වාර්තාවේ කතුවරයා විය.



එම් කේ ජයන්ත මහතා
අධ්‍යක්ෂ - මූල්‍ය

ජයන්ත මහතා 2013 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වී ඇත. ඔහු ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික, එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජික, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමයේ සාමාජික සහ එක්සත් රාජධානියේ පිරිවැය සහ විධායක ගණකාධිකාරීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයකු ද වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට බැඳීමට පෙර, ජයන්ත මහතා ශ්‍රී ලංකාවේ කීර්තිමත් නිෂ්පාදන වෙළඳ සහ සේවා ආයතන රැසක සමූහ මූල්‍ය පාලක, කළමණාකරු මූල්‍ය සහ පරිපාලන මෙන්ම ප්‍රධාන මූල්‍ය නිලධාරී වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවමින් පෞද්ගලික අංශයේ වසර 17කට අධික මූල්‍ය සහ පරිපාලන පළපුරුද්දක් ලබා ඇත.



තරලිකා ලිවේරා මහත්මිය
වැඩබලන අධ්‍යක්ෂ - අනුකූලතා සහ විමර්ශන

තරලිකා ලිවේරා මහත්මිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස පැවති අවධියේ ඉංජිනේරුවරියක ලෙස සේවයට සම්බන්ධ වූ අතර විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රය පිළිබඳව වසර 26කට අධික පුළුල් පළපුරුද්ද හෙබි නිලධාරිනියකි. වර්තමානයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - අනුකූලතා සහ විමර්ශන (වැඩබලන) තනතුර හොබවයි. ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා ගෞරව උපාධිය සහ එක්සත් රාජධානියේ Sheffield Hallam විශ්ව විද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

ලිවේරා මහත්මිය එක්සත් රාජධානියේ ඉලෙක්ට්‍රොනික හා තාක්ෂණ ආයතනයේ වරලත් ඉංජිනේරුවරියක් වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ සාමාජිකාවකි.

ඇය දකුණු ආසියාවේ ආසියා ශාන්තිකර විදුලි සංසදයේ උප සභාපතිත්වය දරන අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ "අධ්‍යයන කණ්ඩායම -1" හි බ්‍රෝඩ්බෑන්ඩ් අධ්‍යයනය පිළිබඳ උප වාර්තාකරු ලෙස ද කටයුතු කර ඇත. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, විදුලි සංදේශ ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ පුළුල් ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇති අතර, උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීමට ඇයගේ එම අත්දැකීම් කොමිෂන් සභාව බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත.



ඊ.එන්.පී.කේ රත්නපාල මහතා
වැඩබලන අධ්‍යක්ෂ - බලපත්‍ර කළමනාකරණය

ශ්‍රී ලංකීය විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවකු ලෙස වසර 26කට අධික වෘත්තීය ජීවිතය තුලින්, නිහාල් රත්නපාල මහතා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් අත්කරගෙන ශ්‍රව්‍ය සහ දෘශ්‍ය විකාශන සේවා ඇතුළු ගුවන් විදුලි සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධනයන් සඳහා දායක වී ඇත.

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු ගෞරව උපාධිය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. ඔහු ඉංජිනේරු කවුන්සලයේ (එක්සත් රාජධානිය) ලියාපදිංචි වරලත් ඉංජිනේරුවකු වන අතර ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (එක්සත් රාජධානිය) සමාජිකයෙකි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ද සාමාජිකයකු වේ.

වර්තමානයේ දී වැඩබලන අධ්‍යක්ෂ (බලපත්‍ර කලමනාකරණ) වශයෙන් ඔහුගේ සේවය රටේ සමස්ථ විදුලි සංදේශ සේවා සැපයීම මෙහෙයවන විදුලි සංදේශ පද්ධති බලපත්‍ර කළමනාකරණය දක්වා ව්‍යාප්ත වී ඇත. ඔහු 1994 වසරේ සිට බොහෝ ජාත්‍යන්තර සංවිධාන ආශ්‍රයෙන් විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් මෙන්ම පළපුරුද්දක් ලබාගෙන ඇති අතර ස්විස්ටර්ලන්තයේ ජිනීවාහි ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් පවත්වන ලද ලෝක ගුවන් විදුලි සන්නිවේදන සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරන වෙනත් කලාපීය නියාමන ක්‍රියාකාරකම් වලදී ද ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.



කේ.එස්.එම්. විශාඛා මෙනවිය
වැඩ බලන අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

කේ.එස්.එම්. විශාඛා මෙනවිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වශයෙන් පැවතුන අවධියේ එහි සේවයට සම්බන්ධ වී ඇත. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධිය සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පශ්චාත් උපාධිය ලබාගෙන ඇති අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ (IET) වරලත් ඉංජිනේරුවරියක් සහ එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සලයේ වරලත් සමාජිකාවක්ද වේ.

ඇය දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ (වැඩබලන) තනතුර හොබවන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විදුලි සංදේශ සහ නියාමන ක්ෂේත්‍රයේ වසර 26කට අධික පළපුරුද්දක් ඇය සතු වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ සහ ජාල අංශවල නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු වල වසර ගණනාවක් සේවය කර ඇති අතර මෙම කාලසීමාව තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ව්‍යාපෘති රැසක් සඳහා ඇයගේ දැනුම හා පළපුරුද්ද ලබා දී ඇත. එමෙන්ම ඇය ජාත්‍යන්තර විදුලි සංදේශ සමයේ ලෝක ගුවන් විදුලි සම්මන්ත්‍රණය මෙන්ම ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැස්වීම් රැසක් වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළාය.



ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණානන්දන
වැඩබලන අධ්‍යක්ෂ - විශේෂ ව්‍යාපෘති

ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණානන්දන 1994 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලයෙන් සිය උපාධිය ලබා ගත් අතර, පෞද්ගලික අංශයේ කෙටි කාලයක් සේවය කිරීමෙන් අනතුරුව 1998 වසරේදී සහකාර අධ්‍යක්ෂ/අන්තර් ක්‍රියාකාරීත්ව ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු සිය පශ්චාත් උපාධි අධ්‍යාපනය හදාරන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

වරලත් ඉංජිනේරුවරයකු වන ගුණානන්දන මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සලයේ ආයතනික සාමාජිකයකු වන අතර එක්සත් රාජධානියේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි.

ඔහු පසුගිය වසර 26 පුරා ශ්‍රී ලංකා මාතාව වෙනුවෙන් සිය සේවය කැප කර ඇති අතර, කොළඹ මහා රෝහල උසස් ඉලෙක්ට්‍රොනික වෛද්‍ය උපකරණ වලින් සවිබල ගැන්වූ විකුණුම් සමාගමක ඉංජිනේරුවරයකු සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අනුබද්ධ සාමාගමක් වූ සීමා සහිත ටෙලිකමියුනිකේෂන් සර්විස් සමාගම සඳහා සැපයුම් ණය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ දිවයින පුරා ව්‍යාප්තව පැවති විදුලි සංදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඉංජිනේරුවරයකු ලෙස සේවය කර ඇත. සහකාර අධ්‍යක්ෂ/අන්තර් ක්‍රියාකාරීත්ව ලෙස ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සුවිශේෂී සේවාවන් රැසක් ඉටු කර ඇති අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රෙගුලාසි, මාර්ගෝපදේශ සහ පටිපාටි සකස් කිරීම සහ පාරිසරික, නියාමන සහ සමාජයීය සම්මතයන් සහ නීති ආරක්ෂා කරමින් ජාලගත කිරීම, කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව, කැලණි විශ්වවිද්‍යාල වැනි වෙනත් අදාළ ආයතන වල සහයෝගය ලබා ගනිමින් විදුලි සංදේශ ජාල සංවර්ධනය පිළිබඳ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දිවයින පුරා මහජනතාවට දැනුවත් කිරීම ඔහු විසින් ඉටු කරන ලද සේවාවන් අතර වේ. ඉංජිනේරු ගුණානන්ද මහතා විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සරල බසින් පොත් සහ මුද්‍රිත ලියවිලි කිහිපයක් රචනා කර ඇත.

ඉංජිනේරු ගුණානන්දන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා ගුවන්විදුලි වර්ණාවලි පිරික්සුම් පද්ධතිය වැඩිදියුණු කිරීම, ගුවන්විදුලි අවහිරතා පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම, අනවසර ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතය අවම කිරීම, විදුලි සංදේශ ක්ෂේත්‍රය මෙන්ම ආරක්ෂක සේවා සඳහා සංඛ්‍යාත වෙන් කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී.

ව්‍යාපෘති කළමනාකරණය, කොන්ත්‍රාත් පරිපාලනය, සංඛ්‍යාත වර්ණාවලි පරිපාලනය විදුලි සංදේශ ජාල සංවර්ධනය පිළිබඳව පුළුල් පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් කොළඹ නෙළුම් කුලුන, කදිරාන පිරික්සුම් සංකීර්ණය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය ඇතුළු දැනට පවතින සියලුම යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා 2017 වසරේ දී විශේෂ ව්‍යාපෘති වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස ගුණානන්දන මහතා පත් කරන ලදී.

එමෙන්ම ඔහු 2011 වසරේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන්විදුලි සංඛ්‍යාත පැවරුම් කමිටුවේ සාමාජිකයෙකි.

ඉංජිනේරු ගුණානන්දන මහතා සමාජ සේවා සහ ස්වේච්ඡා සේවයේ ඉතා ක්‍රියාශීලීව කටයුතු කරන අතර සමාජයට ඔහු කළ විශිෂ්ට මෙහෙවර අගයමින් අධිකරණ අමාත්‍යාංශය විසින් ඔහුව මුළු දිවයිනේම සාම විනිසුරුවරයෙකු ලෙස පත් කර ඇත.



ඉන්ද්‍රජීත් හඳපාන්ගොඩ මහතා
වැඩබලන අධ්‍යක්ෂ - තරඟකාරීත්ව

ඉන්ද්‍රජීත් හඳපාන්ගොඩ මහතා 1994 වසරේදී ශ්‍රී ලංකා Blue-Chip සමාගම් සමූහයේ විධායක නිලධාරිවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද අතර 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මධ්‍යම කළමනාකාරීතවය සඳහා සේවයට එක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආර්ථික කටයුතු අංශයේ සහ තරඟකරීත්ව අංශයේ වසර 23ක සේවා කාලය තුළ ඔහු අන්තර් සම්බන්ධතාවය, අයක්‍රම, බලපත්‍ර, ආවේක්ෂණ යනාදී ප්‍රධාන නියාමන කාර්යයන් මෙහෙයවා ඇත. 2002 වසරේදී ඔහු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විදුලි සංදේශ අංශය ලිහිල් කිරීමේ උපායමාර්ග සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලිය සම්බන්ධීකාණය කරන ලද අතර එම සක්ස කරන ලද උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය. 2000, 2001 සහ 2002 වසර වලදී ශ්‍රී ලංකා ටෙලිකොම්හි අයක්‍රම තුලනය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන ලදී. ඔහු 2003 වසරේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයට අන්තර්සම්බන්ධතා රීති හඳුන්වාදීම සහ 1999 සහ 2010 වසර වලදී අන්තර්සම්බන්ධීය තීරණ නිකුත් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද එවැනි ප්‍රසිද්ධ විභාග දෙකකදී ඔහු මහජන විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. දැනට ඔහු පාරිභෝගික පැමිණිලි නිරාකරණය ක්‍රීමේ අභ්‍යන්තර කමිටුවේ (ICRCC) මුලසුන උසුලයි.

ඉන්ද්‍රජීත් මහතා 2008 වසරේදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ අන්තර්ජාල සම්මුති (IP) පාදක සේවා වල බිල්පත් සහ අයක්‍රම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ කණ්ඩායම් නායකයෙකු ලෙස දායක විය. එමෙන්ම ඔහු 2010/2011 වසර වලදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාකමයන්ගේ සංගමයේ ජාල සහ සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරමින් ඉන්ද්‍රජීත් මහතා ඉන්දියාව, පාකිස්තානය සහ ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රැස්වීම් වලට සහභාගි වූ අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ විවිධ විෂය කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී විය.ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ එක්සත් රාජධානියේ Coventry හි Cable and Wireless College විසින් පවත්වන ලද විදුලි සංදේශ විදුලි සංදේශ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර ආයතන මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පුළුල් දැනුමක් සහ පුහුණුවක් ලබා ගන්නේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ (CPM) සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ (SLEA) යාවජීව සාමාජිකයෙකි. ඉන්ද්‍රජීත් මහතා පිළිවෙලින් කොළඹ විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ Flinders විශ්ව විද්‍යාලය (දකුණු ඕස්ට්‍රේලියාවෙන්) යන විශ්ව විද්‍යාලවලින් ව්‍යාපාර පරිපාලනය (MBA) සහ රාජ්‍ය පරිපාලනය (MPA) පශ්චාත් උපාධි දෙකක් ලබා ඇති අතර ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධිධාරියකි.



රුවනි ගුණරත්න මහත්මිය
කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්

වෘත්තියෙන් නීතිඥවරියක් වන රුවනි ගුණරත්න මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ඇත.

ඇය 2011 වසරේ සිට කොමිෂන් සභාවේ වැඩබලන ලේකම් තනතුර දරයි.

ඇය කොමිෂන් සභාවේ විවිධ නීතිමය කටයුතු මෙහෙයවන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් නීති අංශයේ සේවය කරයි. මීට අමතරව, ආයතනික නීතිමය ගැටළු විධිමත් කිරීම සඳහා ඇය ඉතා වැදගත් සේවාවක් සපයයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 22ක පළපුරුද්ද සමඟින් නීති ක්ෂේත්‍රයේ වසර 26කට වැඩි අත්දැකීම් වලින් හෙබි ඇය කොමිෂන් සභාවේ පාරිභෝගික පැමිණිලි උපදේශ කමිටුවේ සාමාජිකාවකි.

විධායක කාර්ය මණ්ඩලය

කොමිෂන් සභා කාර්යාලය රුවනි ගුණරත්න මහත්මිය වැඩබලන කොමිෂන් සභා ලේකම් **බලපත්‍ර කළමනාකරණ** ඊ.එන්.පී.කේ.රත්නපාල මහතා වැඩබලන අධ්‍යක්ෂ **අනුකූලතා සහ විමර්ශන** තරලිකා ලිවේරා මහත්මිය වැඩබලන අධ්‍යක්ෂ මේනකා පතිරණ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී.එන්.විජේසිංහ මහතා සහකාර අධ්‍යක්ෂ	**සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ** එච්.පී.කරුණාරත්න මහතා අධ්‍යක්ෂ එම්. සි. එම්. ෆාරුක් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ එල්. ගනේෂ්මූර්ති මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්. පී. ගුණසිංහ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ශාන්ත ගුණානන්දන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඊ. වාකිෂ්ට මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්ලිව්.ඒ.ඩී.වී.මධුශංක මහතා සහකාර අධ්‍යක්ෂ ජී.එච්.පී.ඉමාලී ප්‍රශාන්තිකා මහත්මිය සහකාර අධ්‍යක්ෂ	**ජාල** ආර්.ජී.එච්.කේ.රණතුංග මහතා අධ්‍යක්ෂ කේ.එස්.එම්. විශාකා මෙනවිය නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඒ.ආර්.කමලානයනා මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ අයි.එම්.ජවුසි මහතා සහකාර අධ්‍යක්ෂ එස්.ඩබ්ලිව්.එම්.ආර්.එල්.බී.සේනාධීර මහතා සහකාර අධ්‍යක්ෂ
ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා එම්.කේ. ජයසේකර මහතා අධ්‍යක්ෂ (2020-11-12 දක්වා) කේ.එස්.එම්.විශාකා මෙනවිය වැඩබලන අධ්‍යක්ෂ ජේ.කේ.බී.රත්නායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ	**තරහකාරිත්ව** එච්.ඩබ්ලිව්. කේ. ඉන්ද්‍රජිත් මහතා වැඩබලන අධ්‍යක්ෂ ශ්‍රියානි මාවැල්ලගේ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ නිශාන්ත පලිහවඩන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ	**නීති** ජී. මොරගොඩ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ රුවනි ගුණරත්න මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. රුදිගු මෙනවිය වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ අයි.එන්.මැතිව් මහතා සහකාර අධ්‍යක්ෂ
විශේෂ ව්‍යාපෘති ශාන්ත ගුණානන්දන මහතා වැඩබලන අධ්‍යක්ෂ එන්.ඩී.ගීගනගේ මහතා සහකාර අධ්‍යක්ෂ	**අභ්‍යන්තර විගණන** සමන් කිත්සිරි මහතා අභ්‍යන්තර විගණක	**තොරතුරු තාක්ෂණ ඒකකය** එම්.සී.එම්.ෆාරුක් මහතා තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී
මූල්‍යය එම්.කේ. ජයන්ත මහතා අධ්‍යක්ෂ එල්.ඩී.ජයවික්‍රම මෙනවිය සහකාර අධ්‍යක්ෂ අසංකා ලියනගේ මහත්මිය සහකාර අධ්‍යක්ෂ	**පාලන, මානව සම්පත් හා ආයතනික කටයුතු** වී. අරුණ එන් ප්‍රේමරත්න මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ.කේ.බී.රත්නායක මහතා වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ වයි.එස්.පී.ගුණරත්න මහතා සහකාර අධ්‍යක්ෂ	



සටහන: සේවක සංඛ්‍යාව, ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය



තාක්ෂණයේ සීඝ්‍ර කේන්ද්‍රගතවීම සහ සියලුම ඩිජිටල්කරණ සිද්ධාන්ත ඔස්සේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්යයභාරය ව්‍යාප්ත වීමත් සමඟම, සාර්ථක හා තිරසාර ඩිජිටල්කරණයක් කරා මෙහෙයවීම සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගන්නා සම්බන්ධතා යටිතල පහසුකම් සැපයීමේ ප්‍රධාන කේන්ද්‍රීය සහ වැදගත් අංශයක් ලෙස ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය වර්ධනය වී ඇත.අපගේ අංශයේ ප්‍රගතියට ඉවහල් වන විවිධ සාධක රාශියක් තිබේ. ගෝලීය ප්‍රශස්ත නියාමන භාවිතයන් වැළඳ ගනිමින් සියලුම පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව සවිබලගන්වන්නකු සහ වර්ධක උත්ප්‍රේරකයකු වශයෙන් මෙම අංශයේ වර්ධනයට නායකත්වය දීම විදුලි සංදේශ නියාමන ආයතනයේ වගකීම වේ.

කොවිඩ් 19 වසංගතයේ අහිතකර බලපෑමත් සමඟ අනිවාර්යයෙන් ඩිජිටල්කරණ පරිසරයක් නිර්මාණය කිරීමට පෙළඹීමත් සමඟ විදුලි සංදේශ ක්ෂේත්‍රය වර්තමාන පුරවැසියන්ගේ අත්‍යවශ්‍ය ඩිජිටල් පරිසරය සහතික කිරීමෙහිලා යොදා ගැනේ. සේවා, අධ්‍යාපනය, ගෘහ ජීවන රටාව සහ විවේකය ඇතුළත් පුළුල් පරාසයක ජීවිතය සංක්ෂිප්ත වන පරිදි සේවා පරිභෝජන රටාවන් වෙනස් කිරීම සඳහා ආදර්ශ වෙනසක් අවශ්‍ය වේ. ඒ අනුව, නව සාමාන්‍ය පරිසරයක ඉල්ලීම් සපුරාලීම සඳහා අවශ්‍ය ශීඝ්‍ර වෙනසක් හඳුන්වා දීම සහතික කිරීම සඳහා ක්‍රියාකාරී පියවර සහ මුලපිරීම් සහිතව මෙම විදුලි සංදේශ ක්ෂේත්‍රය සක්‍රීය කිරීම සහ සවිබල ගැන්වීම සඳහා නියාමන ආයතනයට විශාල කාර්යභාරයක් පැවරේ.

සුහුරු ශ්‍රී ලංකාවක් සඳහා රජයේ දැක්ම මෙහෙයවනු ලබන්නේ ඩිජිටල් ආර්ථිකයක් පිළිබඳ දැක්ම සහ බුද්ධිමත් සමාජයක් නිර්මාණය කිරීමෙනි. නියාමන ආයතනය වශයෙන්, අපගේ ප්‍රමුඛතාවය වන්නේ සියලුම ඩිජිටල්කරණ මූලාරම්භයන් සඳහා මෙන්ම වර්තමාන ඩිජිටල් බෙදීම තුරන් කිරීම සඳහා ප්‍රධාන උත්ප්‍රේරකයක් ලෙස රට පුරා විදුලි සංදේශ හා බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාවය ස්ථාපිත කිරීම සහ සහතික කිරීමයි. අපගේ රෙගුලාසි, ප්‍රතිපත්ති සහ අනාගත ඩිජිටල් සමාජයක් සඳහා වන සැලසුම් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගෝලීය න්‍යාය පත්‍රය වන “Connect 2030” සමඟ අනුකූල වන පරිදි සකස් කර ඇති අතර එමඟින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහතික කරන වර්ධනය, ඇතුළත් කිරීම, තිරසාර බව, නවෝත්පාදන සහ හවුල්කාරිත්වය යනාදී මූලධර්ම පහ කෙරෙහි අවධානය යොමු කරයි.

2020 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) බලපත්‍ර, කළමනාකරණය, ජාල මෙහෙයුම්, සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය, තරහකාරිත්වය, අනුකූලතාව, නීති, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් සැලකිය යුතු නියාමන ක්‍රියාකාරකම් රැසක් සිය නියාමන කාර්යයන් ලෙස සිදු කළේය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම පිණිස අංශ/ඒකක රැසක් ස්ථාපිත කර තිබේ. මෙම අංශ/ඒකකවල ඉහළ මට්ටමේ සහයෝගීත්වය ඇතිව සාමූහිකව මෙම ක්‍රියාකාරකම් බහුතරයක් ඉටු කළ බව සඳහන් කළ යුතුව ඇත. මෙම වර්ෂයේදී කොමිෂන් සභාව කොමිෂන් සභා රැස්වීම් අටක් පමණ පවත්වා ඇති අතර එහිදී නීති, නියාමන, තාක්ෂණික සහ පරිපාලන විෂයය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සාකච්ඡා තරන ලදී. කොමිෂන් සභාව ක්‍රමෝපායිකව සහ නියාමන වශයෙන් දෙයාකාරයෙන්ම ක්‍රියාකාරකම් රාශියක් සාර්ථකව අවසන් කර ඇති අතර වසර තුළ ප්‍රගතිය සවිස්තරාත්මකව මතු දැක්වේ.

බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම සහ වෙනස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ පටිපාටි: දැනට ක්‍රියාත්මක නීත්‍යානුකූල බලපත්‍ර මාර්ගෝපදේශ පටිපාටියේ හඳුනාගත් අකාර්යක්ෂමතාවය සහ ගැටළු හේතුවෙන්, පවත්නා බලපත්‍ර කළමනාකරණ පටිපාටිය සමාලෝචනය කර සංශෝධනය කිරීමට විධිමත් පියවර ගන්නා ලදී. ඒ අනුව, මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ඇත. මෙහිදී බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, වෙනස් කිරීම, ප්‍රත්‍යාදිෂ්ට කිරීම සහ හිමිකම් පැවරීම වැනි බලපත්‍රකරණය ආශ්‍රිත විෂයය ක්ෂේත්‍ර නීතිගත කරමින් බලපත්‍ර කළමනාකරණ අංශය විසින් යෝජිත නව බලපත්‍ර මාර්ගෝපදේශ සහ පටිපාටි සකස් කරමින් සිටියි. මෙම කටයුතු නිම කිරීමෙන් අනතුරුව, පත් කරන ලද කමිටුව විසින් මෙම මාර්ගෝපදේශ සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ලබා දීමටත් විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කෙරේ.

නව බලපත්‍ර රාමුවක් සඳහා සැලැස්මක් සකස් කිරීම: වර්තමාන බලපත්‍ර රාමුව සුවිශේෂී වෙනසකට ලක් නොවී දශක තුනකට වැඩි කාලයක් තිස්සේ පවතී. එබැවින්, විදුලි සංදේශ කර්මාන්තයේ වර්තමාන සහ අනාගත අවශ්‍යතාවයන් සපුරාලීම සහ තාක්ෂණය කේන්ද්‍රගත ප්‍රතිලාභ වලින් සවිබල ගැන්වීමෙහිලා වර්තමාන බලපත්‍ර රාමුව වෙනස් කළ යුතුව ඇත. සංශෝධිත බලපත්‍ර රාමුවක්

සකස් කරනු ඇති අතර, ශක්‍යතාවයෙන් යුතු අනුමත බලපත්‍ර ආකෘතියකට මාරු කිරීමේ අවස්ථාව ලබා දී පවත්නා සියලුම බලපත්‍ර නව රාමුවකට පිළියෙල කරනු ඇත. මේ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියක් ආරම්භ කරනු ඇත.

බලපත්‍ර සම්බන්ධ 17 වන වගන්තියේ අත්‍යවශ්‍ය අයිතමයක් ලෙස ජාල අනුමැතිය හඳුන්වාදීම: ජාල අනුමැතිය ලබාදීම බලපත්‍ර සම්බන්ධ 17 වන වගන්තියේ අත්‍යවශ්‍ය ප්‍රතිපාදනයක් වන අතර අතීතයේදී එවැනි අනුමත කිරීම් කිසිවක් නිකුත් කර නොමැත. එබැවින්, බලපත්‍ර අංශය විසින් ජාල අනුමැතිය හඳුන්වාදීමේ පියවර ආරම්භ කරන ලද අතර, ඒ සම්බන්ධ අවශ්‍ය අනුමත කිරීම් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් තොරතුරු ඉල්ලා ඇත. තවද, ඉහත සඳහන් ක්‍රියාමාර්ගන්ට අනුකූලව අවශ්‍ය දුරකථන ක්‍රියාකරු සමාගම්වල ජාල සහ තාක්ෂණික තොරතුරු පරීක්ෂා කිරීමට සැලසුම් කර ඇත.

කේබල් විභාජන ජාල බලපත්‍රයක් සම්පූර්ණ කර ඇති අතර අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ (ISP) බලපත්‍ර දෙකක් අළුත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. සෘජු ගෘහස්ථ (DTH) දුරකථන ක්‍රියාකරු සමාගමක බලපත්‍රය අවලංගු කිරීමේ පියවර සම්පූර්ණ කර ඇති අතර හිමිකාරිත්වය පැවරීමේ ඉල්ලීමක් සම්බන්ධයෙන් නැවත සලකා බැලීම සිදු කෙරෙමින් පවතී.

යටිතල පහසුකම් පුළුල් කිරීම: ඇන්ටෙනා ව්‍යුහ භූමි සංකල්පය යටතේ 4G ජාල ව්‍යාප්තිය පිළිබඳ වර්තමාන ප්‍රායෝගික ගැටළු සැලකිල්ලට ගනිමින් දැනට පවතින ඇන්ටෙනා ව්‍යුහයන් පිළිබඳ මාර්ගෝපදේශයේ දක්වා ඇති ඇතැම් නියාමන අවශ්‍යතා ලිහිල් කිරීම සඳහා සංශෝධන යෝජනා කර ඇත. තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නඩත්තු කරන ලද ඇන්ටෙනා ව්‍යුහ දත්ත ගබඩාව සමඟ ගුවන් ගමන් අඩවි තොරතුරු ප්‍රතිසන්ධානය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලද අතර එහිදී අනුමත නොකළ අඩවි වල පැවති අක්‍රමිකතා තහවුරු කරගෙන ඇත. ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ කරන ලද ඉල්ලීම් ද ඇතුළුව දුරකථන ක්‍රියාකරු විසින් කරන ලද ඇන්ටෙනා ව්‍යුහයන් ඉදිකිරීම සඳහා වන ඉල්ලීම් ද ක්‍රියාවට නංවා ඇත. නාගරික ප්‍රදේශවල ජංගම දුරකථන ආවරණය පුළුල් කිරීම සඳහා ප්‍රධාන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟතාවය ඇතිව මාර්ග ඔස්සේ බහුකාර්ය ලාම්පු කණු සවිකිරීමේ සංකල්පය ක්‍රියාත්මක කර ඇත.

දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර හුවමාරු වීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම: ජංගම හා ස්ථාවර ජාල ක්‍රියාකරු සමාගම්වල මූලික එකඟතාවය ඇතිව සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම පිළිබඳ පුළුල් පාරිභෝගික සක්‍රීයතාවය සහ සවිබල ගැන්වීම සහතික කිරීම පිණිස දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර හුවමාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමන ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මෙමඟින් ජංගම / ස්ථාවර දුරකථන භාවිතා කරන්නන්ට ජංගම හෝ ස්ථාවර ජාල ක්‍රියාකරු සමාගම වෙනස් කිරීමේදී සිය දුරකථන අංකය තවදුරටත් එලෙසම තබා ගැනීමට ඉඩ සැලසෙන අතර මෙමඟින් පාරිභෝගිකයින් සඳහා වැඩි කාර්යක්ෂමතාවයක් සහතික කර අඛණ්ඩව වැඩිදියුණු කළ සේවාවක් සැපයීමට මෙන්ම හිතකර තරඟකාරිත්වයක් ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරුවන් දිරිගන්වන හිතකර පරිසරයක් නිර්මාණය කරයි. පවත්නා දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර හුවමාරු වීමේ ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

ජාතික අංකන සැලැස්ම සහ කෙටි සංකේත අංක වෙන් කිරීම: දුරකථන අංක පරාස හිඟ සම්පතක් වන අතර ශ්‍රී ලංකාවේ ජාතික අංක සැලැස්ම ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒවා කළමනාකරණය කරයි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙත කෙටි සංකේත අංක පවරා ඇත. මෙම වසරේදී හදිසි කෝවිඩ් ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන් ඇතුළුව රාජ්‍ය ආයතන 11 ක් සහ පෞද්ගලික අංශයේ ආයතන 07 ක් සඳහා කෙටි සංකේත අංක පවරන ලදී. ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවන් සැපයීම පිණිස පහසුකම් සැලසීම සඳහා කොවිඩ් වසංගතය තුළ වේගවත් අනුමත කිරීමේ ක්‍රියාවලියක් ඇතුළුව ඉලක්කම් තුනක කෙටි සංකේත පරාසයක් සහ හදිසි ඇමතුම් අංක වෙන් කිරීමට වසර පුරා අවශ්‍ය පරිදි කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.

අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය ඔස්සේ කෙරෙන හඬ ඇමතුම් (VOIP) අවහිර නොකිරීමේ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම: දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් කරන ලද VOIP අවහිර නොකිරීමේ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත. මෙම ක්‍රියාවලිය තුළ අවශ්‍ය පරිදි ඕනෑම ගැටළුවක් නිරාකරණය කිරීම සඳහා අදාළ අධීක්ෂණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

මාදිලි අනුමැතිය ලබා දීම සහ උපකරණ නිකුත් කිරීම: රැහැන් සහිත පර්යන්ත උපකරණ සඳහා මාදිලි අනුමැතීන් නවයක් පමණ ප්‍රදානය කර ඇති අතර උපකරණ රේගුවෙන් නිෂ්කාශනය කර ගැනීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම්, වෙළෙන්දන් සහ සෙසු තැනැත්තන් විසින් කරන ලද ඉල්ලීම් මත ආනයන නිෂ්කාශන අනුමැතීන් 2400ක් පමණ නිකුත් කර ඇත.

වෙළඳ බලපත්‍ර ක්‍රියාවලිය සහ උපකරණ නිකුත් කිරීම: මෙම වසර තුළ, වෙළඳ බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීම ප්‍රකාරව, ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) සක්‍රීය කරන ලද උපකරණ සඳහා අදාළ කොන්දේසි සංශෝධනය කරන ලදි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මුහුණ දිය හැකි නීතිමය අවහිරතාවයන් හේතුවෙන් බලපත්‍රය ලබා නොගත් වෙළෙන්දන් එලෙස බලපත්‍ර ලබා නොගත් කාලය සඳහා ක්‍රියා කරන කාල සීමාව අනුව ප්‍රමාද වූ ගෙවීම් වෙනුවෙන් බලපත්‍රය අළුත් නොකිරීමට තවදුරටත් තීරණයක් ගන්නා ලද අතර, වෙළෙන්දන් නීත්‍යානුකූල බලපත්‍රයක් ලබා නොගන්නේ නම් එවැනි අළුත් කිරීම් තුලින් දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරකම් නීත්‍යානුකූල බවට පමුණුවීමේදී නීතිමය අවහිරතා මතු කර ඇත. වර්තමාන වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු ව්‍යුහය සංශෝධනය කිරීම ආරම්භ කරන ලදී. රේගුවෙන් නිෂ්කාශනය කර ගැනීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම්, වෙළෙන්දන් සහ සෙසු තැනැත්තන්

විසින් කරන ලද උපකරණ ආනයන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. එමෙන්ම කෝවිඩ් 19 වසංගත තත්ත්වය තුළ වුව ද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවන්ට අඛණ්ඩව සේවා සැපයීම සහතික කරමින් වෙළඳ බලපත්‍ර සේවා ඩිජිටල්කරණ ක්‍රියාකාරකම් සහිතව මාර්ගගතව සැපයීමට කටයුතු කිරීම ද සැලකිය යුතු කරුණකි.

නීතිවිරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම: මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වේගවත්ව සහ අඛණ්ඩව සිදු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. නීත්‍යානුකූල නොවන වෙළෙන්දන්ගෙන් සේවා ලබාගැනීමේ අවධානම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ඉහළ නැංවීම පිණිස සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ පණිවුඩ යැවීම ඇතුළු මහජනතාව දැනුවත් කිරීම සිදු කළ අතර අවශ්‍ය වෙළඳ බලපත්‍ර හාවිතය තුළින් එවැනි ව්‍යාපාර විධිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව වෙළෙන්දන් සඳහා විධිමත්ව දැනුවත්භාවය ලබා දෙන ලදී. පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමෙහිලා නීති විරෝධී මෙහෙයුම් සිදු නොකෙරෙන බව සහතික කරමින් නීතිය බලාත්මක කරන ආයතන සමඟ එක්ව සත්‍ය විගණන සහ වැටලීම් ආරම්භ කිරීමට අනාගතයේ දී අපේක්ෂා කෙරේ.

රූපවාහිනී සම්ප්‍රේෂණය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන්: ශ්‍රී ලංකාව සඳහා වඩාත් සුදුසු තාක්ෂණයන් පිළිබඳ උපදෙස් සහිතව ඩිජිටල් රූපවාහිනී විකාශනය සහ ඩිජිටල් ගුවන් විදුලි විකාශනය ආරම්භ කිරීමට සහ නොමිලේ ගුවන් කාලය/නැරඹුම් වැනි විකල්ප ප්‍රවේශයන් පිළිබඳව අධ්‍යයනය කිරීමට මෙම වර්ෂය තුළ සලකා බලන ලදී. ජපාන තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ ජයිකා නියෝජිතයින් මෙන්ම ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ද මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි. එහිදී යල්පැනගිය යෝජිත සම්මත ක්‍රමවේදයට වෙනුවට අධි-විභේදන සම්ප්‍රේෂණය සඳහා වන අවශ්‍යතාව වැනි ක්‍රියාත්මක කළ යුතු තාක්ෂණික මූලික කරුණු පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ස්ථාවරය පැහැදිලි කරන ලදී. තවද "set top boxes" පිරිවැය සම්බන්ධයෙන් විමසන ලද අතර වර්තමාන ඉලක්කගත භෞමික නැරඹුම් ප්‍රේක්ෂකයින් අඩු ආදායම්ලාභීන් බව සැලකිල්ලට ගනිමින්, "set top boxes" සැලකිය යුතු ලෙස දැරිය හැකි මිලකට තිබිය යුතු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ස්ථාවරය විය.

ඩිජිටල් විකාශන ස්ථාපනය කිරීමට අවශ්‍ය නොවන විකල්ප නිර්මාණය කරමින් යෝජිත ඩිජිටල් විකාශන ජාල ක්‍රියාකරු (DBNO) සමාගම් ඔස්සේ දේශීය නාලිකා සඳහා අවශ්‍ය ආවරණයක් සැපයීම සඳහා පවත්නා කේබල් හා චන්ද්‍රිකා රූපවාහිනී ජාල සලකා බැලීම මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මීට පෙර පත් කරන ලද කමිටු වාර්තාවේ නිර්දේශ කරන ලද තාක්ෂණික කාර්යක්ෂමතාව සහ බොහෝ රටවල් විසින් පුළුල් ලෙස යොදා ගැනෙන DVBT2 තාක්ෂණය සලකා බැලීම වැනි වෙනත් විකල්ප සම්බන්ධයෙන් ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ යෙදවුම් පිළිබඳ වැඩිදුර තොරතුරු ජනමාධ්‍ය අමාත්‍යාංශයට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ජපාන ණය ගිවිසුම මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු විකල්පය පිළිබඳව සියලු විවල්‍යයන් සාධක කර ගනිමින් තීරණයක් ගත යුතුව තිබුණි.

වැඩිදුරටත් මේ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කරන ලද අතර 2021 වසරේ දී මූලික වශයෙන් ණය ගිවිසුමේ කාලය ඉකුත්වීම සහ ව්‍යාපාතියේ තාක්ෂණික උපදෙස් මෙන්ම සංඛ්‍යාත වර්ණාවලි නියාමන විෂයය ක්ෂේත්‍රය කෙරෙහි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවධානය යොමු කර අවශ්‍ය තොරතුරු සැලකිරීමෙන් පසුව පවා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජයිකා සහතික කිරීමේ ක්‍රියාවලියට සැලකිය යුතු කාලයක් ගතවීම නිසා, මෙය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය නැවත පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) රීති හඳුන්වාදීම සහ බලාත්මක කිරීම: පිළිගත් ප්‍රශස්ත නියාමන පටිපාටි වලට අනුකූලව ප්‍රථම වරට විධිමත් ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති හඳුන්වාදීමට සහ විධිමත් කිරීමට කටයුතු කරන ලද අතර ක්‍රියාත්මක වූ පටිපාටිය සරල වූ අවධිමත් අභ්‍යන්තර ක්‍රියාවලියක් විය. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ අංක 5(ව) , 5(ට) , 5(න) සහ 5(ප) වගන්ති සමඟ කියැවෙන 68 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති රීති 2020 සාදන ලදී.

2020/10/09 දිනැති අංක. 2196/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති 2016/12/16 දින සිට බලාත්මක විය.

2020 දෙසැම්බර් 16 දින සිට බලපැවැත්වෙන නව මාදිලි අනුමැති පටිපාටිය සමඟ, ශ්‍රී ලංකාවේ ආනයනය කිරීමට, අලෙවි කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ හාවිත කිරීමට අපේක්ෂා කරන සියලුම වර්ගවල ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති සඳහා නව මාදිලි අනුමැති පටිපාටිය අදාළ වේ. පැරණි යෝජනා ක්‍රමය යටතේ 2020 දෙසැම්බර් 16 දිනට පෙර නිකුත් කරන ලද සියලුම මාදිලි අනුමැති සහතික 2021 ජූනි 17 වන දින සිට ඉබේම අහෝසි වේ. මෙමඟින් විදුලි සංදේශ උපකරණ ආනයනය විධිමත් කිරීමට හැකි වන අතර එමඟින් ශ්‍රී ලංකාව බාල තත්ත්වයේ සහ යල් පැන ගිය උපකරණ වලින් තොර රටක් බවට පත්වනු ඇත.

සංඛ්‍යාත පැවරීම සහ ප්‍රතිසංස්කරණය: මහජනතාවගේ දැනගැනීම සඳහා ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව සකස් කර කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරන ලදී. පද්ධති කළමනාකරණ දත්ත සමුදාය පෙරහන් කිරීම මඟින් ප්‍රධාන සංඛ්‍යාත ලේඛනය යාවත්කාලීන කරන ලදී.

පවත්නා නීතිමය පටිපාටි වලට අනුගතව විසඳුම් යෝජනා සහිතව ජංගම / ස්ථාවර සේවා සඳහා මෙගහර්ට්ස් 2600 පරාසය පැවරීම ආරම්භ කරන ලදී. දැනට පවත්නා තාවකාලිකව සංඛ්‍යාත පැවරීම විධිමත් කරමින් ත්‍රිවිධ හමුදාවට සහ ශ්‍රී ලංකා පොලිසියට සංඛ්‍යාත පැවරීම

(දිවයින පුරා සන්නිවේදන ජාලය සඳහා) තවදුරටත් අවසන් කරන ලදී. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් දුරස්ථ ඉගෙනුම් පහසුකම් සැපයීමේ අවශ්‍යතාවය මත අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වූ රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා ආරම්භ කිරීමට හැකි වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා සංඛ්‍යාත පවරන ලදී. ජාතික අධ්‍යාපන නාලිකාවක් සඳහා සංඛ්‍යාත පැවරීම පළමු කාර්යය වන අතර එමගින් පාසල් තුළ සම්මත අධ්‍යාපන වැඩසටහන් වලට අතිරේකව රට පුරා මාධ්‍ය ඔස්සේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ප්‍රවේශ වීමට හැකි වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැඩිදුරටත් සමුද්‍රීය උපකරණ, ඩ්‍රෝන හා GPS උපකරණ ආනයනය විධිමත් කිරීම සහ විකාශන සේවාවල සංඛ්‍යාත වෙන් කිරීම අවලංගු කිරීම සම්බන්ධයෙන් රීති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තවදුරටත් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී.

ඉදිරි වසර 5 සඳහා සංඛ්‍යාත වර්ණාවලි සැලැස්ම සකස් කිරීම / 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියලුම ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් යොදා ගෙන ආරම්භක 5G අත්හදා බැලීම් ආරම්භ කළ අතර පූර්ව වාණිජ 5G සේවාවන් මෙහෙයවීම සඳහා ගිගාහර්ට්ස් 3.5 පරාසයේ සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ වාණිජ 5G සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික 5G සංඛ්‍යාත වර්ණාවලි ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සකස් කිරීමෙහිලා මූලික පියවර ගෙන තිබේ. මෙම ප්‍රයත්නයන් ශ්‍රී ලංකාවට නව 5G ආශ්‍රිත නිෂ්පාදන හා සේවා නව්‍යකරණයට පදනම සපයනු ඇති අතර, ගෝලීය 5G වෙළඳපොළට ප්‍රවේශ වීමට සහ 5G හි ප්‍රතිලාභ ලබා ගැනීමට කර්මාන්තවලට පහසුකම් සැපයීමට ඉවහල් වේ.

මුහුදු සංදාම කේබල් ප්‍රත්‍යාස්ථීතිය වැඩසටහන: විදේශ කටයුතු අමාත්‍යාංශය සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (United Nation's Office on Drugs and Crime-UNODC) සමඟ සහයෝගයෙන් ජාතිය සඳහා අඛණ්ඩ දත්ත සහ සන්නිවේදන සේවා සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන සබ්මැරීන් කේබල් ප්‍රත්‍යාස්ථීතිය වැඩසටහන ආරම්භ කිරීමේ මූලික පියවර ආරම්භ කරන ලදී. මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලද මූලික නේවාසික වැඩමුළු පවත්වන ලද අතර, එහිදී මුහුදු සංදාම කේබල් යටිතල පහසුකම් කළමනාකරණය කිරීම සඳහා නියාමන තන්ත්‍රයක් ආරම්භ කිරීම මෙන්ම වරාය පිවිසුම් අවශ්‍යතා වැනි වෙනත් සැපයුම් අංශ සඳහා නියාමන රාමුවක් නිර්මාණය කිරීමේ ප්‍රධාන අවශ්‍යතා සාකච්ඡා කරන ලදී.

විදුලි සංදේශ කර්මාන්තයේ ග්‍රාහකයින්ගේ වර්ධනය: ශ්‍රී ලංකාව සතුව ශීඝ්‍රයෙන් වර්ධනය වන විදුලි සංදේශ අංශයක් පවත්නා අතර දළ වශයෙන් ජංගම දුරකථන ග්‍රාහකයන් මිලියන 28.7, ස්ථාවර දුරකථන ග්‍රාහකයන් මිලියන 2.6ක් වන අතර අධිවේගී අන්තර්ජාල සේවා ග්‍රාහකයන් සංඛ්‍යාව මිලියන 17.5 කි. 2020 වර්ෂය අවසන් වන විට ජංගම හා ස්ථාවර දුරකථන ඝනත්වය (ව්‍යාප්තිය) පිළිවෙලින් 131.1% සහ 11.9% ක් විය. ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තන සැලැස්ම සාර්ථක කර ගැනීමට මෙන්ම තාක්ෂණික ව්‍යාප්තියෙන් ආර්ථිකය නංවාලීමට අත්‍යවශ්‍ය වන ජනගහනය පදනම් කරගත් ආවරණය ව්‍යාප්ත කර රට පුරා භූගෝලීය ආවරණය වැඩි දියුණු කිරීම ප්‍රකාරව විදුලි සංදේශ අධිවේගී අන්තර්ජාල සේවා කර්මාන්තයේ තවදුරටත් වේගවත් වර්ධනයක් අවශ්‍ය වේ.

විදුලි සංදේශ බදු සහ සෙස් බදු එකතු කිරීම: විදුලි සංදේශ බදු සහ සෙස් බදු යටතේ වර්ෂය සඳහා එකතු කළ මුදල රු. බිලියන 18.6 කි. [විදුලි සංදේශ බදු - රුපියල්. බිලියන 9.7 ක්, සෙස් බදු - රුපියල්. බිලියන 4.1 ක්, කුලුනු බදු - රුපියල්. බිලියන 1.1 ක්, කෙටි පණිවුඩ බදු - රුපියල්. බිලියන 0.4 ක් සහ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව - රුපියල්. බිලියන 3.3 ක් (2020 සැප්තැම්බර් දක්වා)] වශයෙනි. 2020 වර්ෂයේ කෙටි පණිවුඩ සේවා බදු එකතු කිරීම 0.08% ක් වූ අතර 2020 වසරේ ජංගම කුලුනු බදු රැස් කිරීම පසුගිය වසරට සාපේක්ෂව 3% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

අයක්‍රම ක්‍රියාත්මක කිරීම: බලාත්මක ඩිජිටල්කරණයට ගැලපෙන සහ පශ්චාත් කෝවිඩ් ක්‍රියාකාරකම්වල නව ආකෘතියක් සඳහා අවශ්‍ය පැකේජවල අවශ්‍යතාවය සහතික කිරීම සඳහා වර්ෂය තුළ සැලකිය යුතු අයක්‍රම තීරණ සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදී. රජයේ පාසල් සඳහා නිල විද්‍යුත් ඉගෙනුම් වේදිකාවට පිවිසීම, දත්ත ගාස්තු රහිතව ඉ-ඉගෙනුම් සඳහා පාසල් දරුවන්ට පහසුකම් සැලසීම පිණිස සියලුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව ඊ-තක්සලාව ඉගෙනුම් භාවිතය හඳුන්වා දෙන ලදී. මෙමඟින් සිසුන්ට පමණක් නොව ගුරුවරුන්ට ද කිසිදු වියදමක් නොමැතිව මෙම ඉගැනුම් ක්‍රමවේදය භාවිතා කිරීමට හැකි විය. එමෙන්ම දෙමව්පියන්ට ද සිය දරුවන් මාර්ගගත අධ්‍යාපනය සඳහා යොමු කිරීමට මෙම ඉගැනුම් භාවිතයට නොමිලේ ප්‍රවේශ විය හැකිය.

එමෙන්ම කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා LEARN ඉගෙනුම් භාවිතය හඳුන්වා දී ඇති අතර එමගින් විශ්ව විද්‍යාල සිසුන්ට කිසිදු දත්ත පරිභෝජනයකින් තොරව ඊ-ටැක්සලාව ප්‍රවේශ වීමට ඉඩ ලබා දී ඇත. එය කොවිඩ් වසංගත කාලයේ මුලපිරීමක් ලෙස ආරම්භ වූ නමුත් දැන් එය සේවා සපයන්නන්ගේ සහාය ඇතිව අඛණ්ඩව ක්‍රියාත්මක වේ. තවද, රජයේ නිල බිහිදොර "Stay Safe" වෙබ් ද්වාරය දත්ත ගාස්තු රහිතව ප්‍රවේශ වීම සඳහා හඳුන්වා දී ඇති අතර දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ස්මාර්ට්ෆෝන් පහසුකම් නොමැති පුරවැසියන් සඳහා 1919 වෙත යවන ලද කෙටි පණිවුඩයක් මගින් ගාස්තු රහිතව මෙයට සම්බන්ධ විය හැකිය. තවද, වර්ෂය තුළ පාරිභෝගිකයින්ට අවශ්‍ය නව භාවිත රටාවන් සමඟින්, වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක වූ නව භාවිත රටාවන් සඳහා විදුලි සංදේශ කර්මාන්තය කාලීනව ප්‍රතිචාර දැක්වීම සහතික කරමින් කොමිෂන් සභාව දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ලබාදුන් ක්‍රියාකාරී උපදෙස් සහිතව, නිවසේ සිට වැඩ කිරීම සහ නිවසේ සිට ඉගැනීමේ සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අඩු මිල අයක්‍රම සැලසුම් හඳුන්වාදීම සහතික කරන ලද අතර සමාජ මාධ්‍ය සහ ගෙවන රූපවාහිනී භාවිතාවන් සඳහා සීමාරහිත භාවිත පැකේජ ලබා දෙන ලදී.

වර්ෂය තුළ සිදු කරන ලද තවත් විශේෂ අයක්‍රම කළමනාකරණ වැඩසටහනක් වූයේ රටේ කොවිඩ් අගුලු දැමීමේ කාලය තුළ බිල්පත් නොගෙවන ලද දුරකථන සම්බන්ධතා වෙනුවෙන් සේවා පහසුකම් සැලසීමයි. එහිදී ගෙවීම් තත්ත්වය නොසලකා සියලුම තැනැත්තන්ගේ විදුලි සංදේශ සේවා අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස රජය කළ ඉල්ලීම කොමිෂන් සභාව විසින් සහතික කර සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලදී. සැමට මූලික සම්බන්ධතාවය සහතික කරමින් වසංගතයට එරෙහි සටනේදී සියලුම පුරවැසියන් සඳහා අත්‍යවශ්‍ය වූ අඛණ්ඩ සම්බන්ධතාවය සහතික කිරීම සඳහා මෙය වැදගත් පියවරක් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

අන්තර් සම්බන්ධතාවය මෙහෙයවීම: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්නා අන්තර්ජාල සම්බන්ධතා ගාස්තු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලද අතර බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම්වල අදහස් ලිඛිතව කොමිෂන් සභාව වෙත සැල කරන ලෙස ඉල්ලා සිටින ලදී. විදුලි සංදේශ කර්මාන්තයේ පාර්ශ්වකරුවන් හා කොමිෂන් සභාව අතර පැවති රැස්වීම් වලදී දැනට පවත්නා අන්තර්ජාල සම්බන්ධතා ගාස්තු අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට දුරකථන ක්‍රියාකරු සමාගම් එකඟතාවයකට පැමිණියේය. කෙසේවෙතත්, යෝජිත පවත්නා අංකය වෙනස් නොකර ජාල අතර හුවමාරු වීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අන්තර්ජාල සම්බන්ධතා ගාස්තු නැවත සලකා බැලිය යුතු බව සඳහන් විය.

විදුලි සංදේශ කර්මාන්තයේ විදේශීය විශේෂඥයින් සහ සේවකයන් සඳහා වීසා නිර්දේශ කිරීම: විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විදේශීය විශේෂඥයින් සහ සේවකයන් සම්බන්ධයෙන් වීසා නිර්දේශ කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර වර්ෂය තුළ විදේශිකයින් සඳහා නේවාසික / ප්‍රවේශ වීසා 94 ක් නිර්දේශ කරන ලදී. වෙනත් රටවල් වලින් අඩු වියදම් මත පදනම්ව සේවකයන් බඳවා ගැනීමට තීරණය නොකර දේශීය මිනිස්බලය හා විශේෂඥතාවයන් යොදා ගැනීමට විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත ආයතන උපරිම පියවර ගත බවට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ වසරේදී ස්ථීර තීරණයක් ගෙන ඇති අතර, වීසා බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම සඳහා දැඩි පටිපාටියක් ක්‍රියාත්මක කර තිබේ. මේ සමඟම, එවැනි සංවිධාන තුළ විශේෂයෙන් තීරණ ගැනීමේ කාර්යභාරය සඳහා දේශීය විශේෂඥතාවයන් යොදා ගැනීම වැඩිකිරීම දේශීය ආර්ථිකයට වාසිදායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු සහ සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම: මෙම වර්ෂය තුළ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ දත්ත, තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන කිරීම සම්පූර්ණ කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රමිතීන්ට අනුව මිල ගණන් කාණ්ඩ පහකට අනුව බෙදා ජංගම හා ස්ථාවර ගාස්තු සැලසුම් මාසිකව විශ්ලේෂණය කර අයක්‍රම ආශ්‍රිත සංඛ්‍යාන දර්ශක ගණනය කිරීම් සකස් කරන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මිණුම් දඬු ආශ්‍රිත අධ්‍යයනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ප්‍රවණතා විශ්ලේෂණයට අනුව, හඬ සහ දත්ත අනුපාත සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දරන ස්ථාවරය ප්‍රශංසනීය ය. නිකුත් කරන ලද නවතම වාර්තා මත පදනම්ව, සාමාජික රටවල් අතර විදුලි සංදේශ සේවා ගාස්තු සන්සන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව ලාභදායී හඬ + දත්ත අඩු භාවිතය සඳහා => 14 වන ස්ථානය, හඬ + දත්ත ඉහළ භාවිතය => 33 වන ස්ථානය, දත්ත පමණක් සහිත අධිවේගී අන්තර්ජාල සේවා => 29 වන ස්ථානය, ජංගම සෙලෙයුලර් සේවා => 09 වන ස්ථානය, ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා => 26 වන ස්ථානයේ ශ්‍රේණිගත වේ. ජංගම හඬ සේවා සඳහා ලාභම රටවල් 10 අතර ශ්‍රී ලංකාව ශ්‍රේණිගත වී ඇති අතර වසර තුළ අඩු මිල ගණන් යටතේ ලබා දෙන නව පැකේජ මත පදනම්ව අනාගත වාර්තා වල දත්ත අනුපාත වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සේවා තත්ත්ව පරාමිතීන් පිළිපැදීම: අනුකූලතා ක්‍රියාකාරකම් යටතේ බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් හඬ සහ දත්ත / අධිවේගී අන්තර්ජාල සේවාවන්හි ගුණාත්මකභාවය (QoS) අධීක්ෂණය කිරීම සඳහා නීති රීති නිකුත් කිරීමට සැලසුම් කරන ලදී. "හඬ සහ දත්ත / අධිවේගී අන්තර්ජාල සේවා සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාදන ලද සේවා ගුණාත්මකභාවය පිළිබඳ පරාමිතීන් දුරකථන ක්‍රියාකරු සමාගම් පිළිපැදීම සහතික කිරීම" පිළිබඳ කාර්යයේ අපේක්ෂිත ප්‍රගතිය සාක්ෂාත් ගෙන ඇත. ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අනුගත වූ සේවා තත්ත්ව පරාමිතීන් 14 ක් වන අතර ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අනුගත වූ පරාමිතීන් සංඛ්‍යාව 16 ක් විය. පාරිභෝගිකයන්ට බලපාන අයාචිත (spam) පණිවුඩ නිකුත් කිරීමත් සමඟ ම, ගෝලීය ප්‍රශස්ත භාවිතයන්ට අනුව අනිවාර්යයෙන්ම පණිවුඩ තේරීම් සහ ඉවත් වීමේ විකල්ප ඇතුළත් කරමින් දුරකථන ක්‍රියාකරු සමාගම් සහ තෙවන පාර්ශවීය සමාගම් විසින් එවන ලද පාරිභෝගිකයන් ඉල්ලුම් නොකළ සමාගම් සිය කැමැත්තෙන් දෙන ප්‍රවර්ධන පණිවුඩ විධිමත් කිරීමට පියවර ගන්නා ලදි. ජාත්‍යන්තර හා දේශීය වංචාසහගත නීති විරෝධී ඇමතුම් වලක්වා ගැනීම සහ එම ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා, වංචාකාරී ඇමතුම් / කෙටි පණිවුඩ අධීක්ෂණය කිරීමට සහ නීති උල්ලංඝනය කරන අංක අවහිර කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් වලට උපදෙස් දෙන ලදී. තවද, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් 4G මෙහෙයුම් පරීක්ෂණ මිනුම් සහ 4G ආවරණය පිළිබඳ අනිවාර්ය මිනුම් සිදු කරන ලද අතර සේවා තත්ත්ව විශ්ලේෂණය යටතේ යතුරු පුවරුවක් වැඩිදියුණු කර දුරකථන ක්‍රියාකරු සමාගම්වල සියලුම සේවා තත්ත්ව පරාමිති මිනුම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම අවධිමත්වීම සහ යාබද රටවල් සමඟ සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය නොකිරීම නිසා සංඛ්‍යාත වර්ණාවලිය තුළ අවහිරතා ඇතිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන "high call drop rates" වැනි අදාළ අඩු සේවා තත්ත්ව දර්ශක සඳහා බලපාන මූලික කරුණු නිරාකරණය කිරීමට වැඩිදුර පියවර ගන්නා ලදී. මෙම තත්ත්වය සම්බන්ධයෙන් මැදිහත් වීමට සහ, පාරිභෝගිකයින්ට අවම අපහසුතාවයන් ඇති වන ආකාරයෙන් පෙරහන් ක්‍රියාත්මක වන තෙක් අනෙකුත් ජාල අවහිරතා පියවරෙන් පියවර ඉවත් කිරීමට වගබලා

ගනිමින් දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පෙරහන් ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම සඳහා වර්ණාවලි සැලසුම්කරණය සහතික කිරීමට පියවර ගෙන ඇත.

අයක්‍රම අධීක්ෂණය සහ විමර්ශනය: බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් හඳුන්වා දුන් අයක්‍රම පැකේජ සමාලෝචනය කරන ලද අතර වෙළඳපොලේ ඇති අනුමත නොකළ අයක්‍රම පැකේජ නිරීක්ෂණය කරන ලදී. ඊට අමතරව, අනුමත නොකරන ලද අයක්‍රම වෙළඳපොලෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, අනුකූලතාවය සහතික කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ප්‍රකාශයක් ලබා ගැනීමේ ක්‍රියාවලියක් හඳුන්වා දෙන ලදී. එම අලුතින් හඳුන්වා දුන් ප්‍රකාශන ක්‍රියාවලියත් සමඟ, වසර ආරම්භයේ දී වෙළඳපොලේ පැවති අනුමත නොකරන ලද බවට තහවුරු වූ ඉහළ අයක්‍රම ප්‍රමාණය වසර අවසානයේදී ශූන්‍යයට ආසන්න විය.

දුරකථන ක්‍රියාකරු සමාගම් බලපත්‍ර කොන්දේසි පිළිපැදීම: විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි පිළිපැදීම අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගත් අතර, ඒ සම්බන්ධ පරීක්ෂණ හතළිස් අටක් සිදු කරන ලදී. විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි ප්‍රකාරව, බලපත්‍ර කොන්දේසි පිළිපැදීම අධීක්ෂණය කිරීම සඳහා විමර්ශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර කොන්දේසි වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

නීතිවිරෝධී මෙහෙයුම් අධීක්ෂණය සහ විමර්ශනය: වෙළෙන්දන් විසින් අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම, වලංගු බලපත්‍රයක් රහිතව නීති විරෝධී ආකාරයෙන් මහජනතාවට විදුලි සංදේශ සේවා සැපයීම සහ නීති විරෝධී කේබල් රූපවාහිනී සහ සැටලයිට් රූපවාහිනී මෙහෙයුම් යනාදිය පිළිබඳව සුදුසු නියාමන පරීක්ෂණ සිදු කරන ලදී. මෙම වසරේදී නීති විරෝධී හා අනුමත නොකළ විදුලි සංදේශ උපකරණ මිලදී ගැනීම පිළිබඳ ඒකාබද්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර සියලුම වෙළෙන්දන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අනුමත කරන ලද උපාංග පමණක් අලෙවි කරන බව සහ අනුමත නොකරන ලද සියලුම ජංගම උපාංග ජංගම දුරකථන ජාල වලින් අවහිර කරන බවට සහතික කිරීම සඳහා ඔක්තෝබර් 1 වන දින දක්වා මූලික කාල සීමාවක් ලබා දෙන ලදී. එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශීය තාක්ෂණික ආයතනයක ස්වේච්ඡා සහාය ඇතිව දේශීය ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා කළමනාකරණ විසඳුමක් සංවර්ධනය කරන ලදී. එමෙන්ම යාවත්කාලීන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම මත දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සපයනු ලබන අවශ්‍ය දත්ත සහිතව සියලුම ලියාපදිංචි උපකරණ නීති විරෝධී ද නොඑසේනම් අනුමත කර ඇති ද යන වග සම්බන්ධයෙන් මේ වන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් පිරික්සිය හැකිය. වර්තමානයේ දී ජාලවල භාවිත වන නීති විරෝධී උපකරණ අවහිර කිරීම ආරම්භ කිරීමට අදාළ නීති, රෙගුලාසි විධිමත් කිරීමට අවශ්‍ය නීතිමය අවශ්‍යතා සකස් කෙරෙමින් පවතින අතර ලියාපදිංචි වෙළෙන්දන්ගෙන් උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව ප්‍රමාණවත් ලෙස දැනුවත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අනුමත කරන ලද හෝ මහජනතාවට අවහිරතාවයක් ඇති නොකරන බවට සහතික කෙරෙන උපකරණ ලැයිස්තුගත කර ඇත. මෙම ක්‍රියාවලිය මඟින් වෙළඳපොළට පැමිණෙන ප්‍රමිතියෙන් තොර ව්‍යාජ / අනුරූප උපකරණ මෙන්ම විමෝචනය යනාදිය ප්‍රකාරව සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පාරිභෝගිකයන්ට බලපාන දිගු කාලීන සෞඛ්‍යය ගැටළු වලට තුඩු දෙන උපකරණ සම්බන්ධ ගැටළු අවම කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්: අනුමත වෙළෙන්දන් විසින් සපයනු ලබන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උපකරණ සහ සේවා මිලදී ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. තවද, සයිබර් හිරිහැර සහ අවහිරතා පිළිබඳව ලැබෙන ඉහළ පැමිණිලි සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් විදුලි සංදේශ හා සමාජ මාධ්‍ය සදාචාරාත්මකව හා නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව පාසල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. විශේෂයෙන් ම දෙමාපියන් සහ සිසුන් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වන මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පාඨමාලා අන්තර්ගතයන් සහිතව ගුවන්විදුලි, රූපවාහිනී සහ සමාජ මාධ්‍ය ඔස්සේ පැවැත්වීමට පියවර ගෙන ඇත.

2020 වසරේ දී සයිබර් හිරිහැර හා අවහිරතා වළක්වා ගැනීම සඳහා කොමිෂන් සභාව සිදුකරන ලද කාන්තා දිනය පිළිබඳ දැනුවත් කිරීම මෙහිලා ප්‍රධාන විශේෂ වැඩසටහනක් විය. එය සමාජ මාධ්‍ය මෙන්ම රූපවාහිනී හා සෙසු මාධ්‍ය නාලිකා වලද පළ වූ අතර එම වැඩසටහන සඳහා ප්‍රමුඛ ප්‍රචාරයක් ලබා දෙන ලදී.

එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග එක්ව "විනිවිද" නමින් අඛණ්ඩව ප්‍රචාරය වූ මාධ්‍ය වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලද අතර එය මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රධාන මාතෘකා පිළිබඳව සාකච්ඡාවට ගැණෙන පුළුල් ප්‍රේක්ෂක පිරිසක් සහිත අඛණ්ඩ වැඩසටහනකි. අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.

පාරිභෝගික පැමිණිලි කළමනාකරණය: බිල්පත්, කරදරකාරී / හිංසාකාරී ඇමතුම්, සේවා තත්ත්ව, කේබල් රූපවාහිනී, අන්තර්ජාලය / දත්ත, සමාජ මාධ්‍ය, සයිබර් හිරිහැර, සහ වෙනත් විදුලි සංදේශ සේවා ආශ්‍රිත ගැටළු සම්බන්ධ පාරිභෝගික පැමිණිලි / ආරාවුල් නිරාකරණය කිරීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් / වෙනත් අදාළ පාර්ශවයන් සමග එක්ව අඛණ්ඩ රැස්වීම් සහ සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව ලැබුණු පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව 1313ක් වන අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

තවද, මාර්ගගතව ලැබුණු අස්ථානගත වූ ජංගම දුරකථන ආශ්‍රිත පැමිණිලි 23,905 ක් පමණ නිරාකරණය කර ඇත. ශ්‍රී ලංකා පොලිසිය සමඟ සහයෝගයෙන් විධිමත් මාර්ගගත පැමිණිලි ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර

පාරිභෝගිකයින්ට දැන් අස්ථානගත වූ දුරකථන සම්බන්ධයෙන් අන්තර්ජාලය ඔස්සේ පැමිණිලි කළ හැකිය. මීට පෙර අස්ථානගත වූ දුරකථනවල ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) එක් වරක් පමණක් පරීක්ෂා කරන ලද අතර එය ඵලදායී නොවූ බැවින් දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් එකී දුරකථනවල ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) දත්ත අඛණ්ඩව අන්‍යෝන්‍යව පරීක්ෂා කිරීම සහතික කරමින් ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) දත්ත පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය වැඩිදුරටත් විධිමත් කරන ලදී. ඒ අනුව දැන් සොරකම් කරන ලද දිගු කාලයක් තිස්සේ අක්‍රීය වූ දුරකථනයක් පවා සොයා ගැනීමට අවස්ථාව සැලසේ.

ආයතන විමර්ශනය සහ සම්බන්ධීකරණය: අපරාධ සහ සිවිල් පරීක්ෂණ සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ඇමතුම් වාර්තා සහ හිමිකාරිත්ව තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා නීතිය බලාත්මක කරන ආයතනවලට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලදී.

තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මීට පෙර ස්ථාපිතව පැවති පොලිස් විමර්ශන ඒකකය ශ්‍රී ලංකා පොලීසිය වෙත ගෙන යන ලද්දේ කොමිෂන් සභාවට නීතිය බලාත්මක කිරීමේ ඒකකයක් කළමනාකරණය කිරීමේ පරිපාලනමය පරිවය නොමැති බව සැලකිල්ලට කරමිනි.

කෙසේ වෙතත්, මහජනතාව විසින් අපේක්ෂා කරන සියලුම නීති බලාත්මක කිරීමේ සහාය ලබා ගැනීම පිණිස විධිමත් ක්‍රියාවලියක් මත එම ඉල්ලීම් ශ්‍රී ලංකා පොලිස් සයිබර් අපරාධ ඒකකයට යොමු කරනු ලැබේ.

ග්‍රාහක අනන්‍යතා මොඩියුලපත් (SIM) ලියාපදිංචිය / ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) පරීක්ෂා කිරීම / අගය එකතු කළ සේවා / ඩිජිටල් ගෙවීම්: SIM ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව SIM ලියා පදිංචි කිරීමේ පටිපාටිය විධිමත් කිරීම ආරම්භ කරන ලදී. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ SIM ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විගණන පවත්වන ලදී. කෙසේ වෙතත්, එහි ගනුදෙනුකරුවන්ගේ වලංගු KYC තොරතුරු පවත්වාගෙන යාමේ දී දුරකථන ක්‍රියාකරු සමාගම්වල සැලකිය යුතු ලෙස අනනුරූපතාවයන් ඇති බව සටහන් වූ අතර අවශ්‍ය නැවත ලියාපදිංචි කිරීමේ / පරීක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග සහතික කිරීමේ ක්‍රියාවලිය ආශ්‍රිත කටයුතු දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සිදු කරනු ලැබේ.

ස්වයංක්‍රීය IMEI සත්‍යාපන විසඳුමක් ඇතුළත් සිම් / උපකරණ / විකුණුම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා වැඩිදුර පියවර ආරම්භ කරන ලදී. ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය විධිමත් කිරීමේ කටයුතු දැන් සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකරු සමාගම් සපයන අගය එකතු කළ සේවාවන්ට අනුකූලව ඔවුන් විසින් පිළිපැදිය යුතු අනිවාර්යය රීති හඳුන්වාදෙමින් එම අගය එකතු කළ සේවාවන් විධිමත් කිරීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අතර ඒ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. අගය එකතු කළ සේවා සහ ඒ ආශ්‍රිත බිල්පත් ආදිය පිළිබඳව සැලකිය යුතු පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති අතර OTP සත්‍යාපනය වැනි ක්‍රියාමාර්ග සේවයට ඇතුළත් කිරීමට නිර්දේශ කර ඇත. දැනට ක්‍රියාත්මක වන එවැනි අගය එකතු සේවාවන්හි කිසියම් විෂමතාවයක් තිබේදැයි තහවුරු කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

වැඩිදුරටත් EZ-Cash / M-cash සේවා වැනි ඩිජිටල් මුදල් සේවා අනිසි අරමුණු සඳහා වැරදි ලෙස භාවිතා කරන බවට ලැබෙන ප්‍රතිචාර මත පදනම්ව, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සපයනු ලබන ඩිජිටල් මුදල් සේවා තවදුරටත් විධිමත් කිරීමේ කටයුතු නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ මහ බැංකුව ඒකාබද්ධව ආරම්භ කරන ලදී. මහ බැංකුව /අන්තරායකර ඖෂධ අධිකාරිය වැනි සියලුම ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සංසදයක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර යාන්ත්‍රික අධ්‍යයනය මත පදනම්ව සැක සහිත ගනුදෙනු සොයා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට අවශ්‍ය විශ්ලේෂක විසඳුම් ක්‍රියාත්මක කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් වගබලා ගෙන ඇති අතර එමඟින් මහබැංකුව යටතට ගැනෙන එම සේවාවන් විධිමත් කිරීමට හැකි වේ. මහ බැංකුව විසින් පාලනය කරනු ලබන භාවිතාවන් සමඟ, පාලන පද්ධති වලින් ජනනය වන එවැනි තොරතුරු දැන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පහසුකම් මත පදනම්ව මූල්‍ය විමර්ශන ඒකකයට යවනු ලැබේ.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනය: ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව විදුලි සංදේශ සම්බන්ධ පර්යේෂණ අධ්‍යයනයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී. ආතර් සී ක්ලාක් නවීන තාක්ෂණ ආයතනයේ සන්නිවේදන අංශය විසින් "සුළු ගංවතුර පූර්ව තීරණ ගැනීම සඳහා නාගරික ප්‍රදේශවල වැව් හා ඇළ ජල මට්ටම තත්‍ය කාලීනව අධීක්ෂණය කිරීම" සහ රුහුණු විශ්ව විද්‍යාලයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් කරන ලද"Fast Uplink Grant- An adaptation of Artificial Intelligence System for Machine Type Communication - යාන්ත්‍රික සන්නිවේදනය සඳහා කෘතිම බුද්ධි පද්ධතියේ අනුවර්තනයකි" අවධානයට ලක් වූ ප්‍රධාන ව්‍යාපෘති වේ. මේ සම්බන්ධ එක් පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රමුඛ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක දී (IEEE Globe Com 2020) ප්‍රකාශයට පත් කර ඇත. ඉහත පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ මූලික ඉදිරිපත් කිරීම් සහ ප්‍රගතිය සම්බන්ධ ඉදිරිපත් කිරීම් දෙකක් සම්පූර්ණ කර ඇත.

විදුලි සංදේශ සමීක්ෂණ හා ප්‍රශ්නාවලිය ආරම්භ කිරීම: දුරකථන ක්‍රියාකරු සමාගම් / වෙනත් රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ තොරතුරු ලබා ගන්නා ලද අතර එක්රැස් කරන ලද තොරතුරු සම්පිණ්ඩනය කිරීම / සම්පාදනය කිරීමෙන් පසු සමීක්ෂණ හා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන ලදී. (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශනය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය 2020,

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශනය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක පිළිබඳ දිර්ඝ ප්‍රශ්නාවලිය 2020, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සයිබර් ආරක්ෂණ දර්ශක පිළිබඳ ප්‍රශ්නාවලිය 2020, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ (ACCIMT - Arthur C Clarke Institute for Modern Technologies) තිරසාර සංවර්ධනය සඳහා අවකාශ තාක්ෂණය පිළිබඳ සමීක්ෂණය, රාජ්‍ය අංශයේ ආයතන අතර ජංගම සහ විහව භාවිතය පිළිබඳ ජාතික සමීක්ෂණය, දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ WG ප්‍රතිපත්තිය, නියාමනය සහ සේවා ආශ්‍රිතව ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය, ආසියානු සහ ශාන්තිකර කලාපයේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණයේ ධාරිතා වර්ධනය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සමීක්ෂණය.]

ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන සමග සහයෝගීත්වය හා සම්බන්ධීකරණය ආරම්භ කිරීම: මෙම වසර තුළ දී විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන (ITU - ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, APT- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, CTO- පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය, SATRC - දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය, SAFIR- යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සංසදය) සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහා සභාවේ 15 වන සැසිවාරය සහ කළමනාකරණ කමිටුවේ 44 වන සැසිවාරයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා නියෝජිත පිරිස සහ අක්තපත්‍ර සංවිධානය කරන ලද අතර එම සංගමයේ මහලේකම් සහ නියෝජ්‍ය මහලේකම් පත් කිරීමේ මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කරන ලදී. කෝවිඩ් 19 වසංගත තත්ත්වය තුළ නිපුණතාවයන් සහ පරිවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනයට ප්‍රතිලාභ ලැබුණු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සංවිධානය කරන ලද එක් මාර්ගගත නොවන පුහුණු වැඩසටහනකට සහ මාර්ගගත පුහුණු වැඩසටහන් / වැඩමුළු සහ මාර්ගගත රැස්වීම් දහඅටකට කාර්ය මණ්ඩලය මෙම වසරේ දී සහභාගී විය. තවද, පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම් පැවැත්වීමෙන් අභ්‍යන්තර දැනුම බෙදාගැනීමේ සැසි සංවිධානය කරන ලදී

තවද, පුහුණු වැඩසටහන් වලින් උකහාගත් දැනුම කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන්ට ද ලබා දීමට වගබලා ගැනීම පිණිස පුහුණු වැඩසටහන් වලට සහභාගී වූ සියලුම දෙනා විසින් අනිවාර්යයෙන්ම කළ යුතු වූ පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම මගින් අභ්‍යන්තර දැනුම බෙදාහැරීමේ සැසි සංවිධානය කරන ලදී.

එමෙන්ම 5G ව්‍යාප්තිය පිළිබඳව පවත්නා අභියෝගාත්මක නියාමන ගැටළු හා සංඛ්‍යාත වර්ණාවලි සැලසුම් උපායමාර්ගවල ප්‍රධාන අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කරමින්, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ නියෝජ්‍ය මහලේකම් මසනෝරි කොන්ඩෝ මහතා විසින් මෙහෙයවන ලද දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සභා සැසිය 2020 හි අංගයක් වූ, දකුණු ආසියාවේ 5G ව්‍යාප්තිය පිළිබඳ කාලීන නියාමන සංවාදය සඳහා කණ්ඩායම් සාමාජිකයකු වශයෙන් විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්තුමා ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

තවද, පාකිස්තානු විදුලි සංදේශ අධිකාරිය (PTA) සහ ඉන්දියානු විදුලි සංදේශ නියාමන අධිකාරිය (TRAI) සමඟ සහයෝගීත්වයට මුලපුරන ලද අතර, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) කළමනාකරණ විසඳුම සහ පවත්නා දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර හුවමාරු වීම වැනි උපාය මාර්ගික ව්‍යාපෘති පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ද්විපාර්ශ්වික රැස්වීම් සංවිධානය කරන ලදී.

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ සැලැස්ම ආරම්භ කිරීම, IPV6 ක්‍රියාත්මක කිරීම සහ යෝජිත නව බලපත්‍ර රාමුව සැකසීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සහාය ලබාගැනීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී.

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) : මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ "Connect 2030: තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ" යන මැයෙන් වූ තේමාව පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. ඊට අමතරව, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්තුමා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ විශේෂ පණිවුඩ අපගේ වෙබ් අඩවියේ සහ ඩිජිටල් නාලිකාවල පළ කරන ලදී.

නියාමනය ආශ්‍රිත නෛතික කටයුතු: විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ප්‍රගතියට සහ පාරිභෝගිකයින්ට අහිතකර ලෙස බලපාන විභාග වෙමින් පවත්නා නඩු සමථයකට පත් කිරීමෙහිලා කොමිෂන් සභාවේ නියාමන ක්‍රියාමාර්ග සහ මුල පිරීම් වලට අවශ්‍ය නීති උපදෙස් / ක්‍රියාමාර්ග ලබා ගැනීමට මුල පුරන ලදී. නඩු පැවරීමත් සමඟම, දුරකථන ක්‍රියාකරු සමාගම් මෙන්ම නියාමන ආයතනය අතර සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම මෙන්ම දුරකථන ක්‍රියාකරු සමාගම් අතර සහයෝගීතාවයට බාධා ඇති විය. රටේ ඩිජිටල්කරණ දැක්ම සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය සඳහා අවශ්‍ය අධිවේගී අන්තර්ජාල සේවා සහ ශීඝ්‍ර ආවරණ ව්‍යාප්තිය සහතික කිරීම සඳහා විසඳුමක් අත්‍යවශ්‍ය බව මෙයින් ගම්‍ය වේ. මෙම අවභිරතාවයන් සමඟ, නීතිපති දෙපාර්තමේන්තුව හා එක්ව කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද සාකච්ඡා හා බේරුම්කරණයට පහසුකම් සැලසීමෙන් පසුව ඩයලොග් සමාගම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ අනෙකුත් ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට සම්බන්ධ නඩු සියල්ලම නිරවුල් කිරීමේ යෝජනා සහිතව නිරාකරණය විය. මෙම විසඳුම මඟින් දුරකථන ක්‍රියාකරු සමාගම් වලට වෙන් කර ඇති නමුත් නඩු පැවරීම නිසා භාවිතා කළ නොහැකි වූ සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීමට හැකියාව ඇති අතර, අපේක්ෂිත ආවරණය පුළුල් කිරීමත් සමඟ

පාරිභෝගිකයින්ට අවශ්‍ය සේවාවේ ගුණාත්මකභාවය ලබා දිය හැකි බව සහතික කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් වලට අවශ්‍ය ප්‍රමාණවත් සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම දැන් අවසන් කර ඇත.

නෙළුම් කුලුන ව්‍යාපෘතියට අනුව, කොළඹ නෙළුම් කුලුනේ වාණිජ මෙහෙයුම් දියත් කිරීම සඳහා සමාගමක් පිහිටුවීමට අදාළ ඉඩම් හිමිකම හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ඇති ගැටළු නිරාකරණය කිරීම සඳහා නීතිමය විධිවිධාන ආරම්භ කරන ලදී. අනාගත වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමේදී නෛතික අනුකූලතාව සඳහා අනිවාර්ය වන නීතිමය විධිවිධාන වසර තුළ ක්‍රියාත්මක කරන තෙක් මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු ඉඩමක් විධිමත් ලෙස පවරා නොතිබීම සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය බව සටහන් කර ගත යුතුය. දැනට, ඉඩම්වල පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා අවසන් පියවර ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එය විධිමත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

තවද, නීති හා නියාමන කටයුතු වලට අදාළ ගිවිසුම්, සංඛ්‍යාත වෙන් කිරීම්, බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, නව ආයෝජන සඳහා නැවත සලකා බැලීමේ ක්‍රියාවලිය, විකුණුම්කරුගේ බලපත්‍ර සම්බන්ධ ගැටළු, ප්‍රශ්නාවලිය, නියාමන රාමුව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා විසඳුම් ලබා දෙන ලදී.

අපරාධ විමර්ශනය, අපරාධ නඩු, වෙබ් අඩවි අවහිර කිරීම / අවහිර නොකිරීම සහ සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පොලිස් ස්ථානවලට ලැබුණු අධිකරණ නියෝග ක්‍රියාවලිය විධිමත් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙම ගැටළු සම්බන්ධයෙන් බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම්, පොලිස් ස්ථාන සහ උසාවිවල උපදෙස් ඇතිව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මෙම වසර තුළදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව එක් අධිකරණ නඩුවක් ගොනු කරන ලදී. විදුලි සංදේශනය සහ සේවකයන් සේවයෙන් ඉවත් කිරීම නිරාකරණය කිරීම සඳහා පැවති නඩු අටක් අවසන් කර ඇත. ඒ අනුව මෙම වසරේදී අධිකරණ නඩු 20 ක් මෙහෙයවා ඇත.

තව දුරටත්, 1991 වසරේ දී සංස්ථාගත කරන ලද වර්තමාන විදුලි සංදේශ පනත කොමිෂන් සභාව ඇතුළත් කිරීම සඳහා 1996 වසරේදී පමණක් සංශෝධනය කර ඇත. ඒ අනුව වසර කීපයක් පුරා ප්‍රධාන තාක්ෂණික සහ නියාමන වැඩිදියුණු කිරීම් වර්තමාන පනතට ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් වර්තමාන විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මේ වන විට මේ සම්බන්ධයෙන් අවශ්‍ය මූලික අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතී.

Connect ශ්‍රී ලංකා ව්‍යාපෘතිය - "ගමට සන්නිවේදනය":
"තාක්ෂණය පදනම් කරගත් සමාජයක් සහ ඩිජිටල් අන්තර්ගත ශ්‍රී ලංකාවක්" ඇතිකරලීමේ රජයේ දර්ශනයට අනුකූලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම රටපුරා 100% 4G / ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය සපුරාලීම සඳහා "ගමට සන්නිවේදනය" (Connect Sri Lanka) ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිර්වචනය කර ඇති පරිදි රජයේ දැක්ම තුළින් ඩිජිටල් සවි බල ගැන්වුණු රාජ්‍යයක් සහ ඩිජිටල් ආර්ථිකයක් කරා රට මෙහෙයවීමේදී ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය වැළඳ ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමත් සමඟ රට ඩිජිටල්කරණය සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම විදුලි සංදේශ සේවා සම්බන්ධතාවය සැපයීමෙහිලා ප්‍රධාන අවශ්‍යතාවයකි. එසේම වර්තමාන කෝවිඩ් වසංගතය හේතුවෙන් අත්‍යවශ්‍ය බව ඔප්පු වී ඇති ඉ-රාජ්‍ය සේවා සහ මාර්ගගත අධ්‍යාපනය වැනි සේවාවන් සඳහා පුරවැසියන්ට විශ්වීය ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම සඳහා දැරිය හැකි මිල කෙරෙහි අවධානය යොමු කරමින් රට පුරා අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය සැපයීම ප්‍රධාන සාර්ථක සංරචකයක් වනු ඇත.

මෙම වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දියත් කරන ලද ගමට සන්නිවේදනය වැඩසටහන පසුව 2021 අයවැය යටතේ රජය විසින් ජාතික වැඩසටහනක් ලෙස හඳුනා ගන්නා ලදී. මෙම ගමට සන්නිවේදනය වඩසටහන මගින් මේ වන විට අධිවේගී අන්තර්ජාල සේවාවල පවත්නා අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කර ඇති අතර පවත්නා ආවරණ ගැටළුවල මූලික යතාර්ථයන් අවබෝධ කරගෙන මුළු දිස්ත්‍රික්ක 25 ග්‍රාමනිලධාරී කොට්ඨාශ 14000 ක පමණ වසරක් පුරා පැවති සමීක්ෂණයේ මූලික කටයුතු අවසන් කර ඇත. මෙම කාර්යයේ මූලික අභිප්‍රාය වන්නේ සමාගමේ දෘෂ්ඨි කොණයෙන් බලන කල මූල්‍යමය වාසියක් නොලැබුණ ද රජයේ දෘෂ්ටි කෝණයෙන් බලන කල අත්‍යවශයය ආර්ථික වාසියක් පෙන්නුම් කරන ග්‍රාමීය ප්‍රදේශ වලට ආවරණය සැපයීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිය විදුලි සංදේශ අරමුදල හරහා දිරි දීමනාවක් සපයමින් විදුලි සංදේශ සේවා සැපයීම පිණිස මූල්‍යමය ආයෝජන සිදු කරලීමයි. මේ වන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සහයෝගය ඇතිව රත්නපුර දිස්ත්‍රික්කයේ පළමු ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර නව විදුලි සංදේශ කුළුණු 36 ක අමතර යටිතල පහසුකම් මෙන්ම තන්තු සම්බන්ධතාවය හඳුන්වා දීමත් සමඟ 2021 මැයි මාසය වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් සභා පාසල් 602 ක්, පොලිස් ස්ථාන 23 ක්, රෝහල් 38 ක් සහ 1400+ වෙනත් රාජ්‍ය ආයතන ආවරණය වන පරිදි ෆයිබර් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය ආවරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.මීට සමගාමීව සෙසු දිස්ත්‍රික්ක වලද මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර 2023 වසර අවසාන වන විට විදුලි සංදේශ සංවර්ධන අරමුදල ප්‍රති ආයෝජනය කිරීම මත පදනම්ව 100% දිවයින පුරා පුළුල් අධිවේගී අන්තර්ජාල ආවරණයක් ලබා ගැනීමේ ආනුෂංගික ඉලක්කය සාක්ෂාත් කර ගැනීම අරමුණ වී ඇත. කෙසේ වෙතත්, අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයෙන් රට ආවරණය කිරීමේ වැඩසටහන තවදුරටත් මාස 18-24 අතර කාල සීමාවක් සක්‍රීය කිරීම සඳහා පවත්නා විදුලි සංදේශ සංවර්ධන අරමුදල වැඩි දියුණු කිරීමට තවදුරටත් මාර්ග සොයා ගත යුතුව තිබේ.

අධිවේගී, දැරිය හැකි සහ තිරසාර 4G / ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ජාලයේ ප්‍රතිඵලයක් වශයෙන්, විදුලි සංදේශ සේවා ව්‍යාප්ති විෂමතාවය අවම කරමින් ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, සීමා මායිම් නොසලකා ඉ-රාජ්‍ය සේවා සහ ළමයින් සඳහා මාර්ගගත අධ්‍යාපනය සැපයීමට පුළුල් ප්‍රවේශයක් සැලසීම මෙන්ම කර්මාන්ත සඳහා අන්තර්ජාලයේ දෑ ස්වයංක්‍රියකරණය කිරීම, කෘෂි තාක්ෂණය වැනි නව තාක්ෂණයන්ට අනුගතවීම කඩිනම් කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනයේ කොටසක් වශයෙන් අනාගතයේ දී ඉ-සෞඛ්‍ය සේවා භාවිතය වේගවත් කිරීමට ද අපේක්ෂා කෙරේ.

"ගමට සන්නිවේදනය" අධිවේගී ආවරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020: මහජන ඉල්ලීම් හා කොමිෂන් සභාවේ ඇගැයීම් මත පදනම්ව, මොණරාගල දිස්ත්‍රික්කයේ මියාගල, බදුරලියේ ලංකාගම හා කෙලින්කන්ද, නවාගත්තේගම මොරගහවැව සහ ලුණුගම්වෙහෙර බෙරලිහෙල ප්‍රදේශ සඳහා 4G ආවරණ පහසුකම් ලබා දී ඇත. ප්‍රමුඛතා පදනමක් මත ඌන සංවර්ධිත ග්‍රාමීය ප්‍රදේශවල ආවරණය වැඩිදියුණු කිරීම සඳහා බෙලිඅත්ත, වලස්මුල්ල, දෙයියන්දර, දෙනියාය, බඹරවාන, පෝරුවගම, වලඹගල සහ ඇල්පිටිය යන ප්‍රදේශවල තාක්ෂණික ක්ෂේත්‍ර චාරිකා සිදු කරන ලදී.

"සුරක්ෂිත සන්නිවේදනයක්" ව්‍යාපෘතිය: මහනුවර, මොණරාගල, බදුල්ල, පුත්තලම, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, කෑගල්ල, නුවරඑළිය සහ ගාල්ල දිස්ත්‍රික්කවල විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හෝ නැවත භාවිතා කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. දිවයින පුරා අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය කෙරෙහි අවධානය යොමු කරමින් ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ ප්‍රගතියට සමගාමීව පාරිසරික ආරක්ෂාව ඇති කරලීමට වගබලා ගනිමින් විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික උපකරණ තිරසාර ලෙස භාවිත කිරීම සහ බැහැර කිරීම ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා ඉදිරි වර්ෂයේදී ව්‍යාපෘතිය පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දේශීය ස්වේච්ඡා වැඩසටහන: ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ වෘත්තීය පුහුණු අධිකාරියේ නිර්දේශය ඇතිව ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පීය පාඨමාලා වලින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 4 හෝ ඊට ඉහළ මට්ටමකින් සමත් වූ සිසුන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ස්වේච්ඡා සේවකයන් ලෙස තෝරා ගන්නා ලදී. මෙම ස්වේච්ඡා වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඇතිව අනුරාධපුරය, පොලොන්නරුව සහ ගම්පහ දිස්ත්‍රික්කවලට අයත් පාසල්වල පවත්වන ලදී.

විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පී වැඩසටහන: ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහයෝගීත්වයෙන් විදුලි සංදේශ කුළුණු කාර්මික වැඩසටහන ආරම්භ කරන ලදී. ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සහ විෂයමාලා සංවර්ධනය කිරීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. කුලුනු තාක්ෂණ ශිල්පීන්/ඉංජිනේරුවන් වශයෙන් සැලකිය යුතු විදේශීය ජාතිකයන් පිරිසක් දේශීයව සේවය කිරීමේදී මුහුණපාන වර්තමාන බාධාවන් සැලකිල්ලට ගනිමින් මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදී. මීට වසර ගණනාවකට පෙර, කුළුණු කාර්මික ශිල්පය සහ ඉංජිනේරු ශිල්පය ඉතා දියුණු කර්මාන්තයක් වී ඇති අතර, විදේශීය මිනිස්බල හා සංවිධාන දේශීය වෙළඳපොළට පැමිණීම හේතුවෙන් කර්මාන්තයේ සැලකිය යුතු කඩාවැටීමක් සිදුවී ඇති අතර දේශීය පුරවැසියන්ට මෙම දිනෙන් දින ව්‍යාප්ත වෙමින් පවතින ක්ෂේත්‍රයේ නියැලීමේ අවස්ථාව අහිමි වී ඇත. ඉහත සඳහන් මුලපිරීමත් සමඟ, වේගයෙන් වර්ධනය වන කර්මාන්තය පුනර්ජීවනය කිරීමටත්, අවශ්‍ය නිපුණතාවය සහිත දේශීය පුරවැසියන්ට රැකියා අවස්ථා නිර්මාණය කිරීමටත්, අනාගතයේ දී රටට විදේශීය විනිමය උපයා ගැනීමට හැකිව පරිදි අත්දැකීම් සහිතව ජාත්‍යන්තරව රැකියා ස්ථානගත කළ හැකි ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමටත් අපේක්ෂා කෙරේ.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය: නෙළුම් කුලුන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මෙම වර්ෂයේ දී ප්‍රධාන අවධානය යොමු වූයේ ව්‍යාපෘතියේ විභවයන් අත්පත් කර ගැනීම සහතික කිරීම පිණිස අනිවාර්ය දෝෂ නිරවද්‍යතාවය සම්පූර්ණ කර කඩිනම් කිරීම සහතික කිරීම සඳහා යි. මෙම ව්‍යාපෘති උපදේශන ඒකකය, ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඉංජිනේරු සහ කොන්ත්‍රාත්කරු විසින් ලබා දී ඇති කාලසීමාවන් අඛණ්ඩව ප්‍රමාද වූ අතර ඉදිකිරීම් අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වාණිජ මෙහෙයුම් වලට සෘජුවම බලපෑම් එල්ල වීමත් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම අහිමිවීමේ තත්වයක් නිර්මාණය විය. එමෙන්ම ව්‍යාපෘතිය භාරදීම විධිමත් ලෙස අවසන් වූ වහාම පවරා ගැනීමේ ක්‍රියාවලියට සහාය කර ගැනීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමව ආරම්භ කිරීම සහතික කිරීමට සමගාමීව වාණිජකරණ සැලසුම් ආරම්භ කිරීමට වගබලා ගැනීම සඳහා කැපවූ වාණිජ මෙහෙයුම් කණ්ඩායමක් ද ස්ථාපනය කරන ලදී. තවද නිරවද්‍යතාවයන් සිදු කිරීමේදී අවශ්‍ය වන අඩුපාඩු හඳුනා ගැනීම ආරම්භ කිරීම පිණිස අවශ්‍ය සෘජු ක්‍රියාමාර්ග ගන්නා ලද අතර අවශ්‍ය සියලුම යටිතල පහසුකම් නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සඳහා අංග සම්පූර්ණ ගිනි සරඹ සංදර්ශනයක් පැවැත්වීම වැනි පියවර ගන්නා ලදී.

වාණිජකරණ මෙහෙයුම් සිදු කිරීම සඳහා ස්ථාපනය කළ යුතු යෝජිත නෙළුම් කුලුන සමාගම යටතේ වාණිජකරණ මෙහෙයුම් ඉටු කිරීමට වගබලා ගන්නා ලදී. ඒ සඳහා මූල්‍යය උත්පාදනය ඇතුළත් සැලැස්මක් සහ සවිස්තරාත්මක වාණිජකරණ උපායමාර්ග සහතික කිරීමට විවිධ වෘත්තීමය පසුබිමකින් හෙබි ප්‍රවීන වාණිජකරණ මෙහෙයුම් කණ්ඩායම සමග එක්ව ස්වේච්ඡාවෙන් කටයුතු කරන ප්‍රවීනයන්ගෙන් සමන්විත කණ්ඩායමක් ස්ථාපනය කිරීම සඳහා මෙම වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමත් විය. තවදුරටත්, කාර්ය මණ්ඩල ධාරිතා සැලසුම්කරණය යනාදිය ඇතුළත් නව සමාගමේ ව්‍යුහාත්මක සැළැස්ම ප්‍රකාරව ස්ථාපනය කරන ලද මෙම මෙහෙයුම් කණ්ඩායම මගින් අවශ්‍ය සියලුම මූලික කටයුතු ආරම්භ කරන ලදී.

කොළඹ නෙළුම් කුලුනේ වාණිජ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා නීතිපතිවරයාගේ උපදෙස් මත සමාගමක් ස්ථාපනය කිරීමේ නීතිමය කටයුතු කඩිනමින් ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ යෝජිත වාණිජකරණ මෙහෙයුම් කළමණාකරන සමාගම අතර අත්සන් කළ යුතු කළමණාකරන ගිවිසුම සහ සාංගමික ව්‍යවස්ථාවලිය සම්බන්ධ මූලික කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති.

තවද, කොළඹ නෙළුම් කුලුනේ පවත්නා ඉඩම් ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා පියවර ගෙන ඇති අතර එහිදී නෙළුම් කුලුන ඉදිකරන ලද ප්‍රධාන භූමි ප්‍රදේශ සහ යාබද ප්‍රදේශ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පවරා හෝ මාරු කර නොමැති බව හඳුනා ගැණිනි. වාණිජකරණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස අනිවාර්යය අවශ්‍යතාවක් වූ ඉඩම් නිරවුල් කිරීම පිණිස අදාළ සෙසු රාජ්‍ය ආයතන සමඟ පුළුල් සම්බන්ධීකරණයක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය: කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගත් අතර වැඩ සමාලෝචනය සඳහා ඉංජිනේරුවෙකු පත් කරන ලදී. ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ටයිල්, නාන කාමර කට්ටල, විදුලි සෝපාන වර්ග, වෛර්ණ ගැන්වීම් සහ විද්‍යුත් සවිකිරීම් යනාදී අභ්‍යන්තර අලංකරණ උචිත ලෙස තෝරා ගැනීම සම්බන්ධ තීරණ අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. ජාල සැලසුම්කරණය සහ පොදු ස්වයංක්‍රීය ශාඛා හුවමාරු (PABX) පද්ධතිය ඇතුළු ගොඩනැගිල්ලේ තොරතුරු තාක්ෂණ විසඳුම් සමාලෝචනය කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය සමඟ ඒකාබද්ධව අවසන් කරන ලදී. රක්ෂණ සහ ඇපකර නිසි ලෙස පවත්වාගෙන යාම අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. ගොඩනැගිල්ලේ අමතර වැසිකිළි කුටි හා ආවරණවල අවශ්‍යතාවය මත නැවත සැලසුම් කරන ලදී. මාසික රැස්වීමේදී වැඩවල ප්‍රගතිය, සැලසුම් දෝෂ, ගෙවීම් සමාලෝචනය කරන ලද අතර වෙනස්කම් නිර්දේශ කිරීම මඟින් වැඩ නිම කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

කදිරානා පුනරුත්ථාපන, නවීකරණ හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය: කොමිෂන් සභාවට පිළිගත නොහැකි ඉංජිනේරු අයවැය විවිධ්‍යයන් සඳහා ගිවිසුම්ගත ක්‍රියාමාර්ග විමර්ශනය කිරීම හා නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. ව්‍යාපෘති උපදේශන ඒකකයේ විවිධ්‍යයන් අධ්‍යයනය කිරීම පිණිස රැස්වීම් සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා පහසුකම් සලසන ලදී. කමිටුව විසින් පෙන්වා දී ඇති කරුණු පැහැදිලි කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සම්බන්ධීකරණය කරන ලදී. තහවුරු නොකළ සහ තක්සේරු නොකළ වියදම් මත පදනම්ව රුපියල් මිලියන 29 ක් පිරිවැයෙන් අඩු කළ යුතු විය. තවද, කොන්ත්‍රාත්කරුට සහ ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාට ගෙවීම් කිරීම සහ රක්ෂණ සහ ඇපකර නිසි ලෙස පවත්වාගෙන යාම අඛණ්ඩව අධීක්ෂණය කිරීම වැනි මූලික ක්‍රියාකාරකම් අවසන් කරන ලදී. තවද, සිදු කරන ලද ප්‍රතිසංස්කරණ මත පදනම්ව කදිරාන පරිශ්‍රය භාවිත කිරීම පිළිබඳ උපාය මාර්ගික සැලැස්මක් නොමැති බව හඳුනා ගැනීම නිසා කදිරාන පරිශ්‍රය ඵලදායී ආකාරයෙන් භාවිතයට ගන්නේ කෙසේද යන්න තක්සේරු කිරීම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

තොරතුරු තාක්ෂණ උද්‍යානය හම්බන්තොට: මෙම ව්‍යාපෘතිය දැනට බේරුම්කරණ ක්‍රියාවලිය යටතේ පවතින අතර මෙම බේරුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ සාකච්ඡා අඛණ්ඩව කරගෙන යනු ලැබේ. අත්තිකාරම් ගෙවීම් සහතිකය යටතේ අවශ්‍ය නඩත්තු කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කිරීම සිදු කෙරේ. විනිශ්චය කිරීම, බේරුම්කරණ ක්‍රියාවලිය සහ නඩු පැවරීම සම්බන්ධයෙන් එස්එල්එල්ආර්ඩීසී විසින් ඉල්ලා සිටින අතිරේක ගෙවීම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

පරිපාලන කටයුතු: 2020 දෙසැම්බර් 31 දින වන විට මුළු කාර්ය මණ්ඩල ධාරිතාව 228 කි. මුළු කාර්ය මණ්ඩලයෙන් 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වලද, 29 ක් මධ්‍යම මට්ටමේ කළමණාකාර තනතුරු වලද, 151ක් සහායක තනතුරු වලද, 44 ක් සුළු ශ්‍රේණිවලද සේවය කරති. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා අනුමත සේවකයින් සංඛ්‍යාව 290 කි.

විදුලි සංදේශ කර්මාන්තයේ වර්තමාන ඉල්ලීම් හා නව ක්ෂේත්‍රය හා තාක්ෂණය දක්වා ව්‍යාප්ත වී ඇති නියාමන කාර්ය භාරය සපුරාලීම සඳහා ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සහ මූලික නිපුණතාවයෙන් හෙබිමානව සම්පතින් යුතුව ආයතනය සවිබල ගැන්වීමේ හදිසි අවශ්‍යතාවය මේ වසරේදී හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අපේක්ෂාවන් හා ඉල්ලීම් සපුරාලීම සඳහා කොමිෂන් සභාවේ වර්තමාන අවශ්‍යතා මත පදනම්ව ආයතනයේ කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන පියවර ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් සමාලෝචන හා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, වර්තමාන විෂමතා හා අඩුපාඩුකම් සපුරාලීම සහතික කිරීම සඳහා කාර්ය සාධන ඇගයීම් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට සමගාමීව නව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) උපදේශන සහාය ලබා ගන්නා ලද අතර එම කාර්යයන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, දැනට පවතින අනුමත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ පවත්නා අවශ්‍යතා අනුව විධායක ශ්‍රේණියේ අනුමත සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවිය යුතුය. අභ්‍යන්තර විගණක (තාක්ෂණික) - තනතුරට පැවරුම් පදනම මත බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබීය. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා සංවර්ධන) තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරියකු ද්විතියන පදනම මත තෝරාගෙන ඇති අතර මෙම වසරේදී සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරේ රාජකාරී භාර ගන්නා ලදී.

එලෙසම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉලක්ක

සාර්ථකව පවතින බව සහතික කිරීම සඳහා ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබන අතර සියලුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් කාර්තුමය වශයෙන් ප්‍රගති පියවරයන් මැන බලයි.

අවශ්‍ය ආයතනික ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික ආයතනික සැලැස්ම, ප්‍රගති වාර්තා සහ 2019 වාර්ෂික වාර්තාව සකස් කර වර්ෂය තුළ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

රජයේ නියෝගයන්ට අනුව, මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ වෙනත් අංශ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන් පහසුවෙන් පරිශීලනය කිරීම සඳහා සහ අදාළ අංශ මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිණිස උඩුගත කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියමන කොමිෂන් සභාවේ සහයෝගීත්ව භාවිතාවක් මත මාර්ගගත වැනලයක් හඳුන්වා දෙන ලදී.

ආයතනයේ ප්‍රයෝජනය උදෙසා කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා දේශීය, විදේශීය, මාර්ගගත පුහුණු වැඩසටහන් මෙන්ම, සමූළු සහ සම්මන්ත්‍රණ වැඩසටහන් 27 ක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහසුකම් සලසන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ඉහළ මට්ටමේ ජාත්‍යන්තර මාර්ගගත රැස්වීම්, සම්මන්ත්‍රණ, අධ්‍යයන කණ්ඩායම් රැස්වීම් සහ විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත සමූළු කිහිපයකට සහභාගී වූ අතර ඒවා දැඩි සංචරණ සීමාවන් නිසා මාර්ගගතව සිදු කරන ලදී.

2020 වසර සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. මෙම කාලය තුළ දී සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 07 ක් සහ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී. සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදනයේ මුළු දළ වටිනාකම රුපියල් 5,058,869.42 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදනවල මුළු දළ වටිනාකම රු. 61,682,235.08 කි.

වර්ණාවලි, ජාල සහ පාරිභෝගික පැමිණිලි අංශ සඳහා පාරිභෝගික කටයුතු හා සේවා පහසුකම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම පිළිබඳ වැඩ පිළිවෙලක් සකස් කිරීමේ කටයුතු අවසන් කරන ලදී. එමෙන්ම මාධ්‍ය ඒකකයේ ක්‍රියාකාරකම් අතරට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රචර්ධන වැඩසටහන් සහ වාර්තාමය වීඩියෝ සකස් කිරීම සඳහා සහාය වීම සහ විද්‍යුත් මාධ්‍ය, සමාජ මාධ්‍ය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් එක්වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය මගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට සහ බාහිර පාර්ශවයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා නිර්දිෂ්ට ලිපි ලේඛන සහ සහ පොත්පත් සපයන ලද අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්තමාන තොරතුරු යාවත්කාලීන කරන ලදි.

තවද, අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් කරන ලද නිරීක්ෂණය මත පදනම්ව, කාර්ය මණ්ඩලය සඳහා වඩා ප්‍රශස්ත සේවා පරිසරයක් සහතික කිරීම සඳහා අළුත්වැඩියා කිරීමේ සහ ගොඩනැගිලි පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

කෝවිඩ් වසංගතයට මුහුණදීමේ සූදානමට අනුව, පරිපාලන කාර්යයන් යටතේ කාර්ය මණ්ඩලය සඳහා පුද්ගලික සනීපාරක්ෂක පහසුකම් සැපයීම, ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත ආම්පන්න සැපයීම මෙන්ම අවශ්‍ය සෞඛ්‍ය මෙහෙයුම් උපකරණ ලබා දීමට ද වග බලා ගන්නා ලදී. කෝවිඩ් කාලය තුළ කාර්ය මණ්ඩලයේ සේවා මුර පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලද අතර කාර්ය මණ්ඩලයේ උපරිම ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෞඛ්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම ද මීට ඇතුළත් වේ.

තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තන වැඩසටහන: ආයතනික ව්‍යුහය තුළ වෙනම තොරතුරු තාක්ෂණ අංශයක් ස්ථාපනය කර නොතිබුණද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඩිජිටල් පරිවර්තනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරමින් ආයතනයට අනිවාර්ය තාක්ෂණික සහාය සහ ආධාර ලබා දීම සහතික කිරීම සඳහා පවත්නා තොරතුරු තාක්ෂණ ඒකකය ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී. තොරතුරු තාක්ෂණ ඒකකයේ පළමු ක්‍රියාකාරකම් වලින් එකක් වන්නේ ආයතනයේ තොරතුරු තාක්ෂණ වත්කම් ඩිජිටල්කරණය කිරීමයි. වත්කම් ජීවන චක්‍රය සහ උපයෝගිතාව කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හා පරීක්ෂා කිරීමේ විසඳුමක් මත සියලු තොරතුරු තාක්ෂණ වත්කම් දැන් ඩිජිටල්කරණය කර ව්‍යාපෘතිය අවසන් කර ඇත.

තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විද්‍යුත් තැපැල් සේවා පුළුල් කිරීම, මාර්ගගතව වැඩ කිරීමට හැකි වන පරිදි කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය බලපත්‍ර වැඩිදියුණුකිරීම් සහතික කරමින් Microsoft Teams platform මගින් ව්‍යාවසාය අන්තර්ගත කළමනාකරණය සහ සහයෝගීතාව හඳුන්වා වර්ෂය ආරම්භයේ දී සිදු කරන ලද ප්‍රධාන වැඩසටහන් වේ. මෙම මූලපිරීමත් සමඟ, සියලුම අංශවල ගොනු කළමනාකරණය සහ කාර්ය මණ්ඩල සහයෝගීතාව සඳහා මාර්ගගත අවකාශයක් සහතික කරන ලදී. 2020 මාර්තු 20 වන දින රජය විසින් බලාත්මක කරන ලද කෝවිඩ් හේතුවෙන් රට අගුලු දැමූ කාලය තුළ සියළුම සේවාවන් මාර්ගගතව සිදු කළ පළමු රාජ්‍ය ආයතනය බවට පත්වීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට මෙම වැඩසටහන උපකාරී විය. විසඳුම යන්නෙන් අදහස් කළේ අවශ්‍ය කාර්ය මණ්ඩලයට නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමයට පහසුවෙන් මාරුවිය හැකිවීම සහ සියලුම අන්තර් කාර්ය මණ්ඩලයට ඒකාබද්ධව මාර්ගගතව වැඩ කිරීමට විසඳුම යන්නෙන් අදහස් කෙරේ.

ඩිජිටල් වේදිකා භාවිතය යනු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා නව තොරතුරු තාක්ෂණ පාලන රාමුවක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය වන අතර ආයතනික තොරතුරු තාක්ෂණ වත්කම් සහ BYOD Wi-Fi ප්‍රතිපත්තිය යොදාගැනීම විධිමත් කිරීමේදී එවැනි මූලික

පාලන පත්‍රිකා 2 ක් හඳුන්වා දෙන ලදී. පරිගණක යටිතල පහසුකම් වැඩි වශයෙන් භාවිතා කිරීම යන්නෙන් WIFI යටිතල පහසුකම් සහ කලාප පළල භාවිතය යනාදිය, දෝෂ නිරාකරණය සඳහා කාර්ය මණ්ඩලයේ සහාය සහ වෙබ් අඩවිවල විධිමත් යාවත් කාලීන කිරීම් සිදු කිරීම, ඩිජිටල් සේවා තොරතුරු පිළිබඳව සමාජ මාධ්‍ය භාවිතය සහ තොරතුරු තාක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් සිදු කර තිබෙන ජාල වැඩිදියුණු කිරීම් අදහස් කර ඇත.ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව් අවශ්‍ය තාක්ෂණික ධාරිතාවය ගොඩනැංවීම යටතේ O365, MS Teams, Planner, MS booking, MS SharePoint, යනාදී උපයෝගී භාවිතාවන් ආශ්‍රිත ඩිජිටල් භාවිතය සහ වැඩ පරිවර්තනය පිළිබඳ පුහුණු මාලාවක් පවත්වන ලදී.

තවද, විශේෂ ව්‍යාපෘතියක් වශයෙන්, මෙරටට නීතිවිරෝධී ආකාරයෙන් දුරකථන ආනයනය කිරීම පරීක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) කළමනාකරණ පද්ධතිය තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ තාක්ෂණික ප්‍රවීණයකුගේ ස්වේච්ඡා සහාය ඇතිව ආරම්භ කරන ලදී වර්තමානයේදී, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ දත්ත මධ්‍යස්ථානයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රථම cloud සර්වරය ක්‍රියාත්මක කිරීම මත මෙම විසඳුම් හඳුන්වාදෙනු ලැබේ. වත්කම් කළමනාකරණ පද්ධතිය තවත් ක්‍රියාත්මක කිරීමක් වූ අතර තෝරාගත් එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීම සඳහා විවිධ අංශ සඳහා MS SharePoint ක්‍රියාත්මක කිරීම සඳහා අංශ පුළුල්ව ස්වයංක්‍රීය ක්‍රියාවලියට සහාය විය. අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කිරීම සඳහා වර්ණාවලි කළමනාකරණ අංශය සහ කෙටි පණිවුඩ ද්වාරය සඳහා වූ SMS පදනම් කරගත් යෙදුම් සැකසුම් පද්ධතිය ද ක්‍රියාත්මක කළ අතර බාහිර පාර්ශවකරුවන්ට දැන් කෙටි පණිවුඩ පදනම් කරගත් ඇඟවීම් දැනුම් දීම් මගින් අභ්‍යන්තර කාර්යමණ්ඩලය සම්බන්ධ කර ගත හැකිවේ.

වර්තමානයේදී, ඉහළ ගොස් ඇති පාරිභෝගික විමසීම් කාලෝචිත ආකාරයකින් කළමනාකරණය කිරීම සඳහා සැලසුම් කරන ලද ඇමතුම් මධ්‍යස්ථාන විසඳුම ක්‍රියාත්මක කරමින් පවතින අතර ප්‍රශස්ත ආකාරයෙන් පාරිභෝගිකයන්ට සත්කාර දැක්වීම සහතික කිරීම පිණිස පොදු ස්විච්කරණ ශාඛා හුවමාරුව (PABX) සහිත වැඩි දියුණු කරන ලද ඒකාබද්ධ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක වේ. තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඩිජිටල් අත්සන පහසුකම හඳුන්වාදීමට කටයුතු කරන ලද අතර අනාගත කඩදාසි රහිත පරිසරයක් සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අවශ්‍ය විය.

මූල්‍ය කටයුතු: 2021 වාර්ෂික අයවැය සම්බන්ධ වාර්තා, 2021 මූල්‍ය බලතල පැවරීමේ ප්‍රකාශනය, 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ වාර්තා සම්පූර්ණ කරන ලදී. 2020 වාර්ෂික මූල්‍ය වාර්තා සකස් කෙරෙමින් පවතී. 2020/21 තක්සේරු වර්ෂය සඳහා ස්වයං තක්සේරු පදනමක් මත කාර්තුමය ආදායම් බද්ද ඍණ විය. ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලට කරන ලද සියලුම ගෙවීම් සුදුසුකම් සහිත ගෙවීමක් ලෙස සැලකිය හැකි අතර ආදායම ගණනය කිරීමේදී අඩු කළ හැකිය. 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි එවැනි සංස්ථාවක ආදායම් බදු ගණනය කිරීමේ දී එම ගෙවීම් අඩු කළ හැකිය. ඒ අනුව, 2019/2020 වසර තුළ ස්වයං තක්සේරුකරණ පදනම මත ගෙවීම් 3 ක් පමණක් සිදු කර ඇති අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අරමුදල සඳහා කරන ලද දායකත්වය එහි ආදායම් බදු වගකීමට වඩා වැඩි බැවින් එම පදනම මත, 2020/2021 වසර සඳහා ද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ස්වයං තක්සේරු පදනම මත කිසිම ආදායම් බදු ගෙවීමක් කර නොමැත.

මුදල් පනත සහ විදුලි සංදේශ පනත යටතේ සියලුම බදු (දුරකථන බදු, සංවර්ධන ගාස්තු, කෙටි පණිවුඩ සේවා බද්ද, කුලුනු බද්ද) නිවැරදිව හා කාලෝචිත ලෙස එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී. දේශීය ආදායම් පනතට ගැනෙන සියලුම අදාළ බදු (එකතු කළ අගය මත බදු - VAT, උපයන විට ගෙවීමේ බදු PAYE / අත්තිකාරම් පුද්ගල ආදායම් බදු -APIT, මුද්දර ගාස්තු - Stamp Duty) සහ සේවක ප්‍රතිලාභ (සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල) සඳහා දායකත්වය ලබා දෙන ලදී.

සේවාදායකයන්ට පහසුවෙන් සේවා සැපයීමේ අපේක්ෂාවෙන්, ආයතනයට කාඩ්පත් ගෙවීමේ පහසුකම් හඳුන්වා දී ඇති අතර දැනට ක්‍රියාත්මක වන POS පද්ධතිය හරහා මහජනතාවට කාඩ්පත් ගෙවීම් කළ හැකිය. කාර්යක්ෂම බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලියක් සහ ඉහළ පාරිභෝගික තෘප්තියක් ලබා දෙන ඍජු අරමුදල් මාරු කිරීම් / ඍජු තැන්පතු හරහා ගෙවීම් පියවීම් භාර ගැනීම ද මෙම වසරේ ක්‍රියාත්මක කර ඇත.සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය විසින් මූල්‍ය අංශය සමඟ තොරතුරු බෙදාගත් මොහොතේ සිට බදු ගෙවීමෙන් පසු කාලෝචිත ආකාරයකින් ගැනුම්කරු වෙත ඉන්වොයිසි යැවීම විධිමත් කිරීම (කෝවිඩ්-19 කාල පරිච්ඡේදය තුළ, සියලුම ගැනුම්කරු වෙත යැවෙන ඉන්වොයිසි ගනුදෙනුකරුවන්ට කිසිදු ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව ලබා ගැනීමට හැකිවන පරිදි විද්‍යුත් තැපෑලෙන් යවන ලදී.) 2019 වසරේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ භාණ්ඩ සමීක්ෂණ සම්පූර්ණ කර ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර විගණනය: වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර, ආදායම, බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම, ජාතික විගණන කාර්යාලයේ සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් සහ පිළිතුරු පිළිබඳ විගණන කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලැබීම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගෙවීම්, විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම, වැටුප් හා වේතන ගෙවීම, සේවකයින්ට ගෙවන ලද ණය සහ අත්තිකාරම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙ ආයෝජන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගිනි ආරක්ෂණ උපායමාර්ග, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2018 සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර ඇත.

කෝවිඩ්-19 හමුවේ ඉදිරි ගමන්මග

- නිවසේ සිට වැඩකිරීම / කාර්යාලයේ සිට වැඩකිරීමේ පරිසරය ස්ථාපනය කිරීම.
- කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා ඇඳිරි නීති බලපත්‍ර, දුම්රිය හා බස් ගමන් බලපත්‍ර සකස් කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල පරිශ්‍රයන්හි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාමාර්ග සංවිධානය කිරීම.
- මාර්ගගත සමීක්ෂණ මගින් කාර්ය මණ්ඩල තොරතුරු එක්රැස් කිරීම.
- කාර්යාල කාර්ය මණ්ඩලයේ ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- පාරිභෝගිකයා සඳහා කාර්යාලීය පොදු ස්විචිකරණ ශාඛා හුවමාරු (PABX) පද්ධතිය සහ ඇමතුම් මාර්ගගත කිරීමේ පහසුකම (call routing facility) වැඩිදියුණු කිරීම.
- සේවා කොන්දේසි පිළිබඳ රජයේ චක්‍රලේඛ / රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- අවශ්‍යතාවය පදනම් කරගෙන සනීපාරක්ෂක හා ආරක්ෂක සේවා කටයුතු සිදු කිරීම.
- කාර්යාල සේවා පවත්වාගෙන යාම පිණිස රාජකාරි වැඩමුර ක්‍රියාත්මක කිරීම.
- අංශ ප්‍රධානීන්, අමාත්‍යාංශය, ජාත්‍යන්තර ආයතනවල විදේශ සහයෝගිතා රැස්වීම් සහ වෙනත් රැස්වීම් මාර්ගගතව පැවැත්වීම.
- නිවසේ සිට වැඩ කිරීමේ (WFH) කාලය තුළ අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගැනීම පිණිස නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා කාර්යාල වෙබ් අඩවිය සකස් කිරීම.
- වෙබ් අඩවි, සමාජ හා විද්‍යුත් මාධ්‍ය භාවිතාවන් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කාර්යාලයේ පාරිභෝගික මාර්ගගත හමුවීම් සහ පිළිතුරු සැපයීම් / රැස්වීම් පද්ධතිය සකස් කිරීම.
- කාර්යාලයේ ජාතික QR කේත නිරීක්ෂණ පද්ධතියක් සකස් කිරීම.
- සේවකයින් සඳහා PCR පරීක්ෂණ පැවැත්වීම.
- කාර්යාල පරිශ්‍රය විෂබීජානුහරණය කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා මුහුණු ආවරණ සැපයීම.
- නිවසේ සිට වැඩ කිරීම (WFH) සම්බන්ධ සතිපතා වාර්තා සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
- වසංගත ප්‍රේරිත නිවසේ සිට වැඩ කිරීම / නිවසේ සිට අධ්‍යයනය කිරීම හේතුවෙන් නව භාවිත ප්‍රවණතා සාධක කරමින් මහජනතාවට විශේෂ අයකුම පැකේජ හඳුන්වා දීම.
- නිවසේ සිට වැඩ කිරීමේ දැනුම වැඩිදියුණු කිරීම / අධ්‍යයන කටයුතු සකස් කිරීම සහ කාර්ය මණ්ඩලය අතර බෙදා හැරීම.
- Microsoft Teams මෘදුකාංගය මඟින් අංශ මට්ටමින් කාර්ය මණ්ඩලය සමඟ කාර්යාල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අංශ ක්‍රියාකාරී සැලැස්ම / කාර්ය මණ්ඩල රැස්වීම් / ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- නිල ලිපිලේඛන ලබාගැනීම සහ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ඊමේල් නිර්මාණය කිරීම.
- නිවසේ සිට වැඩකරන කාල සීමාවේදී ආයතනයට ලැබෙන පොදු විමසුම් වලට කාර්ය මණ්ඩලය ඇමතුම් මාර්ගගත කිරීම.
- මහජන විමසීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ ක්‍රියාකරුවන් සමඟ ක්‍රියාමාර්ග ගැනීමට සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සඳහා 1999 කෙටි සංකේත අංකය වෙන් කිරීම.
- හදිසි අවස්ථාවන්හිදී මෙන්ම සාමාන්‍ය වැඩකටයුතු කරගෙන යන ආකාරයට නියාමන සහ ක්‍රියාකාරී ගැටලු නිරාකරණය කිරීමට සහභාගී වීම.
- විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම සඳහා අකුණු බිම්ගැන්වීමේ මාර්ගෝපදේශ සකස් කිරීම.
- අවශ්‍ය කටයුතු සඳහා ක්‍රියාකරුවන් / වෙනත් ආශ්‍රිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- විදුලි සංදේශ ක්‍රියාකරුවන් සඳහා උපකරණ නිෂ්කාශනය නිකුත් කිරීම.
- කෝවිඩ්-19 තොරතුරු සම්බන්ධයෙන් කෙටි සංකේත අංක ක්‍රියාත්මක කිරීම පිළිබඳව ස්ථාවර හා ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සම්බන්ධීකරණය කිරීම (117, 119, 135, 1390, 1999) .
- කොවිඩ්-19 තොරතුරු / දැනුවත්කිරීම් පිළිබඳව තෙහෝ‍ෂිකව සකස් කරන ලද රින්ග්-ඉන් ටෝන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්ථාවර හා ජංගම දුරකථන ක්‍රියාකරුවන් සමඟ කටයුතු කිරීම.

- කොවිඩ්-19 රෝගීන්ගේ රෝගී ස්ථානීය ඉතිහාසය සැපයීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ස්ථාවර / ජංගම දුරකථන ක්‍රියාකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- සියලුම පාසල් සහ විශ්ව විද්‍යාල සඳහා රාජ්‍ය විද්‍යුත් ඉගෙනුම් වේදිකා වෙත ප්‍රවේශය සඳහා නොමිලේ දත්ත ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- අයක්‍රම කමිටුවේ මූලපිරීම් මත කෝවිඩ්-19 වසංගතය තුළ පාරිභෝගිකයින්ගෙන් වෙනස් වන ඉල්ලීම් සපුරාලීම සඳහා වේගවත් නව පැකේජ හඳුන්වා දීමේ.
- විද්‍යුත්-බැංකුකරණ පහසුකම් හරහා දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් ගෙවනු ලබන බදු සහ අයබදු ලැබීම සම්බන්ධයෙන් කටයුතු කිරීම හා තහවුරු කිරීම.
- අදාළ අංශය සමඟ ආදායම් එකතු කිරීමට කටයුතු පිළියෙල කිරීම හා ආදායම් එකතු කිරීමේ ක්‍රියා පටිපාටිය හඳුන්වා දීම.
- සමාජ මාධ්‍ය සම්බන්ධ මහජන පැමිණිලි වලට සහභාගී වීම.
- නිල මාධ්‍ය තුළ COVID-19 ආශ්‍රිත සමාජ මාධ්‍ය පණිවුඩ බෙදා හැරීම.
- නිවසේ සිට වැඩ කිරීමේ සංස්කෘතිය හුරු කරවීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- අත්‍යවශ්‍ය ප්‍රවෘත්ති ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල ප්‍රකාශයට පත් කිරීම.
- අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීම.
- කොළඹ නෙළුම් කුලුනේ වැඩ වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අදාළ පාර්ශ්වයන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- පර්යේෂණ සම්බන්ධ ඉදිරිපත් කිරීම් පැවැත්වීම.
- නැතිවූ දුරකථන ලුහුබැඳීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය සමඟ "I need" මාර්ගගත පද්ධතිය දියත් කරන ලද අතර ඒ හරහා ලබාගත් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- "ගමට සන්නිවේදනය" යටතේ ජාල ආවරණය පරීක්ෂා කිරීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- කොවිඩ්-19 පසුබිම හේතුවෙන් රට වසා තිබූ කාලය තුළ බිල්පත් ගෙවීම නොසලකා ක්‍රියාකරුවන් විසින් පාරිභෝගික සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා යාන්ත්‍රණයක් ආරම්භ කිරීම.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- ගාස්තු පැකේජ විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් වලට පහසුකම් සලසමින් අයක්‍රම නිර්දේශ කිරීම.
- විද්‍යුත් බිල්පත් යාන්ත්‍රණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ අනුමත අයක්‍රම ප්‍රදාන යටතේ බිල්පත ගෙවීමට පාරිභෝගිකයන් දිරි ගැන්වීම.
- පාරිභෝගිකයින් සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම.
- සෘජු තැන්පතු සහ බැංකු අරමුදල් මාරු කිරීම් සහ අදාළ සියලු තොරතුරු විද්‍යුත් තැපෑලෙන් ලබා ගැනීම.
- පාරිභෝගික ඉල්ලීම් කළමනාකරණය කිරීම සඳහා උපකාරක කවුළුවක් පිහිටුවීම.

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ මුලපිරීම් - 2020

සංවර්ධනය පිළිබඳව පවත්නා ගෝලීය අවබෝධය වර්තමානයේ සමෘද්ධිය, ආර්ථික අවස්ථාව, පරිසරය ආරක්ෂා කිරීම සහ සමාජ යහපැවැත්ම වඩාත් ප්‍රවර්ධනය කරන තිරසාර සංවර්ධනය දෙසට ගමන් කරමින් සිටී. මෙම සන්දර්භය තුළ, විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කිරීමේ ප්‍රධාන සවිබලගන්නන් ලෙස සැලකේ.

මානව ප්‍රගතිය වේගවත් කිරීමට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සැපයීමේ විෂමතාවය අවම කිරීම සඳහා ගෝලීය අන්තර් සම්බන්ධතාවයට සම්බන්ධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාප්තිය විශාල අනුබලයක් සපයන බව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන අරමුණුවල ද පිළිගනී.

විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම සඳහා 2020 වසරේ අපගේ ක්‍රියාකාරකම්වල තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) පිළිබඳ සැලසුම් ඇතුළත් කළෙමු.

ක්‍රියාමාර්ග	සාක්ෂාත්කිරීම්	තිරසාර සංවර්ධන ඉලක්කවල පරමාර්ථ/අරමුණු
5G අත්හදා බැලීම් වැනි නව්‍ය මූලපිරීම් හඳුන්වාදීම, දැනට භාවිතා කරන දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, IPV6 තාක්ෂණය හඳුන්වාදීම සහ බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් හඬ සහ දත්ත / අධිවේගී අන්තර්ජාල සේවාවන්හි සේවා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා නීති රීති නිකුත් කිරීම.	• වසර ආරම්භයේදී 5G අත්හදා බැලීම් ආරම්භ කිරීම. • දැනට භාවිතා කරන දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය හඳුන්වාදීම සහ ඒ සඳහා මහජන උපදේශන ක්‍රියාවලිය ආරම්භ කිරීම • විදේශ කටයුතු අමාත්‍යාංශය සහ UNODC සමඟ එක්ව මුහුදු සංදාම කේබල් ප්‍රත්‍යාස්ථිතිය වැඩසටහන ආරම්භ කරන ලදී. • විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීමේ තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා RTTE රීති හඳුන්වා දීම. • ශ්‍රී ලංකාව සඳහා 100% 4G / ෆයිබර් සම්බන්ධතාවය සහතික කිරීම සඳහා ගමට සන්නිවේදනය වැඩසටහන දියත් කිරීම. • වැඩ සහ ජීවන රටාව නව සම්මතයන්ට අනුවර්තනය වීම සඳහා පාරිභෝගිකයින් සඳහා අවශ්‍ය නව පැකේජ හඳුන්වා දීම. • පවත්නා සේවා තත්ත්ව පරාමිතීන් විශ්ලේෂණය කිරීම. • කළ යුතු සංශෝධන පිළිබඳව දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ සාකච්ඡා කිරීම. • පවත්නා අධිවේගී අන්තර්ජාල සේවා පරාමිතීන් සංශෝධනය කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ සාකච්ඡා කිරීමට පෙර රටේ විවිධ ස්ථානවල අන්තර්ජාල වේගය මැනීම. • හඬ සේවා සහ අධිවේගී අන්තර්ජාල සේවා සඳහා අත්හදා බැලීමේ පදනම මත ක්‍රියාකරුවන් විසින් කෙටුම්පත් පරාමිතීන් ක්‍රියාත්මක කිරීම.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය. **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
විදුලි සංදේශ කර්මාන්තයේ ශීඝ්‍ර සංවර්ධනයන් සපුරාලීම පිණිස පවත්නා ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනයන කිරීම/ නව පනත සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය.	• අංශවල තොරතුරු ලබාගැනීමෙන් අනතුරුව පනතේ සංශෝධනයන් නීති කෙටුම්පත් කිරීමේ දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. • නීති කෙටුම්පත් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම. • පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය.

හඬ සහ දත්ත / අධිවේගී අන්තර්ජාල සේවා සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාදන ලද සේවා තත්ත්ව පරාමිතීන් දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පිළිපදින බව සහතික කිරීම.	• ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සේවා තත්ත්ව පරාමිතීන් පිළිපැදීම. • ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සේවා තත්ත්ව පරාමිතීන් පිළිපැදීම. • ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා- දුරකථන ක්‍රියාකරු සමාගම් තුනම පරාමිතීන් 16 මිනුම් ඉදිරිපත් කර ඇත. • ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා - ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් හතර විසින් පරාමිතීන් 14 මිනුම් ඉදිරිපත් කර ඇත.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය. **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
විවිධ විදුලි සංදේශ සේවා සැපයීම සඳහා පනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	• පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය හා කෙටි පණිවුඩ සේවා ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.. • ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මගින් ව්‍යාපාරය ලියාපදිංචි කර ගන්නා ලද වෙළඳුන්ගේ විස්තර ලබා ගැනීම සහ වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට වෙළෙඳුන්ට දැනුම්දීම.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය.
විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයකුම යෝජනා සකස් කිරීම.	• ප්‍රවර්ධන /උත්සව දීමනා, ප්‍රවර්ධන අයකුම හා ස්ථිර අයකුම යෝජනා ක්‍රියාත්මක කිරීම. • වැඩ කිරීමේ සහ ඉගෙනීමේ නව සම්මතයන් සඳහා අවශ්‍ය නව පැකේජ හඳුන්වාදීම.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය.
4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය 100% රටපුරා ව්‍යාප්ත කිරීම (Connect Sri Lanka) සපුරාලීම පිණිස "ගමට සන්නිවේදනය" ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාත්මක කිරීම.	• 2021 වසරේ රජයේ අයවැය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපෘතියක් වශයෙන් මෙම වැඩසටහන නම් කිරීම. • විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) බෙදාහැරීම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ. • රත්නපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. • දෙවන අදියරේ ව්‍යාපෘති වැඩසටහන වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරා ගැනීම සහ තාක්ෂණික විමර්ශන සාර්ථකව සිදු වෙමින් පවතී. • ප්‍රමුඛතා පදනම මත 4G ආවරණය සැපයීම පිණිස විදුලි සංදේශ පහසුකම් අඩු ග්‍රාමීය ප්‍රදේශවල විදුලි සංදේශ සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීම. • එම ප්‍රදේශවල පාසල් සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් සැපයීම හා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව පාසල්වල පරිගණක විද්‍යාගාර ඉදිකිරීමට වැඩපිළිවෙල යෙදීම. • දිස්ත්‍රික්ක අටක ආවරණය සැපයීම හා තාක්ෂණික විමර්ශන පැවැත්වීම පිළිබඳව	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය. **SDG 10 – අසමානතාවය අඩු කිරීම.** රට තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම. **SDG 11 – තිරසාර නගර සහ ප්‍රජාවන්.** නගර අංගසම්පූර්ණව, ආරක්ෂිතව, ප්‍රකෘතිමත්ව හා තිරසාර ආකාරයෙන් ඇතුළත් කරන්න, පවත්වා ගැනීම.

	සමීක්ෂණ සම්පූර්ණ කිරීම සහ 4G ආවරණය අවශ්‍ය ප්‍රදේශ හඳුනා ගැනීම. • ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 17ක ආවරණය සැපයීම පිළිබඳ සමීක්ෂණ සිදු කරමින් පවතී. • ආවරණය වැඩිදියුණු කිරීම පිණිස තාක්ෂණික ක්ෂේත්‍ර වාරිකා සිදු කිරීම.	
දැනුවත් කිරීම මගින් නියාමන පරිසරයක් නිසැක කිරීම.	• පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • අධ්‍යාපනය සහ ඩිජිටල් බෙදීම අඩු කිරීම සහතික කිරීම සඳහා නිල විද්‍යුත් ඉගෙනුම් වේදිකා සඳහා සියලුම රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පාසල් වෙත නොමිලේ ප්‍රවේශ වීම ලබා දීම.	**SDG 7 – දැරිය හැකි සහ සම්පූර්ණ බලය.** සැමට දැරිය හැකි, විශ්වාසනීය,තිරසාර හා නවීන බලය සඳහා ප්‍රවේශය නිසැක කිරීම.. **SDG 10 – අසමානතාවය අඩු කිරීම.** රට තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම.
විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘති වැඩසටහන (සුරක්ෂිත සන්නිවේදනයක්) ක්‍රියාත්මක කිරීම.	• මහනුවර, මොනරාගල, බදුල්ල, පුත්තලම,කොළඹ, ගම්පහ, අනුරාධපුර, කෑගල්ල, නුවරඑළිය, ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	**SDG 3 – යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම.** සෞඛ්‍ය සම්පන්න ජීවිත සහතික කිරීම සහ සෑම වයස් කාණ්ඩයකම සැමගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම. **SDG 11 – තිරසාර නගර සහ ප්‍රජාවන්.** නගර අංගසම්පූර්ණව, ආරක්ෂිතව, ප්‍රකෘතිමත්ව හා තිරසාර ආකාරයෙන් ඇතුළත් කරන්න, පවත්වා ගැනීම. **SDG 12 – වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය.** තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.
පාරිභෝගිකයන් හා දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා සාධාරණ හා යුක්තිසහගත විසඳුම් සහතික කිරීම.	• කරදරකාරී ඇමතුම්, කෙටි පණිවුඩ, සමාජ මාධ්‍ය, ස්ථාවර දුරකථන, කුලුනු දෝෂ සහ සිම්, PEO TV සහ අන්තර්ජාලය, බිල්පත්, සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) පිළිබඳ පාරිභෝගික පැමිණිලිවල ලියකියවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම. • අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධ ඉල්ලීම් මෙහෙයවීම සහ නැතිවූ ජංගම දුරකථන සොයා ගැනීමට සමගාමීව හඳුන්වා දුන් නව පද්ධතිය භාවිතා කිරීම. • වීසා / මාස්ටර් කාඩ්පත් ගෙවීම් ක්‍රමය හඳුන්වාදීම.	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය. **SDG 10 – අසමානතාවය අඩු කිරීම.** රට තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම. **SDG 16 – සාමකාමී, යුක්තිසහගත සහ ශක්තිමත් ආයතන.** සාධාරණ, සාමකාමී හා අංගසම්පූර්ණ සමාජ ප්‍රවර්ධනය කිරීම.
විදුලි සංදේශ පරිසරය ආශ්‍රිතව පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම.	• බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමඟ රැස්වීම් පැවැත්වීම. • පවතින ගැටලු නිරාකරණය කිරීමට පියවර ගැනීම.	**SDG 10 – අසමානතාවය අඩු කිරීම.** රට තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම.
දැනට පවත්නා අංකන සැලැස්ම සමාලෝචනය කිරීම හා අවශ්‍ය	• අංකන සැලැස්ම සමාලෝචනය කිරීම. • අන්තර්ජාලයේ දෑ (IOT) , M2M සහ අභ්‍යන්තර සන්නිවේදනයන් සඳහා අංක 3 කින් යුත්	**SDG 8 – ප්‍රශස්ත සේවය හා ආර්ථික වර්ධනය.** තිරසාර ආර්ථික වර්ධනය හා අන්තර්ගතය වැඩිදියුණු

සංශෝධන යෝජනා කිරීම.	සංඛ්‍යාංක සංකේත අංක වලින් යුතු අංකන සැලැස්මක් හඳුනා ගැනීම.	කිරීම, සැමට සේවා නියුක්තිය සහ ප්‍රශස්ත සේවය. **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
යටිතල පහසුකම් ව්‍යාප්තිය හා පහසුකම් සැපයීම	• විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය කිරීම. • විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා විදුලි සංදේශ කුලුන ආශ්‍රිත මහජන පැමිණිලි මෙහෙයවීම. • ඇන්ටනා අනුමත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රායෝගික දුෂ්කරතා සාකච්ඡාවට ගැනෙන හා මහජන සෞඛ්‍ය, ආරක්ෂාව සහ වෙනත් අවශ්‍යතා කෙරෙහි නිසි අවධානයක් යොමු කරන අතරම විදුලි සංදේශ කර්මාන්තයේ විශාල සංවර්ධනයක් ඇති කිරීමට පහසුකම් සපයන ඇන්ටෙනා ව්‍යුහයන් පිළිබඳ මාර්ගෝපදේශ සංශෝධනය කර අවසන් කිරීම. • ඉතා උස ගොඩනැගිලිවල සන්නිවේදන සේවා සැපයීම පිණිස තාක්ෂණික ප්‍රමිති මාර්ගෝපදේශ සකස් කිරීම.	**SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
කේබල් රූපවාහිනී සේවා සැපයුම්කරුවන්ගේ මෙහෙයුම් පිරික්සීම	• කේබල් රූපවාහිනී ජාල පද්ධතිවල තොරතුරු එකතු කිරීම හා යාවත්කාලීන කිරීම.	**SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
2020 වසර සඳහා පුහුණු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ආයතන සම්බන්ධීකරණය කිරීම.	• උසස් පුහුණු කමිටුවේ (ATC) නිර්දේශය සහ පුහුණු තේරීම් කමිටුවේ (TSC) සහ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු විදේශීය පුහුණු / අධ්‍යයන චාරිකා සඳහා සහභාගී වීමට නිලධාරීන් තෝරා ගැනීම. • පුහුණු වැඩසටහන් / අධ්‍යයන චාරිකා වලින් පසුව දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • ජාත්‍යන්තර සංවිධාන හා විදේශීය විශේෂඥයින්ගේ සහයෝගයෙන් පවත්වන ලද සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සඳහා බලපත්‍ර ලාභී දුරකථන ක්‍රියාකරු සමාගම්වලට ආරාධනා කිරීම.	**SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම. **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) සහාය ඇතිව කුලුනු තාක්ෂණ පුහුණු වැඩසටහන හඳුන්වා දීම.	• තෘතීය හා වාත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) , ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහයෝගීත්වය ඇතිව විදුලි සංදේශ කුලුනු තාක්ෂණ වැඩසටහන ආරම්භ කරන ලදී.	**SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම.

	• ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සහ විෂයමාලා සංවර්ධනයට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.	 **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.
ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දින තේමා වැඩසටහන 2020 ක්‍රියාත්මක කිරීම.	• ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2020 තේමාව "තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) "සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් : 2030 සමඟ සම්බන්ධ කිරීම" පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම.	 **SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම.
තොරතුරු සන්නිවේදන තාක්ෂණ ධාරිතාවය ගොඩනැංවීම (තොරතුරු තාක්ෂණ හා වෙනත් කාර්ය මණ්ඩලය)	• නිවසේ සිට වැඩකිරීමේ පරිසරය යටතේ MS Teams යටතේ කාර්ය මණ්ඩලය සඳහා මාර්ගගත තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම. • නිවසේ සිට වැඩකිරීමේ රාජකාරි යාවත්කාලීන කිරීම හා නිරීක්ෂණය කිරීම සඳහා Microsoft - List පුහුණුව සම්පූර්ණ කිරීම.	 **SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම.
ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් හඳුන්වාදීම. වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරියේ සහාය ඇතිව දේශීය තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන සංවිධානය කිරීම.	• විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල පාසල්වල සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. පසුගිය වසරේ පුහුණුවලත් ස්වේච්ඡාදායකයන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයන් වශයෙන් සේවය කිරීම පිණිස ගම්පහ, අනුරාධපුරය, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් වලට අනුයුක්ත කරන ලදී. මෙම තෝරා ගත් පාසල්වල සිසුන් මෙනම ගුරුවරුන් මෙම වැඩසටහනේ ප්‍රතිලාභ ලබා ගන්නා ලදී.	 **SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම.  **SDG 9 – කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්.** ප්‍රකෘතිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, තිරසාර කාර්මීකරණය වැඩිදියුණු කිරීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.  **SDG 10 – අසමානතාවය අඩු කිරීම.** රට තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම.
ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය/ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහායක වැඩසටහන.	• ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සංවිධානය කරන ලද මාර්ගගත/ අධ්‍යයන පුහුණු වැඩසටහන්, රැස්වීම් හා සම්මන්ත්‍රණ වලට සහභාගිවීම.	 **SDG 17 – එම ඉලක්ක සඳහා හවුල්කාරිත්වය.** තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය පුනර්ජීවනය කිරීම.  **SDG 4 – ගුණාත්මක අධ්‍යාපනය.** සැමට අන්තර්ගත හා ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම වැඩිදියුණු කිරීම.

විදුලි සංදේශ තොරතුරු ආශ්‍රිත සංඛ්‍යාලේඛන



වගුව 01: විදුලි සංදේශ අංශයේ සංඛ්‍යාන දළ විශ්ලේෂණය

පද්ධති බලපත්‍ර සංඛ්‍යාව	29
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්ව සංඛ්‍යාව	2,613,140
පදිංචිකරුවන් 100 දෙනෙකුට ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්ව	11.9
සෙලෙයුලර් ජංගම දුරකථන දායකත්ව සංඛ්‍යාව	28,739,277
පදිංචිකරුවන් 100 දෙනෙකුට සෙලෙයුලර් ජංගම දායකත්වය	131.1
ස්ථාවර පටුපරාස දායකත්ව	58
ස්ථාවර පුළුල් පරාස දායකත්ව	1,956,325
ජංගම පුළුල් පරාස දායකත්ව (3G, 4G)	15,567,665
පොදු දුරකථන කුටි සංඛ්‍යාව	461

*තාවකාලික දත්ත

සටහන - ශ්‍රී ලංකා ටෙලිකොම් (පී.එල්.සී) , ලංකා බෙල් හා ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම් සිය බලපත්‍රය මගින් පොදු දුරකථන කුටි හා දත්ත සේවා සැපයීමට සුදුසුකම් ලැබී ඇත.

2020 වසරේ මැද භාගයේදී ජනගහනය = මිලියන 21.919

ප්‍රස්ථාරය 01: පද්ධති බලපත්‍ර සංඛ්‍යාව



ප්‍රස්ථාරය 02: ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා, පටුපරාස හා ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වයන්



* තාවකාලික දත්ත

ප්‍රස්ථාරය 03: දුරකථන ව්‍යාප්තිය



* තාවකාලික දත්ත

ප්‍රස්ථාරය 04: ජංගම සහ ස්ථාවර ග්‍රාහක වර්ධනය



* තාවකාලික දත්ත

2011-2020 කාල පරිච්ඡේදය සඳහා ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන්නන් විසින් කරන ලද නව ආයෝජන වාර්ෂික පදනම මත පහත වගුවෙන් සහ ප්‍රස්ථාරයෙන් පෙන්වයි. [ආයෝජන වලට දේපල පිරියත, උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් එකතු කිරීම සහ කෙරෙමින් පවතින වැඩ ඇතුලත් වේ.]

ප්‍රස්ථාරය 05: විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන



	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020*
එකතුව	44,885	34,033	56,054	50,118	68,561	45,084	48,948	86,084	78,263	65,831	93,452	64,523
ජංගම	33,678	24,387	41,999	29,508	49,509	23,444	22,703	27,121	36,151	37,389	49,423	39,824
ස්ථාවර	11,207	9,646	14,055	20,610	19,052	21,640	26,245	58,963	42,112	28,442	44,029	24,699

*තාවකාලික දත්ත

සටහන: 2020 වර්ෂයේදී, ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන කාර්යයට එකතු කිරීම ආයෝජනයේ කොටසක් ලෙස නොසැලකේ.

ප්‍රස්ථාරය 06: ජංගම හා ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම



*තාවකාලික දත්ත

ප්‍රස්ථාරය 07: විදුලි සංදේශ බදුවල වර්ධනය



*තාවකාලික දත්ත

ප්‍රස්ථාරය 08: සෙස්



*තාවකාලික දත්ත

විදුලි සංදේශ අංශයෙන් රැස් කර ගන්නා ආදායම රටේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රජයේ භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

ප්‍රස්ථාරය 09: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ



*තාවකාලික දත්ත

බලපත්‍ර කළමනාකරණ අංශය

සමාලෝචනය

ජාතික යහපැවැත්මට අත්‍යවශ්‍ය යැයි සැලකෙන විදුලි සංදේශ සේවාවන් සඳහා වන සියලු සාධාරණ ඉල්ලීම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ දේශීය හා ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා විශ්වසනීය හා කාර්යක්ෂම ලෙස සපයන බව ශ්‍රී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සහතික කළ යුතුය. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 17 වන වගන්තියේ විධිවිධාන අනුව බලපත්‍ර ලබා ඇති ක්‍රියාකරු විසින් විදුලි සංදේශ සේවා සැපයිය යුතු බව සහතික කෙරේ.

පනතේ උක්ත සඳහන් වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකුට වලංගු විදුලි සංදේශ බලපත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ පොදු විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කළ නොහැක. කොමිෂන් සභාවේ නිර්දේශයට හා මහජන අදහස් විමසීමට යටත්ව අමාත්‍යවරයා විසින් විදුලි සංදේශ පද්ධති බලපත්‍ර විධිමත් ලෙස ලබා දෙනු ලැබේ.

වර්තමානයේදී විදුලි සංදේශ යටිතල පහසුකම් සහ සේවාවන් ප්‍රකාරව බලපත්‍ර වර්ග පහත පරිදි පුළුල් ලෙස වර්ගීකරණය කළ හැකිය.

පහසුකම් පාදක කරගත් සේවා බලපත්‍ර

විදුලි සංදේශ සේවා සැපයීමේදී පොදු විදුලි සංදේශ ජාලය ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සංඛ්‍යාත වර්ණාවලිය සහ / හෝ ප්‍රවේශයේ අයිතිය සහ අංකනය වැනි හිඟ සම්පත් භාවිතා කරමින් ස්වකීය යටිතල පහසුකම් ස්ථාපනය කිරීමෙහිලා මෙම බලපත්‍ර කාණ්ඩයෙන් අවසර දී ඇත.

පහසුකම් පාදක කර නොගත් සේවා බලපත්‍ර

මහජනතාව සඳහා විදුලි සංදේශ සේවා සැපයීම පිණිස සිය යටිතල පහසුකම් ස්ථාපනය කිරීමට අවසර නොලබන ලද දුරකථන ක්‍රියාකරු සමාගම් මහජනතාව වෙත ස්වකීය විදුලි සංදේශ සේවා සැපයීම පිණිස පහසුකම් පාදක කරගත් ඕනෑම දුරකථන ක්‍රියාකරුවෙකුගෙන් විදුලි සංදේශ ජාල මූලිකාංග (Backbone, Backhaul and Access) බද්දට ගැනීම අවශ්‍ය කෙරේ.

බලපත්‍ර ප්‍රභේද

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විදුලි සංදේශ පනතේ 17 වන වගන්තියෙන් පහත සඳහන් සේවා ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වෙත බලපත්‍ර නිකුත් කර ඇත.

i. ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම්
ii. ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්
iii. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් (බාහිර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්)
iv. දත්ත සන්නිවේදන ක්‍රියාකරු සමාගම්
v. අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්
vi. කේබල් බෙදාහැරීමේ ජාල ක්‍රියාකරු සමාගම්
vii. සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන ක්‍රියාකරු සමාගම්
viii. දිගු දුර ගුවන් විදුලි ක්‍රියාකරු සමාගම්
ix. චන්ද්‍රිකා සේවා
x. Backhaul /Last mile යටිතල පහසුකම් සැපයුම්කරුවන්

තාක්ෂණික-ආන්ථික ප්‍රවේශයට අනුකූලව, අයදුම්කරුවන් ස්වකීය වාණිජ තීරණ මත පදනම්ව යෝජිත මෙහෙයුම් සඳහා වඩාත් කාර්යක්ෂම තාක්ෂණය යොදා ගැනීම සඳහා නිරන්තරයෙන් වර්ධනය වන වෙළඳපල ගතිකතාවයන් කෙරෙහි නිරන්තරයෙන් බලපෑම් කරයි. කිසියම් කරුණක් පැන නගින්නේ නම්, එය බලපත්‍ර කොන්දේසි සහ මහජන යහපත සම්බන්ධයෙන් පනවනු ලබන සීමාවන්ට යටත් වේ.

බලපත්‍රලාභියාට බලපත්‍රය ලබා දුන් පසුව සිදු කරන ඔවුන්ගේ ජාල සහ සේවා පිරිනැමීම්වල සිදුකරන වෙනස්කම් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කෙරේ.

හිඟ සම්පත් පැවරීම සඳහා අවශ්‍ය කරන වර්ණාවලිය, අංකනය, ප්‍රවේශ අයිතිය යනාදිය බලපත්‍රයේ කොටසක් ලෙස නොසැලකෙන අතර පවතින පරිදි ඒවා පවරනු ලැබේ.

අනෙකුත් බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරුවන්, ව්‍යාපාරික ගනුදෙනුකරුවන් සහ සාමාන්‍ය ජනතාව ඇතුළුව තෙවන පාර්ශවයන්ට සේවා සැපයීමට පහසුකම් පදනම් කරගත් බලපත්‍රලාභීන්ට අවසර ලැබේ.

සේවා පහසුකම් පාදක බලපත්‍ර වසර දහයක් සහ අවුරුදු පහක කාලයක් සඳහා නිකුත් කරනු ලැබේ, නමුත් පහසුකම් පාදක කර නොගත් බලපත්‍රයේ වලංගුභාවය වසර පහකට සීමා වේ. එහි මුල් කාල සීමාව ඉක්මවා නොයන කාලයක් සඳහා කාර්ය සාධනය මත පදනම්ව සමාන හෝ / සහ වෙනස් කොන්දේසි යටතේ බලපත්‍ර අලුත් කළ හැකිය.

විදුලි සංදේශ බලපත්‍ර ගාස්තු තීරණය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි. ලබාදෙන සේවාවේ වර්ගය අනුව වරින් වර විදුලි සංදේශ

බලපත්‍ර ගාස්තු වෙනස් වේ. ඊට අමතරව බලපත්‍රලාභීන් විසින් සෙස් සහ විදුලි සංදේශ බදු ගෙවිය යුතුය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බලපත්‍රකරණ පටිපාටිය

බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය පනතේ 17 වන වගන්තියේ විධිවිධාන වලට හා 2006.03.10 දිනැති අංක. 1435/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද බලපත්‍ර මාර්ගෝපදේශ වලට අනුකූල වේ.

පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අභිලාෂය දක්වා ඇති පාර්ශවයන් බලපත්‍රකරණ මාර්ගෝපදේශ හා පටිපාටිවල සඳහන් කරන ලද අවශ්‍යතා වලට අනුකූලව සිය යෝජනා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව කලින් තීරණය නොකරයි. කෙසේ වෙතත්, මහජන යහපත සහ වෙළඳපල තත්ත්වයන් හේතුවෙන්, ස්වාභාවික හා / හෝ සීමිත සම්පත් සීමාවන් හෝ අවශ්‍ය වෙනත් හේතූන් මත පදනම්ව ඇතැම් සේවාවන් යටතේ ඇති බලපත්‍ර සංඛ්‍යාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සීමා කළ හැකිය.
2. නියම කරන ලද නිර්ණායකයන්ට අනුව අයදුම්පත සාර්ථකව ඇගයීමට ලක් කරන්නේ නම්, කෙටුම්පත් බලපත්‍රය සඳහා කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙනු ඇත.
3. කෙටුම්පත් බලපත්‍රය මගින් මහජනතාවට සැල කිරීම් / විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු ඇත.
4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලැබී ඇති සැල කිරීම් / විරෝධතා විමර්ශනය කර කොමිෂන් සභාවේ පිළිගැනීම මත අවශ්‍ය සංශෝධන සිදු කරනු ඇත.
5. කොමිෂන් සභාවේ නිර්දේශය ඇතිව විදුලි සංදේශ භාර අමාත්‍යවරයා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

බලපත්‍රකරණ රාමුව

වෙළඳපල වර්ධනය සඳහා හිතකර පරිසරයක් සැපයීම සහ සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම පිණිස, කොමිෂන් සභාව විසින් ඊළඟ පරම්පරාවේ ජාල සහ තාක්ෂණයේ කේන්ද්‍රීයතාව අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පහත සඳහන් අංග සලකා බලනු ලැබේ.

- තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම
- සේවා තත්ත්ව
- නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම
- කාර්යක්ෂමතාවය හා කේන්ද්‍රීයත්වය
- විවෘත ප්‍රවේශය

බලපත්‍ර අවලංගු කිරීම

- සීමාසහිත එටිසලාට් ලංකා (පුද්ගලික.) සමාගම -ජංගම ක්‍රියාකරු බලපත්‍රය
- සීමාසහිත ඩිෂ් TV ලංකා (පුද්ගලික) සමාගම(හිමිකම පැවරීමේ ඉල්ලීම මේ වන විට සලකා බලමින් පවතී.)

බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය

- සීමාසහිත සිටි කේබල් ලින්ක්ස් (පුද්ගලික) සමාගම - කේබල් බෙදාහැරීමේ ජාල ක්‍රියාකරු බලපත්‍රය
- සීමාසහිත ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම - අන්තර්ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය
- ටාටා කම්‍යුනිකේෂන්ස් ලංකා (පුද්ගලික) සමාගම - අන්තර්ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය

2020 වර්ෂයේ කාර්ය සාධනය

වර්තමාන බලපත්‍ර රාමුව හඳුන්වාදීමේ සිට මේ දක්වා එහි විශේෂ වෙනස්කම් සිදු කර නොමැති අතර බලපත්‍ර රාමුව වෙනස් කිරීම සේවාවල සීමාවන් සහිතව යටිතල පහසුකම් වර්ගය මත පදනම් වේ. කෙසේ වෙතත්, තාක්ෂණය කේන්ද්‍රගත කිරීම වැඩි දියුණු කිරීමත් සමඟ තනි යටිතල පහසුකමක් සහිතව පුළුල් සංඛ්‍යාත වර්ණාවලි සේවාවන් ලබා ගත හැකිය. සේවා සීමා කිරීම සංවර්ධනය වෙමින් පවතින වෙළඳපල ස්ථාවරත්වයට බාධා පමුණුවනු ඇත. එබැවින්, ඉල්ලා සිටින සේවා සැපයීම පහසු කිරීම සඳහා නව බලපත්‍ර රාමුවක් හඳුන්වාදීමේ වැදගත්කම මතු වී තිබේ. පවත්නා බලපත්‍ර රාමුව සමාලෝචනය කරමින් පවතින අතර තාක්ෂණයේ වැඩිදියුණුවීම සමඟ විදුලි සංදේශ කර්මාන්තයට ඇති අනපේක්ෂිත නියාමන බාධක ඉවත් කරමින් ඒකාබද්ධ බලපත්‍ර යාන්ත්‍රණයක් හඳුන්වාදීම සඳහා නව බලපත්‍ර රාමුවක් හඳුන්වාදෙමින් පවතී. මෙම කටයුතු සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් සහාය ලබා දෙනු ඇත.

ඒ හා සමානව, ජාල සඳහා අනුමැතිය ලබා ගැනීම 17 වන වගන්තිය ප්‍රකාරව වැදගත් අවශ්‍යතාවයක් වන අතර එම අනුමැතිය ලබා ගැනීම අතීතයේ දී බලපත්‍රයට නිසි ලෙස අමුණා නොමැත. එබැවින්, ක්‍රියාකරු ජාලයේ / සේවාවේ සමීක්ෂණ මත පදනම්ව මෙය ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගෙන ඇත.

බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ වෙනස් කිරීම සඳහා වර්තමාන බලපත්‍ර මාර්ගෝපදේශ සකසා ඇත. කෙසේ වෙතත්, බලපත්‍ර අලුත් කිරීම සම්බන්ධයෙන් වෙන්වූ හා ඒ සඳහා සකස් කරන ලද පරිච්ඡේදයක් නොමැත. නව බලපත්‍රයක් ලබා ගැනීමේදී වර්තමානයේ ක්‍රියාත්මක වන බලපත්‍ර අළුත් කිරීමේ ක්‍රියාපටිපාටිය බලපත්‍රය අළුත් කිරීම ප්‍රමාද කිරීමට හේතු වේ. එබැවින් මෙම මාර්ගෝපදේශය සංශෝධනය කර බලපත්‍ර අළුත් කිරීම, අවලංගු කිරීම, අයිතිය පැවරීම යනාදිය සඳහා නව පරිච්ඡේද ඇතුළත් කෙරේ.

ජාල අංශය

සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික විදුලි සංදේශ ජාල ආශ්‍රිත ගැටළු නියාමනය කිරීමේ වගකීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශය සතුය.

පොදු විදුලි සංදේශ ජාල සඳහා ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම, සංඥා සංකේත අංක වෙන් කිරීම, ජංගම ජාල සංකේත අංක වෙන් කිරීම, ඉලක්ක හඳුනාගැනීම, යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ පහසුකම් සැලසීම, විදුලි සංදේශ උපකරණ වෙළඳාම් කරන්නන්ට බලපත්‍ර ලබා දීම, ජාල උපකරණ ආනයනය කිරීම සහ රේගු නිෂ්කාශනය නිකුත් කිරීම, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා නව නාක්ෂණය හඳුන්වාදීම සම්බන්ධ ගැන්වීම ජාල අංශයේ විෂය පථය යටතට ගැනේ.

කාර්යයන්

විදුලි සංදේශ පනත ප්‍රකාරව 2019 වසරේදී විවිධ ක්ෂේත්‍ර යටතේ ජාල අංශය විසින් සිදු කරන ලද කාර්යයන් පහත විස්තර කෙරේ.

අංකනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා අවශ්‍ය අංකනය සීමිත සම්පතක් වන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශන කර්මාන්තයේ ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කරයි. රටේ විදුලි සංදේශ ජාල සඳහා ලබාගත හැකි අංකන සම්පත් භාවිතා කිරීම සඳහා රාමුව සහ මාර්ගෝපදේශන අංකන සැලැස්මේ සඳහන් වේ. අංකනය සීමිත සම්පතක් වන බැවින්, නිසි සැලසුමකින් යුතුව කළමනාකරණය කර ඇත. එබැවින් අංකන සැලැස්ම කර්මාන්තයේ නව සංවර්ධනයන් සහ වත්මන් ප්‍රවනතාවයන් රදාපවත්නා කර්මාන්තයේ ඉල්ලුමට අනුකූලව කලින් කල වෙනස් වේ. මෙම කාර්යයන්ට අදාල ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

- ජාතික අංකන සම්පත කළමනාකරණය කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කිරීම.
- කෙටි සංකේත අංක ආශ්‍රිත කරුණු සම්බන්ධව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සම්බන්ධීකරණය කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා ජාත්‍යන්තර සහ දේශීය සංඥා ඒකක සංකේත අංක, ජාල සංකේත අංක වෙන් කිරීම.
- Object Identifiers (OIDs) වෙන් කිරීම.

දැනට භාවිතා කරන දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ දැනට භාවිතා කරන දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. මෙම ක්‍රමය සම්බන්ධ ජාත්‍යන්තර අත්දැකීම් අධ්‍යයනය කිරීමෙන් මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නිරතවූවන්ගේ හා වෙනත් පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගෙන සුදුසු ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා ජාල අංශයේ ප්‍රධානත්වය යටතේ අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇත. මූලික අධ්‍යයන කටයුතු සිදු කර ඇති අතර මහජන උපදේශන ලියකියවිලි කෙටුම්පත පිළියෙල කර ඇත.

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

ජාල අංශය මඟින් සිදු කරන තවත් ප්‍රධාන කාර්යයක් වන්නේ තඹ හෝ දෘශ්‍ය තන්තු ජාල, මුහුදු යට කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටනා කුලුනු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ පහසුකම් සැපයීමයි. විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් පවතින ජාල ව්‍යාප්ත කිරීම සඳහා අවසරය ලබා ගැනීම සහ ඉහත සඳහන් භෞතික යටිතල පහසුකම් භාවිතා කරමින් නව සේවා හඳුන්වාදීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරයි.ජාල අංශය අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාල අනුමැතීන් නිකුත් කිරීම මඟින් ඒවාට පහසුකම් සපයයි.

විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය පවත්වාගෙන යන අතරම, පාරිසරික බලපෑම්, සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු, ජාතික ආරක්ෂාව මෙන්ම මහජන යහපත ආශ්‍රිත කරුණු කෙරෙහිද අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන් මෙම අංශය විසින් සිදු කරන කාර්යයන්වල සාරාංශයක් පහත දැක්වේ.

- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත කරුණු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ (ASMS) මෘදුකාංග ඉදිකිරීමේ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම. 2020 වර්ෂය තුළ, සියළුම ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ ගුවන් විදුලි හා රූපවාහිනී වෙබ් අඩවි ලැයිස්තුව ඉදිරිපත් කර ඇත. 50% ක් පමණ වාර්තා සඳහා ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ (ASMS) ඇති දත්ත සමඟ ක්‍රියාකරුගේ තොරතුරු ප්‍රතිසන්ධානය සිදු කරනු ලැබේ.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකර සමාගම් වලට සිය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැපයීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශයේ සම්බන්ධීකරණය සහිතව, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහය ඇතිව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සඳහා "IPv4/IPv6 BGP Routing" දේශීය පුහුණු පාඨමාලාව පැවැත්වීම.
- විදුලි සංදේශ කුලුනු සම්බන්ධ මහජන පැමිණිලි මෙහෙයවීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාපෘතිය ආශ්‍රිතව පෞද්ගලික/ ආයතනික වශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම, නිර්දේශ කිරීම සහ ඒ සම්බන්ධ වාර්තා ඉදිරිපත් කිරීම.
- ඇන්ටනා ව්‍යුහ අනුමත කිරීමේ ක්‍රියාවලියේදී පැන නගින ප්‍රයෝගික දුෂ්කරතා පිළිබඳව අවධානය යොමු කෙරෙන ඇන්ටනා ව්‍යුහ මාර්ගෝපදේශන සංශෝධනය කිරීම අවසන් කිරීම සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සහ වෙනත් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ අඛණ්ඩ සංවර්ධනයට පහසුකම් සැලසීම.
- ඉහළ ගොඩනැගිලිවල සන්නිවේදන සේවා සැපයීම සඳහා තාක්ෂණික ප්‍රමිති මාර්ගෝපදේශන පිළියෙල කිරීම.

4G ව්‍යාප්ත කිරීමේදී පවතින තාක්ෂණික බාධාවන් සැලකිල්ලට ගනිමින්, පවත්නා ඇන්ටෙනා ව්‍යුහය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇන්ටෙනා ව්‍යුහ භූමියේ (ASF) සංකල්පය ලිහිල් කිරීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. මෙම වෙනස් කිරීමත් සමඟ, ළඟම ඇති ඇන්ටනා ව්‍යුහ භූමියේ කේන්ද්‍රයේ සිට අවම වශයෙන් කිලෝමීටර 2 ක් දුරින් පිහිටි ස්ථානවල මීටර් 30 ට වඩා උස කුලුනු ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. එබැවින් මුළු රටෙම 4G ආවරණය පුළුල් කිරීම සඳහා අවශ්‍ය කුලුනු ව්‍යාප්ත කිරීම වේගවත් කළ හැකිය.

කේබල් රූපවාහිනී සේවා වල නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන මෙහෙයුම් පාලනය කිරීම

විදුලි සංදේශ පනතේ 22 (අ) (1) වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව පත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය. ජාල අංශය අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ සහය ඇතිව දිවයින් පුරා නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන කේබල් රූපවාහිනී සේවා සැපයීම පාලනය කිරීමේ කටයුතුවල නිරත වී සිටියි.

කේබල් රූපවාහිනී සේවා සපයන්නන්ගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රයේ 22 වන පරිච්ඡේදය ප්‍රකාරව, අවශ්‍ය වන්නේ නම් තාක්ෂණික, වාණිජ හා වෙනත් තොරතුරු කොමිෂන් සභාව වෙත ලබා දීමට දුරකථන ක්‍රියාකරු සමාගම් බැඳී සිටී.

ජාල අංශය විසින් කේබල් රූපවාහිනී ජාල මෙහෙයුමට අදාළ ඉහත තොරතුරු කාර්තුමය පදනමක් මත රැස්කරන අතර පාලන මැදිරියේ භෞතික පරීක්ෂණ අහඹු ලෙස සිදු කිරීමට කටයුතු කරයි.

මාදිලි උපකරණ සහ උපකරණ නිෂ්කාශනය

විදුලි සංදේශ පනතේ 5(ක) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විදුලි සංදේශ පද්ධතියට සම්බන්ධ කල හැකි විදුලි සංදේශ උපකරණ වර්ග අනුමත කිරීමට බලය ඇත. විදුලි සංදේශ පනතේ 5 (ක) වගන්තියේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සම්බන්ධ කිරීම සඳහා පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රවල 2 වන උපලේඛනයේ දක්වා ඇති සියලුම දුරකථන ක්‍රියාකාර සමාගම් වලට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලය පවරා ඇත.

ඒ අනුව, බලපත්‍රලාභී ජාලයකට සම්බන්ධ කරනු ලබන දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව (PABXs - Private Automated Branch Exchange) , මොඩම්ස්, රැහැන් රහිත දුරකථන සහ වෙනත් පාරිභෝගික පරිශ්‍ර උපකරණ දුරකථන ක්‍රියාකරු සමාගම්, වෙළෙන්දන් හෝ පුද්ගලයන් විසින් දේශීයව නිෂ්පාදනය කරන්නේද නොඑසේනම් ආනයනය කරන්නේද යන්න පිළිබඳව මාදිලි අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව/ ආයෝජන මණ්ඩලය/ ආනයන පාලක වෙත අවසරදීමේ ලිපි නිකුත් කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි සාරාංශ කර ඇත.

- විදුලි සංදේශ පර්යන්ත සහ ජාල උපකරණ වල මාදිලිය අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- අනුමැති ලිපි මාර්ගයෙන් නිෂ්කාශනය කිරීමේ කටයුතු සඳහා රේගුව/ ආයෝජන මණ්ඩලය/ ආනයන පාලක වෙත නිර්දේශ කිරීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ සහ මාර්ගෝපදේශන වලට අනුකූලව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ ජාල උපකරණවල තාක්ෂණික ප්‍රමිතීන්වල අනුකූලතාවය සහතික කිරීම.
- නීති විරෝධී ආකාරයෙන් ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් අවසන් කිරීම වැලැක්වීම පිණිස හඬ, අන්තර්ජාල සම්මුති සහ භාවිතාවන් සඳහා විදුලි සංදේශ දුරකථන ක්‍රියාකාර සමාගම් වලට අනුමැතිය ලබා දීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල කරුණු ආශ්‍රිතව මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සම්බන්ධව පොලිස්/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ විමර්ශන වලට සහය වීම.

- රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය සංස්ථාවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සහභාගීත්වය සහ විදුලි සංදේශන ආශ්‍රිත තාක්ෂණික උපදේශ ලබා දීම.

වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ කිසියම් විදුලි සංදේශ උපකරණයක් හෝ ගුවන් විදුලි සන්නිවේදන උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය. වෙළෙඳ බලපත්‍රය යනු පූර්වෝක්ත ක්‍රියාකාරකම් ඉටුකිරීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකි. වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම ආශ්‍රිතව සිදු කරන ක්‍රියාකාරකම් පහත දැක්වේ;

- වෙළඳ බලපත්‍ර පිලිබඳ අයදුම්පත්‍ර ක්‍රියාවලිය සහ ඉල්ලුම්කරු විසින් අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බවට වගබලා ගැනීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම.
- වෙළඳ බලපත්‍ර පාලනය කළමනාකරණය කිරීම.
- වෙළඳ බලපත්‍ර ආශ්‍රිත කරුණු වලදී මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සම්බන්ධයෙන් පොලිසිය/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු විමර්ශන වලට සහායවීම.

නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම

ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නිත්‍යානුකූලව අලෙවි කිරීමේ ස්ථාන ස්ථාපනය කිරීම බලාත්මක කිරීම සහ දිරිගැන්වීම පිණිස ජාල අංශය ශ්‍රී ලංකා පොලිසියේ සහාය ඇතිව නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වයි.

විකුණුම්කරුගේ බලපත්‍රයේ කොන්දේසි වෙනස් කිරීම

සිම් සක්‍රීය උපාංග සඳහා වෙළඳපල වැඩිදියුණු කර ඇති අතර මහජනතාවගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සඳහා මෙම උපකරණ ආනයනය කිරීම සහ විකිණීම විධිමත් කළ යුතුය. එබැවින්, මෙම අවශ්‍යතාවයට සරිලන පරිදි විකුණුම්කරුගේ බලපත්‍රයේ පවතින කොන්දේසි වෙනස් කර ඇත.

2020 වසර සඳහා කාර්යසාධනය

වගුව 02: ජාල අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාල සංඛ්‍යා ලේඛන

විස්තරය	2019	2020
නිකුත් කරන ලද මුළු වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව	845	794
ඉදි කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව	7160	7312
කුලුනු සම්බන්ධන්යෙන් ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව	168	183
මෙහෙයවන ලද මුළු විමර්ශන සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිත)	80	26
කුලුනු සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව	0	0
පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ මුළු වැඩසටහන් සංඛ්‍යාව	03	04
දෙන ලද මුළු මාදිලි අනුමැති සංඛ්‍යාව	14	09
මුළු ආනයන නිෂ්කාශන නිකුත් කිරීම් සංඛ්‍යාව	3797	2400
මුළු පුද්ගලික නිෂ්කාශන කිරීම් සංඛ්‍යාව	15	06
නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව	78	18

අංකනය

කෙටි සංකේත අංක වෙන් කිරීම

මහජනතාවට හා පාරිභෝගිකයන්ට දුරකථන ඇමතුම් කඩිනමින් ලබා ගැනීම පිණිස ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කරනු ලැබේ. රාජ්‍ය ආයතන සඳහා එක් පරාසයක් හා පෞද්ගලික ආයතන සඳහා තවත් පරාසයක් වශයෙන් ආයතනයේ ස්වභාවය පදනම් කරගෙන කෙටි සංකේත අංක පරාස දෙකක් හඳුන්වා දී ඇත. රාජ්‍ය ආයතන සඳහා 19XX කෙටි සංකේත අංක පරාසය වෙන් කර ඇත. ඊට සමානව පෞද්ගලික අංශයේ ආයතන සඳහා 13XX පරාසයේ කෙටි සංකේත අංක හතරක් වෙන් කර දී ඇත.

රාජ්‍ය ආයතන

2020 වර්ෂයේදී, රාජ්‍ය ආයතන සඳහා 19XX පරාසයේ කෙටි සංකේත අංක හය (06) වෙන් කරන ලදී. ආයතනයේ නම සහ අදාල කෙටි සංකේත අංක පහත දැක්වේ.

වගුව 03: රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක

ආයතනය	කෙටි සංකේත අංකය
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	1971
සීමාසහිත ලංකා සතොස සමාගම	1998
සෞඛ්‍යය ප්‍රවර්ධන කාර්යාංශය	1999
සීමාසහිත ගුවන් හා සිවිල් ගුවන් සේවා (ශ්‍රී ලංකන්) සමාගම	1994
පොලිස් මූලස්ථානය	1997
පොලිස් මූලස්ථානය - අපරාධ විමර්ශන කොට්ඨාශය	1917
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1972
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	1976
මධ්‍යම පරිසර අධිකාරිය	1981
ජාතික තරුණ සේවා සභාව	1940
කෝවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය	1906

පෞද්ගලික අංශයේ ආයතන

2020 වර්ෂයේදී, පෞද්ගලික අංශයේ ආයතන සඳහා 13XX පරාසයේ කෙටි සංකේත අංක හයක් (06) වෙන් කරන ලදී. ආයතනයේ නම සහ අදාල කෙටි සංකේත අංක පහත වගුවේ දැක්වේ.

වගුව 04:පෞද්ගලික අංශයේ අයතන සඳහා වෙන් රකන ලද කෙටි සංකේත අංක

ආයතනය	කෙටි සංකේත අංකය
සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම	1311
යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී	1330
ඩයලොග් ආසියාටා පී. එල් . සී	1377 1390
සම්පත් බැංකුව පී.එල්.සී	1355
ලාෆ්ස් ලංකා පී.එල්.සී	1345
සීමාසහිත සිලෝන් බිස්කට් සමාගම	1310

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

විදුලි සංදේශ කුලුනු ඉදි කිරීම

ඉදි කරන ලද මුළු විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 7312 දක්වා වැඩි වී ඇත. මෙයට 2020 වසරේදී ඉදි කරන ලද නව කුලුනු 152 ද ඇතුලත් වේ.

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත පැමිණිලි මෙහෙයවීම

ජාල අංශය විසින් 2020 වසරේදී මහජනතාවගෙන් කුලුනු ඉදිකිරීමට එරෙහිව ලැබුණු පැමිණිලි 80 සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ඇත. 2020 වසරේ විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත නඩු විභාග නොමැත. කුලුනු ආශ්‍රිත මහජන පැමිණිලි 183 ක් 2020 වසරේදී ලැබිණි.

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

2020 වසරේදී, ජාල අංශය මෙම ක්ෂේත්‍රයේ දැනුමැති වෘත්තිකයන්ගේ සහාය ඇතුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් (04) පවත්වා ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණ වුයේ විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු ගැසීම වැනි ඇන්ටනා කුලුනු ආශ්‍රිත කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

වෙළෙඳ බලපත්‍ර ලබාදීම

2020 වසරේදී විවිධ වර්ග වලට අයත් විදුලි සංදේශ උපකරණ වෙළඳුන් සඳහා වෙළඳ බලපත්‍ර 794 ක් නිකුත් කරන ලදී.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය කිරීම

ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා නිෂ්කාශන ලිපි සහ මාදිලි අනුමැතිය නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහිලා අංශයට පැවරී ඇති නියාමන කර්තව්‍යයන් ජාල අංශය විසින් අඛණ්ඩව සිදු කර ඇත.

වගුව 05: නිකුත් කරන ලද උපකරණ නිෂ්කාශන හා මාදිලි අනුමැති සංඛ්‍යාව

විස්තරය	2020 දී නිකුත් කරන ලද ලිපි සංඛ්‍යාව
උපකරණ නිෂ්කාශනය	2400
මාදිලි අනුමැතීන්	09

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය

සමාලෝචනය

ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය යනු ස්වාභාවික හා සීමිත සම්පතක් වන අතර එය සමාජීය ජීවන තත්ත්වය සහ ආර්ථිකයේ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කිරීමෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ උපරිම කර ගැනීමට නිසියාකාරව කළමනාකරණය කළ යුතුය. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිතව පැවරුණු සියළුම වගකීම් ඉටු කිරීමටත්, සීමිත ජාතික සම්පතක් වශයෙන් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව කළමණාකරනය කිරීමෙන් බලතල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංඛ්‍යාත කළමණාකරන අංශයට පවරා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සහ භූස්ථානගත වන්දිකා කක්ෂයට අදාළ කරුණු කළමණාකරනය කිරීම සහ පාලනය කිරීමටත්, අවශ්‍ය අවශ්‍යතාවල එකී සියළුම සංඛ්‍යාත භාවිතය තහනම් කිරීම හෝ එහි භාවිතය අත්හිටුවීමට හෝ ආපසු ගැනීමට බලය පැවරී ඇති ශ්‍රී ලංකාවේ එකම නීත්‍යානුකූල බලධරයා වේ.

එමෙන්ම පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සන්නිවේදන සේවා පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන් විදුලි සන්නිවේදන ස්ථාපනය කිරීම් මගින් නිපදවෙන විද්‍යුත් චුම්භක අවහිරතා අවම කිරීම පිණිස රීතිවල අනුකූලතාවය බලාත්මක කිරීමේ බලධාරියා වේ.

කාර්යයන්

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගුවන් විදුලි රීති (5 වගන්තිය) සහ ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව ගුවන් විදුලි සංඛ්‍යාත පරාස වෙන් කිරීම
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම
- ගුවන් විදුලි සංඛ්‍යාත, පිහිටීම,සම්ප්‍රේෂණ බලය, ඇමතුම් සංඥා යනාදිය සම්බන්ධයෙන් ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය (Master Frequency Register -MFR) පවත්වාගෙනයාම
- බලපත්‍රයේ 22 වන වගන්තිය ප්‍රකාරව සංඛ්‍යාත පැවරීම
- නීති විරෝධී ලෙස භාවිතා කරන, භාවිතයේ නොමැති සහ ඌන භාවිතය සහිත ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය අනාවරණය කර ගැනීම සඳහා ගුවන් විදුලි සංඛ්‍යායාත වර්ණාවලිය පිරික්සීම
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සහ රටට අයත් වන්දිකා කක්ෂ භාවිතා කිරීම සඳහා අවශ්‍ය රීති, තාක්ෂණික ප්‍රමිති, ස්ථාපනය කිරීම
- ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා තාක්ෂණික ප්‍රමිති නියම කිරීම
- රටේ සමාජ ආර්ථික ඉලක්ක සඳහා අදාල වැදගත්කම මත විවිධ සේවා ප්‍රමාණවත් පරිදි සැපයීම පිණිස ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම
- බලපත්‍රයේ නියම කරන ලද තාක්ෂණික ප්‍රමිති සහ පරාමිතින්ට අනුකූලව සිය මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම පිණිස ගුවන් විදුලි සන්නිවේදන මධ්‍යස්ථානවල බලපත්‍ර අනුකූලතා විමර්ශන පැවැත්වීම
- නව තාක්ෂණයන් සහ සේවා සම්පාදනය කිරීම පිණිස නව සංඛ්‍යාත වර්ණාවලි අවකාශ නිදහස් කර ගැනීම සඳහා නිසි ගුවන් විදුලි සන්නිවේදන සේවා ක්‍රමවත්ව පවත්වාගෙන යා හැකි පරිදි විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නැවත සකස් කිරීම
- ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතා කිරීම සඳහා කලාපීය සහ ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීත්වය පවත්වාගෙන යාම
- අවහිරතාවයන්ගෙන් තොරව අවසරලත් විමෝචන භාවිතා කිරීම, සහ අනුකූලතාවය පිරික්සීම, අවහිරතාවයන් ඇතිවන ආකාරය අනාවරණය කර ගැනීම මෙන්ම ඒවා නිරාකරණය කිරීම
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු රැස් කිරීම
- ආධුනික ගුවන් විදුලි සහ ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්ෂණ පද්ධතිය (Global Maritime Distress Safety System - GMDSS) පිළිබඳ විභාග පැවැත්වීම
- ගුවන් විදුලි පර්යන්ත උපකරණ (Radio Terminal Equipment - RTE) සඳහා මාදිලි අනුමැතිය ලබා දීම.

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සේවා වර්ගයට අනුකූලව විවිධ පරාසයන්ට වෙන් කරනු ලැබේ. ගුවන් විදුලි තරංග, උපකරණයේ තාක්ෂණික පරාමිතීන් සහ භාවිතයන් වල ලක්ෂණ පදනම් කරගෙන සේවාවේ ස්වභාවය එකකින් අනෙකට වෙනස් වේ. එබැවින් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සිදු කරන සේවා වර්ග කීපයකට බෙදා වෙන් කරනු ලැබේ.

විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතා කරන කිසියම් තැනැත්තෙකු සතුව කොමිෂන් සභාව විසින් නිකුත් කරන වලංගු බලපත්‍රයක් තිබිය යුතුය. බලපත්‍රය,

වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් මිස, එම කරුණු තීරණය කිරීම පිණිස සාදන ලද රීති වල සඳහන් පරිදි ගාස්තුවක් ගෙවීමෙන් නිකුත් කරනු ලැබේ. බලපත්‍රයේ කොන්දේසි පැහැදිලිව සඳහන්වේ. බලපත්‍රයේ කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් වේ. මෙම කොන්දේසි කඩ කරනු ලැබූ අවස්ථාවලදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට උපකරණ මුද්‍රාතැබීම හෝ බලපත්‍රය අවලංගු කිරීමට බලතල ඇත.

තැනැත්තෙකු හෝ සමාගමක් විසින් ආනයන නිෂ්කාශණය සඳහා ඉල්ලා සිටින විට එය නිකුත් කිරීමට පෙර, උපකරණය ක්‍රියා කරවීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ගුවන් විදුලි සංඛ්‍යාතයන් තිබෙන බව සහ උපකරණය අවශ්‍යය ප්‍රමිතිවලට අනුකූල බව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සහතික කරනු ලැබේ.මෙම ක්‍රියා මාර්ගය බලපත්‍රලාභී සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන්ට පවතින ගුවන් විදුලි අවහිරතා අවම කරයි.

කෙසේ වුවද,පරිහරණය කරන්නන් සිය සම්ප්‍රේෂණ වලට බලපාන අවහිරතාවයන්ට ලක්වීමේදී සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරණ අංශයට පැමිණිලි කරයි. එවිට එම අවහිරතාවය ඇතිවීමට හේතුවන ප්‍රභවය හඳුනාගෙන අවශ්‍ය නිසි ක්‍රියා මාර්ග ගනු ලැබේ.

2020 වසරේ කාර්ය සාධනය

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ කාර්යයන් ප්‍රතිව්‍යුහගත කිරීම

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය එහි ක්‍රියාකාරකම්වල නිසි ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රතිව්‍යුහගතකරණය කර ඇත. ඊට අමතරව, පාරිභෝගික ඉල්ලීම් හැසිරවීම සඳහා උපකාරක කවුළුවක් සහ මාර්ගගත පාරිභෝගික කළමනාකරණ පද්ධතියක් ද පිහිටුවා ඇත. තවද, පාර්ශවකරුවන් සමඟ විද්‍යුත් මාර්ගයෙන් සන්නිවේදන කටයුතු සිදු කිරීම පිණිස වර්ණාවලි කළමනාකරණ ක්‍රියාකාරකම්වල අර්ධ ස්වයංක්‍රියකරණය ආරම්භ කර ඇත.

සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු සංශෝධනය කිරීම ඇතුළුව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රෙගුලාසි හඳුන්වා දීම

සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු වලින් නිදහස් කර ඇති සියලුම පරිශීලකයින්ට බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. (ඇතැම් බලපත්‍ර සඳහා සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර ගාස්තු සංශෝධනය කර ඇති අතර එය කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත) . වර්තමානයේ ක්‍රියාත්මක වන සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු සමහරක් වසර 20 කට වැඩි කාලයක් තිස්සේ සංශෝධනය කර නොමැත. යෝජිත සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු සංශෝධනය කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. නීතිමය අනුමැතිය ලබා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද ලේඛනයේ කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) නහවුරු කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කර වෙළඳපොලේ අළෙවි කරනු ලබන දුරකථන සොයා ගැනීමට මහජනතාවට හැකි වන පරිදි ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය (IMEI) නහවුරු කිරීමේ පද්ධතිය භාවිතා කරනු ලැබේ. මෙම පද්ධතියේ කාර්යසාධනය අඩු වී ඇති අතර, සියලුම ගුවන්විදුලි සන්නිවේදන උපකරණ ඇතුලත් කර පද්ධතිය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. පිරිවිතර හා සැලසුම් අවශ්‍යතා සංකල්ප පත්‍රිකාව පරිපාලන අංශයට යවන ලදි. රටේ පැවති විවිධ පරිපාලනමය ගැටලු සහ කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීම ප්‍රමාද විය. එබැවින්, ප්‍රගති සමාලෝචනයේදී තුන්වන කාර්තුවේදී මෙම ක්‍රියාකාරකම තොරතුරු තාක්ෂණ ඒකකයට මාරු කර ඇත.

මෙම ක්‍රමයේ ආරම්භක ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණ ඒකකයේ සහය ඇතිව දේශීයව සංවර්ධනය කරන ලද අතර සංවර්ධිත පද්ධතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරන ලදී. එය නිසියාකාරව ක්‍රියාත්මක වන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දැනට පවතින ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවලංගු කිරීමට තීරණය කළේය. අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමට තීරණය විය.

විද්‍යාගාරය ස්ථාපනය කිරීම

මිලදී ගැනීමට අවශ්‍ය උපකරණ හඳුනාගෙන උපකරණ ලැයිස්තුව පරිපාලන අංශය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශය වෙනස්වීම හේතුවෙන් ක්‍රියාවලිය ප්‍රමාද වූ අතර මෙය 2021 දී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

ඉදිරි වසර 5 සඳහා සංඛ්‍යාත වර්ණාවලි මාර්ගෝපදේශය සකස් කිරීම / 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් හරහා මූලික 5G අත්හදා බැලීම් ආරම්භ කර ඇති අතර පූර්ව වාණිජමය 5G සේවාවන් නියාමනය කිරීම සඳහා ගිගාහර්ට්ස් 3.5 කලාපයේ සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කර ඇත. තවද, ශ්‍රී ලංකාවේ වාණිජමය 5G සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික 5G සංඛ්‍යාත වර්ණාවලි ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සකස් කිරීමට පියවර ගෙන තිබේ. මෙම ප්‍රයත්නයන් ශ්‍රී ලංකාවට නව 5G ආශ්‍රිත නිෂ්පාදන හා සේවා නවෝත්පාදනය කිරීමෙහිලා ශ්‍රී ලංකාව සඳහා පදනම සපයනු ඇති අතර ගෝලීය 5G වෙළඳපොළට ප්‍රවේශ වීමට මෙන්ම 5G හි ප්‍රතිලාභ ලබා ගැනීමට කර්මාන්තවලට පහසුකම් සපයයි.

මෙම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) විශේෂඥයින්ගේ සහාය ඉල්ලා සිටියේය. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙතින් ලැබුණු විශේෂඥයන්ගේ ජීව දත්ත තොරතුරු සමාලෝචනය කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තවත් අමතර

තොරතුරු ඇතුළු විශේෂඥයින්ගේ ජීව දත්ත තොරතුරු ඉල්ලා සිටියේය. පවතින කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් අපට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) වෙතින් නිසි ප්‍රතිචාරයක් නොලැබුණි. එබැවින් මෙම කාරණය ස්විට්සර්ලන්තයේ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කිරීමට තීරණය කර ඇත. ප්‍රගති සමාලෝචනයේදී, අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 වර්ෂය සඳහා මෙම වැඩසටහන අඛණ්ඩව කරගෙන යාම පිණිස වෙනත් ජාත්‍යන්තර සංවිධාන සහ නියාමන ආයතනවල විශේෂඥ දැනුම ලබා ගැනීමට තීරණය කරන ලදී.

විකාශන බලපත්‍ර කළමනාකරණය හඳුන්වා දීම

විකාශන බලපත්‍ර කළමනාකරණය සම්බන්ධයෙන් මාධ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා වාර කිහිපයක් පැවැත්විණි. නව බලපත්‍ර අයදුම්පත් අධ්‍යයනය කිරීම සහ නිර්දේශ කිරීම සඳහා මෙන්ම පවතින ජාල පුළුල් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

අනුමත කිරීම් විධිමත් කිරීම පිළිබඳව වෙනත් රජයේ ආයතන සමඟ සම්බන්ධ වීම

අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම අවසන් කර ඇත. ඊට අමතරව, ගැටළු විසඳීමේදී වෙනත් අදාළ රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කරන ලදී.

රූපවාහිනී සම්ප්‍රේෂණය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඩිජිටල් රූපවාහිනී විකාශනය සහ ඩිජිටල් ශ්‍රව්‍ය විකාශනය ශ්‍රී ලංකාව සඳහා වඩාත් සුදුසු තාක්ෂණයන් පිළිබඳ උපදෙස් සහ නොමිලේ ශ්‍රව්‍ය / දෘශ්‍ය විකල්ප වැනි විකල්ප ප්‍රවේශයන් සහිතව ආරම්භ කරන ලදී. රූපවාහිනී විකාශනය ඩිජිටල්කරණය කිරීම මාධ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් ලබන වසරේදී ආරම්භ කිරීමට නියමිතය. අදාළ ආයතන සමඟ සාකච්ඡා පවත්වා මෙම කාර්යය නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

සංඛ්‍යාත වෙන් කිරීම හා ප්‍රතිසංස්කරණය

මහජනතාවගේ දැනගැනීම සඳහා ජාතික සංඛ්‍යාත වෙන්කිරීමේ වගුව සකස් කර වෙබ් අඩවියේ පළ කරන ලදී. පද්ධති කළමනාකරණ දත්ත සමුදාය පිරිපහදු කිරීම සමඟ ප්‍රධාන සංඛ්‍යාත ලේඛනය යාවත්කාලීන කරන ලදී.

ජංගම / ස්ථාවර සේවා සඳහා මෙගහර්ට්ස් 2600 පරාසය වෙන්කිරීම අවසන් කරන ලදී. ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලිසිය සඳහා සංඛ්‍යාත පැවරීම මෙම වසර තුළදී සිදු කරන ලදී. තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් අධ්‍යාපන පාදක කරගත් රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා සඳහා සංඛ්‍යාත වෙන් කිරීම සිදු කර ඇති අතර අධ්‍යාපන අරමුණු සඳහා දිවයින පුරා සන්නිවේදන ජාලයක් පිහිටුවීමට කටයුතු කර ඇත.

සමුද්‍රීය උපකරණ, ඩ්‍රෝන යානා, GPS උපාංග ආනයනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණ මෙන්ම ගුවන්විදුලි සේවාවල සංඛ්‍යාත වෙන් කිරීම අවලංගු කිරීම සම්බන්ධයෙන් නිශ්චිත නීති රීති ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙන ලදී.

සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම

වගුව 06: සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

සේවා වර්ගය	වර්ෂය		
	2018	2019	2020
ස්ථාවර සේවා	167	160	159
විකාශන සේවා (රූපවාහිනී හා ගුවන් විදුලි)	39*	49	41
ට්‍රන්කින්/පේජින්/සිටිසන් බෑන්ඩ්	10	07	5/1
දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවා	20/28	45/47	18/23
ගුවන් හා සමුද්‍ර සේවා			
(i) ගුවන්යානා මධ්‍යස්ථාන	74	69	67
(ii) නැව් මධ්‍යස්ථාන	94	121	105
(iii) සමුද්‍රීය ජංගම	1041	575	174
(iv) ගුවන් ජංගම	12	08	08
පෞද්ගලික ජංගම ගුවන්විදුලි සේවා	361	193	159
ආධුනික ගුවන්විදුලි	33	64	46

**ප්‍රධාන බලපත්‍ර පමණක් ගණනය කරන ලදී.*

වගුව 07: ලැබුණු පැමිණිලි සහ සිදුකරන ලද විමර්ශන

සේවාව	ලැබුණු පැමිණිලි සංඛ්‍යාව		
	2018	**2019**	**2020**
රූපවාහිනී හා ශ්‍රව්‍ය විකාශන	5	5	2
වෙනත් සේවා	32	22	23

වගුව 08: ලැබුණු පැමිණිලි හා සිදු කරනල ලද විමර්ශන

සේවාවේ වර්ගය	වර්ෂය		
	2018	**2019**	**2020**
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) ඇතුළු ස්ථාවර සේවා	506	765	781
විකාශන සේවා (රූපවාහිනී හා ගුවන්විදුලි)	57	81	90
සෙලෙයුලර් ජංගම සේවා			
(i) බෙදාහැරීමේ බලපත්‍ර	6526	7263	5010
(ii) ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්	757	11011	1030
(iii) පෞද්ගලික ජංගම ගුවන්විදුලි	190	155	95
දත්ත සේවා / ගුවන්විදුලි ටෙලිමෙට්‍රි	173	130	113
වන්ද්‍රිකා සේවා	153	222	138+
ආධුනික ගුවන්විදුලි	21	78	20
අඩු බල උපකරණ	1036	1215	466*
සමුද්‍රීය සන්නිවේදනය	-	-	118

* තාවකාලික දත්ත

ගුවන්විදුලි සංඛ්‍යාත පිරික්සීම සහ විමර්ශනය

ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම යනු වර්ණාවලී කළමනාකරණ ක්‍රියාකාරකම්වල අනිවාර්ය අංගයකි. 22 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රය නිකුත් කිරීමෙන්, බාධාවන් රහිත ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් සහතික කිරීමට කටයුතු කරයි. ගුවන්විදුලි සම්ප්‍රේෂකයන් මගින් අනවශ්‍ය බාධාවන් රහිත ගුවන් විදුලි සන්නිවේදන සේවා කලාපීය විමෝචනයන්ගෙන් ව්‍යාජ හා අනවශ්‍ය ලෙස සංඛ්‍යාත පරාස වලින් බැහැර විමෝචන උත්පාදනය කරන බැවින් බාධාවකින් තොරව ගුවන් විදුලි සන්නිවේදන සේවාව භාවිතා කිරීම අතිශයින් දුෂ්කර ය. එසේම ඒවා අනපේක්ෂිත බාධාවන්ට හේතු විය හැකි පරිදි සංවේදී ග්‍රාහකවල ධාරිතාවය වැඩිවීමට හේතු විය හැකියි. එමනිසා, බාධාවන් හඳුනා ගැනීම සහ අවම කිරීම අතිශයින්ම අභියෝගාත්මක කාර්යයක් වන අතර ඒවා හඳුනා ගැනීම සඳහා නවීන උපකරණ අවශ්‍ය වේ. වර්ණාවලී කළමනාකරණ අංශය කොළඹ, කදිරාන සහ මහනුවර ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන තුනක් (RMC) පවත්වාගෙන යයි. එමෙන්ම මෙම කාර්යය සඳහා යක්කල දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කර තිබේ. සිය ජංගම පිරික්සුම් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා නවීන සංඛ්‍යාත වර්ණාවලී පිරික්සුම් වාහනයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව ඇත. මෙම සියලුම පද්ධති වලට දුරස්ථව ප්‍රවේශ විය හැකිය.

මේ සඳහා උපකරණ ජාලයක් මිල දී ගැනීමෙන් දිවයින පුරා අධීක්ෂණ කටයුතු පුළුල් කිරීමට සංඛ්‍යාත වර්ණාවලී කළමනාකරණ අංශය පියවර ගෙන තිබේ.

පුළුල් පිරික්සුම් පද්ධතියක් / නව ස්වයංක්‍රීය සංඛ්‍යාත වර්ණාවලී කළමනාකරණ පද්ධතියක් පිහිටුවීම

මෙම ක්‍රියාකාරකම් දෙකම එක්වර අවසන් කිරීමට තීරණය විය. තවද, වැඩිදියුණු කරන ලද සංඛ්‍යාත කළමනාකරණ සහ දීප ව්‍යාප්ත පිරික්සුම් පද්ධතිය සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලද අතර මෙම කාර්යය මෙම වසරේ දී ද අඛණ්ඩව සිදු කෙරේ.

ගුවන්විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා මාදිලි අනුමැති රෙගුලාසි 2020 හඳුන්වා දීම සහ බලාත්මක කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් 202දෙසැම්බර් 16 දින සිට බලපැවැත්වෙන පරිදි ගුවන්විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා නව මාදිලි අනුමැති පටිපාටිය ප්‍රකාශයට පත් කර ඇත. ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම, අලෙවි කිරීම, නිෂ්පාදනය කිරීම හෝ භාවිතා කිරීමට අපේක්ෂා කරන සියලුම වර්ගවල ගුවන්විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා මෙම නව මාදිලි අනුමැති පටිපාටිය අදාළ වේ. පැරණි යෝජනා ක්‍රමය යටතේ එනම් 2020 වසරේ දෙසැම්බර් 16 දිනට පෙර නිකුත් කරන ලද සියලුම මාදිලි අනුමත සහතිකපත්වල වලංගුභාවය 2021 ජුනි 17 වන දින සිට බලපවත්වන පරිදි ඉබේම අහෝසි වේ.

1. ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීතිවල ප්‍රධාන අරමුණ වන්නේ:

   අ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වල මාදිලි අනුමැති ක්‍රියාවලිය නිර්වචනය කිරීම;

   ආ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වල මෙහෙයුම් සංඛ්‍යාත ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාත වෙන්කිරීමේ වගුවට අනුකූල වන බව නිසැක කිරීම;

   ඇ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙනත් ගුවන් විදුලි සන්නිවේදන සේවා වලට හෝ විදුලි සංදේශ ජාල වලට අවහිරතා ඇතිකිරීමකින් තොරව නිශ්චිතව දක්වා ඇති තාක්ෂණික පිරිවිතර තුළ ක්‍රියාකරවනු ලබන බව සහ වෙනත් ගුවන් විදුලි සන්නිවේදන සේවා හෝ විදුලි සංදේශ ජාලවල බාධාවකින් තොරව ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිශ්චිත තාක්ෂණික පිරිවිතරයන් තුළ ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.

   ඈ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මගින් උත්පාදනය කරන ලද විද්‍යුත් චුම්භක බාධාවන් ආසන්නයේ පිහිටි වෙනත් උපකරණ වල ක්‍රියාකාරී මෙහෙයුම් අවක්‍රමණය නොකිරීම සහතික කිරීම සහ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආසන්නයේ වෙනත් උපකරණ වල මෙහෙයුම් වල ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි විද්‍යුත් චුම්භක බාධාවන් පිළිගත හැකි පරිදි වැලැක්වීමේ හැකියා මට්ටමකින් සමන්විත යුතු වීම.

   ඉ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මිලදී ගැනීමට පෙර, එම උපකරණ පරිශීෂ්ට සහ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති වලට අනුකූල බව නිසැක කර පිණිස අවශ්‍ය දැනුවත් භාවය ලබාදීමට පරිහරණය කරන්නන් සවිබල ගැන්වීම.

   ඊ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ භාවිතා කිරීමෙන් පැන නැඟිය හැකි විද්‍යුත් උපද්‍රව හෝ කිසියම් වෙනත් හානිකර විමෝචන මගින් අවසන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහ සෞඛ්‍යය ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

   උ. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල වලට අනුකූල නොවන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වලින් පරිහරණය කරන්නන් ආරක්ෂා කිරීම.

   ඌ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සැපයීමෙහිලා තරහකාරීත්වය ඇති කිරීම සහ පරිහරණය කරන්නාට දැරිය හැකි මිල ගණන් යටතේ විවිධ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ලබාගත හැකි බව දිරිගැන්වීම.

2. මෙම මාදිලි අනුමැති රීතිවල අන්තර්ගත වඩා වැදගත් කරුණු කිහිපයක් වන්නේ:

   අ. ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති යටතේ මාදිලි අනුමැති යෝජනා ක්‍රම දෙවර්ගයකි :

   - සම්මත මාදිලි අනුමැතිය: පෙර මාදිලි අනුමැතිය ලබා නොගත් සියලුම ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (ගුවන් විදුලි විදුලි සංදේශ පර්යන්ත උපකරණ)
   - සරල මාදිලි අනුමැතිය: සරල මාදිලි අනුමැති ක්‍රියාවලිය ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා දැනටමත් කොමිෂන් සභාව විසින් මාදිලි අනුමැතිය ලබා දී ඇති අවස්ථාවක යොදා ගත යුතුය. මෙම ක්‍රියාවලියේදී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන නමුත්; කෙසේවෙතත්, නියෝජිත සාම්පලයක් අවශ්‍ය වනු ඇත.

මාදිලි අනුමැති සහතිකපත් නිකුත් කිරීම සඳහා මාදිලි අනුමැති ගාස්තු ව්‍යුහය හඳුන්වා දී ඇත.

   අ. අයදුම්පත සමඟ උපකරණයේ සාම්පලයක් ඉදිරිපත් කළ යුතුය. මාදිලි අනුමැතිය සඳහා අදාළ ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ සාම්පල දෙකක් ඉල්ලා සිටීමේ අයිතිය කොමිෂන් සභාව සතුව සතු වන අතර මාදිලි අනුමැතිය ලබාගැනීමේ අයදුම්පත සමඟ ඉදිරිපත් කරන ලද සාම්පල වසර 2 ක් රඳවා ගනු ලැබේ.

   ආ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන්නේ බලයලත් පරීක්ෂණ රසායනාගාර (ISO/IEC 17025 අනුකූලව (ILAC) විසින් පිළිගත් රසායනාගාර) මගින් ඉදිරිපත් කරනු ලබන පරීක්ෂණ වාර්තා පමණි. පරීක්ෂණ වාර්තාවේ දිනය අයදුම් කරන දිනට මාස (3) වඩා පැරණි නොවිය යුතුය.

   ඇ. මාදිලිය අනුමත කරන ලද සියලුම ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ ඇසුරුම්වල ස්ථිරවම ඇලවූ ලේබලයක් තිබිය යුතු අතර එම ලේබල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙතින් මිලදී ගත යුතුය.

   ඈ. සම්මත මාදිලි අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය වැඩ කරන දින 30 කි. එමෙන්ම අමතර ගාස්තුවක් ගෙවා කඩිනම් මාදිලි අනුමැතිය ලබාදීමේ සේවාව ලබා ගත හැකිය.

ඉ. මාදිලි අනුමැති සහතික පත්‍රයේ වලංගු කාලය වසර 4 කි.

ඊ. පහත සඳහන් ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැතිය ලබා ගැනීමෙන් නිදහස් වේ.

- රූපවාහිනී දුරස්ථ පාලක, ගරාජ දොර විවෘතකරණ වැනි කෙටි පරාස අධෝරක්ත දුරස්ථ පාලක උපකරණ.
- වයිෆයි, බ්ලූටූත් වැනි කෙටි පරාස ගුවන් විදුලි තාක්ෂණය භාවිතා කරන ඩෙස්ක්ටොප් පරිගණක හා ලැප්ටොප් පරිගණකවල සවිකරන ලද ගුවන් විදුලි හා විදුලි සංදේශ පරියන්ත උපකරණ.
- මෙගාවොට් 50 වඩා අඩු ප්‍රතිදාන බලය සහිත සම්ප්‍රේෂක උපකරණ.
- කෙටි පරාස ගුවන් විදුලි තාක්ෂණය භාවිතා කරන කාර් සංචාලන ඒකක, දුරස්ථ කාර් යතුරු වැනි වාහනයක සවිකරන ලද ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව පුද්ගලයින් විසින් සිය පෞද්ගලික පරිහරණය සඳහා මෙරටට රැගෙන එනු ලබන ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ.

කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍ර විභාගය

ආධුනික ගුවන්විදුලි මෙහෙයුමේ නිපුණතා සහතික නිකුත් කිරීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර විභාග දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විභාග තුනක් පවත්වන්නේය. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍රය කාණ්ඩ තුනකින් සමන්විත වේ

1. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ උසස් පෙළ බලපත්‍රය
2. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ සාමාන්‍ය පෙළ බලපත්‍රය
3. ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ නවක පෙළ බලපත්‍රය

වයස අවුරුදු දාහතරට (14) වැඩි ඕනෑම අයෙකු විභාගයට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. විභාගයට අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර, එකක් උසස් විදුලි තාක්ෂණය සහ ගුවන්විදුලි සන්නිවේදනය සහ අනෙක බලපත්‍ර කොන්දේසි, මෙහෙයුම් පරිවයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව වේ. මෝර්ස් කේතය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන්නේ ලිඛිත ප්‍රශ්න පත්‍ර සමත් වූ උසස් පෙළ බලපත්‍ර අයදුම්කරුවන් සඳහා පමණි

සාමාන්‍යයෙන් වසරකට වරක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙම විභාගය පවත්වනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය අයදුම් පත්‍රය කොමිෂන් සභාවෙන් හෝ කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. අනෙකුත් විස්තර කොමිෂන් සභාව විසින් සහ විභාගය පැවැත්වෙන දිනට සති හතරකට පෙර නිකුත් කෙරෙන ගැසට් නිවේදනයෙන් ද ලබාගත හැකිය අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට මුදල් ගෙවා මෙහි විෂය නිර්දේශය ලබාගත හැක.

විභාග ගාස්තු:

විභාග කාණ්ඩය	පළමු කොටස සඳහා ගාස්තුව (රු.)	දෙවන කොටස සඳහා ගාස්තුව (රු.)
උසස් පෙළ	250.00	125.00
සාමාන්‍ය පෙළ	125.00	-
නවක පෙළ	125.00	-

සටහන: රජයේ බදු සහ බද්ද හැර.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පසුගිය වසරේ ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුවන්ගේ බලපත්‍ර විභාගයක් පැවැත්වූ අතර ඒ සඳහා අපේක්ෂකයින් 156 දෙනෙක් විභාගයට පැමිණ සිටියහ. පහත වගුවේ විභාග ප්‍රතිඵල පිළිබඳ තොරතුරු නිරූපනය වේ. සිසුන් 18 දෙනෙකුගෙන් සිසුන් 10 දෙනෙකු (55.5%) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ උසස් පෙළ බලපත්‍රය ලබාගෙන ඇත. සිසුන් 79ක් අතරින් සිසුන් 39ක් (49%) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ සාමාන්‍ය පෙළ බලපත්‍රය ලබාගෙන ඇත. සිසුන් 65 දෙනාගෙන් සිසුන් 21ක් (32%) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ නවක පෙළ බලපත්‍රය ලබාගෙන ඇත.

ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුගේ බලපත්‍ර විභාග ප්‍රතිඵලය

කාණ්ඩය	උසස් පෙළ	සාමාන්‍ය පෙළ	නවක පෙළ
සමත්	10	39	21
අසමත්	2	7	30
නොපැමිණි	6	27	14
එකතුව	**18**	**73**	**65**

තරඟකාරිත්ව අංශය

සමාලෝචනය

තරඟකාරිත්ව අංශය විසින් පාරිභෝගිකයන්ගේ සහ දුරකථන ක්‍රියාකාර සමාගම් වල යහපත පිණිස කාර්යක්ෂම සහ පූර්ණ ස්වාධීන විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා වන නියාමන කටයුතු මෙහෙයවයි. මෙම අංශය විසින් සාධාරණ වූ ගාස්තු සහ ගුණාත්මක සේවා පවත්වාගෙන යන අතර අයක්‍රම, අන්තර්ජාල සේවා නියාමනය කිරීම, විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ අදාළ පාර්ශ්වයන් සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම සිදු කරනු ලැබේ. පාර්ශවකරුවන් විදුලි සංදේශ පහසුකම් ආවරණය වී නොමැති හා ආවරණය කලයුතු කටයුතු සඳහා මැදිහත් වී කටයුතු කිරීම මෙම අංශය විසින් සිදු කරන තවත් එක් කාර්යයකි. මෙම අංශය විසින් විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර විදුලි සංදේශ බදු, සෙලෙයුලර් කුලුනු බදු, ජංගම කෙටි පණිවුඩ සේවා බදු, සහ සෙස් බදු රැස් කරනු ලබයි. නව ව්‍යාපෘති සඳහා නව සේවාවන් සපයන විදුලි සංදේශ නාක්ෂණය පිළිබඳ විදේශීය විශේෂඥයින් අතයාවශ්‍යය වන අතර එම වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර ක්‍රියාවලිය මෙම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

කාර්යයන්

- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය විශ්ලේෂණය කිරීම තුළින් ප්‍රවණතාවන් අධීක්ෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයේ සංඛ්‍යාලේඛන තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයෙන් රාජ්‍ය බදු/අයබදු (විදුලි සංදේශ බද්ද, සෙස්, සෙලෙයුලර් කුලුනු බදු සහ ජංගම කෙටි පණිවුඩ සේවා බදු) එකතු කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ආශ්‍රිත ව්‍යාපෘතිවල නිරත විදේශීය විශේෂඥයින් සඳහා අදාල වීසා ලබාගැනීමට පහසුකම් සැපයීම.
- අන්තර් සම්බන්ධතාවයට අදාළ තොරතුරු රැස් කිරීම සහ ඒ සම්බන්ධයෙන් පැන නගින ගැටළු විසඳීම.
- අයක්‍රම නියාමනය කිරීම.
- දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව නොදියුණු හා ඌන සංවර්ධිත ප්‍රදේශවල විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීම.
- විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- අන්තර්ජාතික විදුලි සංදේශ බදු නිවැරදිව හා කාලෝචිත ලෙස එකතු කිරීම සහතික කිරීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරු සමාගම්වල විගණනය කළ ගිණුම් එකතු කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරු සමාගම්වල ආදායම, ලාභය සහ අලාභ සහ ආයෝජන විශ්ලේෂණය කිරීම.

2020 වසරේ කාර්යසාධනය

ග්‍රාහක පදනම

2020 නොවැම්බර් 30 වන විට ජංගම හා ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනම 31,352,417කි. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දී ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහක පදනමේ අඩුවීමක් පෙන්නුම් කළ අතර 2019 වසරට සාපේක්ෂව ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහකයින්ගේ වැඩිවීමක් පෙන්නුම් කරයි.

***වගුව 09:* ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව**

වර්ගය	2018	2019	2020*	% වෙනස්වීම	
				2018-2019	2019-2020*
ජංගම	32,528,104	32,884,099	28,547,381	1%	-13%
ස්ථාවර ප්‍රවේශ	2,484,616	2,299,767	2,604,177	-7.4%	13%
එකතුව	35,012,720	35,183,866	31,151,558	0.5%	-11.4%

*තාවකලික දත්ත

එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම (ARPU)

ජංගම දුරකථන ක්‍රියාකරු කාණ්ඩය සඳහා 2020 වර්ෂය සඳහා එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍යය ආදායම (වර්ෂයකට) රු. 4,718 (ඇස්තමේන්තු කර ඇති) ක් වන අතර එය 2019 වර්ෂයේ එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍යය ආදායම (ARPU) හා සසඳන විට 6% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු කාණ්ඩය පසුගිය වසරට සාපේක්ෂව 1 % ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වගුව 10: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)

වර්ගය	2016	2017	2018	2019	2020*	% වෙනස්වීම			
						2016-2017	2017-2018	2018-2019	2019-2020*
ජංගම	5,258	4,977	4,591	4,441	4,718	-5%	-7.7%	-3.3%	6%
ස්ථාවර ප්‍රවේශ	21,691	22,911	30,745	30,171	29,834	6%	34%	-1.9%	-1%

* තාවකාලික දත්ත

විදුලි සංදේශ බදු (TL)

විදුලි සංදේශ බදු ශ්‍රී ලංකා රජය විසින් 2011 වසරේදී විදුලි සංදේශ කර්මාන්තය සඳහා "තනි අනුපාත බද්දක්" ලෙස හඳුන්වා දුන් අතර ආරම්භයේදී සැපයුම් වටිනාකම මත බදු අනුපාතය 20% ක් විය. අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2013 ආරම්භයේ සිට අන්තර්ජාල සේවා සඳහා 10% ක සහනදායී විදුලි සංදේශ බදු අනුපාතයක් පැනවීය. අනෙකුත් විදුලි සංදේශ සේවා සඳහා වන විදුලි සංදේශ අනුපාතය නොවෙනස්ව පැවතුනි. 2014 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ බදු අනුපාතය 20% සිට 25% දක්වා වැඩිවූ අතර අන්තර්ජාල සේවා සඳහා විදුලි සංදේශ බදු අනුපාතය 10% ලෙස නොවෙනස්ව පැවතුනි. පසුව, 2017 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අන්තර්ජාල සේවා සඳහා වන බද්ද අහෝසි කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2016ට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා එකතු කරන ලද විදුලි සංදේශ බදු ප්‍රමාණය පහළ වැටිණි. 2018 නොවැම්බර් 10 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 25% සිට 15% දක්වා වෙනස් විය. නැවතත්, විදුලි සංදේශ බදු අනුපාතය 2019 දෙසැම්බර් මාසයේදී 25% කින් අඩු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන විදුලි සංදේශ බදු අනුපාතය 11.25% කි.

ප්‍රස්ථාරය 10: විදුලි සංදේශ බදු



* තාවකාලික දත්ත

සෙස් බදු

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 22 උ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් සෙස් බදු එකතු කරනු ලැබේ.

ප්‍රස්ථාරය 11: සෙස් බදු



ජංගම දුරකථන කුලුනු බදු (CTL)

2018 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 35 දරන මූදල් පනතේ XII වන කොටස යටතේ ජංගම දුරකථන කුලුනු බදු පනවන ලදී. ඉහත සඳහන් මුදල් පනතට අනුව සෑම ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමක් විසින් එක් කුලුනක් සඳහා වාර්ෂිකව රු. 200,000 ක් ගෙවිය යුතුය. තව දුරටත් ජංගම දුරකථන ක්‍රියාකරු සතු නොවන නමුත් ඔවුන් විසින් භාවිතා කරන කුලුනු සඳහා ජංගම දුරකථන කුලුනු බදු ගෙවිය යුතුය. රු. 200,000 බදු මුදල කුලුන හවුලේ පරිහරණය කරන ලද දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සමානව බෙදා ගත යුතුය. බද්ද කාර්තුමය වශයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතුය. 2020 වසරේ ජංගම දුරකථන කුලුනු බදු එකතුව 2019 ට සාපේක්ෂව 3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

වගුව 11: ජංගම දුරකථන කුලුනු බදු

වර්ෂය	2019	2020	% වෙනස්වීම
එකතුව	1,384,526,669.00	1,426,333,333.68	3%

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා බද්ද (SMS බද්ද)

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අයබදු 2018 අංක 35 දරන මූදල් පනතේ XIII කොටස විසින් පනවා ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි 2014/16 ගැසට් නිවේදනය මගින් ලබා දී ඇත. ඒ අනුව ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමකට වාණිජ අරමුණු සඳහා ග්‍රාහක පිරිසකට ජංගම දුරකථන හරහා යවන කෙටි පණිවුඩයකට 0.25 මුදලක් ගෙවීම අවශ්‍ය වේ. මෙම බද්ද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාසිකව එකතු කරනු ලැබේ. 2020 වසරේ ජංගම දුරකථන කෙටි පණිවුඩ බද්ද එකතු කිරීමෙන් 2019 ට සාපේක්ෂව 0.08% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වගුව 12: 2019 වසරේදී ජංගම කෙටි පණිවුඩ සේවා බදු එක්රැස් කිරීම

වර්ෂය	2019	2020	% වෙනස්වීම
එකතුව	419,023,886	418,650,661	0.08%

වීසා අයදුම්පත් නිර්දේශ කිරීම

විදුලි සංදේශ කර්මාන්තය ශීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් බැවින්, ලෝකයේ නව තාක්ෂණයන් සමඟ සිය ජාල වැඩිදියුණු කිරීමට දුරකථන ක්‍රියාකාර සමාගම් අඛණ්ඩව උත්සාහ කරති. දුරකථන ක්‍රියාකාර සමාගම් සිය විශේෂ ව්‍යාපෘතිවල වැඩ කිරීමේදී විශේෂඥ සේවය ලබා ගැනීම සඳහා විදුලි සංදේශ කර්මාන්තයේ විදේශීය වෘත්තිකයන් මෙරටට ගෙන්වා ගනු ලබයි. දුරකථන ක්‍රියාකාර සමාගම් වෙනුවෙන් කොමිෂන් සභාව එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර රේඛීය අමාත්‍යාංශයට නිර්දේශ කරයි. 2020 වර්ෂය තුළ එවැනි වෘත්තිකයින්ගේ වීසා බලපත්‍ර අයදුම්පත් 95 ක් මෙම අංශය විසින් සකස් කරන ලදී.

විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු මෙහෙයවීම

තරඟකාරිත්ව අංශය විසින් විදුලි සංදේශ කර්මාන්තයේ දත්ත රැස්කර තොරතුරු වරින් වර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. තවද, මෙම අංශය ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) වැනි දේශීය හා ජාත්‍යන්තර ආයතන සඳහා විදුලි සංදේශ කර්මාන්ත තොරතුරු ඉදිරිපත් කරයි. පවත්නා අන්තර් සම්බන්ධතා අනුපාතයන් සමඟ ඉදිරියට යාමට සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් එකඟ වූ අතර ආරම්භක ක්‍රියාවලිය අවසන් විය.

අන්තර් සම්බන්ධතාවය මෙහෙයවීම

2010 දී තීරණය කරන ලද දැනට පවතින අන්තර් සම්බන්ධතා අනුපාත සමාලෝචනය කිරීම සඳහා තරඟකාරිත්ව අංශය විසින් ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. එම ක්‍රියාවලියේ පළමු පියවර වශයෙන් කොමිෂන් සභාව විසින් සිය අදහස් ලිඛිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ඉල්ලා සිටි අතර ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වේ.

අයක්‍රම

2020 වර්ෂය තුළ බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා උත්සව අයක්‍රම දීමනා 10 ක්, ප්‍රවර්ධන පදනම් මත අයක්‍රම අනුමත කිරීම් 60 ක් සහ ස්ථිර පදනම් අනුමත කිරීම් 40 ක් ලබා දී ඇත.

ඊට අමතරව, 2020 වර්ෂය තුළ අයක්‍රම යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- පාසල් ළමුන්ට e-තක්සලාව ඉගෙනුම් භාවිතාව සඳහා නොමිලේ ප්‍රවේශය ලබාදීමට කටයුතු කිරීම. සියලුම රජයේ පාසල්වලට කිසිදු දත්ත ගාස්තුවකින් තොරව e-තක්සාලාව වේදිකාවට (නිල විද්‍යුත් ඉගෙනුම් වේදිකාව) ප්‍රවේශ වීමට ශ්‍රී

ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කටයුතු සූදානම් කර ඇත.

- රාජ්‍ය විශ්ව විද්‍යාල සිසුන් සඳහා LEARN වේදිකාව සඳහා නොමිලේ ප්‍රවේශය ලබා දීමට කටයුතු කිරීම.

  මෙම කාලය තුළ අධ්‍යයන ප්‍රජාව සඳහා විශ්ව විද්‍යාල LMS සඳහා නොමිලේ ප්‍රවේශය ලබා දීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත.

- නිවසේ සිට වැඩ කිරීම (WFH) සහ නිවසේ සිට අධ්‍යයනය කිරීම (SFH) වැනි ක්‍රියාකාරකම් සඳහා අනුමත කරන ලද විශේෂ ගාස්තු පැකේජයක් ලබාදීම.

  COVID-19 කාල පරිච්ඡේදය තුළ, රාජ්‍ය ආයතන, ව්‍යාපාර සහ සමාජය අතර අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහයෝගයෙන් දැරිය හැකි මිලකට නිවසේ සිට වැඩ කිරීමේ පැකේජ සහ වැඩ කිරීම සහ නිවසේ සිට අධ්‍යයනය කිරීමේ පැකේජ හඳුන්වා දෙන ලදී.

- යූ ටියුබ් සහ සමාජ මාධ්‍ය (Facebook, WhatsApp, Viber…) සඳහා "සීමා රහිත" අයකුම ප්‍රදාන අනුමත කිරීම.
- රූපවාහිනී භාවිතයන් (Netflix, Amazon Prime) සඳහා ප්‍රවේශවීමේ අසීමිත ප්‍රදාන ලබාදීම.
- නෙට්ෆ්ලික්ස්, ඇමසන් ප්‍රයිම් වැනි හඳුනාගත් විනෝදාස්වාද වේදිකා සඳහා සීමා රහිත දත්ත සහිත විශේෂ විනෝදාස්වාද ඇඩෝන අනුමත කිරීම.
- COVID –19 වසංගතය පැතිරීම වැළැක්වීමේ අරමුණින් 1919 යවන සියලුම කෙටි පණිවුඩ සහ "StaySafe" වෙබ් ද්වාරය සඳහා නොමිලේ ප්‍රවේශය ලබා දීමට කටයුතු කිරීම.

- අයකුම ආශ්‍රිත සංඛ්‍යාන දර්ශක ගණනය කිරීම.

  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් පාරිභෝගිකයින්ගේ විවිධ භාවිත රටාවන් සහ හැසිරීම් පිළිබිඹු කිරීම සඳහා විවිධ මිල පැකේජ කාණ්ඩයක් පවත්වා ගෙන යනු ලබන අතර ඒවා වරින් වර පාරිභෝගික හැසිරීම වෙනස් කිරීමට අනුව ගලපනු ලබයි. මෙම මිල පැකේජ මගින් විවිධ තාක්ෂණ කාණ්ඩ තුනක් එනම්:ජංගම දත්ත, ජංගම හඬ සහ ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රමිතීන්ට අනුව ජංගම දුරකථන හා ස්ථාවර අයකුම සැලසුම් වල මාසික භාවිතය විශ්ලේෂණය කිරීමෙන් අයකුම ආශ්‍රිත සංඛ්‍යාන දර්ශක සකස් කරන ලදී.

- ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යයන මෙහෙයවීම

  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සිය සාමාජික රටවල් අතර දුරකථන මිල ගණන් සංසන්දනය කර වාර්ෂිකව "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ප්‍රවණතාව" ලෙස ප්‍රකාශයට පත් කරයි. හඬ සහ දත්ත මිල ගණන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඉතා හොඳ මට්ටමක පසුවේ. 2020 දී නිකුත් කරන ලද "ඩිජිටල් සංවර්ධන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ප්‍රවණතා මැනීම 2019" නවතම වාර්තාවට අනුව අදාළ ශ්‍රේණි පහත දැක්වේ

වගුව 13: ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මිල ප්‍රවණතාවල ශ්‍රී ලංකාව ශ්‍රේණිගතවීම

කාණ්ඩය	2019 ශ්‍රේණිගතවීම	2020 ශ්‍රේණිගතවීම
හඬ + දත්ත අඩු භාවිතය	14	13
හඬ + දත්ත වැඩි භාවිතය	33	23
ජංගම අධිවේගී අන්තර්ජාල සේවා සඳහා පමණක් දත්ත	29	8
ජංගම හඬ පැකේජ	9	7
ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා	26	20

"සුරක්ෂිත සන්නිවේදනයක්" ව්‍යාපෘතිය

පහත සඳහන් දිස්ත්‍රික්කවල විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

මහනුවර, මොණරගල, බදුල්ල, පුත්තලම, කොළඹ, ගම්පහ, අනුරාධපුර, කෑගල්ල, නුවරඑළිය සහ ගාල්ල දිස්ත්‍රික්ක

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු රැස් කිරීම

විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) වශයෙන් එකතු වූ මුදල රුපියල් මිලියන. 4,293 කි



තාක්ෂණයෙන් බල ගැන්වුණු ශ්‍රී ලංකාවක්

கம ட

சன்னிவேதனய

"இலங்கையை இணைப்போம்"

Gamata

Sannivedanaya

"Connect Sri Lanka"

ගමට සන්නිවේදනය "Connect ශ්‍රී ලංකා" තාක්ෂණය පදනම් කරගත් සමාජයක් (සුහුරු ජාතියක්) සහ ඩිජිටල් අන්තර්ගත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ රජයේ දැක්ම සමඟ එක්වූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ Connect 2030 න්‍යාය පත්‍රයට අනුකූලව රට පුරා 100% 4G ෆයිබර් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය සාක්ෂාත් කිරීම පිණිස රටේ සංවර්ධිත විදුලි සංදේශ සේවා පහසුකම් නොමැති ප්‍රදේශ හඳුනාගැනීම සඳහා "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හඳුනාගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා 4G/ෆයිබර් අදිවේගී අන්තර්ජාල සේවා ආවරණය ක්‍රියාත්මක කිරීම සහ කඩිනම් කිරීම සඳහා විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) අරමුදල මඟින් දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ආධාර සපයයි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය හුදෙක් අධිවේගී අන්තර්ජාල ප්‍රවේශය සහිත සම්බන්ධතාවය කෙරෙහි අවධානය යොමු කරන 4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ජාලය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පමණක් නොව, දැරිය හැකි මිලකට අධිවේගී අන්තර්ජාල සේවා වහතික කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමය.

දිස්ත්‍රික්ක 25 පුරා ග්‍රාම නිලධාරී වසම් 14,022 සහ ගම් 37,659ක් ඇතුළත්ව දිවයිනේ ජංගම/ස්ථාවර සහ අධිවේගී අන්තර්ජාල සේවාවල බිම් මට්ටමේ ආවරණය පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා දීප ව්‍යාප්ත සමීක්ෂණයක් ආරම්භ කිරීමත් සමඟ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ විශේෂත්වය වන්නේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සියලුම සන්නිවේදන කුලුනු නව දේශීය කර්මාන්තයන් නිර්මාණය කරමින් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම සහ දේශීය අමුද්‍රව්‍ය, තාක්ෂණික දැනුම සහ මිනිස් බලය පදනම් කරගෙන දේශීයව නිෂ්පාදනය කරන කුලුනු යටිතල පහසුකම් යෙදවීම සහ භාවිතයට දුරකථන ක්‍රියාකරු සමාගම් දිරිගැන්වීමත්, රට තුළ ශ්‍රී ලංකීය නිෂ්පාදන සඳහා වෙළඳපොල ඇති කිරීමටත් ය. යටිතල පහසුකම් සඳහා කුලුනු බෙදා ගැනීමේ ක්‍රමවේදයක් තවදුරටත්සහතික කර ඇති අතර එමඟින් පරිසරයට අවම බලපෑමක් ඇති වී තිබේ.

ව්‍යාපෘතියේ පළවන අදියරේදී, කළුතර, පොළොන්නරුව, කරුණෑගල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්ක වල තෝරගත් ග්‍රාම නිලධාරී වසම් වල සමීක්ෂණය අවසන් කරන ලද සමීක්ෂණය සහ තාක්ෂණික ඇගයීම් මත පදනම්ව ජංගම/ස්ථාවර සන්නිවේදන පහසුකම් සහ අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙන ඇත.

ග්‍රාමීය ජන ඝනත්වය, විවිධභූගෝලීය ලක්ෂණ, කාලගුණික තත්ත්වයන් සහ ආදායම් ව්‍යාප්තිය ආදිය සැලකිල්ලට ගනිමින් රත්නපුර දිස්ත්‍රික්කය ප්‍රථම ව්‍යාපෘතිය ලෙස තොරා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතියෙන් ඌන සංවර්ධිත විදුලි සංදේශ පහසුමක් නොමැති ප්‍රදේශවල 500,000 අධික ජනතාවකට ප්‍රතිලාභ සැලසෙන අතර එමඟින් විදුලි සංදේශ පහසුකම් නොමැති ග්‍රාම නිලධාරී වසම් 125ක් 4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා පහසුකම් වලින් ආවරණය වේ. සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂණය සහ ව්‍යාපාරික අවස්ථා සඳහා ප්‍රජාවට ප්‍රවේශවීමට අවකාශය සැලසුණු කදිම අවස්ථාවකි. මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමත් සමඟ, රත්නපුර දිස්ත්‍රික්කයේ මුලු ග්‍රාම නිලධාරී වසම් 575ම 4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියලුම දුරකථන ක්‍රියාකාර සමාගම් සමඟ තාක්ෂණික රැස්වීම් මාලවක් පවත්වන ලද අතර නව කුලුනු සහ ප්‍රධාන මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ස්ථාන 37ක් හඳුනා ගැනුනේය. මෙම ව්‍යාපෘතිය 2021 අප්‍රේල් මාසය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික සහ පළාත් පාසල් 602, පොලිස් ස්ථාන 23ක්, රෝහල් 88ක් සහ 1400ට වැඩි සංඛ්‍යාවක රාජ්‍ය ආයතන අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයෙන් ආවරණය කිරීමට නියමිතය.

ගමට සන්නිවේදන කණ්ඩායම මෙම ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකම් වල කොටසක් ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ 100% 4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ආවරණය ලබා ගැනීම පිණිස කුලුනු සවිකිරීමට සුදුසු ස්ථාන සොයා බැලීම සඳහා සේවා සපයන්නන් සමඟ ඒකාබද්ධව නිරීක්ෂණ ආරම්භ කරන ලදී.

දෙවන අදියර සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තොරා ගත් අතර කුලුනු ඉදිකිරීම පිණිස ස්ථාන සෙවීම සඳහා තාක්ෂණික පරීක්ෂණ පැවැත්විණි.

මහනුවර, මොණරාගල, බදුල්ල, පුත්තලම, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, කෑගල්ල, නුවරඑළිය, ගල්ල සහ වෙනත් තොරගත් දිස්ත්‍රික්ක ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතියේ (දත්ත රැස්කිරීම පිළිබඳ සමීක්ෂණ) රැස්වීම් පවත්වන ලදී.

ගමට සන්නිවේදනය
“Connect ශ්‍රී ලංකා”
ව්‍යාපෘතියේ විශේෂ අවස්ථා



4G/ෆයිබර් අධිවේගී අන්තර්ජාල සේවා ආවරණ ක්‍රියාමාර්ග සක්ෂාත් කර ගැනීම සඳහා පාර්ශවකරුවන් සමඟ සැලසුම් සැසි පැවැත්වීම




sprout





කඩිනම් ලෙස ආවරණය වැඩිදියුණු කිරීමේ මෙහෙයුම් වල සාරාංශය - 2020

"ගමට සන්නිවේදනය" ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති වැඩසටහන්

ගමට සන්නිවේදනය (Connect ශ්‍රී ලංකා) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව 4G/ෆයිබර් තාක්ෂණයෙන් සමස්ථ ශ්‍රී ලංකාවම සවිබල ගන්වයි. මෙහිදී විවිධ දුක්ෂරතා මධ්‍යයේ දුරකථන සංඥා පවතින ස්ථාන සොයා බැලීම, මාර්ගගත අධ්‍යාපනයේ නිරත ග්‍රාමීය දරුවන්ගේ දුෂ්කරතා හඳුනාගැනීම මෙන්ම එම ප්‍රදේශ වල පාසල් වල තාක්ෂණික විද්‍යාගාර සහ පන්තිකාමර සඳහා තොරතුරු තාක්ෂණ උපකරන සපයමින් පවතින සේවා කොන්දේසි වැඩිදියුණු කිරීමට බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම අවශ්‍ය කෙරේ.

ලංකාගම

සඳහා 4G ආවරණ පහසුකම් සැපයීම

ලංකාගම ගම්මානය ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සිංහරාජ වැසි වනාන්තරයේ දකුණු මායිමේ පිහිටා ඇති අතර එම ගම්මානය දැඩි ලෙස සේවා සැපයුම් ලබාගැනීමේ අභියෝගයකට මුහුණ පා සිටියි. ලංකාගම ගම්වාසීන් අතිගරු ජනාධිපතිතුමාගෙන් කළ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලබන ගමට සන්නිවේදන ව්‍යාපෘතියට සමගාමීව ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් සේවා සපයන්නන් විසින් 4G පහසුකම් ස්ථාපනය කරන ලදී. ලංකාගම ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලයට ද සුහුරු පන්ති කාමර පහසුකම් ලබාදී ඇති අතර එමඟින් නව තොරතුරු තාක්ෂණ පහසුකම් සහිතව සිසුන්ගේ කුසලතා වැඩි දියුණු කර ගැනීමට හැකිවේ. තවද මෙම සුවිශේෂී අවස්ථාවේදී වසර 18කටත් වැඩි කාලයක් පාසලේ දියුණුව වෙනුවෙන් කළ කැපවීම සඳහා විදුහල්පති සුමිත් ලාල් මහතා වෙනුවෙන් විශේෂ උපහාරයක් පිරිනමන ලදී. මේ වන විට ලංකාගම ගම්මානය අධිවේගී ජංගම සම්බන්ධතාවයෙන් සමන්විතය.












TRC
Telecom
Mobitel


Colombo




ROOM
Sri Lanka Telecom Mobitel
4G LTE


ROOM
Sri Lanka Telecom Mobitel






ලංකාගම ඩිජිටල් නවෝදය
TRC
Sri Lanka Telecom
Mobitel
HUAWEI MateBook Series



මියාගල

සඳහා 4G ආවරණ පහසුකම් සැපයීම

මොණරාගල දිස්ත්‍රික්කයේ මියාගල මූලික දුරකථන සම්බන්ධතාවයක් පවා නොතිබුණු දුෂ්කර ගම්මානයකි. ගම්වැසියන් විසින් කරන ලද ඉල්ලීම මත අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ ගමට සන්නිවේදනය කණ්ඩායම මියාගල දුෂ්කර ගම්මානයේ කළ ක්ෂේත්‍ර චාරිකාවේදී එම ප්‍රදේශයේ සන්නිවේදන් පහසුකම් නොමැති බව තාක්ෂණික කන්ඩායම තහවුරු කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් සහ ඩයලොග් සමාගම් විසින් මියාගල ප්‍රදේශය සඳහා 4G ආවරණය 2020.11.24 දින සපයන ලද අතර එමඟින් විදුලි සංදේශ සේවා සැපයීම මෙන්ම මියාගල ප්‍රාථමික විද්‍යාලයේ තොරතුරු තාක්ෂන විද්‍යාගාරයට පරිගණක, ලැප්ටොප්, රූපවාහිනි වැනි තොරතුරු තාක්ෂණ උපකරණ පරිත්‍යාග කිරීම තුලින් සිසුන්ට e-තක්සලාව විද්‍යුත් ඉගෙනුම් ක්‍රමවේදයට ප්‍රවේශවීමට සහ නැණස රූපවාහිනී වැඩසටහන නැරඹීමටද අවස්ථාව උදා වී ඇත.


















5G












6 ශ්‍රේණිය



කෙලින්කන්ද

සඳහා 4G ආවරණය සැපයීම

කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බදුරලියේ පිහිටි කෙලින්කන්ද ග්‍රාමීය ප්‍රදේශය සඳහා විදුලි සංදේශ පහසුකම් නොමැතිවීමත්, එබැවින් සිසුන් 4G ආවරණය ලබාගැනීම සඳහා පාර දෙපස රැස්වී අධ්‍යයන කටයුතු කරමින් සිටින් ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අවධානයට යොමු විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ගමට සන්නිවේදයන කණ්ඩායම සහ දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ පෞද්ගලිකවම එම ස්ථානය නිරීක්ෂණය කරන ලදී. එම ගමනේ මූලික අරමුණ වුයේ වහාම ක්‍රියාත්මක වන පරිදි 4G ආවරණය ස්ථාපනය කිරීමයි.

2020 දෙසැම්බර් 04 දින සිදු කරන ලද එම ගමනින් අනතුරුව ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් සහ ඩයලොග් සමාගම් විසින් කෙලින්කන්ද සහ ඒ අවට දුෂ්කර ගම්මාන සඳහා 4G ආවරණය ලබා දෙන ලදී.

ඒ සමඟ කෙලින්කන්ද කනිෂ්ඨ විද්‍යාලය සඳහා අංග සම්පූර්ණ තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් සඳහා මුල්ගල තැබිණි. ඊට අමතරව, පරිගණක, ලැප්ටොප් සහ චන්ද්‍රිකා රූපවාහිනී සම්බන්ධතා ද පාසල වෙත පරිත්‍යාග කරන ලදී.


DEFENDER










Divisional Secretariat
PALINDANUVARA




කෙලින්කන්ද ඩිජිට
Sri Lanka Telecom Mobitel
We Care. Always.
TRC


Regulatory Commission of Sri Lanka
LE BASE STATION ON-AIR
Powered by
Dialog
Dialog
Sri Lanka Telecom Mobitel


DONATION
SCHOOL DEVELOPMENT FUND
WP/MT/ KELINKANDA JANAPADAYA PRIMARY SCHOOL
KELINKANDA, AGALAWATTA.
Sri Lanka Telecom Mobitel




We Care. Always.
LTE
FASTEST INTERNET
WIDEST COVERAGE




Handcrafted
Enro


Sri Lanka
Telecom


FASTEST INTERNE
WIDEST COVERAG

මොරගහවැව

සඳහා 4G ආවරණ පහසුකම් සැපයීම

නවගත්තේගම, මොරගහවැව ග්‍රාමීය ප්‍රදේශයේ සිසුන්ට මාර්ගගත පන්තිවලට සහභාගී වීමේදි සිදුවන දුෂ්කරතා පිළිබඳව සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය දැනුවත් කිරීම් වලට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ‘‘ගමට සන්නිවේදනය’’ කණ්ඩායම සේවා සපයන්නන් සමඟ එම ප්‍රදේශයට ගිය අතර මොරගහවැව පාසලට 4G ආවරණය සහතික කිරීම සඳහා තාක්ෂණික සැලසුම් සකස් කරන ලදී.

එමෙන්ම සේවා සැපයුම්කරුවන් විසින් දානගහවැව විද්‍යාලයද තොරතුරු තාක්ෂණ උපකරණ මෙන්ම 4G යටිතල පහසුකම් පරිත්‍යාග කරන ලදී. පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මොරගහවැව සඳහා 4G ආවරණය ලබාදීමට තවදුරටත් ආවරණය පුළුල් කිරීමට සැලසුම් කර ඇත.
















Telecommunications Regulatory Commission of Sri Lanka
MORAGAHAWEWA MOBILE BASE STATION ON-AIR
Powered by
Dialog
COMMISSIONING OF THE
MORAGAHAWEWA BASE STATIC
Dialog
Sri Lanka
Telecom
Mobitel
We Care. Always.
Dialog
Sri Lanka
Telecom




COMMISSIONING OF THE
MORAGAHAWEWA BASE STATION
Dialog


Sri Lanka
Telecom
Mobitel
We Care. Always.






FASTEST INTERNET
WIDEST COVERAGE
4G




TONING OF THE
EWA BASE STATION
TRC


Dialog




AKIRA
INTERNET

බෙරලිහෙල

සඳහා 4G ආවරණය සැපයීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර, බෙරලිහෙල මහජනතාව විසින් කරන ලද ඉල්ලීමකට අනුව, මොබිටෙල් සේවා සැපයුම්කරු විසින් බෙරලිහැල ප්‍රදේශය ආසන්න ඇලගල්ල හවි කුලුනෙන් 4G පහසුකම ස්ථාපනය කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතියට සමගාමීව බෙරලිහැල ප්‍රදේශයේ 80% වඩා වැඩි ප්‍රදේශයක් මෙමඟින් දැන් ආවරණය කෙරේ.

බෙරලිහෙල ප්‍රදේශය සඳහ සපයන ලද 4G ආවරණ සිතියම



ආවරණය වැඩිදියුණු කිරීම පිළිබඳ තාක්ෂණික ක්ෂේත්‍ර චාරිකා වල විශේෂ අවස්ථා

සියලුම විදුලි සංදේශ සේවා සපයන්නන් සමඟ සහයෝගීත්වය ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් දිස්ත්‍රික්ක වල කරන ලද ක්ෂේත්‍ර චාරිකා මඟින් ආවරණය වැඩි දියුණු කිරීම අවසන් කර ඇත.

- හම්බන්තොට දිස්ත්‍රික්කය - බෙලිඅත්ත, වලස්මුල්ල හා ඕමාර
- මාතර දිස්ත්‍රික්කය - දෙයියන්දර, දෙනියාය, තලපලකන්ද, දෙහිගම්පොල හා පස්ගොඩ
- ගාල්ල දිස්ත්‍රික්කය - ඇල්පිටිය, බඹරවාන, උස්බිම්ජනපදය, ලියනගම කන්ද, බානගල, සමකන්ද, වලඔගල සහ පෝරවගම


ZA - 5123























“ගමට සන්නිවේදනය” ව්‍යාපෘතිය යටතේ දේශීය කෑලුනු නිෂ්පාදනය සවිබල ගැන්වීම








TANTRI







ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව, පොදු විදුලි සංදේශ සේවා සැපයීම සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව රජයට උපදෙස් ලබාදීමේ බලතල මෙන්ම විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත සියලුම කරුණු පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය හෝ ඊට අනුබද්ධිත ආයතන සමඟ සාකච්ඡා කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැවරී ඇත. විදුලි සංදේශනය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙන්ම නව තාක්ෂණයන් භාවිතා කිරීම පනතේ සඳහන් කරන ලද එක් අරමුණකි. පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම සඳහා දේශීය විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන වලට සහාය ලබාදීම මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ප්‍රශස්ත ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම අරභයා ජාත්‍යන්තර සහ දේශීය වැඩසටහන් / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශයට බලය පවරා ඇත.

ජාත්‍යන්තර සංවිධානවල කේන්ද්‍රස්ථානය වශයෙන් මෙම අංශය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), කලාපීය සහයෝගීතාව පිළිබඳ දකුණු ආසියානු සංගමය (SAARC), පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානය (CTO) ඇතුළු ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව නියාමන මෙන්ම සම්බන්ධීකරණ කටයුතු සිදු කරන අතර විදුලි සංදේශ අංශයේ සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරයි.

කාර්යයන්

ප්‍රතිපත්ති

- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත නියාමන කරුණු පිළිබඳ උපදෙස් ලබා දීම.
- විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන වල සහාය ඇතිව විදුලි සංදේශනය ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම සඳහා මූල්‍ය සහාය ලබාදීම.
- ග්‍රාමීය ප්‍රදේශවල ශිෂ්‍යයන් හා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ප්‍රජාවන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් හෝ ජාත්‍යන්තර ආයතනවල සහාය ඇතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ජාත්‍යන්තර සම්බන්ධතා

- විවිධ ජාත්‍යන්තර සංවිධාන සඳහා කොමිෂන් සභාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම [උදා. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), කලාපීය සහයෝගීතාව සඳහා දකුණු ආසියානු සංගමය (SAARC), යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සංගමය (SAFIR), සහ පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) විසින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ හා රැස්වීම් වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සම්බන්ධීකරණය කිරීම හා විවිධ ජාත්‍යන්තර සංවිධාන විසින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම.
- කොමිෂන් සභාව තුළ ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙන තොරතුරු සංසරණය කිරීම.
- කොමිෂන් සභාව / විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් / වෙනත් රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණය ඇතිව අදාල දත්ත රැස්කිරීම හා වාර්තා කර ගැනීම හා ජාත්‍යන්තර ආයතන සඳහා සමීක්ෂණ / ප්‍රශ්නාවලි ආශ්‍රිත තොරතුරු ලබාදීම.

2020 වර්ෂයේ කාර්ය සාධනය

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනය 2019/20

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශන හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නව තාක්ෂනයන් භාවිතා කිරීමට මෙන්ම පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරනු ලබයි. මෙන්ම නව තාක්ෂණයන් හා. ශ්‍රී ලංකා රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන විසින් සිදු කරනු ලබන විදුලි සංදේශනය ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය මූල්‍ය ආධාර සපයයි. විදුලි සංදේශ ක්ෂේත්‍රයට පවත්නා අදාළත්වය සැලකිල්ලට ගනිමින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති දෙකක් තෝරාගෙන ඇති අතර එම ව්‍යාපෘතිය පහත දැක්වේ. අදාළ පර්යේෂණ කණ්ඩායම් විසින් 2020 වර්ෂය සඳහා පහත සඳහන් පර්යේෂණ අධ්‍යයනයන්හි දී මූලික ඉදිරිපත් කිරීම් සහ ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ වැඩසටහන් දෙකක් සම්පූර්ණ කර ඇත.

- "Fast Uplink Grant- යාන්ත්‍රික මාදිලියේ සන්නිවේදනය සඳහා කෘතිම බුද්ධි පද්ධතියේ අනුවර්තනය" ආචාර්ය සී. කේ. ඩබ්ලිව්. සෙනෙවිරත්න, විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුව, රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය. මෙම අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රධාන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක (IEEE GlobeCom 2020) ප්‍රකාශයට පත් කර ඇත.

- "සුලු ගංවතුර ව්‍යාප්තිය සම්බන්ධ තීරණ ගැනීම සඳහා නාගරික ප්‍රදේශවල වැව් හා ඇළ ජල මට්ටම තත්‍ය කාලීනව අධීක්ෂණය කිරීම". ජේ.කේ. ජයවර්ධන, සන්නිවේදන අංශය, නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු හා සන්ිනවේදන තාක්ෂණ ස්වේච්ඡාදායක වැඩසටහන 2020

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය, විශේෂ අවශ්‍යතා සහිත/ආන්තික කණ්ඩායම් සවිබල ගැන්වීම සහ ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපනය නංවාලීම සඳහා වැඩසටහන් කිහිපයක් සංවිධානය කර තිබේ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) /ජාතික කොරියානු තොරතුරු නියෝජිතායතනයේ (NIA) අන්තර්ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (IIV) වැඩසටහන ග්‍රාමීය පාසල්වල සිසුන් හා විශේෂ අධ්‍යාපනයේ නිරත ගුරුවරුන්, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ජාතික තොරතුරු නියෝජිතායතනයේ (NIA) සහාය ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ එක් පියවරකි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පසුගිය වසර 8 තුළ මාස 3 ක් දක්වා වූ කාලපරාසයක් සඳහා කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සේවකයන් 100 කට අධික ප්‍රමාණයක් රට පුරා අනුයුක්ත කර ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහ පෙන්වීම ඇතිව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා සේවකයින් යෙදවීම හා ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම මගින් නියමු ව්‍යාපෘතියක් ලෙස දේශීය තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහනක් පසුගිය වසරේදී සංවිධානය කරන ලදී. විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශවල සිටින ගුරුවරුන් සහ සිසුන් අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්ව විද්‍යාලවල මෙන්ම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය පුහුණු අධිකාරිය සහ විශ්ව විද්‍යාලවල සහයෝගීත්වයෙන් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහ පෙන්වීම ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාතයන්තර විදුලි සංදේශ සංගමයේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ප්‍රතිව්‍යුහගත කරමින් නියමු ව්‍යාපෘතියක් ලෙස දේශීය තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන පසුගිය වසරේ සංවිධානය කරන ලදී. විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශවල සිටින ආන්තික ප්‍රජාවන් සහ සිසුන් අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය පුහුණු අධිකාරිය සහ විශ්ව විද්‍යාල මෙන්ම දුරකථන ක්‍රියාකරු සමාගම් වල ද සහාය ඇතිව මෙම වැඩසටහන සංවිධානය කර ඇත. වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) විසින් නිර්දේශ කරන ලද NVQ මට්ටම 4 හෝ 5 (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ජාතික සහතිකය) සමත් වූ සිසුන් 33 දෙනෙකු මෙම වැඩසටහන සඳහා තොරතුරු හා සන්ිනවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයින් වශයෙන් තෝරා ගන්නා ලදී. මෙම ස්වේච්ඡා සේවකයන්ට ආරම්භක කඳවුරක් හරහා මාසයක් පුහුණු කරන ලදී. පළමු මාසය තුළ ඔවුන් පරිගණක වැඩසටහන්කරණය, වෙබ් යෙදුම් සංවර්ධනය සහ අධ්‍යාපනික අංශ පිළිබඳව පුහුණු කරන ලදී. ඉන්පසුව, ඔවුන් මාස දෙකක් සඳහා අනුරාධපුර, පොලොන්නරුව, කළුතර සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පාසල් 16 ක් සඳහා (එක් පාසලකට එක් ස්වේච්ඡා සේවකයෙකු බැගින්) අනුයුක්ත කරන ලදී. දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහනේ ප්‍රතිලාභීන් අතර සිසුන් 300 කට අධික සංඛ්‍යාවක් සහ ගුරුවරුන් කිහිප දෙනෙකු ඇතුළත් වන බව වාර්තා වේ.

2019 වසරේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන සමාලෝචනය කිරීමේදී ස්වේච්ඡා සේවකයන්ගේ සේවා කාලය දීර්ඝ කරන ලෙස පාසල් කිහිපයකින් ඉල්ලීම් ඉදිරිපත් විය. එබැවින්, සේවය ලබා ගත හැකි සහ නිර්දේශිත ස්වේච්ඡා සේවකයන්ගේ (පස් දෙනෙකුගේ) සේවය 2020 වසරේදී ද තවදුරටත් මාස දෙකක කාලයක් සඳහා ලබා ගන්නා ලදී. පැවරුම අවසානයේ සෑම ස්වේච්ඡා සේවකයෙකුගේම ක්‍රියාකාරී සහභාගීත්වය අගය කරමින් සහතිකයක් ප්‍රදානය කරන ලදී. එමෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයින් ඉලක්කගත ප්‍රතිලාභීන් ලෙස සලකනු ලැබුවේ මෙම වැඩසටහන තුළින් ඔවුන් ලබාගත් පළපුරුද්ද / අත්දැකීම් ඔවුන්ට වඩා හොඳ රැකියා අවස්ථා සොයා ගැනීමට ඉවහල් වන බැවිනි. මෙම දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාප්ති විෂමතාවය අවම කිරීම සඳහා පුහුණුව ලබා දී සේවය ලබා ගැනීමේ ප්‍රධාන වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

විදුලි සංදේශ කුලුනු කාර්මික වැඩසටහන

විදුලි සංදේශ කුලුනු කාර්මික වැඩසටහන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) , ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහයෝගයෙන් ආරම්භ කරන ලදී. ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සහ විෂයමාලා සංවර්ධනයට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, අනුමැතිය ලබාදීමේ කටයුතු මේ වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ක්‍රියාත්මක කරමින් පවතී.

විදුලි සංදේශ සමීක්ෂණ සහ වෙනත් ප්‍රශ්නාවලි

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය 2020**

  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ඉල්ලීම මත පදනම්ව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල හා දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව ලෝක විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන

තාක්ෂණ දර්ශක පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ලැබුණු සමීක්ෂණ දත්ත එක්රැස් කර, සම්පාදනය කර, නියමිත කාල සීමාවන් තුළ ඉදිරිපත් කර ඇත. ලෝකය පුරා රජයන්, ජාත්‍යන්තර සංවිධාන, සංවර්ධන බැංකු සහ පෞද්ගලික අංශයේ විශ්ලේෂකයින් විසින් පුළුල් ලෙස රඳා පවතින බැවින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා ගෝලීය දත්ත එක්රැස් කිරීම / යාවත්කාලීන කිරීම සමීක්ෂණයේ පරමාර්ථය විය . සපයන ලද දත්ත ලෝක විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාන ප්‍රකාශන සහ ලෝක බැංකු ප්‍රකාශන යනාදිය යාවත්කාලීන කිරීමට භාවිතා කරන ලදී.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගෝලීය සයිබර් ආරක්ෂණ සමීක්ෂණය**

  ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය (GCI) ප්‍රශ්නාවලිය යනු ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) සහ ටෙක් සර්ටිහි (Tech CERT) සහාය ඇතිව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලද තවත් සමීක්ෂණයකි. එමෙන්ම ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය (GCI) යනු සයිබර් ආරක්ෂාව සඳහා රටවල් දක්වන කැපවීම මැනීම සඳහා වන එක් එක් රටෙහි සංවර්ධන මට්ටම නෛතික මිනුම්, තාක්ෂණික මිනුම්, ආයතනික මිනුම්, ධාරිතා වර්ධනය සහ සහයෝගීතාව යන කාණ්ඩ පහ යටතේ විශ්ලේෂණය කරනු ලැබේ.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ -D කණ්ඩායමේ ලෝක විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණ 2020**

  ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශ සංවර්ධන කාර්යාංශයේ (BDT) වාර්ෂික ලෝක විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණය යනු ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජික පරිපාලන රාජ්‍ය වලින් පළමු වරට තොරතුරු රැස් කිරීම සඳහා හඳුන්වා දුන් මෙවලමකි. මෙම සමීක්ෂණය මගින් පුළුල් පරාසයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සහ නියාමන ගැටළු ආවරණය කරන අතර නවතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සහ පරිණාමයන් සොයා ගැනීමට අපට ඉඩ සලසයි. මෙම අංශය විසින් වෙනත් අංශවලින් සමීක්ෂණ දත්ත එක්රැස් කිරීම හා සම්පාදනය කිරීම සඳහා සාකච්ඡා හා රැස්වීම් සංවිධානය කළ අතර නියමිත කාල සීමාව තුළ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත සවිස්තරාත්මක සමීක්ෂණ ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. වාර්ෂික ලෝක විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියාමන සමීක්ෂණ මගින් රැස්කරන දත්ත ITU Eye platform සහ ITU ICT Regulatory Tracker වෙතින් ලබා ගත හැකිය.

- **ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය(ITU) / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (APT) අධ්‍යයන කණ්ඩායම් ප්‍රශ්නාවලිය සහ වෙනත් සමීක්ෂණ**

  මෙම අංශය දුරකථන ක්‍රියාකරු සමාගම් / වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ දත්ත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ අතර එකතු කරන ලද තොරතුරු එක්රැස් කිරීම / සම්පාදනය කිරීම සිදු කිරීමෙන් පසුව පහත සමීක්ෂණය හා ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන ලදී.

  - ආතර් සී ක්ලාක් නවීන තාක්ෂණ ආයතනය (ACCIMT) තිරසාර සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය පිළිබඳ සමීක්ෂණය: රාජ්‍ය අංශයේ සංවිධාන අතර විද්‍යුත් ධාරා හා විභවයන් භාවිතය පිළිබඳ ජාතික සමීක්ෂණය
  - දකුණු ආසියානු විදුලිසංදේශ නියාමකයින්ගේ සංගමයේ WG ප්‍රතිපත්ති, නියාමනය සහ සේවාවන් ආශ්‍රිත ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය.
  - ආසියානු සහ පැසිෆික් කලාපයේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධනය ආශ්‍රිත ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සමීක්ෂණය.

ජාත්‍යන්තර විදුලි සංදේශ නියාමන සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ITU, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - APT, පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය - CTO, දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය - SATRC සහ SAFIR) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

කෝවිඩ් -19 තත්ත්වය හේතුවෙන් අන්තර්ජාතික සංවිධාන විසින් සිය සාමාජික රටවලට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය අඛණ්ඩව පවක්වාගෙන යාමට සහ මාර්ගගත රැස්වීම් ඔස්සේ අදාළ වැඩසටහන් සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා දීමටත් දිරිගැන්වීය. මෙම සන්දර්භය තුළ, මෙම අංශය විසින් අදාළ ජාත්‍යන්තර ආයතන සම්බන්ධීකරණය කරගෙන අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පහත සඳහන් වැදගත් වැඩසටහන් සඳහා සහභාගී කරවීමට සැලසුම් කර ඇත.

1. 2020 ජුනි 22 වන දින "කෝවිඩ්-19 වසංගතය තුළ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ට ඇති අභියෝග" පිළිබඳව ආසියානු ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 4 වන වෙබ් සංවාදය.

   අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ අධ්‍යක්ෂ / ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා මෙම වෙබ් සංවාදයට සහභාගී වූ අතර අපගේ අත්දැකීම් මෙන්ම කොවිඩ් -19 ට ප්‍රතිචාර වශයෙන් ගත් පියවර සම්බන්ධ කරුණුද හුවමාරු කර ගන්නා ලදී. මෙම වසංගතය තුළ ශ්‍රී ලංකාවේ සාර්ථකත්වයන් සහ උගත් පාඩම් පිළිබඳව සෙසු නියාමකයින් අවධාරණය කරන ලද අතර ඒවා අගයන ලදී.

2. "කොවිඩ් -19 තුළ ලෝකයේ වෙළඳ, තාක්ෂණ හා නවෝත්පාදන" පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ (CTO) රැස්වීම, 2020 ජුනි 25, මාර්ගගත, ලන්ඩන්, එක්සත් රාජධානිය.

3. 2020 ඔක්තෝබර් 27 සිට 28 දක්වා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ - දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සිලයේ (APT-SATRC-21) 21 වන රැස්වීම.

   අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන් කිහිප දෙනෙක් මෙම රැස්වීමට සහභාගී වූහ. අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් රැස්වීම් සැසි දෙකක් සඳහා මණ්ඩලයේ සාමාජික සභිකයකු ලෙස සිය දායකත්වය ලබා දුන්නේය.

4. පාකිස්තානු විදුලි සංදේශ අධිකාරිය සහ ඉන්දියානු විදුලි සංදේශ නියාමන අධිකාරිය වැනි දකුණු ආසියානු කලාපයේ අනෙකුත් විදුලි සංදේශ නියාමකයින් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීම.

   විශේෂයෙන් පවතින දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තොරතුරු හා අත්දැකීම් හුවමාරු කර ගැනීම පිණිස ඉන්දියානු විදුලි සංදේශ නියාමන අධිකාරියේ (TRAI) සභාපති සමඟ එක් මාර්ගගත රැස්වීමක් සහ පාකිස්තානු විදිලි සංදේශ අධිකාරිය සමඟ මාර්ගගත රැස්වීම් දෙකක් සංවිධානය කරන ලදී. අනාල ර විශේෂයෙන් අංක අතේ ගෙන යා හැකි හැකියාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු හා අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා PTA සභාපති සමඟ මාර්ගගත සාකච්ඡා දෙකක් සංවිධානය කරන ලදී.

5. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල් (චීනය, දකුණු කොරියාව සහ ජපානය) සමඟ මාර්ගගත සාකච්ඡා පැවැත්වීම. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සහයෝගීතාවයට අදාළ කරුණු පිළිබඳව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල (දකුණු කොරියාව සහ ජපානය) අමාත්‍යාංශ සහ නියාමකයින්ගේ ඉහළ පෙළේ නිලධාරීන් සමඟ මාර්ගගත සාකච්ඡා පවත්වන ලදී.

6. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගෝලීය සයිබර් ඩ්‍රිල් (CyberDrill) 2020

   ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගෝලීය සයිබර් ඩ්‍රිල් 2020 මාර්ගගත සැසි මාලාවට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ නිලධාරීන් කිහිප දෙනෙකු සහභාගී වූහ.

7. මහා සභාවේ 15 වන සැසිවාරය (2020 දෙසැම්බර් 2 සිට 5 දක්වා) සහ කළමනාකරණ කමිටුවේ 44 වන සැසිය (2020 දෙසැම්බර් 7-10)

   මහා සභාවේ 15 වන සැසිවාරයේදී (2020 දෙසැම්බර් 2 සිට 5 දක්වා) සහ කළමනාකරණ කමිටුවේ 44 වන සැසිවාරයේදී (2020 දෙසැම්බර් 7-10) ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා නියෝජිත පිරිස සහ ලිපිලේඛන සංවිධානය කිරීම සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහලේකම් සහ නියෝජ්‍ය මහලේකම් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම.

8. සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ මාර්ගෝපදේශ, IPV6 ක්‍රියාත්මක කිරීම සහ නව බලපත්‍ර රාමුව පිළිබඳ විශේෂඥ සහායක වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සමඟ මාර්ගගත සාකච්ඡා පැවැත්වීම.

ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් සංවිධානය කරන ලද ධාරිතා වර්ධනය හා පුහුණු වැඩසටහන්

මෙම අංශය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ SAFIR ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් ආයතනයේ නිලධාරීන් සඳහා ධාරිතා වර්ධනය හා පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම් සිදු කරමින් දැනුම බෙදා ගැනීමේ සැසි ද සංවිධානය කර ඇත

උසස් පුහුණු කමිටුවේ අනුමැතිය ඇතිව 2020 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් 11 ක්, සම්මන්ත්‍රණ 3 ක් සහ වැඩමුළු/රැස්වීම් 3 ක් සඳහා සහභාගී වීමට අදාළ කොමිෂන් සභාවේ නිලධාරීන් නම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වයන්

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) , ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) , දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) සහ යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සම්මේලනයේ (SAFIR) සාමාජිකයෙකි. මෙම සංවිධානවල සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික පදනම්න් දායක මුදල් ගෙවනු ලැබේ. එකී ජාත්‍යන්තර සංවිධාන සඳහා සාමාජික ගෙවීම් පහත වගුවේ දක්වා ඇත.

*වගුව **14:** ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වයන්*

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU)	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT)	පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO)
CHF 159,000 2020 මාර්තු	USD 15,420 2020 මාර්තු	GBP 25,000 2020 ජූලි

විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍යතාක්ෂණික සහාය, විශේෂඥ සහාය, ව්‍යාපෘති, වැඩසටහන් සහ සාමාජිකත්ව අවස්ථා මෙම ජාත්‍යන්තර සංවිධානවලින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණි.

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2020

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) පිහිටුවීම සනිටුහන් කරමින් සෑම වසරකම මැයි 17 වන දින ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) සමරනු ලැබේ. ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සමාජ ආර්ථික සංවර්ධනය හා තොරතුරු තාක්ෂණ වයාප්ති විෂමතාවය අවම කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගත හැකි ආකාරය පිළිබඳ ගෝලීය දැනුවත්භාවය ඇති කිරීමයි. 2020 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව වූයේ “Connect 2030: තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය” (SDGs) යන්නයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සිය සාමාජික රටවලට ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීම හා Connect 2030 න්‍යාය පත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කරන ලෙස ආරාධනා කළේය.

මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීම සඳහා මෙම අංශය අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය. ඊට අමතරව, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම් තුමා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ විශේෂ පණිවුඩ අපගේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

අනුකූලතා සහ විමර්ශන අංශය

සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ කාර්යක්ෂම, දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවාවක් සැපයීමට වගබලා ගැනීමයි. මෙම කාර්යයේදී, විශ්වාසනීය, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන්ගේ නියාමන බැඳීම් ආශ්‍රිත පැමිණිලි විසඳීම පිණිස අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගත යුතුය. මෙම අවශ්‍යතාවය මුදුන්පත් කර ගැනීමේදී විදුලි සංදේශ කර්මාන්තය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ උචිත නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අවශ්‍ය කෙරේ. පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පාරිභෝගිකයන් සෑහීමකට පත්වන ආකාරයෙන් ඔවුන්ගේ ගැටළු වලට සාධාරණ විසඳුම් ලබාදීම මෙන්ම ප්‍රජාවගේ අවශ්‍යතාවයන් වලට සරිලන ප්‍රශස්ථ සේවාවක් සැපයීම සහ විදුලි සංදේශ සේවා පද්ධතිය භාවිතා කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළු සමස්ථයක් වශයෙන් සියළුම පැතිකඩ වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ. මෙම වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා සහ විමර්ශන අංශය විසින් මෙහෙයවනු ලබයි.

සේවා තත්වය (QoS) ඒකකය

කාර්යයන්

- බලපත්‍රයේ සඳහන් කර ඇති සේවා තත්ත්ව ප්‍රමිති සහ පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) අන්තර් සම්බන්ධිය ගිවිසුම් වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න පිරික්සීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) ජාල කාර්ය සාධනය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සකස් කරන ලද සේවා තත්ත්ව පරාමිති ඉලක්කගත අගය සාක්ෂාත් කර ගැනීම පිරික්සීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන් විසින් හඩ සේවා සඳහා මිනුම්ගත සේවා තත්ත්ව පරාමිති අගයන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විගණනය කල අගයන් අතර සන්නස්දනාත්මක වාර්තාවක් පිළියෙල කිරීම.
- කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැන ගැනීම පිණිස පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් (PSTN) අතර සන්සන්දනාත්මක වාර්තාව බෙදා හැරීම.
- කාලානුරූප විගණන සිදු කිරීම මගින් පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් සකස් කළ සේවා තත්ව කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාව ඇගයීම.
- විදුලි සංදේශ සේවාවල සේවා තත්වය සඳහා නීති සහ රෙගුලාසි පිළියෙල කිරීම.
- මූලික මට්ටමේදී සේවා තත්ත්ව අධීක්ෂණය හා විගණනය කිරීම මෙන්ම ග්‍රාහකයින්ට ලබා දී ඇති සේවා තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ සාකච්ඡා කිරීම.

2020 වර්ෂයේ කාර්ය සාධනය

- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් (PSTN) මගින් ලැබෙන මාසික සේවා තත්ව වාර්තා සැලකිරීම් විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී සේවා තත්ත්ව පරාමිතීන් වැඩිදියුණු කිරීම පිණිස ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීම.
- සියළු කාර්තූන් සඳහා අවශ්‍ය සන්සන්දනාත්මක වාර්තා පිළියෙල කිරීම සහ කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැනගැනීම පිණිස පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් අතර වාර්තා බෙදා හැරීම සහ කාර්යසාධන මැනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් ජාල කවුළු මගින් ලබා ගන්නා කාර්ය සාධන මිනුම් දත්ත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දෙනු ලබන සමීකරණය ප්‍රකාර ගණනය කිරීම් සිදුකර, සේවා තත්ත්ව පරාමිතින් ආකාරයෙන් වාර්තාව නැවත ලබාදීම හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල නිරීක්ෂණය කිරීම සහ ගණනය කිරීමේ ක්‍රමවේදය නැවත ඇගයීම සහ සේවා තත්ත්ව පරාමිතින් ගණනය කිරීම පිණිස ජාල කවුළු මගින් සකස් නොකරන ලද දත්ත ලබා ගැනීම.

ආවේක්ෂණ ඒකකය

කාර්යයන්

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

නිකුත් කළ බලපත්‍ර නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව පොදු ස්ථිවිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් කටයුතු කරන බව පිරික්සීම.

- පනතේ 21 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයේ කොන්දේසි පිළපදින්නේ ද යන්න පිරික්සීම හා කොන්දේසි වලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- බලපත්‍රලාභී පොදු ස්ථිවිකරණ දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබාදීම පාලනය කිරීම පිරීක්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග අනුමත කිරීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීති විරෝධී ලෙස දුරකථන ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සහ අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- බලපත්‍රලාභී වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ බලපත්‍රයේ නියමනයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳව අනාවරණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ වෙළඳ බලපත්‍රයක් රහිතව නීති විරෝධී ආකාරයෙන් වෙළෙන්දන් විසින් විදුලි සංදේශ උපකරණ විකිණීම පිරික්සීම සහ විමර්ශන පැවැත්වීම මෙන්ම කිසියම් නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් වෙළඳපලේ අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- අනුකූලතා ක්‍රියාකාරකම් වලට අදාලව නීති සහ රීති පිළියෙල කිරීම.
- ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) සක්‍රීය උපකරණ මෙරටට ආනයනය කිරීම විධිමත් කිරීම.
- දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් සිම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ, විමර්ශන කටයුතු සිදු කිරීම සහ අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- විවිධ විදුලි සංදේශ සේවා සැපයීම සඳහා පනතේ පවත්නා විධිවිධාන යටතේ බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2020 වර්ෂයේ කාර්ය සාධනය

- වෙළෙන්දන් විසින් මාදිලිය අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීමේ අවස්ථා 7 ක් පිළිබඳ පරීක්ෂණ අවසන් කර ඇත.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබා දුන් අවස්ථා 4 ක් පිළිබඳ පරීක්ෂණ අවසන් කර ඇත.
- දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් 17 වන වගන්තියේ බලපත්‍ර කොන්දේසි පිළිපදින්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා විමර්ශන 13 ක් සිදු කර ඇත.
- වෙළෙන්දන් විසින් 21 වන වගන්තියේ බලපත්‍ර කොන්දේසි පිළිපදින්නේ ද යන්න පිරික්සීම සඳහා දිස්ත්‍රික්ක අටක විමර්ශන සිදු කරන ලදී.
- විදුලි සංදේශ සේවා සැපයීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- සිම්කාඩ්පත් සම්බන්ධ ගැසට් නිවේදනයට අනුව ග්‍රාහකයින් නැවත ලියාපදිංචි කිරීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් පියවර ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා භෞතික විගණන තුනක් (03) සිදු කර ඇත.
- ග්‍රාහකයින්ට ලබා දෙන අයක්‍රම පැකේජවල අයකිරීම් යාන්ත්‍රණයන් පිළිබඳව විගණන 16 ක් (16) සම්පූර්ණ කර ඇත.

විමර්ශන සහ බුද්ධිමය කටයුතු

කාර්යයන්

- තාක්ෂණික බාධාවන් සහ සියලු අනවසර භාවිතයන් අවම කිරීම සඳහා නීති රීති වලට අනුකූල වීම සහ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග විමර්ශනය කිරීම.
- ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ ආරක්ෂාව පිළිබඳ රජයේ නියෝගයන්ට අනුකූල වීම සඳහා නියාමන ක්‍රියාමාර්ග පිළිබඳ බුද්ධිමය සහ විමර්ශන කටයුතු සිදු කිරීම.
- බලතල, කාර්යයන් සහ රාජකාරිය ඉටු කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධ ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා අවශ්‍ය යැයි සිතිය හැකි උපදේශන ආයතන හරහා බුද්ධිමය උපදෙස් ලබා දීම.

2020 වර්ෂයේ කාර්ය සාධනය

- පොලිසියේ / රහස් පොලිසියේ ඉල්ලීම් මත ඔවුන්ගේ පරීක්ෂණ සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

- විදුලි සංදේශ සේවා නීති විරෝධී ලෙස පවත්වාගෙන යාම පිළිබඳ තාක්ෂණික විමර්ශන සිදු කිරීම.
- ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI) සත්‍යාපනය කිරීමේ විසඳුම් ඇතුලත් සිම් උපකරණ / විකුණුම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම.
- නීති විරෝධී DTH / කේබල් රූපවාහිනී සේවා සපයන්නන් අවම කිරීම.
- සයිබර් හිරිහැර පැමිණිලි කළමනාකරණය කිරීම.

පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීම

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (1996 පනතින් සංශෝධිත) පනත ප්‍රකාරව, විදුලි සංදේශ සේවා ග්‍රාහකයකු හෝ මහජන සාමාජිකයෙකු දුරකථන ක්‍රියාකාර සමාගමක් සපයන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කල විටෙකදී කොමිෂන් සභාවට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට බලය පවරා ඇත.

යම් විමර්ශනයක් පැවැත්වීමේදී ඒ පැමිණිල්ලට හේතුවූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවේදී පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථා වලදී මුදල් සහන සලසන ලෙසද විධාන කළ හැකිය.

කාර්යයන්

විදුලි සංදේශ සේවා ආශ්‍රිතව ඕනෑම මහජන සාමාජිකයකුගෙන් හෝ ග්‍රාහකයකුගෙන් ලැබී ඇති පැමිණිලි මෙහෙයවීමේ කටයුතු සිදු කරනු ලැබේ. එවැනි පැමිණිලි විශ්ලේෂණය කර අවශ්‍ය නිර්දේශ සහිතව අදාළ සේවා සැපයුම්කරු වෙත යොමු කරනු ලැබේ. පාරිභෝගික සම්බන්ධතා ඒකකය සේවා සැපයුම්කරු සමඟ එක්ව මේ සම්බන්ධයෙන් කටයුතු කරන අතර පැමිණිලිකරුට සාධාරණවූත්, යුක්තිසහගතවූත් විසඳුමක් ලබා දීමට අවශ්‍ය පියවර ගනී. සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන විසඳුම පිළිබඳව පැමිණිලිකරු සෑහීමකට පත් නොවන්නේ නම්, එවැනි අවස්ථාවලදී නියෝජ්‍ය අධ්‍යක්ෂ අනුකූලතා (පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීම) මැදිහත්වීමෙන් ගැටළුව සාකච්ඡා කිරීම පිණිස දෙපාර්ශවයටම රැස්වීමක් සංවිධානය කරනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දෙපාර්ශවයම සමථයකට පත්වන විසඳුමකට එළැඹීමට පහසුකම් සපයයි.

එම පරිශ්‍රමය ව්‍යවර්ථ වන්නේ නම් එවැනි පැමිණිලි පාරිභෝගික පැමිණිලි විසඳීමේ අභ්‍යන්තර කමිටුව වෙත යොමු කරනු ලැබේ.

2020 වසරේ කාර්යසාධනය

අස්ථානගත වූ ජංගම දුරකථන සඳහා ඉල්ලීම් මෙහෙයවීම

ඉහත සේවාවට අමතරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාරිභෝගිකයින්ගේ අස්ථානගත වූ ජංගම දුරකථන සොයාදීමේ ක්‍රියාවලියේ මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියා කරමින් කොමිෂන් සභාවට දෛනිකව ලැබෙන පැමිණිලි දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත යොමු කරන අතර ඒ පිළිබඳ ලැබෙන ප්‍රතිචාර අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කරනු ලැබේ.

දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී, දුරකථන භාවිතය මෙන්ම අනෙකුත් අදාළ කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් වීමේ වැදගත්කම නිරීක්ෂණය විය. එබැවින් පුළුල් පරාසයක දැනුවත් කිරීමේ වැඩසටහන් සමාජයට ඵලදායී සේවාවක් සපයයි. විදුලි සංදේශනය සදාචාරාත්මකව භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කළ යුතු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තරයේ විශ්වාස කරයි. නියාමන ආයතනය වශයෙන් එම සමාජීය වගකීම පිළිබඳව අප සැලකිලිමත් වන්නෙමු.

1. පොලිස් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන
   සම්පත් දායකයකු වශයෙන් කටාන ජාතික පොලිස් ඇකඩමිය, කළුතර පොලිස් පුහුණු විද්‍යාලය, මිරිහාන පොලිස් ස්ථානය, කොළඹ විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව යන ස්ථානවල දේශන පවත්වන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීති රාමුව තුළ ප්‍රධාන තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී/ ගුවන් විදුලි වැඩසටහන් පවත්වා ඇත.
2. පොස්ටර්, අත් පත්‍රිකා, ස්ටිකර්ස් මඟින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන
   ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සන්නිවේදනය යහපත් ආකාරයෙන් භාවිතා කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම උදෙසා පොස්ටර් සහ අත්පත්‍රිකා හා ස්ටිකර් සකස් කර ඇත. සියළුම දුම්රිය ස්ථාන, පොලිස් ස්ථාන, පාසල්වල පෝස්ටර් බෙදා හරින ලද අතර ස්ටිකර්ස් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී.

නීති අංශය

සමාලෝචනය

නීති අංශය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉතා වැදගත් කාර්යභාර්යයක් ඉටු කරනු ලබන අතර, සියළුම නෛතික හා නියාමන කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් ලබා දීම සිදු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවෙකු වන සියලුම නඩු කටයුතු මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලබයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා නීති අංශයේ කාර්යභාරය වැදගත් වේ. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන නියාමන කටයුතු වලදී සෘජුවම සම්බන්ධ වන නෛතික උපදෙස් සම්පාදනය කිරීම නීති අංශයේ වගකීම වේ.

කාර්යයන්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීති අංශයේ ප්‍රධාන වගකීම් සහ කාර්යභාරයන් වන්නේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නීති, රීති, රෙගුලාසි සහ ප්‍රමිතිවලට අදාලව ප්‍රාථමික සහ ද්විතියික නීති සම්පාදන කෙටුම්පත් කිරීම, නීති අර්ථ නිරූපනය කිරීම, නීති උපදෙස් ලබාදීම සහ නීති සමාලෝචනය කිරීමයි.එමෙන්ම බලපත්‍රලාභීන්, පාර්ශවකරුවන්, විවිධ අමාත්‍යාංශ මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ විසින් යොමු කරන කරුණු පිළිබඳ නීතිමය උපදෙස් සැපයීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විවිධ නියාමන කරුණු සහ නීතිමය කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය වන අවස්ථා වලදී නීති අංශය කොමිෂන් සභාවට උපදෙස් ලබාදෙයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවකු වන ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණය සහ කම්කරු විනිශ්චය සභාව වැනි අධිකරණවල ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් මැදිහත්ව ක්‍රියා කරයි.

2020 වසරේ කාර්ය සාධනය

කෝවිඩ් -19 හේතුවෙන් රට අගුලු දමා තිබියදීත් 2020 වසරේ දී නීති අංශය කොමිෂන් සභාවේ බොහෝ නියාමන කාර්යන්හී දායක විය.

වර්ණාවලි ගැටළු, වෙළඳ බලපත්‍ර ගැටළු, දුරකථන ක්‍රියාකරු සමාගම්වල ජාල ආශ්‍රිත කරුණු සහ ස්ථාවර, ජංගම සහ කේබල් රූපවාහිනී සේවාවන් බලපත්‍රයේ 17 වන වගන්තියට අනුකූලව පවත්වාගෙන යාම සඳහා නීතිමය යෙදවුම් ලබා දෙන ලදී.

පාරිභෝගික ගැටළු විසඳීම සඳහා පැමිණිලි කිහිපයක් සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දී ඇත.

පොලිස් විමර්ශන වලට සහාය වීමේ ව්‍යාපෘතියක් වශයෙන් අපරාධ විමර්ශනයට අදාළ අධිකරණ නියෝග 346 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධයෙන් 2020 වසරේ දී නීති අංශය විසින් කටයුතු කර ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනය සපුරාලීම සඳහා වර්තමාන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට නව සංශෝධන සම්පාදනය කිරීමට නීති අංශය විසින් කටයුතු කරමින් සිටියි.

නඩු කටයුතු

විදුලි සංදේශනය ආශ්‍රිත නඩු හයක් සමථයකට පත් කිරීම සහ සේවකයින් දෙදෙනෙකු සේවයෙන් පහ කිරීම සම්බන්ධ කරුණු ඇතුළුව 2020 වසරේ දී නීතිමය කරුණු අටක් අවසන් කරන ලදී. බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීම, සංඛ්‍යාත වර්ණාවලීය පැවරීම, 17 වන වගන්තියේ පද්ධති බලපත්‍ර සම්බන්ධයෙන් අධිකරණවල විදුලි සංදේශ

නියාමනයන්ට අදාළ නඩු විභාග වෙමින් පවතී. 2020 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව නඩුවක් ගොනු කර ඇත

විශේෂ ව්‍යාපෘති අංශය

සමාලෝචනය

විශේෂ ව්‍යාපෘති අංශය ජාතික යහපතට මං සැලසෙන ව්‍යාපෘති මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා වගකියනු ලැබේ.

අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් විදුලි සංදේශ කර්මාන්තය වැඩි දියුණු කිරීම මෙන්ම වැඩිදුරටත්, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්ෂණයන් හඳුන්වාදීමට ඉවහල්වන පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

කාර්යයන්

- කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානයේ (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයීය නව ගොඩනැගිල්ල ප්‍රධාන ගොඩනැගිල්ලේ දිගුවක් ලෙස සංවර්ධනය කිරීම.
- කදිරානා සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම.
- වාහන නැවැත්වීමේ පහසුකම සහිතව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් මත නෙළුම් කුලුන 02 වන අදියර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම.

2020 වසරේ කාර්ය සාධනය

2020 වර්ෂයේදී විශේෂ ව්‍යාපෘති අංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

නගරය කේන්ද්‍රගතව පිහිටි විකාශන කුලුනු ලෝකයේ සියළුම සංවර්ධිත නගරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන වැඩසටහන් ඉදිරිපත් කිරීමට සහයවීම සහ විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම එවැනි ජාලවල ප්‍රධාන අරමුණ වේ.

එක් දිශාවක සිට,තනි ඇන්ටනාවක් භාවිතා කර, විකාශන සංඥා නිසි ලෙස භාර ගැනීම මහජනතාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර, එවැනි සංවර්ධනය කිරීම් මගින් විකාශන සමාගම් වලට සිය යටිතල පහසුකම් හුවමාරු කර ගැනීමට ඉඩ සැලසීමත් සමඟ ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ මෙහෙයුම් වියදම් අඩුවීම විකාශන සමාගම් වලට ලැබෙන ප්‍රතිලාභ අතර ප්‍රධාන වේ.

නගරය කේන්ද්‍රගතව ස්ථාපිත විකාශන කුලුනු මගින් නගරයේ ක්ෂිතිජයට අලංකාර පෙනුමක් ලැබෙන අතර, කොළඹ නගරයේ පවත්වනා ගැටළුවක් වන, අහස උසට නැගුනු විකාශන කුලුනු මෙමගින් අවම වීම නිසා නගරයේ අහස් ක්ෂිතිජයේ දර්ශනීය බව වැඩිදියුණු වීමට ඉවහල් වී ඇත.

නගරය කේන්ද්‍රගත සංකේතයක් බවට පත්වී ඇති විකාශන කුලුනු නගර මධ්‍යයේ ස්ථාපනය කරනු ලබන අතර ඉඩම් වටිනාකම් ඇතුලු සංවර්ධන පිරිවැය බොහෝ දුරට ඉහල අගයක් ගනියි. එබැවින් ආයෝජනයන් තහවුරුකර ගනිමින් සහ අවශ්‍ය ආදායම සහතික කර ගනිමින් කුලුනු සංකීර්ණයේ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා කුලුනු සංකීර්ණයේ මෙහෙයුම් පවත්වාගෙන යාම පිණිස ඉහල උන්නතාංශ නැරඹුම් මැදිරි, ආපන ශාලා, සාප්පු සංකීර්ණ වැනි ආකර්ශනීය ස්ථාන රැසක් එකතු කරනු ලැබේ.

කොළඹ නෙළුම් කුලුනේ ප්‍රධාන ආකර්ශනීය ස්ථාන

- කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල දර්ශන අත්විඳිය හැකි පරිදි නරඹන්නන් සඳහා ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි.
- උත්සව ශාලා දෙකක් -විවාහ මංගල උත්සව, සමාජ සහ ආයතනික කටයුතු.
- විශේෂ අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම, භෝජනශාලා මෙහෙයුම්වලට සහාය කර ගැනීම පිණිස රජයේ තානායම .
- විශාල සාප්පු සංකීර්ණ සහ ආහාර භෝජනාගාර.
- කැරකෙන අවන්හල.
- කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශවල ඩිජිටල් වීඩියෝ විකාශන සේවා, ශ්‍රව්‍ය විකාශන සෙවා සැපයිය හැකි ඇන්ටනා කුලුනු, ඇනලොග් විකාශන පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම, එෆ්.එම් නාලිකා 50, ඩිජිටල් වීඩියෝ විකාශන සේවා 50 සේවා සැපයිය හැකි විකාශන කුලුනු.
- මහජනතාවට විවේකය ගතකළ හැකි පරිදි වාහන නැවැත්වීමේ පහසුකම් සහිත විශාල උද්‍යානයක්.

වගුව 15: කොන්ත්‍රාන්තු සාරාංශය

සේවා දායකයා (ආයෝජක)	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
කොන්ත්‍රාත්කරු	CEIEC සහ ALIT
කොන්ත්‍රාත් වර්ගය	සැලැස්ම සහ ගොඩනැගිල්ල
ව්‍යාපෘති ඉංජිනේරු	මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය
කොන්ත්‍රාත් මුදල	ඇමරිකානු ඩොලර් මිලියන 104.3 .
ආරම්භ කරන ලද දිනය	2012 නොවැම්බර් 16
කොන්ත්‍රාත් ව්‍යපෘතිය අවසන් කරන දිනය	2017 ඔක්තෝම්බර් 31 (දින 912 මූල් ඉදිකිරීමේ කාලය + ශ්‍රී.වි.සං.නි.කොා.ස. ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමේ කාලය)
ප්‍රධාන කොන්ත්‍රාත්කරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට අපේක්ෂිත තාවකාලික දිනය	2019 දෙසැම්බර් 31

ප්‍රස්ථාරය 12: සැලසුම් කරන ලද හා තථ්‍ය ප්‍රගතිය සහ ඉලක්ක සම්පූර්ණ කරන දිනය රහිතව අඛණ්ඩ ප්‍රගතිය



2020 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය



වගුව 16: නෙළුම් කුලුනේ වැඩවල ප්‍රගතිය

විස්තරය	සම්පූර්ණ කරන ලද ප්‍රමාණය %
ඇන්ටනා ආධාරකය	100%
ආධාරක පාදම පිරිසිදු කිරීම සහ පින්තාරු කිරීම	99%
කුලුනු ශීර්ෂය සවි කිරීම	99.9%
කුලුනු බඳ පින්තාරු කිරීම	100%
අභ්‍යන්තර අලංකරණය	99%
කුලුනු ශීර්ෂයට විදුලිය සැපයීම	98%
කුලුනු ශීර්ෂයට (ගිනි,ජලය)	98%
කුලුනු ශීර්ෂයට ජලය සැපයීම සහ ජලාපවාහනය	100%
කුලුනු පාදම විදුලිය සැපයීම	100%
කුලුනු පාදම විදුලිය සැපයීම හා ජලාපවාහනය	100%
බාහිර විදුලි සැපයුම	100%
කුලුනු පාදම ඉහල	100%
කුලුනු ශීර්ෂය,පාදම සහ බඳ ආලෝකකරණය	100%
විදුලි සෝපාන සහ විදුලි පියගැටපෙල	98%
ගොඩනැගිලි කළමණාකරන තොරතුරු පද්ධතිය	80%



වගුව 17: කොළඹ නෙළුම් කුලුනේ කාර්යයන්වල සාරාංශය

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය	කාර්යසාධනය
කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම	කැබිනට් අනුමත ගනුදෙනු කිරීමේ කමිටුවක් පත් කිරීම. සුළු අඩුපාඩු නිවැරදි කිරීම සහ පරීක්ෂා කිරීම. ප්‍රධාන දෝෂ නිවැරදි කිරීම. Force majeure was reported. COC සඳහා අයදුම්කිරීම ක්‍රියාත්මක කිරීම. අතිරේක අපවහන සම්බන්ධතාවය ඉල්ලා සිටීම. නඩත්තු ගිවිසුම කෙටුම්පත් කිරීම. පුහුණු ලියකියවිලි කෙටුම්පත් කිරීම. පොදු ස්ථානවල ගිනි හයිඩ්‍රන්ට් පෙට්ටි ප්‍රතිස්ථාපනය කිරීම. වෘත්තීය වන්දි රක්ෂණ ආවරණයට අදාළ වැඩවලට මුදල් ගෙවීම සම්බන්ධයෙන් PCU උපදේශනය දීර්ඝ කිරීමේ අමාත්‍ය මණ්ඩල කැබිනට් පත්‍රිකාව සමාලෝචනය කරමින් පවතී.
නෙළුම් කුලුන-PCU උපදේශන ගාස්තුව	කොමිෂන් සභා තීරණයට අනුව, PCU විසින් ව්‍යාපෘති නිම කිරීමේ කාලසටහන ඉදිරිපත් කරන තෙක් PCU උපදේශන සේවාව දීර්ඝ කරන ලදී.
කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය වාණිජකරණය කිරීම	සමාගම ස්ථාපනය කිරීමේ අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලයට සටහනක් ඉදිරිපත් කිරීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවේ අදහස් සහ උපදෙස් ලබා ගන්නා ලදී. කොළඹ නෙළුම් කුලුනේ වටිනාකම තක්සේරු කිරීම. ගිනි පොම්ප, ABB පැනල් (demo මගින්) , විදුලි උත්පාදක යන්ත්‍ර, විදුලි සෝපාන, සිසිල් ජල පද්ධතිය, VRV පද්ධතිය, VAV පද්ධතිය, ගිනි ආරක්ෂණ පොම්ප සහ ජලනල පද්ධතිය සඳහා PCU විසින් සමාලෝචනය කරන ලද නඩත්තු ගිවිසුම් ලැබුණි. කොළඹ නෙළුම් කුලුනේ වාණිජකාර්ණ කටයුතු ආරම්භ කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ කුලුන භාර ගැනීම සඳහා වෙන්වූ කණ්ඩායමක් පත් කරන ලදී. මෙම කණ්ඩායමට අමතරව, විෂය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රවීනයන්ගෙන් සමන්විත ස්වෙච්ඡා කණ්ඩායමක් විසින් කුලුනේ වාණිජකරණ සැලැස්ම සහ උපායමාර්ග සකස් කිරීමේ කටයුතු වල නිරත වන ලදී.
පරීක්ෂාව සහ ඉදිකිරීම	සුළු අඩුපාඩු නිවැරදි කිරීමේ නිරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. ප්‍රධාන දෝෂ නිවැරදි කිරීම් වල නිරත වීම (තිර බිත්ති ජල කාන්දුවීම් ආදිය) FDAC, BMS, CCTV පද්ධතිය, භූමි දර්ශක සහ Aces පාලන පද්ධතිය පරීක්ෂා කිරීම. දුර්වල විද්‍යුත් පද්ධතිය, මධ්‍යම වායු සමීකරණ BMS පුහුණු සටහන් සමාලෝචනය කිරීම. DEMO ආයතනයේ නිර්දේශ ප්‍රකාරව දෛනික කාර්යයක් වශයෙන් විදුලි උකිපාදන සේවා පවත්වාගෙන යාම. එක් එක් ක්ෂේත්‍රය පිලිබඳව ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ සතිපතා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.



කොළඹ නෙළුම් කුලුනෙන් මුදල් ඉපැයීම සඳහා යෝජිත සැලැස්ම

COLOMBO

LOTUS TOWER

EPICENTER OF TECHNOLOGY



A NATIONAL EMBLEM FOR A PROUD COUNTRY

THE COLOMBO LOTUS TOWER IS THE ULTIMATE CULMINATION OF BROAD KNOWLEDGE AND HARD WORK BY PROFESSIONALS.

FOR THE VERY FIRST TIME IN SRI LANKA,
MANY FORMS OF TECHNOLOGY COME TOGETHER TO CREATE A PLATFORM FOR KNOWLEDGE AS WELL AS ENTERTAINMENT.





THE MAIN PURPOSE OF THE TOWER IS THE FACILITATION OF A SINGLE TRANSMISSION HUB FOR TELECOMMUNICATION, TV AND RADIO.

THIS CONTRIBUTES GREATLY TO THE REDUCTION OF THE CITY'S CARBON FOOTPRINT, WHILE ALSO HELP TO IMPROVE THE OVERALL QUALITY OF TRANSMISSIONS.

LOTUS TOWER

EPICENTER OF TECHNOLOGY



1. TOWER BASE
2. LOTUS TOWER PODIUM BASE
3. MAIN ENTRANCE TO PODIUM BASE
4. ENTRANCE TO PODIUM BASE-01
5. ENTRANCE TO PODIUM BASE-02
6. ENTRANCE TO PODIUM BASE-03
7. PARKING SPACE
8. SRI LANKA POST HEADQUARTERS
9. ENTRANCE AND EXIT
10. WATER FEATURE
11. LANDSCAPED AREA
12. ENTRANCE PAVILION
13. OPEN PLAZA
14. THE RIBBON OF BEIRE- WALKWAY
15. WATER SHOW AREAS
16. OBSERVATION DECK
17. JETTY
18. FLOATED DINING RESTAURANTS
19. AREA FOR PUBLIC PARK
20. TERMINAL PODIUM
21. PARKING SPACE FOR BUSSES
22. ADMIN FACILITY BUILDING
23. GYM & MANAGEMENT BUILDING
24. GARBAGE COLLECTION BUILDING

MASTER PLAN



LUXURY SUITES

(8100 sq. ft.)

ON THE LOOKOUT FOR LUXURIOUS TRENDY ROOMS OOZING WITH CHARACTER AND COMPLETE WITH A MAGNIFICENT VIEW? LOOK NO FURTHER;

FOUND ALONG THE **BEST LOCATIONS** OF THE TOWER HOUSE AT THE 239M LEVEL.

FEATURING A L**UXURIOUS** AND **COZY** INTERIOR ALL VIP ROOMS OVERLOOK AMAZING VIEWS OF THE CITY'S URBAN FABRIC.

COMFORT IS SUPREME WITHIN THESE SPACES AND WILL **CREATE LASTING MEMORIES.**











GROUND FLOOR

THE CONCEPTUAL APPROACH

THE LOTUS, WHICH IS ASSOCIATED AS AN EMBLEM IN SRI LANKAN CULTURE IS A SYMBOL OF THE LORD BUDDHA, HIS PURE TEACHINGS AND THE BUDDHIST TRADITION.

THE ESSENCE OF THE LOTUS TOWER IS CONTINUED AS INSPIRATION FOR THE GROUND LEVEL INTERIOR.

THE LOTUS FORM IN ABSTRACTS IN ENVISIONED TO SYMBOLIZE THE LORD BUDDHA AND HIS ENLIGHTENMENT IS MARVELOUSLY REPRESENTED BY THE INCORPORATION OF LIGHT.

IT IS EXPRESSED ARCHITECTURALLY, AS AN ABSTRACTED SKELETAL FORM OF THE LOTUS, AND IS ILLUMINATED AND HUNG BELOW A MIRROR CLAD CEILING TO GENERATE ENDLESS REFLECTIONS WITHIN A SPACE, CREATING A FEELING OF SELF-REALIZATION.



MAIN SPACES

ENTRANCE LOBBY

EXHIBITION GALLERY (4639sq. ft.)

SOUVENIRS SHOP (3630 sq. ft.)

FOOD COURT
(10365 sq. ft.)

VISITOR INFORMATION

L.E.D. WALL AT
ENTRANCE LOBBY

DIGITAL
TOUCH SCREEN DISPLAY

ROBOT ASSISTANTS

A.R. LOCATION MAP



THE REVOLVING RESTAURANT

GIVING YOU EVERY POSSIBLE VIEW OF THE CITY, EACH TIME YOU LOOK BEYOND.

WATCH THE COLOMBO CITY WAKE UP TO THE LUSH MORNING AND GO THROUGH THE VARIED AND EXCITING MOTIONS OF ITS DAY UNTIL THE BEAUTIFULLY ILLUMINATED EVENING SKY TAKES OVER USHERING IN THE BUSTLING CITY NIGHT GLOW WITH MILLIONS OF MOVING AND STATIONARY LIGHTS.
A VIEW LIKE NO OTHER, ALL WHILE ENJOYING THE BEST OF CUISINES.

THE BIERA LAKE, COLOMBO PORT, PORT CITY, ALL THE STANDING PINNACLES OF SKY LINE UP TO THE HORIZON OF INDIAN OCEAN.

ENJOY WATCHING THE COLOMBO PORT, THE NEW PORT CITY AND THE ENTIRITY OF THE COLOMBO SKYLINE ALIGN ITSELF TO THE HORIZON OF THE INDIAN OCEAN



SEE THE CITY OF COLOMBO IN 90 MINUTES

224 PAX

THE FINEST CUISINE

(9300 sq. ft.)



OBSERVATION DECK

360⁰ VIEW OF THE COLOMBO COMMERCIAL CITY FABRIC.

A VIEW OF ALL THE PINNACLES OF COLOMBO'S SKYLINE AGAINST A BACKDROP OF THE FRESH INDIAN OCEAN.

SKY IS THE LIMIT FOR WHAT CAN BE SEEN.

SURE TO BE THE NEXT SOCIAL MEDIA SENSATION IN SRI LANKA. #LOTUS

SKY LOUNGE / INTERNAL OBSERVATION DECK

(10365 sq. ft.)



SOVENIRSHOP

A VAST ARRAY OF SOUVENIRS THAT BRING OUT THE RICH HERITAGE AND CULTURE OF THE ISLAND ARE AVAILABLE HERE, RANGING FROM TRADITIONAL FOOD ITEMS TO INDIGENOUS AYURVEDIC AROMATICS AND COSMETIC ITEMS.




Sounir shop - Colombo Lotus Tower









FIRST FLOOR

AS ONE OF THE FASTEST GROWING ECONOMIES IN THE WORLD, SRI LANKA NOW OPENS ITS DOORS TO BRING IN THE LATEST TECHNOLOGICAL EXPERIENCES FOR ITS CITIZEN.



- INNOVATION CENTER (6888 sq. ft.)
- ESPORTS AREA (5252 sq. ft.)
- DIGITAL BANKING AREA (1483 sq. ft.)
- COFFEE LOUNGE (4183 sq. ft.)
- DIGITAL ART MUSEUM (2300 sq. ft.)
- 7D CINEMA (1097 sq. ft.)

TOWER HOUSE

THE LOTUS PETALS CONCEAL WITHIN THEM NINE FULLY FURNISHED, LUXURIOUS FLOORS / NINE FULLY FURNISHED FLOORS
LIE WITHIN THE BEAUTIFUL LOTUS PETALS OF THE FLOWER.



RESTAURENT & BANQUET HALL

SPECIAL EVENTS FOR 350 PAX CAN BE ACCOMMODATED IN THE SPECIAL RESTAURANT OR THE BANQUET HALL FEATURING AN UNIQUE ILLUMINATIVE INTERIOR DESIGN AND THE PANORAMIC VIEW OF COLOMBO'S COMMERCIAL CITY FABRIC FROM BEYOND THE 360^0 GLASS FACADE.

(9600 sq. ft.)







TOWER BASE ROOF TERRACE

(15564 sq. ft.)





LET'S SHARE THE GRAND EXPERIENCE AND TOGETHER, WE MAKE THE WORLD.



VIEW FROM LOTUS TOWER OBSERVATION DECK.

WELCOME TO...

THE COLOMBO LOTUS TOWER

SRI LANKA IS AN ISLAND LIKE NO OTHER AND DESIRES
CONTINUED PEACE AND SEEKS DEVELOPMENT.
THE LOTUS FLOWER SYMBOLIZES
PURITY, ENLIGHTENMENT AND HONESTY TO ALL SRI LANKANS.

IT IS A FUSION OF REALITY AND THE IDEAL AND IS ALSO
THE PERFECT COMBINATION OF THE PAST AND THE FUTURE.

THE LOTUS FLOWER WHICH IS
THE INSPIRATION BEHIND THE COLOMBO LOTUS TOWER,
SYMBOLIZES SRI LANKA'S FLOURISHING DEVELOPMENT.




SOUVENIR SHOP
(3630 sq. ft.)





ENTRANCE & TICKETING PAVILION

LOCATED ALONG THE ENTRANCE PATH OF THE LOTUS TOWER, THIS SECTION CREATES A POCKET, AND MAKES ONE PAUSE IN THEIR JOURNEY.

OBSERVATION DECK TICKETING FACILITIES WILL ALSO BE LOCATED IN THE PAVILION.

THE AREA SEMI-ENCLOSED WITH WHITE PANELS AND GLASS, MAKES ONE FOCUS TOWARDS THE LOTUS TOWER, WHICH IS VISIBLE THROUGH THE SKYLIGHT ALONG THE PAVILION.

නෙළුම් කුලුන අදියර 02 ව්‍යාපෘතිය - වාහන නැවතුම් පහසුකම සහිතව මිශ්‍ර සංවර්ධනය

කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය ආශ්‍රිතව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම දිගු කාලීනව සියළුම පාර්ශවකරුවන්ට එහි ප්‍රතිලාභ උපරිම කර ගැනීම ඉතා වැදගත් වන අතර කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට ප්‍රදේශයේ පවත්නා සංවර්ධිත නොවූ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් ඒකාබද්ධව සංවර්ධනය කිරීමෙහි ලා විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වැනි අදාළ රාජ්‍ය ආයතන සමග කටයුතු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ප්‍රශස්ත අවස්ථාවක් උදාවෙන අතර, එමගින් ඉදිරි වසර 75 කාලය තුළ මෙම සමස්ථ ප්‍රදේශය මහජන ආකර්ශණයට ලක් වූ ප්‍රදේශයක් බවට පත් වනු ඇත. කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට පවත්නා සියලුම අක්‍රමවත් සංවර්ධනයන් එහි දිගුකාලීන සාර්ථකත්වයට දැඩි බලපෑමක් වෙනු ඇත.

ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ වත්මන් තත්ත්වය

- කොළඹ නෙළුම් කුලුන සංකීර්ණයට යාබද ඉඩම විනෝස්වාදය සපයන පහසුකම් සහිතව බහුකාර්ය රථගාල සංකීර්ණයක් ලෙස වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පියවර ගෙන ඇත.
- අමාත්‍ය මණ්ඩලය විසින් ඉඩම වෙන් කිරීම දැනටමත් අනුමත කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම අත්පත් කර ගැනීම සහ පැවරීම සඳහා වග කියනු ලැබේ.
- ඉදිකිරීම් මෙහෙයුම් හා පැවරුම් (BOT) පදනම මත කොළඹ නෙළුම් කුලුනට යාබද ඉඩම සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තීරණය කර ඇත.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා සංවර්ධන නිර්නායක සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා සම්මුති කමිටුවක් සහ ව්‍යාපෘති කමිටුවක් පත් කිරීමට අනුමැතිය ඉල්ලා ආරක්ෂක අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.
- ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. නීති අංශය යටතේ මෙම ක්‍රියාකාරකම අඛණ්ඩව සිදු කෙරේ.

හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය

අමාත්‍ය මණ්ඩලය විසින් 2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පදනම් කරගෙන 2012 ජූලි 04 දින පවත්වන ලද අමාත්‍යය මණ්ඩල රැස්වීමේදී එළැඹී තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව KPMG විගණන ආයතනය විසින් සකස් කරන ලද අතර තිරසාර පදනම මත වාණිජමය වශයෙන් ලාභ ලැබිය හැකි ව්‍යාපෘතියක් බවට පත් කිරීමෙහිලා වාණිජමය හවුල්කරුවන් සහ බදුකරුවන් සොයා ගැනීමේ වගකීම සහිතව අනුග්‍රාහක නියෝජිතායතනය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRPC) ව්‍යාපෘති ඉංජිනේරු වශයෙන් පත්කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2014 ජූලි 11 දින සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත වැඩබිම බාර දෙන ලද අතර ඉදිකිරීමේ වැඩ 2016 අගෝස්තු 11 දින ආරම්භ කරන ලදී. කොන්ත්‍රාත්තු කාලය දින 730 කි.

සැලසුම්කර ඇති පරිදි, 2015 ජූනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කල ආකාරයට ආරම්භවී නොතිබූ බැවින්, එය තොරතුරු තාක්ෂණ උද්‍යානයෙන් අපේක්ෂිත විවිධ ආදායම් උත්පාදන හැකියාවන් කෙරෙහි අහිතකර අන්දමට බලපානු ඇති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙකී ව්‍යාපෘතිය ආශ්‍රිත කරුණු පරීක්ෂා කරන ලද අතර එම ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා ඉදිකිරීම් අවසන් කිරීමට තීරණය කෙරිණි.

මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව(SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතුවල නිරත වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එළැඹුණු කොන්ත්‍රාත්තුව අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉංජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමගවූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි.

2020 දෙසැම්බර් 31 දින වන විට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතියේ තත්වය

ව්‍යාපෘතිය බෙරුම්කරණය යටතේ පවතින අතර පවත්නා නීතිමය කරුණු මත නීති අංශය විසින් අනුමැතිය නිකුත් කළ පසුව එහි කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා පස්මහල් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කර ඇත. මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය ඉහත ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙකු

වශයෙන් පත්කරන ලදී. ව්‍යාපෘති උපදේශන ඒකකය සෙසු ගොඩනැගිලි දෙකට යාවන පාලම් සහිතව පවතින ප්‍රධාන ගොඩනැගිල්ලට ඇමුණුමක් වශයෙන් වානේ ව්‍යුහය සහිත ගොඩනැගිල්ල සැලසුම් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් සමස්ථ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 502 අරමුදලක් අනුමත කර ඇත. විස්තරාත්මක ප්‍රමාණාත්මක බිල්පත ප්‍රකාරව ඇස්තමේන්තුව, මුළු ඉදිකිරීමේ ඇස්තමේන්තු පිරිවැයේ 5% උපදේශන ගාස්තුව ඇතුලත්ව, ශ්‍රී ලංකා රුපියල් මිලියන 344 කි.

නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පරමාර්ථ අරමුණ සහ ප්‍රතිලාභ

මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ පහත දැක්වේ.

- නියාමන සේවා ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත දිනපතා පැමිණෙන පොදු මහජනතාව, සහ ක්‍රියාකරු සහ විකාශන සමාගම් සඳහා වඩා ප්‍රශස්ත සහ කාර්යක්ෂම සේවා පහසුකම් සැපයීම.
- ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සහ අවශ්‍යතාවයන් සැපයීම.
- කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පිරිවැය ඉතිරි කිරීමේ අරමුණ ඇතිව පරිශ්‍රය තුල රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ පහත දැක්වේ.

- මහජනතාව සඳහා වඩා ප්‍රශස්ථ සේවාවක් සැපයීම පිණිස එක් එක් අංශ ඵලදායි ලෙස ප්‍රතිසංවිධානය කිරීම.
- මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා වඩා උචිත ස්ථානයක් සැපයීම.
- ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම් දේපල නිසි ලෙස පරිහරණය කිරීම

ව්‍යාපෘතියේ ප්‍රගතිය

***වගුව 18:** කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය*

විස්තරය	% සම්පූර්ණ කිරීම
පිරවීම	100%
වානේ ව්‍යුහය	100%
කොන්ක්‍රීට් වැඩ	90%
විදුලිය වැඩ	30%
ජලනල වැඩ	50%
තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්	20%
පින්තාරු කිරීම හා නිම කිරීම	45%

***වගුව 19:** ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ සාරාංශය*

නව කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය	2020 වසරේ ප්‍රගතිය
ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම	සනීපාරක්ෂක උපකරණ, ටයිල් සඳහා අනුමැතිය
උපදේශන ගාස්තු	පඩිපෙළ, වායුසමීකරණ පද්ධතිය වැනි සැලසුම් වැරදි සමාලෝචනය කරන ලදී. දැනටමත් හඳුනාගෙන ඇති BOQ වැරදි සමාලෝචනය කිරීම. වැසිකිළි බ්ලොක්, ආවරණ හා පිවිසුම් ලොබිය සම්පූර්ණ කිරීමේ ඉදිරි කටයුතු පිළිබඳ මූලික සාකච්ඡා පැවැත්වීම. නව කාර්යයන් සඳහා ලංසු ලේඛන පිළියෙල කිරීම පිළිබඳ මූලික කටයුතු සිදු කිරීම. පාලම් ඉදිකිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබීම. බිම් කොන්ක්‍රීට් කිරීම අවසන් කරන ලදී, බිත්ති කපරාරු කිරීම සහ කුඹල් බැඳීම, විදුලි රැහැන් ඇදීම, කේබල් කිරීම, වහලේ වැඩ කිරීම. විදුලි සෝපාන භාරදීම, ගරාදි වැට සවිකිරීම. මෙහෙයුම් කටයුතු සිදුකිරීමට භාර දීම පිණිස ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කිරීම සඳහා රැඳී සිටීම..









කදිරාන ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

කලාපීය මට්ටමින් UHF/VHF ගුවන් විදුලි සංඛ්‍යාත විශ්ලේෂණ අවශ්‍යතාවයන් මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් HF (අධි සංඛ්‍යාත) පිරික්සීමට සහ දිශා නිර්ණය කිරීම සපුරාලීම පිණිස කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිරික්සුම් සහ දිශා - නිර්ණය කිරීමේ උපකරණ සහ පද්ධතිවලින් සමන්විත වී ඇත. මෙම මධ්‍යස්ථානය අධිසංඛ්‍යාත පිරික්සීම සහ දිශාව නිර්ණය කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලියාපදිංචි වී ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතියක් යටතේ Rohde සහ Schwarz විසින් සපයන ලද උපකරණ සහ පද්ධති ක්‍රියාත්මක කරමින්, 2000 දශකයට පෙර කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ඉහල ප්‍රමිතියකින් යුතු පිරික්සුම් මධ්‍යස්ථානයක් බවට වැඩි දියුණු කරන ලදී. ස්වාධීන අංග සම්පූර්ණ ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථානයක් වශයෙන් කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ නිල කාර්යයන් සිදු කිරීම පිණිස එක් ඉංජිනේරුවරයකු සහ විදුලි සංදේශ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත පරිපාලන කාර්ය මණ්ඩලයක් සේවය කරන අතර, ජංගම සංඛ්‍යාත පිරික්සුම් ආවේක්ෂණ රථයක් (MFMSV) සහ ඩබල් කැබ් රථයකින් ද සමන්විතය. ප්‍රධාන කාර්යාලයේ හදිසි කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් නිසා මීට වසර කිහිපයකට පෙර ප්‍රධාන කාර්යාලයේ බලධාරීන්ට මෙම මධ්‍යස්ථානය ඵලදායී ලෙස මෙහෙයවන ලද කාර්යමණ්ඩලය සහ වෙන් කරන ලද වාහන නැවත ගෙන්වා ගැනීමට සිදු විය.

ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති යටතේ 2000 දශකය ආරම්භයේදී ලබාගත් භෞතිකමය සහ පිරික්සුම් උපකරණ පසුගිය දශකය පුරා ක්‍රමිකව යල් පැන ගිය තත්ත්වයට පත් විය. මහජනතාව විසින් පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩම අනවසරයෙන් අල්ලා ගන්නා ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය විසින් ඉතිරි ඉඩම් කැබැල්ල (අක්කර 53 ක් පමණ) සඳහා පිරික්සුම් මධ්‍යස්ථාන මායිම් සීමාකිරීමට තීරණය කරන ලදී. ඉතිරි ඉඩම් කැබැල්ල ආරක්ෂා කිරීම පිණිස ඉඩමෙන් ගලන ඇල මාර්ගය ඔස්සේ වෙන් වූ ස්ථාන දෙක සම්පූර්ණ කිරීමෙන් තොරව ආරක්ෂක තාප්පයක් ඉදි කරන ලදී. මෙම ආරක්ෂක තාප්පයේ කොටසක් කඩා වැටීමට ආසන්න අතර වැසි ජලය ගලා යාම සඳහා ඉඩකඩ සැලසීම පිණිස ගම්වාසීන් විසින් එම තාප්පයේ ස්ථාන කිහිපයකට හානි කර ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද අධි සංඛ්‍යාත දිශා නිර්ණය කිරීමේ (HFDF) පද්ධතිය හැර සෙසු උපකරණ භාවිතා කළ හැකි කාලය, නව තාක්ෂණයට අනුකූලවීම, නවීන පිරික්සුම් විශේෂාංග පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම යන කරුණු නොසලකා හරිමින් තවමත් භාවිතයේ පවතී. එමෙන්ම පවත්නා දේශීය සහ ජාත්‍යන්තර වැදගත්කම නිසා ප්‍රමුඛතාවය දිය යුතු කරුණක් ලෙස සලකා 2015 වසරේදී අධි සංඛ්‍යාත දිශා නිර්ණය කිරීමේ පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන ලදී.

පසුගිය දශකය පුරා නොසලකා හැර තිබූ ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත පහසුකම් නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතුව ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රධාන භූගෝලීය විෂය ක්ෂේත්‍ර වලට ඉවහල් කර ගැනීම පිණිස මෙහෙයුම් පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා දීප ව්‍යාප්ත පදනමක් මත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. එබැවින් කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ප්‍රාදේශීය කාර්යාලයක් ද වනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු ලියකියවිලි, ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ නිර්මාණ ඉදිරිපත් කරන ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයෙන් ඉල්ලා සිට ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තාක්ෂණික, පරිපාලන සහ සහායක කාර්ය මණ්ඩලයක් සහිතව කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථාන පරිශ්‍රයේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. එබැවින්, කාර්ය මණ්ඩලයේ නවාතැන් පහසුකම් සැලකිල්ලට ගෙන ස්ථීර ප්‍රාදේශීය කාර්යාලයක් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය කෙරේ. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ සැලකිය යුතු කොටසක් විවිධ පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බැවින් වැඩි දුරටත් ඉඩම බලෙන් අල්ලා ගැනීමෙන් මුදා ගැනීම පිණිස ඵලදායී පියවර ගැනීම වැදගත්ය. එමෙන්ම ශක්තිමත් ආරක්ෂක තාප්පයක් ඉදි කිරීම සහ ආරක්ෂක මුර පොලක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත නවීකරණයන් සහ ඉදිකිරීම් යෝජනා කෙරේ.

i. පවත්නා ආරක්ෂක පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම.
ii. පවත්නා ලේඛනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
iii. අනවශ්‍ය ගරාවැටුන ගොඩනැගිලි ඉවත් කිරීම.
iv. පවතින සම්මන්ත්‍රණ ශාලාව සහ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.
v. පවතින නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.
vi. පවතින පිරික්සුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.
vii. ආරක්ෂක තාප්පය සම්පූර්ණ කිරීම සහ අවශ්‍ය පාලම් ඉදිකිරීම.
viii. නව කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම.
ix. ආරක්ෂක මුරපොල ස්ථාපනය කිරීම (අභ්‍යන්තර පාරවල්වල නව ප්‍රවේශ ගේට්ටුව, ආරක්ෂක කටයුතු සඳහා වැඩබිම අවට ඇවිදීමේ මංතීරු)
x. චතුර ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම.

පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම පිණිස මෙම අවශ්‍යතාවයන් මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදී. ක්ෂේත්‍ර වැඩබිම පරීක්ෂා කිරීමෙන් අනතුරුව මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන කමිටුව

විසින් ව්‍යාපෘතියේ ඉංජිනේරු සඳහා වන 5% උපදේශන ගාස්තුව රහිතව ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 වටිනාකමකින් යුත් ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි සැලසුම්, ලංසු ලියකියවිලි සහ ඉංජිනේරු ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.

මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සහ පරමාර්ථ පහත දැක්වේ:

- කදිරාන ප්‍රාදේශීය කාර්යාලය පුළුල් කළ යුතු බැවින් අපේක්ෂිත කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- වැඩබිමේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම.
- පිරික්සුම් උපකරණ සඳහා ආරක්ෂක ඉඩකඩ සැපයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වර්තමානයේ පවත්නා අධික වැඩ කොටස් අවම කරමින් වඩා ප්‍රශස්තව සහ කාර්යක්ෂම නියාමන සේවා සැපයීම. යෝජිත කදිරාන කාර්යාලය කටුනායක ගුවන්තොටුපලේ සිට දිවයිනට පැමිණෙන සිය විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් නිශ්කාශන ලිපි ලබා ගැනීමට අවශ්‍ය මගීන්ට මෙන්ම මීගමුව සහ ඒ අවට ප්‍රදේශවල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් සංඛ්‍යාත බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය තැනැත්තන්ට පහසු ස්ථානයක් කිරීම.
- දේශීය / ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා ස්ථානය සැපයීම.
- අනවසරයෙන් ඉඩම අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා කිරීම.

මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල පහත දැක්වේ:

- ප්‍රාදේශීය කාර්යාලය මගින් මහජනතාව සඳහා ඵලදායී සහ විමධ්‍යගත වූ සේවා සැපයීම.
- බලපත්‍ර කොන්දේසි වඩා ඵලදායී ආකාරයෙන් බලාත්මක කරමින් ප්‍රාදේශීය මට්ටමින් අවහිරතාවයන් සහ දෛනික පිරික්සුම් ක්‍රියාකාරකම් වල නිරතවීම.
- නීති විරෝධී ආකාරයෙන් සංඛ්‍යාත පරිහරණය කරන්නන් හඳුනා ගැනීම පිණිස ධාරිතාවය ඉහළ නැංවීම.
- මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා සුදුසු ස්ථානයක් සැපයීම.
- ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම සහ දේපල නිසි ලෙස පරිහරණය කිරීම.

ව්‍යාපෘතියේ ප්‍රගතිය

වගුව 20: කදිරාන ප්‍රතිසංස්කරණ හා නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය

විස්තරය	සම්පූර්ණ කිරීම
කඩා දැමීමේ වැඩ	100%
පැරණි ගොඩනැගිල්ල නවීකරණය කිරීම	100%
නව ගොඩනැගිල්ලේ අත්තිවාරමේ වැඩ	100%
නව ගොඩනැගිල්ලේ සිවිල් ඉදිකිරීම්	70%
විදුලි වැඩ	20%
ජලනල වැඩ	50%
පින්තාරු කිරීම හා නිම කිරීම	50%

ඉංජිනේරු නිර්දේශිත විචලනය මත පදනම්ව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගත යුතු ගිවිසුම් ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම හා නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, කාර්යයේ විෂය පථය අවසන් කරනු ලැබේ. මෙහෙයුම් කටයුතු සඳහා භාර ගැනීමට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු සඳහා භාර ගැනීමේ අපේක්ෂාවෙන් පසුවේ.

කදිරාන ප්‍රතිසංස්කරණ හා නවීකරණ ව්‍යාපෘතිය





පර්යේෂණ ව්‍යාපෘති සංවර්ධනය

පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති දෙක මෙම වසරේ දී ආරම්භ කර ඇත.

1. ආපදා පූර්ව අනතුරු ඇඟවීම් සහ කළමනාකරණ පද්ධතිය සංකල්පය වැඩිදියුණු කිරීම.
    - ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී.
    - පවතින කෝවිඩ්-19 තත්වය හේතුවෙන් සැලසුම් කළ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය.
    - මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ.
2. විදෙස් නිෂ්පාදකයින්ගේ සහ පර්යේෂණ ආයතනවල සහයෝගීත්වයෙන් ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාලවල පර්යේෂණ විද්‍යාගාර ස්ථාපනය කිරීමේ ශක්‍යතාවය පිළිබඳ පර්යේෂණය
    - මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගිගාහර්ට්ස් 26.5 සංඛ්‍යාත පරාසය භාවිතා කරන ලෙස මොරටුව විශ්ව විද්‍යාලයට දැනුම් දෙන ලදී.
    - නමුත් මොරටුව විශ්ව විද්‍යාලය විසින් ගිගාහර්ට්ස් 3.4 සිට ගිගාහර්ට්ස් 3.6 සංඛ්‍යාත පරාස ඉල්ලා ඇත.
    - විශ්ව විද්‍යාලය විසින් ඉල්ලා සිටින ලද සංඛ්‍යාත පරාස මුදා හැරීමට නොහැකි බැවින්, පර්යේෂණ විද්‍යාගාරවල ප්‍රයෝජනය සඳහා විකල්ප සංඛ්‍යාත පරාස ලබා දීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මොරටුව විශ්ව විද්‍යාලය සමඟ අඛණ්ඩව සාකච්ඡා කරමින් සිටී.

පාලන, මානව සම්පත්, ආයතනික කටයුතු සහ සැලසුම් අංශය

සමාලෝචනය

සමස්ථ ආයතනයේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා මෙම අංශයේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර එහි විෂය පථය පුළුල් කාර්යය පරාසයකින් සමන්විත වේ. පරිපාලනය මෙහෙයවීම, මානව සම්පත් කළමනාකරණය සහ සේවකයින්ට සිය කාර්යයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා හිතකර භෞතික පරිසරයක් නිර්මාණය කිරීම වැනි අංශ මෙයට ඇතුළත් ය.

මීට අමතරව, මෙම අංශයේ විෂය පථය ආයතනික කටයුතු, සැලසුම් සහ අධීක්ෂණය, ආයතනයේ අංශ මෙන්ම පරිබාහිර ආයතන සම්බන්ධීකරණය , කාර්යාල අවශ්‍යතා සහ කාර්ය මණ්ඩලයට ආධාරක පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහතික කිරීම, පුස්තකාල පහසුකම් සැපයීම සහ ආයතනයේ වැදගත් සිදුවීම් පිළිබඳ මාධ්‍ය ආවරණයන් ලබා දීම දක්වා විහිදී ඇත.

කාර්යයන්

- මානව සම්පත් කළමනාකරණය සහ පොදු පරිපාලනය සම්බන්ධයෙන් නීති රීති, චක්‍රලේඛ, රෙගුලාසි සහ පටිපාටි පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථිර කිරීම, කාර්ය සාධන ඇගයීම, උසස් කිරීම,නිවාඩු වාර්තා, පැමිණීම,ස්ථාන මාරු, විනය පාලනය, සේවයෙන් නිදහස් කිරීම හා විශ්‍රාම ගැන්වීම සම්බන්ධ සියළුම කටයුතු සිදු කිරීම.
- කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම.
- අදාල ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ උපදෙස් සහිතව එක් එක් තනතුරු සඳහා රැකියා පිරිවිතරයන් සැපයීම ඇතුළුව කොමිෂන් සභාව සඳහා කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.
- මානව සම්පත් සංවර්ධන අයවැය පිළියෙල කිරීම.
- දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සම්බන්ධීකරණය කිරීම, සහ අවශ්‍ය චාරිකා සංවිධානය කිරීම, ලියාපදිංචි කිරීම සහ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය සෙසු කටයුතු පිළියෙල කිරීම.
- ආරක්ෂක සේවා,පවිත්‍රතා සේවා, ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම මෙන්ම යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදුලිය, ජලය සහ දුරකථන සේවා වැනි උපයෝගී සේවා කාර්යක්ෂමව සැපයීමට වග බලා ගැනීම.
- වාහන සංචිතය නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ මගින් සිදු කරන කාර්යයන් සඳහා නිසි සහයෝගය ලබා දීම.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය බලතල පැවරීම ප්‍රකාරව ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම.
- භාණ්ඩ පිළිබඳ ලේඛනය සහ ලේඛණාගාරය පවත්වාගෙන යාම.
- වාර්ෂිකව වත්කම් පිළිබඳ සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සහ අවශ්‍ය නොවන සහ අබලි ද්‍රව්‍ය අයිතමයන් බැහැර කිරීම.
- වෘත්තීමය හිතකරභාවය සහ සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා සපුරාලීමට වග බලා ගැනීම.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.
- කාර්ය මණ්ඩලය සඳහා වන ජීවිත ආරක්ෂණ සහ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සේවා සැපයීම පිණිස සුභසාධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ දුක්ගැනවිලි සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම , ආයතනික සැලැස්ම , ප්‍රගති සමාලෝචන වාර්තාව හා වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තුවේ විමසන ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම, විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යාවසායක කමිටුව (COPE) සඳහා වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පොදු කාර්යයන් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- පූර්ව ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් පිළිබඳ කටයුතුවල නිරතවීම.
- පුස්තකාලය හා මාධ්‍ය ඒකකය පරිපාලනය කිරීම.

2020 වසරේ කාර්යසාධනය

කාර්යයන් සංස්ථාපනය කිරීම හා සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම

පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස්වීම්, නිවාඩු වාර්තා, පැමිණීම, සේවකයින්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම, විනය පරීක්ෂණ වැනි ආයතනයේ සංස්ථාපන කාර්යයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

2020 වසරේ දී සේවකයින් සඳහා කාර්ය සාධන ඇගයීම සකස් කිරීමට සහ ස්ථිර නිලධාරීන් 185 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබා දීමට මෙම අංශය විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. අංක 01/2016 චක්‍රලේඛයට අනුව 2020 වර්ෂය සඳහා නිලධාරීන් 218 දෙනෙකුගේ වැටුප් පරිවර්තනය ද සකස් කර ඇති අතර අදාළ ලිපි ලේඛන මුදල් අංශයට භාර දී තිබේ. මීට අමතරව, සේවකයින්ගේ ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම, නිලධාරීන් ස්ථිර කිරීම හා උසස් කිරීම සම්බන්ධයෙන් වැටුප් පරිවර්තනය සකස් කිරීම සහ සේවක අර්ථසාධක අරමුදලේ නිලධාරීන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලදී. මූලික විනය පරීක්ෂණයක් ද පවත්වන ලදී.

මෙම අංශය විසින් ණය මුදලේ පොලියෙන් 2/3 ප්‍රතිපූරණය කිරීම් 261, ආපදා ණය 24, වාහන ණය 07 සම්බන්ධයෙන් කටයුතු කර ඇත. එමෙන්ම විශ්‍රාමික සේවකයින් තිදෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් ද සිදු කර ඇත.

2020 දෙසැම්බර් 31 වන විට කොමිෂන් සභාවේ මුළු කාර්ය මණ්ඩලය 228 ක් විය. මෙම සමස්ථ කාර්ය මණ්ඩලයෙන් නිලධාරීන් 04 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණ තනතුරු වලටද 29 ක් මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු වලටද අයත් වන අතර යටත් නිලධාරීන් 151 ක් සහ සුළු ශ්‍රේණිවලට අයත් 44 ක් සිටිති. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා අනුමත කරන ලද මුළු සේවක සංඛ්‍යාව 290 කි.

සේවක සංඛ්‍යාව, සංවිධාන ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්තමාන අවශ්‍යතාවයන්ට අනුව, ඵලදායී හා යාවත්කාලීන සේවාවක් සැපයීමේ අරමුණින් සංවිධාන ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) උපදේශන සේවය ලබා ගෙන ඇති අතර එහි කටයුතු සිදු කෙරෙමින් පවතී .

අනුමත බඳවා ගැනීම් පටිපාටියේ පවත්නා අවශ්‍යතා ප්‍රකාරව විධායක කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණක (තාක්ෂණික) - පැවරුම් පදනම සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබූ අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට සැලසුම් කර ඇත.

කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් 14 දෙනෙකු සහ ද්විතීය පදනම මත සේවය කරන සේවකයින් 06 දෙනෙකුගේ සේවය දීර්ඝ කර ඇත. කොළඹ නෙළුම් කුලුන සඳහා පැවරුම් පදනමක් මත උපදේශක සහායකයින් 05 දෙනෙකු බඳවා ගන්නා ලදී. පරිපාලන හා මූල්‍ය අංශ සඳහා සහකාර අධ්‍යක්ෂවරුන් බඳවා ගන්නා ලදී. එක් කළමනාකරණ සහකාරවරයකු පළමු ශ්‍රේණියට උසස් කරන ලදී. පරිවාස කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව, කළමනාකරණ සහකාරවරු 04 දෙනෙකු සහ තාක්ෂණ නිලධාරීන් 06 දෙනෙකුගේ සේවය ස්ථිර කරන ලදී. කොන්ත්‍රාත් කාලය ඉකුත්වීම හේතුවෙන් නිලධාරීන් 02 දෙනෙකුගේ සේවය අවසන් කර ඇති අතර 2020 වර්ෂය තුළ නිලධාරීන් 03 දෙනෙකු විශ්‍රාම ගන්නා ලදී.

විදුලි සංදේශ කර්මාන්තයේ අත්දැකීම් ලබා ගැනීමට හැකිවන පරිදි රජයේ විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් 18 දෙනෙකු මාස 06 ක සේවාස්ථ පුහුණුවක් සඳහා අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගන්නා ලදී.

ගැටළු විසඳීම, සේවා දිශානතිය සහ නිලධාරීන්ගේ රාජකාරිවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහාය වන විෂය දැනුම වැනි මූලිකාංග තක්සේරු කිරීම පිණිස නිලධාරීන් 29 දෙනෙකු කාර්යක්ෂමතා විභාගයට මුහුණ දී ඇත.

කොමිෂන් සභාවේ අවශ්‍ය අංශ සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම පිණිස අභ්‍යන්තර මාරුවීම් සහ රාජකාරි ආවරණ ආදේශන 09 ක් සිදු කර ඇත.

කාර්යාල චක්‍රලේඛ නිකුත් කිරීම සහ කාර්යාල පටිපාටි හඳුන්වාදීම

2020 වසරේ දී මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ භාවිතය සඳහා මාර්ගගත මාර්ගයක් ස්ථාපිත කරන ලදී. මෙම චක්‍රලේඛ අංශ ප්‍රධානීන්ට මෙන්ම අදාළ නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ පහසුවෙන් පරිශීලනය කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය තුළින් කටයුතු කිරීම සිදු විය.

පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම, කුසලතා වර්ධනය කිරීම සහ ආකල්ප වෙනස් කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. 2020 වසර සඳහා පුහුණු වැඩසටහන් / ශිෂ්‍යත්ව / සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වගුව 21: 2020 වසරේ විදේශීය වැඩසටහන් සඳහා සහභාගීත්වය

	පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/ සම්මන්ත්‍රණයේ විෂයපථය	රට	කාලය		සහභාගී වූ සංඛ්‍යාව
			සිට	දක්වා	
01	SAFIR විසින් සංවිධානය කරන ලද 18 වන පදනම් පාඨමාලාව	ඉන්දියාව අහමදාබාද්, ගුජරාට්	2020 ජනවාරි 20	2020 ජනවාරි 23	01
02	ITU ඉ-ඉගෙනුම් පාඨමාලාව "ජාත්‍යන්තර දත්ත හුවමාරුවලදී ක්ලවුඩ කම්පියුටින්වල නෛතික නියාමන හා තාක්ෂණික පැතිකඩ පිළිබඳ ITU e- ඉගැනුම් පාඨමාලාව	මාර්ගගත පුහුණුව	2020 ජූනි 15	2020 ජූනි 22	01
03	ITU සැටලයිට් වෙබ් පාදක පුහුණු වැඩසටහන් මාලාව	වෙබ් පාදක	2020 සැප්තැම්බර් 07	2020 සැප්තැම්බර් 25	01
04	ITU ගෝලීය සයිබර් පුහුණු වැඩසටහන 2020	මාර්ගගත	2020 සැප්තැම්බර් 15	2020 නොවැම්බර් 05	01
05	WRC-23 (APG23-1) සඳහා APT සම්මන්ත්‍රණ පූර්ව සූදානම් කිරීමේ කණ්ඩායමේ 01 වන මාර්ගගත රැස්වීම	සම්මන්ත්‍රණය	2020 සැප්තැම්බර් 24	2020 සැප්තැම්බර් 25	01
06	ITU විද්‍යුත් ඉගෙනුම් පාඨමාලාව "ස්ථාවර හා ජංගම සේවා සඳහා සේවා තත්ත්ව තාක්ෂණයන් සහ නියාමනය" පිළිබඳව ITU e- ඉගැනුම් පාඨමාලාව	මාර්ගගත පුහුණුව	2020 සැප්තැම්බර් 28	2020 ඔක්තෝම්බර් 05	01
07	ඉන්දියාවේ චෙන්නායි හි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය සහ අධීක්ෂණය පිළිබඳ APT පුහුණු පාඨමාලාව (මාර්ගගත පුහුණු පාඨමාලාව) , චෙන්නායි , ඉන්දියාව	මාර්ගගත පුහුණුව	2020 ඔක්තෝම්බර් 05	2020 ඔක්තෝම්බර් 16	02
08	APT-SATRC 21 වන රැස්වීම	මාර්ගගත රැස්වීම	2020 ඔක්තෝම්බර් 27	2020 ඔක්තෝම්බර් 28	02
09	"ජංගම අධිවේගී අන්තර්ජාලය, 5G සහ අනාගත සේවා" පිළිබඳ ITU e-ඉගැනුම් පාඨමාලාව	මාර්ගගත පුහුණුව	2020 නොවැම්බර් 17	2020 දෙසැම්බර් 14	01
10	ආසියා ශාන්තිකර කලාපයේ "ගුවන්විදුලි සංඛ්‍යාත විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර සඳහා මානව නිරාවරණය" පිළිබඳව මාර්ගගත පුහුණු පාඨමාලාව - ITU Centers of Excellence	මාර්ගගත පුහුණුව	2020 නොවැම්බර් 23	2020 දෙසැම්බර් 06	03
11	ආසියා ශාන්තිකර කලාපයේ "සයිබර් ආරක්ෂාව සහ වැදගත් යටිතල පහසුකම් ආරක්ෂාව" පිළිබඳ මාර්ගගත පුහුණු පාඨමාලාව	මාර්ගගත පුහුණුව	2020 නොවැම්බර් 23	2020 දෙසැම්බර් 05	02
12	පුද්ගලික දත්ත ආරක්ෂණ හා හරස් දේශසීමා දත්ත හුවමාරුව පිළිබඳ APT මාර්ගගත පුහුණු පාඨ මාලාව	මාර්ගගත පුහුණුව	2020 නොවැම්බර් 23	2020 නොවැම්බර් 25	04
13	අන්තර්ජාලයේ දෑ සඳහා සුහුරු අන්තර් සම්බන්ධතාවය පිළිබඳ (XUPT) APT පුහුණු පාඨමාලාව, තැපැල් හා විදුලි සංදේශනය පිළිබඳ Xi'an විශ්ව විද්‍යාලය (XUPT) Xi'an, චීන සමූහාණ්ඩුව	මාර්ගගත පුහුණුව	2020 නොවැම්බර් 30	2020 දෙසැම්බර් 08	01

14	ලෝක ගුවන් විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණය 01 කොටස	මාර්ගගත සම්මන්ත්‍රණය	2020 නොවැම්බර් 30	2020 දෙසැම්බර් 04	02
15	ලෝක ගුවන් විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණය-02 කොටස	මාර්ගගත සම්මන්ත්‍රණය	2020 දෙසැම්බර් 07	2020 දෙසැම්බර් 11	
16	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහා සභාවේ 15 වන සැසි වාරය	මාර්ගගත සම්මන්ත්‍රණය	2020 දෙසැම්බර් 03	2020 දෙසැම්බර් 05	06
17	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ කළමනාකරණ කමිටුවේ 44 වන සැසි වාරය	මාර්ගගත සම්මන්ත්‍රණය	2020 දෙසැම්බර් 07	2020 දෙසැම්බර් 10	
18	විදුලි සංදේශනය මගින් "හදිසි ආපදා තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම පිළිබඳITU සහ USTTI වෙබ් පාදක පාඨමාලාව	වෙබ් පාදක	2020 දෙසැම්බර් 15	2020 දෙසැම්බර් 16	02
19	ටෙලිමෙඩිසින් සඳහා ආධාරවන අන්තර්ජාල ජාලයන්හී සේවා තත්ත්වය හා ආරක්ෂාව පිළිබඳ APT පුහුණු පාඨමාලාව , Bharat Ratna Bhim Rao ආයතනය, විදුලි සංදේශ පුහුණු මධ්‍යස්ථානය, 9BSNL, ජබල්පීර්, ඉන්දියාව	මාර්ගගත පුහුණු	2020 දෙසැම්බර් 16	2020 දෙසැම්බර් 22	02

වගුව 22: 2020 දී සහභාගී වූ දේශීය වැඩසටහන්

වැඩසටහන	ආයතනය	ස්ථානය	කාලය	සහභාගි වූ සංඛ්‍යාව
පොදු ප්‍රසම්පාදන පටිපාටිය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	SDFL සම්මන්ත්‍රණ ශාලාව	2020 ජූලි 30 සහ 31	01
රාජ්‍ය ආයතනයන්හී විගණන විමසුම් අවම කරන්නේ කෙසේද	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	SDFL සම්මන්ත්‍රණ ශාලාව	2020 ජූලි 30 සහ 31	01
අවදානම් පාදක කරගත් අභ්‍යන්තර විගණන සැලසුම්	Prag ආයතනය	ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය , කොළඹ 01	2020 අගෝස්තු 27	01
පාඩු අත්හැරීම් සහ කපාහැරීම්	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	SDFL දේශන ශාලාව	2020 අගෝස්තු 24 සහ 25	01
භාණ්ඩ හා සේවා සඳහා ලංසු ලියකියවිලි පිළියෙල කිරීම	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	SDFL සම්මන්ත්‍රණ ශාලාව	2020 අගෝස්තු 27 සහ 28	01
කාර්යාල කළමනාකරණය, ආචාර විධි සහ පාරිභෝගික සේවා	D & R වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය	ගාලු මුවදොර හෝටලය, කොළඹ 03.	2020 සැප්තැම්බර් 24 සහ 25	01
පොදු ප්‍රසම්පාදන පටිපාටිය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	SDFL සම්මන්ත්‍රණ ශාලාව	2020 සැප්තැම්බර් 24 සහ 25	01
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ 41 වන ජාතික සම්මන්ත්‍රණය(2020 වසරේදී කල් තබන ලදී.)	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	මාර්ගගත සම්මන්ත්‍රණය	2021 ජනවාරි 18 සහ 21	04

ප්‍රසම්පාදන කටයුතු

කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙම අංශය විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාකාරකම් අතරට ලංසු ලියකියවිලි සකස් කිරීම, දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සහ ප්‍රසම්පාදන කමිටු පත් කිරීම, අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම සඳහා වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, අදාළ පාර්ශවයන්ට තීරණ දැනුම් දීම, සේවා ගිවිසුම් සකස් කිරීම නීති අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, සේවා සපයන්නන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම සහ සේවා ගිවිසුම් වලින් බැහැරවීම් නිරීක්ෂණය කළ විට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුලත් වේ .

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සුළු ප්‍රසම්පාදන කමිටු සහ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් ගණන පිළිවෙලින් 07සහ 04 විය. සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදනවල මුළු දළ වටිනාකම රු. 5,058,869.42 කි. ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදනවල මුළු දළ වටිනාකම රු61,682,235.08 කි.

මෙම අංශය කාර්යක්ෂමව විදුලිය, ජලය සහ දුරකථන සේවා සැපයීමට වගබලා ගන්නා ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම අංශවලට ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ නියමිත වේලාවට සැපයීම සහතික කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගෙන ඇත.

කාර්යාල නඩත්තුව සහ යටිතල පහසුකම් වැඩ නිම කිරීම යටතේ ප්‍රවේශ ශාලාව සඳහා කවුන්ටරයක් සැපයීම, බිත්තිවල තීන්ත ආලේප කිරීම, අංශ සඳහා කාපට් සැපයීම, පිටාර පංකා සැපයීම (Exhaust Fan) සහ සවිකිරීම සහ වායු සමීකරණ, දොරවල්, විදුලි සෝපානය, මායිම් බිත්ති , කම්බි වැටවල් සහ වැසි ජලය කාන්දු වීම ආදිය පිළිසකර කර අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත.

වාහන සංචිතය නඩත්තු කිරීම

2020 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන සංචිතය කාර් එකොළහක්, ඩබල් කැබ් රථ දෙකක්, ජීප් රථ හතරක්, වෑන් රථ හයක්, එක් බස් රථයක්, ලොරි මාදිලියේ රථ තුනක් සහ මෝටර් බයිසිකල් දෙකකින් සමන්විත විය. පරීක්ෂණ වාරිකා මෙන්ම කෝවිඩ් 19 තත්ත්වය යටතේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ප්‍රවාහනය කිරීම සඳහා බස් රථය යොදා ගන්නා ලදී. සංචිතයේ සමහර වාහන අධ්‍යක්ෂවරුන් සඳහා වෙන් කර ඇති අතර අනෙක් වාහන පරීක්ෂණ වාරිකා, රැස්වීම් / වැඩමුළු / සම්මන්ත්‍රණවලට සහභාගී වීම, සංවිධානය කිරීම, නිල ලිපි බෙදා හැරීම ආදිය වැනි නිල කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

2020 වසරේ දී වාහන අලුත්වැඩියා කිරීම, ටයර් මාරු කිරීම, බැටරි මාරු කිරීම සහ වාහන සංචිතය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා වියදම් කරන ලද මුදල රු. 5,689,931.98 කි.

ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික සැලැස්ම, ප්‍රගති වාර්තා සහ වාර්ෂික වාර්තාව සකස් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම 2020, කාර්තුමය ප්‍රගති සමාලෝචන වාර්තා 2020 ,ආයතනික සැලැස්ම 2020-2022, වාර්ෂික වාර්තාව 2019 අදාළ අමාත්‍යාංශ සහ බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. පෙර වර්ෂවල වාර්ෂික වාර්තාවල අඩුපාඩු නිමකිරීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම ද මෙම වර්ෂය තුළ අවසන් කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම 2021-2023 සමග 2021 අයවැය පිළිබඳ විස්තර පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත.

ආයතනික හා සමාජ වගකීම් (CSR) පූර්ව ක්‍රියාකාරකම් වලට අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම

මෙම කාරණය සම්බන්ධයෙන් අදාළ කොමිෂන් සභා පත්‍රිකාවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ නීති අංශය මගින් මෙම ආයතනික හා සමාජ වගකීම් පිළිබඳ කාරණය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය ලබා ගැනීමට තීරණය කරන ලදී. නීතිපතිවරයා සමඟ උපදේශන සාකච්ඡා පවත්වන ලද අතර කොමිෂන් සභා තීරණයන් ක්‍රියාත්මක කරන ලදී.

ඵලදායිතාවය/5S සංකල්පය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඵලදායිතා / 5S සංකල්පය පිළිබඳ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් MS Teams ඔස්සේ පවත්වන ලදී. ඵලදායිතාව / 5S සංකල්පය පිළිබඳ වීඩියෝ වාර්තා සහ පින්තූර MS-Teams භාවිතයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. කොවිඩ් -19 වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දී පවත්වා ඇත. පරිපාලන අංශය තුළ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ලේඛනාගාර දත්ත සමුදා දර්ශක (Database Index) පද්ධතිය ස්ථාපනය කරන ලදී. අංශ මට්ටමින් ඩිජිටල්කරණ ලේඛනාගාර පිහිටුවීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. වර්තමාන covid-19 වසංගත තත්ත්වය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය ඔස්සේ මහජනතාවට සේවය සැපයීම ආරම්භ කරන ලදී. ඒ අනුව, විදුලි සංදේශ / නියාමන ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පාරිභෝගික විමසීම්වලට සෘජුවම සම්බන්ධ වන නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. අංශවල පවත්නා සීමිත ඉඩකඩෙහි කඩදාසි මත පදනම් වූ ලිපිගොනු ගබඩා කිරීම සඳහා ලිපිගොනු කබඩ් සවි කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීමේ සහාය

කොමිෂන් සභාවේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍යය ක්‍රියාමාර්ගයක් වශයෙන් පාලන අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක

කිරීමේදී සහය ලබා දෙන ලදී. මෙම වසර තුළ පුවත්පත් දැන්වීම් 122 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර, සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහල භාෂාවට සකස් කරන ලද දිවුරුම් දුන් පරිවර්තන කාර්යයන් 20 ක් පමණ සම්පූර්ණ කර ඇත. පරිපාලනමය වාර්තා, අමාත්‍ය මණ්ඩල සංදේශ, පුවත්පත් දැන්වීම්, ගැසට් නිවේදන වැනි දෙමළ පරිවර්තන අවශ්‍යතා ඉටු කරලීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර ඒ සඳහා බාහිර භාෂා පරිවර්තකයන්ගේ සේවය ලබා ගන්නා ලදී.

ගෙවීම් නිර්දේශ කිරීම / අනුමත කිරීම

පාලන අංශයේ වැදගත් ක්‍රියාකාරකමක් වන්නේ වැටුප් වර්ධක, අතිකාල, හිඟ දීමනා, ගමන් සහ යැපීම් දීමනා, විනය පරීක්ෂණ ගාස්තු, වාහන අළුත්වැඩියා කිරීම, පරිභෝජන අයිතමයන් , උපකරණ හා යන්ත්‍රෝපකරණ, පොත් සහ වාර සඟරා මිලදී ගැනීම සහ සේවා සැපයීම (ආරක්ෂක, සනීපාරක්ෂක, ජලය, දුරකථන, විදුලිය) සම්බන්ධ විවිධ ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීමයි. මෙම අංශය විසින් ගෙවීම් වවුචර් හොඳින් පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම හෝ ගෙවීමේ ස්වභාවය සහ මූල්‍ය අධිකාරියේ සීමාව අනුව අනුමැතිය ලබා දීම සිදු කරයි. ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට පියවර ගෙන ඇත.

සුභසාධන කටයුතු

මෙම වර්ෂයේ දී පහත සුභසාධන කටයුතු සිදු කරන ලදී:

- 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත්ව ඇති ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සුභසාධක සංගමයේ සාමාජිකයින්ගේ දරුවන් දිරිමත් කිරීම සඳහා ඇගයීම් උත්සවයක් පැවැත්වීම.
- 2020/2021 වර්ෂයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දේපළ , පිරියත , උපකරණ හා වාහන සංචිත මෙන්ම 2020 / 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමූහ ජීවිත සහ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යාවත්කාලීන කිරීම අවසන් කර ඇත.

මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්

2020 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද රැස්වීම්, ව්‍යාපෘති, සමාරම්භක උත්සව මෙන්ම වැදගත් සිදුවීම් සඳහා මාධ්‍ය ඒකකය මාධ්‍ය ආවරණය සපයන ලදී. කෝවිඩ් –19 තත්ත්වය තුළ දැනුවත් කිරීමේ කරුණු සම්පාදනය කිරීමෙහිලා නිරත වූ අතර ඒවා සමාජ මාධ්‍යවල පළ විය. මාධ්‍ය ඒකකය අදාළ ස්ථාන වලට ගොස් ඡායාරූපගත කිරීම, වීඩියෝ පටිගත කිරීම, ඒවා සංස්කරණය කිරීම සහ නවීන තාක්ෂණයන් භාවිතයෙන් සංරක්ෂිත එකතුවෙහි ගබඩා කිරීම වැනි ක්‍රියාකාරකම් සිදු කර ඇත.

තවද, ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2020, විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සහ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක(IMEI) ලියාපදිංචිය, සමාජ මාධ්‍ය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රවර්ධන සටහන් හා වාර්තාමය වීඩියෝ නිපදවීම මාධ්‍ය ඒකකය විසින් සිදු කරන ලදී.

වීඩියෝ දර්ශන සංස්කරණය කිරීමේ ක්‍රියාකාරකම්වල යෙදී සිටින ඒකකය මහජනතාව දැනුවත් කිරීම සඳහා ඒවා විවිධ ආයතන වෙත ලබාදීම සිදු කරන ලදී.

නෙළුම් කුලුන ව්‍යාපෘතියේ පියවරෙන් පියවර නිශ්චිත සංවර්ධන අදියරයන් සහ පාසල් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, වෙරළ පිරිසිදු කිරීමේ දිනය, සුභසාධන කටයුතු සහ ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ රැස්වීම් සහ තාක්ෂණික විශ්ලේෂණ වැඩසටහන් රූගත කිරීම, ආවරණය කිරීම සහ සංරක්ෂණ කිරීමද මාධ්‍ය අංශය විසින් මෙම වර්ෂයේ සිදුකරන ලද කාර්යභාරයන්වේ.

පුස්තකාලය

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියැලී සිටින පුද්ගලයින්ට සහ උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට සහාය වීමේ අරමුණින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුස්තකාලයේ විදුලි සංදේශ පිළිබඳ පෙළපොත් සහ සඟරා විශාල එකතුවක් ඇති අතර එය පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩව ශක්තිමත් කරනු ලැබේ. පුස්තකාලය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පමණක් නොව, පර්යේෂකයින්, විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් ළමුන් වැනි බාහිර පාර්ශවයන්ට ද පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයයි. පහත සඳහන් ක්‍රියාකාරකම් 2019 වසරේ දී සිදු කරන ලදී;

පුස්තකාලය නඩත්තු කිරීම හා ශක්තිමත් කිරීම

- 2020 වසර සඳහා දායකත්වය අලුත් කිරීම සහ නව සඟරා සඳහා දායක මුදල් ගෙවීම.
- අනාගත පරිශීලනය සඳහා විශේෂ විෂයයන් පිළිබඳ පුවත්පත්වල ලිපි (මුල් පිටපත) එකතු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේඛන භාවිතා කරමින් උද්ධෘත සේවා සහ ප්‍රලේඛන සේවා ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ ලිපි ලේඛන පහසුවෙන් පරිශීලනය කිරීම සඳහා අදාළ කොටස් වෙන් වශයෙන් එක් රැස් කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තය විෂය පිළිබඳ ශීර්ෂයන් හා සංකල්ප සහිත පොතක් සකස් කිරීම ආරම්භ කිරීම.
- අන්තර්ජාලය හා ආයතනයේ අභ්‍යන්තර ජාලය හරහා පරිශීලකයින් සඳහා තෝරාගත් තොරතුරු බෙදා හැරීම (SDI) සඳහා පුවත්පත් වල විශේෂිත මුල් ලිපි සඳහා දත්ත සැකසීම සිදු කිරීම.
- පූර්න පුස්තකාල දත්ත සමුදාය නඩත්තු කිරීමේ ගිවිසුම අළුත් කිරීම. පූර්න දත්ත සමුදාය භාවිතා කරමින් පුස්තකාලයෙන් පොත් ලබාදීමේ

සේවාවන් විද්‍යුත් මාර්ගයෙන් ආරම්භ කිරීම. පූර්ණ පුස්තකාල දත්ත සමුදා නඩත්තු පද්ධතිය පූර්ණ වෙබ් පාදක වැඩිදියුණු පුස්තකාල පද්ධතියක් බවට පරිවර්තනය කිරීම.

- කාර්යාල නිවේදන, පුරප්පාඩු දැන්වීම්, නෙළුම් කුලුන ව්‍යාපෘතිය, පනත්, අති විශේෂ ගැසට් නිවේදන, කෙටි සංකේත අංක, ෆේස්බුක් / තොරතුරු තාක්ෂණයේ ප්‍රවෘත්ති ලිපි එකතුව සහ පොත් පිළිබඳව වත්මන් දැනුවත් කිරීමේ සේවාවන්හි වැදගත් තොරතුරු රැස් කිරීම සහ ලැයිස්තුගත කිරීම.
- සකස් කළ ආධුනික ගුවන් විදුලි තොරතුරු එකතුව
- සාමාජිකත්වය අළුත් කිරීම සහ මහජන ජංගම පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමට අපගේ කාර්ය මණ්ඩලයට සහාය වීම.
- ආයතනයේ අභ්‍යන්තර ජාලය (intranet) හරහා තොරතුරු ලබා ගැනීමටත් අතිවිශේෂ/සාමාන්‍ය ගැසට් හා පනත්වල දත්ත පරිලෝකනය කර දත්ත සමුදායට ඇතුළත් කිරීම.
- පුස්තකාලයේ අභ්‍යන්තර සැකැස්ම වෙනස් කර ප්‍රතිනිර්මාණය කරන ලදි.
- පොත් වර්ගීකරණය කිරීමේදී විශ්වීය දශම වර්ගීකරණයේ නව සංස්කරණය සඳහා කටයුතු සිදු කරන ලදී.

තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ ඒකකය

සමාලෝචනය

තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) ඒකකය අදාළ පාර්ශවකරුවන් අතර නව සේවා පරිසරය හා සංස්කෘතිය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය මෘදුකාංග, විසඳුම් සහ හාවිතාවන් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තුළ ඩිජිටල් පරිවර්තනය හඳුන්වා දෙයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවකයන් සහ එහි ගනුදෙනුකරුවන් සඳහා නවීනතම තාක්ෂණයට අනුකූලව අභ්‍යන්තර හා බාහිර කර්තව්‍යයන් සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විසඳුම් මෙමඟින් සපයනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය සහතික කිරීම සහ ඩිජිටල්කරණය සහිත ආයතන සක්‍රීය කිරීම පිණිස තොරතුරු තාක්ෂණයේ උපායමාර්ගික භාවිතය තුළින් මෙහෙයුම් වැඩි දියුණු කිරීමෙහි ලා තොරතුරු සන්නිවේදන අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය අතර තාක්ෂණය සහ එහි භාවිතය හඳුන්වා දීම සඳහා තවදුරටත් ධාරිතා වර්ධනය / දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

කාර්යයන්/අරමුණු

- ආයතනය සඳහා තොරතුරු තාක්ෂණ මාර්ගෝපදේශන සකස් කිරීම, තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ පාලනය සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම. අනුකූල නොවන විෂයය ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ සිදු කිරීම හා අනුකූල නොවීම ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් වාර්තා පිළියෙල කිරීම සහ ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාලය කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා සකස් කිරීම මෙන්ම අදාළ පද්ධතිය හා උපකරණ මඟින් සයිබර් ආරක්ෂණය පරීක්ෂා කිරීම.
- ආයතනයේ LAN සහ WAN වල නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම.
- ආයතනයේ ඩිජිටල් පරිවර්තනය වැඩි දියුණු කිරීම නව තාක්ෂණය තක්සේරු කිරීම සහ සුදුසු තාක්ෂණය යොදා ගැනීම.
- අදාළ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ඇතිව සියලුම තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා සැලසුම් කිරීම, සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම.
- කාර්යය පරිසරය, ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා මෘදුකාංග පද්ධතිය, දත්ත සමුදාය සංවර්ධනය කිරීම, යෙදවීම සහ කළමනාකරණය කිරීම.
- ඩිජිටල් පරිවර්තනය සඳහා මෘදුකාංග, දෘඩාංග හා යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ වෙනත් අංශවල සහාය ඇතිව අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීම..
- දත්ත සමුදාය, සංකේත අංකවල වාර්තා සහ එහි පිටපත් සුරක්ෂිතව හා ආරක්ෂිතව තබා ගැනීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වත්කම් ලේඛනය පවත්වාගෙන යාම සහ අවශ්‍ය අයවැය සමඟ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම
- ඩිජිටල්කරණය මෙහෙයවන ආයතනය වශයෙන් ඩිජිටල් පරිවර්තනයට අනුගත වීමේදී නව දැනුම හා කුසලතා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා සම්බන්ධීකරණ හා අධ්‍යයන කටයුතු සිදු කිරීම.
- සියළුම වාර්ෂික නඩත්තු හා දායකත්ව ගිවිසුම් කාලානුරූපව අධීක්ෂණය කර ක්‍රියාත්මක කරන බවට සහතික වීම.
- තොරතුරු තාක්ෂණ ප්‍රවේශයට අදාළ සියලුම පරිපාලනමය නිර්දේශ සුරක්ෂිත හා ආරක්ෂිත ආකාරයකින් පවත්වාගෙන යාම.
- නව කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුව පිළිබඳ වාර්ෂික සැලැස්ම සකස් කිරීම. පුහුණු කාලසටහන ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කරන්නන් සඳහා උපකාරක සේවා සැපයීම සහ උපස්ථම්බක ආධාරක පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කාර්ය මණ්ඩලය / සම්පත් පැවරීම.

කාර්යසාධනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා නව තොරතුරු තාක්ෂණ පාලනය හඳුන්වා දීම

තොරතුරු සන්නිවේදන තාක්ෂණ පරිසරය නිවැරදි දිශානුගතව කේන්ද්‍රීයව ස්ථාපනය කිරීම පිණිස තොරතුරු සන්නිවේදන තාක්ෂණ බලයලත් ප්‍රකාශන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා අනිවාර්ය සාධකයකි. මේ වන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා සන්නිවේදන තාක්ෂණ බලයලත් ප්‍රකාශන හතරක් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කර ඇත. ප්‍රකාශිත බලයලත් ප්‍රකාශන පහත පරිදි වේ.

- Guideline for the owners of the TEAMS in O365.

- Add Microsoft Planner and Microsoft Notebook in Teams.
- Enforce the Multi Factor Authentication across MS O365 at TRCSL.
- Bring Your Own Device policy within TRCSL IT infrastructure.

නීසි ක්‍රියාකාරිත්වය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාලය වැඩිදියුණු කිරීම/ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාලය සහ ආරක්ෂක පද්ධතිය අධීක්ෂණය, විශ්ලේෂණය සහ වැඩිදියුණු කිරීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල පරිසරයට අනවසරයෙන් ප්‍රවේශ වීම අනවසරයෙන් ප්‍රවේශ වීම, උපාංගවල අවදානම සහ වෛරස් ප්‍රහාර වලින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල පරිසරය ආරක්ෂා කිරීම මෙන්ම නුසුදුසු ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඉහළ මට්ටමේ ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කර ඇත. ජාල පරිසරය ආරක්ෂා කිරීම ආරක්ෂණ පද්ධතිය (firewall) ජාලය තුළ ස්ථාපනය කරන ලදී. පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල භාවිතා කරන්නන්ට අන්තර්ජාලය සඳහා පූර්ණ විවෘත ප්‍රවේශය හේතුවෙන් අඩු ජාල වේගයක් අත්විඳීමට සිදුවිය. firewall පද්ධතියට අවශ්‍ය ආරක්ෂණ ප්‍රයත්නයන් සහ ප්‍රතිපත්ති යෙදීමෙන් අන්තර්ජාල ප්‍රවේශය පෙරණය කරමින් හා වැඩිදියුණු ආරක්ෂණ ප්‍රතිපත්ති තුළින් ජාලය වේගවත් කිරීමට තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට හැකි විය.

firewall පද්ධතියට අවශ්‍ය ආරක්ෂණ ප්‍රයත්නයන් සහ ප්‍රතිපත්ති යෙදීමෙන් අන්තර්ජාල ප්‍රවේශය පෙරණය කරමින් හා වැඩිදියුණු ආරක්ෂණ ප්‍රතිපත්ති තුළින් ජාලය වේගවත් කිරීමට තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට හැකි විය. (ජාල ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ෆයර්වෝල් ලොග් නිරීක්ෂණය කිරීම, ආරක්ෂක සිදුවීම් අධීක්ෂණය කිරීම සහ සතියේ පැය විසිහතර තුළම ක්‍රියාත්මක ජාල පරිසරයක් සඳහා ලොග් විශ්ලේෂණ කළමනාකරණ පද්ධතියක් සහ ආරක්ෂක තොරතුරු සිදුවීම් කළමනාකරණය (SIEM) අත්‍යවශ්‍ය වේ.)

කාර්ය මණ්ඩල සඳහා තොරතුරු තාක්ෂණ සහාය ලබා දීම සහ දෝෂ නිරාකරණය කිරීම

තොරතුරු තාක්ෂණ ඒකකය විසින් කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ සහාය ලබාදීම, අවශ්‍යතාවය අනුව දෝෂ නිරාකරණය කිරීම, වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය භාවිතය නිතිපතා යාවත්කාලීන කිරීම සහ තොරතුරු තාක්ෂණ උපකරණ ප්‍රසම්පාදන විශ්ලේෂණයට සහභාගී විය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ධාරිතාවය ගොඩනැංවීම

තොරතුරු තාක්ෂණය වැඩිදියුණු කිරීමේ දී ආයතනයේ සේවකයින් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවකයින්ගේ තාක්ෂණික දැනුවත්භාවය උපරිම කිරීම පිණිස, අභ්‍යන්තර සේවකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ තාක්ෂණික සැසි කිහිපයක් සංවිධානය කර තිබුණි. ප්‍රධාන වශයෙන්, සේවකයන් බහුතරයක් මයික්‍රොසොෆ්ට් නිෂ්පාදන භාවිතා කරන බැවින් මයික්‍රොසොෆ්ට් පිළිබඳ මූලික හා උසස් දැනුම ඔවුන් සමඟ බෙදාගන්නා ලදී. ඔවුන්ගෙන් බොහෝ O365, Planner, MS booking, MS SharePoint list වැනි ඩිජිටල් භාවිතයන් සහ පරිවර්තනයන් පිළිබඳ පුහුණු පාඨමාලා වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. විශේෂයෙන් Microsoft teams පුහුණුව කාර්ය මණ්ඩලයට ලබා දී ඇති අතර එය රැස්වීම් සහ සාකච්ඡා සිදු කිරීම සඳහා COVID-19 වසංගතය අතරතුර භාවිතා කරන ලදී. එසේම, Microsoft List පිළිබඳ පුහුණුව ලබා දී ඇති අතර එය සේවකයින්ගේ දෛනික කටයුතු යාවත්කාලීන කිරීමට සහ නිරීක්ෂණය කිරීමට යොදා ගනී.

මෙරටට නීතිවිරෝධී ආකාරයෙන් දුරකථන ආනයනය කිරීම නිරීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) සත්‍යාපන පද්ධතිය / ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) කළමනාකරණ පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ටෙලිකොම් VDC හි ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ උපකරණ අනන්‍යතා ලේඛනයක් ස්ථාපනය කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවයක් පැවතුණි. කඩිනම් අවශ්‍යතාවයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ජාලයන්හි භාවිතා කරන අනුමත නොකරන ලද IMEI සක්‍රීය උපාංග හඳුනා ගැනීම සඳහා ජාතික IMEI සත්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සම්පූර්ණ කර ඇත. නුදුරු අනාගතයේ දී මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබීමෙන් පසු මෙය ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නීති විරෝධී ලෙස ආනයනය කරන ලද IMEI උපාංග තහනම ක්‍රියාත්මක කරනු ඇත. මෙම ක්‍රමය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ ශ්‍රී ලංකාවේ IMEI අංක වල විශාලතම දත්ත සමුදාය බවට පත්ව ඇත.

ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ ඒකකය මේ වන විට ආයතනයේ ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත ආකාරයෙන් පවත්වාගෙන යාම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඩිජිටල්කරණය කිරීමේ ආරම්භක කටයුතු වල නිරත වේ.මේ දක්වා තොරතුරු තාක්ෂණ අංශය පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර ඇත.

- කාර්ය සාධන ඇගයීම් මොඩියුලය සහිත මානව සම්පත් කළමනාකරණය (ක්ෂණික අවශ්‍යතාවයක් ලෙස දේශීය නිෂ්පාදනයක් සඳහා POC එකක් ලබා දීමට තීරණය කරන

ලදී. දේශීය නිෂ්පාදන වලින් ඉදිරිපත් කිරීම් කිහිපයක් තිබුනේ නම්, ටෙන්ඩර් ඇගයීම් කමිටුවක් පත් කර ඇත. ටෙන්ඩර් / මිලගනන් කැඳවීම් සිදු කරන අතර පාලන සහ තොරතුරු තාක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ

- තොරතුරු තාක්ෂණ උපකාරක කවුළුව (IT help desk)
- වත්කම් කළමනාකරණ පද්ධතිය (AMS)
- සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය - වර්ණාවලි කළමනාකරණ අංශයේ කෙටි පණිවුඩ පදනම් කරගත් යෙදුම් සැකසුම් පද්ධතියක් හඳුන්වා දීම.
- Network division application management system. ජාල විබෙදුම් යෙදුම් කළමනාකරණ පද්ධතිය.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මෙන්ම පාරිභෝගික වෙළෙන්දන් සන්නිවේදනය කිරීම සඳහා කෙටි පණිවුඩ සේවා ප්‍රවේශය සැපයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඇමතුම් මධ්‍යස්ථානය (Covid-19 වසංගතය හේතුවෙන් POC රඳවා තබා ගැනීම) සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය(CRM)
- ඇමතුම් මධ්‍යස්ථානය (Covid-19 වසංගතය හේතුවෙන් POC රඳවා තබා ගැනීම) සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (CRM)
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල වැඩිදියුණු කිරීම සහ අන්තර්ජාල සම්මුති පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව (PABX) සමඟ ඒකාබද්ධ කිරීම (ක්‍රියාත්මක කිරීම සිදු වෙමින් පවතී) . ඇමතුම් මෙහෙයවීමේ භාවිතාවන් සහිත ඇමතුම් මධ්‍යස්ථාන සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ කටයුතු සඳහා Teams සහ PABX ඒකාබද්ධ කිරීම.
- අයක්‍රම භාවිතාවන් සහ ක්‍රියාකරු තත්ත්වය ස්වයංක්‍රීයකරණය (POC) සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. අයක්‍රම භාවිතාවන් සහ ක්‍රියාකරු තත්ත්වය ස්වයංක්‍රීයකරණය සාර්ථක නොවූ බැවින් නව භාවිතය ප්‍රති සංවර්ධනය කිරීමට තීරණය විය.
- මූල්‍ය කළමනාකරණ පද්ධතිය ප්‍රසම්පාදන අවධියේ ක්‍රියාත්මක වෙමින් පවතී.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා ඩිජිටල් අත්සන හඳුන්වා දීම (ක්‍රියාත්මක වෙමින් පවතී)
- පවතින සක්‍රීය නාමාවලිය Azure cloud ලෙස වැඩිදියුණු කිරීම.

මාර්ගගත රැස්වීම් භාවිතය

Covid-19 වසංගතය නිසා කාර්යාලයීය කටයුතු සඳහා මාර්ගගත රැස්වීම් සහ සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම කඩිනම් අවශ්‍යතාවයක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව Microsoft 365 සමඟ Microsoft Teams හි දැනටමත් දායකත්වය ලබා ගෙන ඇති බැවින් , ඉහත සඳහන් භාවිතයන් ඔස්සේ මාර්ගගත රැස්වීම් පැවැත්වීමට සහ සම්බන්ධතා පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට හැකි විය. අද වන විට Microsoft teams ඔස්සේ නිවසේ හෝ කාර්යාලයේ සිට බොහෝ නිල කාර්යයන් සහ සාකච්ඡා සිදු කරනු ලැබේ.

රැස්වීම් / හමුවීම් සඳහා මාර්ගගත වෙන් කිරීම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බාහිර ගනුදෙනුකරුවන්ගේ / වෙළෙන්දන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා Covid-19 වසංගතය තුළ මාර්ගගත වෙන්කරවා ගැනීමේ ක්‍රමවේදය ආරම්භ කර ඇත. මාර්ගගත හමුවීම් මෙන්ම ස්ථානීය හමුවීම් සඳහා වෙන්කරවා ගැනීමේ පහසුකම සකස් කර ඇත.

මයික්‍රොසොෆ්ට් ෂෙයාපොයින්ට් (Microsoft SharePoint)

කාර්යාලයීය අංශ සහ දෙපාර්තමේන්තු අතර හෝ නිවසේ සිට කරන වැඩ නිරීක්ෂණය කිරීම සඳහා Microsoft SharePoint මාර්ගගත භාවිතය හඳුන්වා දෙන ලදී..

ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්

- පූර්ණ ස්වයංක්‍රීය මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- කාර්ය සාධන ඇගයීම් මොඩියුලය සමඟ පූර්ණ ස්වයංක්‍රීය මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඩිජිටල් අත්සන හඳුන්වා දීම.
- පවතින සක්‍රීය නාමාවලිය Azure cloud බවට වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා සමස්ත ඩිජිටල් පරිවර්තනය සිදු කිරීම.
- පවත්නා IMEI සහ TA පද්ධතිය වැඩි දියුණු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම.

මූල්‍ය අංශය

සමාලෝචනය

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමයි. ආදායම එකතු කිරීම සහ එම අරමුදල් නිසි පරිදි ආයෝජනය කරමින් ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීම සෙසු ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම මූල්‍ය රීති, වක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වැනි අදාළ නීති සහ රීති වලට අනුකූලව ව්‍යවස්ථාපිත රාමුව තුළ මුදල් පාලනය කිරීම සහ වියදම් කිරීම මූල්‍ය අංශය විසින් සිදු කරනු ලැබේ.

එමෙන්ම රජය විසින් මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රධාන තීරණ ගන්නා බැවින්, නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම මූල්‍ය අංශයේ ප්‍රධාන වගකීමක් වේ. සියලුම රාජ්‍ය ආයතන, සියලුම මූල්‍ය ප්‍රතිපත්ති රජයේ මූල්‍ය රෙගුලාසි වලට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට සහ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන බවට සහතික කිරීම මෙන්ම ගණුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය තහවුරු කිරීම පිණිස මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා නීතියෙන්ම බැඳී සිටී. සමාලෝචිත වර්ෂය තුළදී අප විසින් අපගේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

මූල්‍ය කළමනාකරණ අංශයේ කාර්යයන් පූර්ව දත්ත වාර්තාකරණය සඳහා පමණක් සීමා නොවන අතර මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය, සංවර්ධන සැලසුම්කරණය සහ උපාය මාර්ගික තීරණ ගැනීම සහ සහභාගිවීම මෙම අංශය මගින් සිදු කරන වැදගත් කාර්යයන් වේ.

කාර්යයන්

- අයවැය/පුරෝකථනය සහ ඒ හා සමාන කාරණාවල විචලනයන්ට අනුව මූල්‍ය බලපෑම් වාර්තාකරණය කිරීම.
- වාර්ෂික අයවැය/පුරෝකථන පිළියෙල කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම.
- සියළුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම සහ සේවා ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම.
- ප්‍රාග්ධන සහ ආදායම් වියදම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඉහළ කළමණාකාරිත්වයට උපදෙස් ලබාදීම සහ සහායවීම.
- බදු සැලසුම්කරණය කිරීම මෙන්ම අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීම.
- විගණකාධිපති වාර්තා සහ විගණන කමිටු වාර්තා වැනි මූල්‍ය වාර්තා සහ කාලානුරූප මෙහෙයුම් සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම අවශ්‍ය නම් අපගමනයන් නිවැරදි කිරීම සඳහා නිවැරදි/සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- රජය සහ පාර්ලිමේන්තු පනත මගින් පනවන විවිධ බදු කඩිනමින් එකතු කිරීමට වගබලා ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම.
- වාර්ෂිකව මූල්‍ය බලය පැවරීමට කටයුතු පිළියෙල කිරීම සහ කොමිෂන් සභා අනුමැතියට යටත්ව අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- මුදල් පනත හා විදුලි සංදේශ බදු පනත යටතේ, එකතු කරන ලද මුදල් කඩිනමින් හා නිසි පරිදි රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම සහතික කිරීම.
- අතිරික්ත අරමුදල් ඇත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අඩු අවදානමක් සහිත වැඩි ප්‍රතිලාභ ලබන ආයෝජනවල ප්‍රශස්ත ලෙස පරිහරණය කිරීමට වග බලා ගැනීම.
- කොමිෂන් සභාවේ කාරක හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- ආදායම, වියදම, වත්කම් සහ වගකීම් පිළිබඳව මූල්‍යකරණය සහ සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙනයාම මෙන්ම ඉහළ කළමණාකාරිත්වයට අවශ්‍ය වූ විට තොරතුරු සැපයීම.

කාර්යසාධනය

වාර්ෂික අයවැය / මූල්‍ය බලතල පැවරීම / මූල්‍ය ප්‍රකාශය

කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2021 වාර්ෂික අයවැය, 2021 මූල්‍ය බලතල පැවරීමේ ප්‍රකාශනය, 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.

කාර්තුමය මූල්‍ය වාර්තා

2020 වසරේ 04 වන කාර්තුවේ / වාර්ෂික මූල්‍ය වාර්තා සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

කාර්තුමය ආදායම් බදු ප්‍රතිලාභ

2020 .01.07 දිනැති දේශීය ආදායම් (සංශෝධන) පනත පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව 2019.04.01 දින සිට බලපවත්වන පරිදි ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදල සඳහා කරනු ලබන සියලුම ගෙවීම් සුදුසුකම් ලත් ගෙවීමක් ලෙස සැලකිය හැකි බවත්, එම සංස්ථාවේ ආදායම් බදු ගණනය කිරීමේදී අඩු කළ හැකි බවත් නිවේදනය කරන ලදී. ඒ අනුව, 2019 වසර තුළ ස්වයං තක්සේරුකරණ පදනම මත ගෙවීම් 3

ක් පමණක් සිදු කර ඇති අතර, එම අමාත්‍ය මණ්ඩල සංදේශය නිකුත් කළ වහාම අවසාන කාර්තුමය ගෙවීම් අත්හිටුවන ලදී.

ඒ අනුව, 2019 තක්සේරු වර්ෂය සඳහා රු. ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද රු.8,950,000,000 ක් සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස සලකනු ලැබූ අතර එම නිසා එම තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායමක් නොමැත.

එම පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2020/2021 වසර සඳහා කිසිදු ස්වයං තක්සේරුකරණ පදනමක් මත ආදායම් බදු ගෙවීමක් කර නොමැත.

අවසාන ආදායම් බදු ගණනය කිරීම

2020/2021 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායමෙන් කරන ලද මුළු ප්‍රේෂණය රු. 5,000,000,000 ක් වන බැවින් එම තක්සේරු වසර සඳහා අවසාන වරට ආදායම් බදු ගෙවීමක් සිදු කර නොමැත.

විදුලි සංදේශ බදු පනත සහ මූල්‍ය පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතු කිරීම

විදුලි සංදේශ බදු පනත සහ මූල්‍ය පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතු කිරීම නියමිත කාල සීමාව තුළ එකතු කර මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී. 1 වන කාර්තුව - රුපියල් මිලියන .3,712, දෙවන කාර්තුව - රු මිලියන.3,728, 3 වන කාර්තුව - රුපියල් මිලියන. 3,840Mn සහ 4 වන කාර්තුව-රුපියල් මිලියන. 3,713 යි.

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2019

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) 2019 වසරේ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සම්පූර්ණ කර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික විගණන කාර්යාලය සහ අභ්‍යන්තර විගණක වෙත ඉදිරිපත් කර ඇත.

සෘජු මුදල් / වෙක් තැන්පතු / මාර්ගගත අරමුදල් මාරු කිරීම් භාර ගැනීම

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් මූල්‍ය අංශය සෘජු තැන්පතු සහ බැංකු අරමුදල් මාරු කිරීම් භාර ගැනීම ආරම්භ කරන ලද අතර රිසිට්පත් රේඛනය කළ විගසම නාම මාත්‍ර ඉන්වොයිස් විස්තර / අදාළ දැන්වීම් වැනි සියලු තොරතුරු විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීම සිදු විය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, රට කීප වරක් අගුලු දැමූව ද , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුදල් සුමටව ගලා ඒම සහ ආදායම් එකතු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් වලට බාධා ඇති වී නොමැත.

මූල්‍ය අංශයේ ස්වයංක්‍රියකරණය

මෙම වසර තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ ඒකකයේ සහයෝගිත්වයෙන් කාර්යයේ ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ කාර්ය සාධනය ප්‍රවර්ධන කිරීම සඳහා අංශයේ ක්‍රියාකාරකම් ස්වයංක්‍රියකරණය ආරම්භ කිරීමට පියවර ගෙන තිබේ. මෙම ක්‍රියාකාරකම පිළිබඳ පිරිවිතර සකස් කිරීම සඳහා මූලික සාකච්ඡා සහ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා හඳුනා ගන්නා ලදී.

1996 අංක 27 දරන විදුලි සංදේශ පනත යටතේ ආදායම

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් කොමිෂන් සභාවේ ආදායම උපයා ගැනීම සහ රැස්කිරීමේ ව්‍යවස්ථාපිත බලතල පැවරී ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු හා පොදු ස්විච්කරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරු සමාගම් සහ ගුවන් විදුලි සංඛ්‍යාත පරිහරණය කරන්නන්ගේ ආදායම උපයා ගැනීම/එකතු කිරීම කරනු ලැබේ. කොමිෂන් සභාවේ ආදායම පහත වගුවෙන් දැක්වේ.

වගුව 23: කොමිෂන් සභාවේ ආදායම

ආදායම් ප්‍රභවය	2018 (රු. '000)	2019 (රු. '000)	2020 (රු. '000)
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු	122,449	168,367	5,402
සෙස් ගාස්තු	4,550,706	4,713,115	4,674,874
ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු	10,789,520	7,048,994	6,724,408
ගුවන් විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු	1,071,429	4,032,143	-
වෙළඳ බලපත්‍ර ගාස්තු	13,818	13,726	14,393
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු	164	85	88
නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	450	-	-
ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	401	-	-
රැහැන් රහිත දුරකථන වෙළඳ ගාස්තු	114,619	116,388	94,408
විභාග ගාස්තු	368	312	203
මාදිලි අනුමැති ගාස්තු	-	-	102
අයදුම්පත් සැකසීමේ ගාස්තු	1,020	1,016	400
කෙටි සංකේත අංක ගාස්තු	26,531	31,888	34,250
වෙනත් ආදායම් (ස්ථාවර තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය යනාදිය සඳහා පොළියෙන් ලැබෙන ආදායම)	1,108,519	369,992	488,995
එකතුව	**17,799,994**	**16,496,026**	**12,037,523**

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ එකතු කිරීම්

2019 නොවැම්බර් 01 වන දින දක්වා විදුලි සංදේශ බද්ද 15% ක් විය. රජය විසින් 25% ක බදු අඩුකිරීමක් නියම කරන ලද අතර 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලි සංදේශ සේවා සැපයීමේ වටිනාකම අනුව 11.25% ක් වන නව විදුලි සංදේශ බදු අනුපාතය 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වේ.

ප්‍රස්ථාරය 13: විදුලි සංදේශ බදු



මුදල් පනත යටතේ රැස්කිරීම්

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බද්ද

ඉහත ආදායමට අමතරව, 2009 අංක 13 මුදල් පනත මගින් සංශෝධනය කරන ලද 2004 අංක 11 දරණ මූල්‍ය පනතට අනුව, කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගෙන් "ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු" බද්ද අය කරන ලදී.

ඒ අනුව, කොමිෂන් සභාව "ලැබෙන දේශීය ප්‍රවේශ ගාස්තු" ලෙස විනාඩියකට ඇමරිකානු ඩොලර් 0.06 ක් එකතු කර එයින් 50% ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද අතර ඉතිරි 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ලෙස රඳවා ගනු ලැබේ.

වැඩිදුරටත් කොමිෂන් සභාව විසින් "පිටතට යන දේශීය ඇමතුම් ගාස්තු" ලෙස පිටතට යන ජාත්‍යන්තර ඇමතුම් වලින් අය කර ගන්නා ලද විනාඩියකට රුපියල් 3.00 ක් වන බදු මුදල 2019 ජූලි 01 දින සිට අහෝසි කරන ලදී.

ජංගම දුරකථන කුලුනු බදු

නව බද්දක් වශයෙන් 2019 ජනවාරි 01 දින සිට හඳුන්වා දෙන ලද මෙම බද්ද කාර්තුවක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් රැස්කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

කෙටි පණිවුඩ සේවා බදු

මෙය කෙටි පණිවුඩ ගොනු ලෙස අය කෙරෙන අතර එක් කෙටි පණිවුඩයකට රු. 0.25 ගාස්තුවක් අය කෙරේ. 2019 අප්‍රේල් 01 දින සිට බලපවත්වන පරිදි හඳුන්වා දී ඇත.

ප්‍රස්ථාරය 14: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු



* තාවකාලික දත්ත

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම

කොමිෂන් සභාවේ මුළු ආදායම පහත සඳහන් ප්‍රභවයන් යටතේ එකතු කරන ලද ආදායමෙන් සමන්විත වේ.

i. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත
ii. 011 අංක 21 විදුලි සංදේශ බදු පනත
iii. 009 අංක 13 මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 මුදල් පනත

ප්‍රස්ථාරය 15: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම



*තාවකාලික දත්ත

ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ

පහත දැක්වෙන පරිදි රජයේ ආදායම ශක්තිමත් කිරීම සඳහා 2020 වසරේදී (මුල් මාස 06 තුළ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් බිලියන 7.45 ක් රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී.

වගුව 24: ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණ

විස්තරය	2018 රු. බිලියන	2019 රු. බිලියන	2020* රු. බිලියන
විදුලි සංදේශ පනත/ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභා අරමුදල	21.85	7.95	4.0
විදුලි සංදේශ බදු	24.35	15.07	10.82
විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව 50%	2.79	2.67	2.15
පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු බදු	0.54	0.19	0
කෙටි පණිවුඩ සේවා බදු	-	0.42	0.42
කුලුනු බදු	-	1.38	1.42
එකතුව	**49.53**	**27.68**	**18.8**

* තාවකාලික දත්ත

දේපළ, පිරියත සහ උපකරණ

2020 වසරේදී (මුල් මාස 06) දේපළ, පිරියත සහ උපකරණ සඳහා එකතු කළ රුපියල් මිලියන 5.01 න් පිළිවෙලින් වායුසමීකරණ, පරිගණක, වෙනත් කාර්යාල උපකරණ, ජංගම දුරකතන සහ කාර්යාලීය ගෘහ භාණ්ඩ සඳහා පිළිවෙලින් රු. මිලියන 0.6, රු. මිලියන 2.56, රු. මිලියන 0.37, රු. මිලියන 0.16 හා මිලියන1.32 වැය කර ඇත.

ආයෝජන

කොමිෂන් සභාව මහජන බැංකුව සමඟ කොටස් වෙළඳපොළ දෛනික ගනුදෙනු ගිණුමක් පවත්වා ගෙන යන අතර 2020 වර්ෂයේ එම කොටස් වෙළඳපොළ ගනුදෙනු තුළින් රු. මිලියන 219ක පොලී ආදායමක් උපයා ඇත.

අභ්‍යන්තර විගණන අංශය සහ විගණන කමිටුව වාර්තා

අභ්‍යන්තර විගණන

සමාලෝචනය

අභ්‍යන්තර විගණනය යනු උපාය මාර්ග, අරමුණු සහ අවදානම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයට සහ එහි පාර්ශවකරුවන්ට වටිනාකමක් එක් කිරීම අභිමතාර්ථය කරගත් ස්වාධීන ක්‍රියාකාරකමකි ; එමගින් පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට සහ වෛෂයිකව අදාළ ආරක්ෂණය ලබා දීමට ක්‍රම ඉදිරිපත් කිරීමට පරිශ්‍රමය දරයි.

දත්ත සහ ව්‍යාපාර ක්‍රියාවලීන් ක්‍රමානුකූලව විශ්ලේෂණය කිරීම සහ තක්සේරු කිරීම මත පදනම්ව සූක්ෂ්ම දෘෂ්ටිය සහ නිර්දේශ ලබා දීමෙන් ආයතනයක පාලනය, ඵලදායීතාවය, අවදානම් කළමනාකරණය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා එය උත්ප්‍රේරකයකි. අඛණ්ඩතාව සහ වගවීම සඳහා පවත්නා කැපවීම සමග ආයතනයක් තුළ අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් වන අතර මෙහෙයුම් වල කාර්යක්ෂමතාව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා වැළැක්වීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ නීති රීති වලට අනුකූල වීම වැනි ක්ෂේත්‍ර ඊට ඇතුළත් විය හැකිය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව් අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා (අභ්‍යන්තර විගණක) කොමිෂන් සභාවට සෘජුවම වාර්තා කරන අතර වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලනමය වශයෙන්, අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරයි.

කාර්යයන්

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිනුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය සහ ඇගයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභහානි සහ වංචා වලින් ආරක්ෂා වී තිබේ දැයි නිශ්චිතව දැන ගැනීම.
- ගණු දෙනු වල අවශ්‍යතාව, ගණු දෙනු වල ප්‍රතිලාභ විමර්ශනය කිරීම සහ නාස්තිය සහ පමණ ඉක්මවා වියදම් කිරීම, ඉවත් කිරීම තුළින් වියදම් අඩු කිරීමේ වාර්තා පිළිබඳව ගවේශණය කිරීම.
- ඉහත දැක්වෙන ක්‍රියා මාර්ග තුළින් අනාවරණය වන කරුණු පාදක කර ගනිමින් විගණන කමිටු වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැඳවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරණ සකස් කිරීම සහ අදාළ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් අතර බෙදා හැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභා සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලබන විවිධ කමිටු වලට සහාය වීම හා නිර්දේශ ලබාදීම.

කාර්ය සාධනය

අභ්‍යන්තර විගණනය 2020 වර්ෂය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

වගුව 25: අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

#	විස්තර	සම්පූර්ණ / ක්‍රියාත්මක වෙමින් පවති / වෙනත්
01	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලැබීම් (මුදල්, චෙක්පත් සහ මුදල් ඇණවුම්)	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
02	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගෙවීම් (වැටුප් හා ඒ සම්බන්ධ ගෙවීම්, සේවකයන් සඳහා ණය සහ අත්තිකාරම්)	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
03	1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
04	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
05	වැටුප් සහ වේතන ගෙවීම	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
06	සේවකයන් සඳහා ගෙවන ලද ණය සහ අත්තිකාරම්	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
07	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ ක්‍රමෝපායන්	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
08	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය – 2018/12/31	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
09	රට අගුළු දැමූ කාළය තුළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණනය	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී
10	සියලුම විගණන විමසුම් සහ පිළිතුරු සම්බන්ධයෙන්, ජාතික විගණන කාර්යාලය සම්බන්ධීකරණය කිරීම – විගණන විමසුම් 40ක් වේ	සම්පූර්ණ කරන ලදි
11	විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම	සම්පූර්ණ කරන ලදි
12	අතිරික්ත ආදායම්	සම්පූර්ණ කරන ලදි
13	බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම	සම්පූර්ණ කරන ලදි
14	1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය යටතේ නව බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
15	ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීම	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
16	ණය ගැනියන් සහ ණය හිමියන්	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
17	කොළඹ නෙළුම් කුලුනේ අභ්‍යන්තර විගණනය (ඉංජිනේරු විගණනය හැර)	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

විගණන කමිටු වාර්තා

2020 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇති අතර පහත සඳහන් කරුණු මෙම රැස්වීම්වලදී සාකච්ඡා කෙරිණි.

1. **2020 පෙබරවාරි 07 වන දින විගණන කමිටු රැස්වීම:** වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර තීරණ / ක්‍රියාමාර්ග පහත පරිදි ගනු ලැබීය.

විෂය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණය
කොළඹ නෙළුම් කුලුනේ ඉංජිනේරු විගණනය	• අභ්‍යන්තර විගණක විශේෂ විගණන වාර්තාව සමාලෝචනය කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඊළඟ විගණන කමිටු රැස්වීමට සාරාංශයක් ඉදිරිපත් කිරීම. • අභ්‍යන්තර විගණක නෙළුම් කුලුන ව්‍යාපෘතිය පිළිබඳ අභ්‍යන්තර විගණනයක් ආරම්භ කිරීම (ඉංජිනේරු හා තාක්ෂණික විගණනය හැර).
විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය	සියලුම විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත ඉංජිනේරු විෂයය පිළිබඳ ප්‍රවීන අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම.
ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය සහ ප්‍රසම්පාදන සැලැස්ම	පසු විපරම් කිරීමට හා නියමිත දින හෝ එදිනට පෙර සියලුම වාර්තා සකස් කරන ලෙසට උපදෙස් දෙන ලදී.
වාහන ණය පරීක්ෂා කිරීම	වර්තමාන චක්‍රලේඛවල ඇති අඩුපාඩු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු වාහන ණය චක්‍රලේඛය සංශෝධනය කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	රුපියල් මිලියන 354 ක භාණ්ඩාගාර තැන්පතු ආයෝජනය කිරීම පිළිබඳව මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.
2018/2019 සෙස් ගාස්තු එකතු කිරීම	අධිභාරය පිළිබඳ කරුණු නීතිපතිවරයාගේ මතය විමසීම සඳහා යොමු කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම්	• විදුලි සංදේශ කුලුනු සම්බන්ධයෙන් දිවයින පුරා භෞතික පරීක්ෂාවක් සිදු කිරීම. • නීතිපති සමඟ බදු කාරණා පසු විපරම් කිරීම. • පෙර කොමිෂන් සභා කිරණයේ පටහැනි තොරතුරු නැවත සලකා බලමින් නෙළුම් කුලුනට අයත් ඉඩම් පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
වැටුප් හා වේතන	වැටුප් ලේඛනයේ කාලීනව උපස්ථ පවත්වා ගෙන යාම සහ එය ආරක්ෂිතව තබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් අනුගමනය කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන	ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ උපායමාර්ග	සති දෙකක් (02) ඇතුළත ගිනි නිවන උපකරණ ප්‍රතිස්ථාපනය කර අළුත්වැඩියා කිරීම සහතික කිරීම.

2. **2020 ජුනි 03 දින පැවති විගණන කමිටු රැස්වීම:** වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර පහත සඳහන් තීරණ / ක්‍රියාමාර්ග ගනු ලැබිය.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණය
කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය	නෙළුම් කුලුන ව්‍යාපෘතිය පිළිබඳ වර්තමාන අභ්‍යන්තර විගණන සැලැස්ම නැවත සලකා බැලීම (ඉංජිනේරු සහ තාක්ෂණික විගණනය හැර)
විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය	සියලුම විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා ඉංජිනේරු විෂයය පිළිබඳ ප්‍රවීන අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ කොන්දේසි (TOR) සම්බන්ධ අවසාන කෙටුම්පත ලැබීමෙන් පසු නැවත දැන්වීම් පළ කිරීම.
වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම	2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2020 අගෝස්තු මස අවසන් වන විට කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.
වාහන ණය පරීක්ෂා කිරීම	වාහන ණය චක්‍රලේඛය සංශෝධනය කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	රුපියල් මිලියන 354 ක භාණ්ඩාගාර තැන්පතු පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා බැංකුව වෙත ලිපියක් යොමු කිරීම.
සෙස් ගාස්තු එකතු කිරීම 2018/2019	අදාළ සියලු අවශ්‍යතා ඇතුළුව නිවැරදිව සකස් කරන ලද පටිපාටියක් සහිත කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම්	විදුලි සංදේශ කුලුනු පිළිබඳ දීප ව්‍යාප්ත භෞතික පරීක්ෂාවක් සිදු කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	ස්ථාවර තැන්පතු හා මුදල් වෙළඳපොළේ අතිරික්ත අරමුදල රාජ්‍ය බැංකුව හරහා භාණ්ඩාගාරයෙන් ආයෝජනය කිරීමේ නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම් නෙළුම් කුලුන - ණය ලැබීම සහ ගෙවීම	කළමනාකරණ ගාස්තුව හා රක්ෂණ වාරිකය සම්බන්ධයෙන් සමානුපාතික මුදලක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඊළඟ ගෙවීමෙන් අඩු කරන බව දන්වා එක්සිම් බැංකුවට ලිපියක් යැවීම.

3. **2020 සැප්තැම්බර් 07 වන දින විගණන කමිටු රැස්වීම:** වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර පහත සඳහන් තීරණ / ක්‍රියාමාර්ග ගනු ලැබිය.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ
කොළඹ නෙළුම් කුලුනේ අභ්‍යන්තර විගණනය (ඉංජිනේරු විගණනය හැර) සහ විශේෂ ව්‍යාපෘති	• නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීම (ඉංජිනේරු සහ තාක්ෂණික විගණනය හැර) • කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය පරීක්ෂා කිරීම සඳහා පැවරුම් පදනම මත පරීක්ෂකයකු බඳවා ගැනීම.
විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය	සියලුම විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා පැවරුම් පදනම මත ඉංජිනේරු විෂයය පිළිබඳ ප්‍රවීන අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම.
වාහන ණය පරීක්ෂා කිරීම	සකස් කර අවසන් කරන ලද වාහන ණය චක්‍රලේඛය ඊළඟ විගණන කමිටුවට ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	රුපියල් මිලියන. 354 භාණ්ඩාගාර තැන්පතුව පිළිබඳව මහා භාණ්ඩාගාරය සමග පසු විපරම් කිරීම.
සෙස් ගාස්තු එකතු කිරීම 2018/2019	නීතිපතිවරයාගෙන් ලැබුණු පිළිතුර පිළිබඳව කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම්	සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම. අනුමත කරන ලද කුලුනු, ප්‍රදානය කරන ලද සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව සහ අය කරන ලද කුලුනු බදු සම්බන්ධයෙන් ප්‍රතිසන්ධානයක් ඇති කිරීම සහ අනාගතයේදී කුලුනු ස්ථාපනය සඳහා අනුමැතිය ලබා නොගෙන සංඛ්‍යාත නිකුත් කිරීම වැළැක්වීම සඳහා යාන්ත්‍රණයක් සැලසුම් කිරීම හා ලේඛනගත කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	රැස්වීමේදී සාකච්ඡා කළ සංශෝධන ඇතුළත් කිරීමෙන් පසු ප්‍රතිපත්ති වාර්තාව විගණන කමිටුවට ඉදිරිපත් කිරීම.
2018.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ නිරීක්ෂණ පරීක්ෂා කිරීම.	2019.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සමාලෝචනය කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම.
වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම	ඉහත අභ්‍යන්තර විගණන වාර්තාවේ අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හෝ එවැනි අභ්‍යන්තර විගණන නිරීක්ෂණ මත ක්‍රියාත්මක කළ යුතු විකල්ප නිර්දේශයන් පිළිබඳ සවිස්තරාත්මක කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

4. **2020 දෙසැම්බර් 22 දින පැවති විගණන කමිටු රැස්වීම:** වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර පහත තීරණ / ක්‍රියාමාර්ග පහත පරිදි ගනු ලැබීය.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ
කොළඹ නෙළුම් කුලුනේ අභ්‍යන්තර විගණනය (ඉංජිනේරු විගණනය හැර) සහ විශේෂ ව්‍යාපෘති	කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය සඳහා පැවරුම් පදනමක් මත ස්වාධීන අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම.
විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සියලුම විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා ඉංජිනේරු විෂයය පිළිබඳ ප්‍රවීන අභ්‍යන්තර විගණකවරයකු තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා ස්වාධීන ඉංජිනේරුවෙකු පත් කිරීම.
වාහන ණය පරීක්ෂා කිරීම	සකස් කරඅවසන් කරන ලද වාහන ණය වක්‍රලේඛය නැවත ඉදිරිපත් කිරීම
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	රුපියල් මිලියන 354 ක භාණ්ඩාගාර තැන්පතුව සඳහා මහා භාණ්ඩාගාරයේ ආයෝජන පැවැත්ම සහතික කිරීමේ හැකියාව අවබෝධ කර ගැනීම.
සෙස් ගාස්තු එකතු කිරීම 2018/2019	1996 විදුලි සංදේශ පනතේ 22 උ වගන්තිය ප්‍රකාරව අදාළ සියලු අවශ්‍යතා ද ඇතුළත් කරමින් අධිභාර නොපැනවීම පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාවක් ඒකාබද්ධව ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම්	විදුලි සංදේශ කුලුනු පිළිබඳ දීප ව්‍යාප්ත පරීක්ෂාව අඛණ්ඩව කරගෙන යාම. අනුමත කරන ලද කුලුනු සංඛ්‍යාව, ප්‍රදානය කරන ලද සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව සහ අයකරනු ලබන කුලුනු බදු අතර සැසඳුම අවසන් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව	ආයෝජන ප්‍රතිපත්තිය කෙටුම්පත කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.
2018.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ නිරීක්ෂණ පරීක්ෂා කිරීම.	2019.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සමාලෝචනය කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම.
වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම	අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සඳහා ක්‍රියාත්මක කළ යුතු විකල්ප නිර්දේශ පිළිබඳ සවිස්තරාත්මක කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.
ආපදා ණය ලබා දීමේ හා අයකර ගැනීමේ ක්‍රියාවලිය	මිණුම් ලකුණක් ලෙස නිසි ලෙස ස්ථාපිත රාජ්‍ය ආයතන විසින් අනුගමනය කරන ලද ප්‍රශස්ත පටිපාටි හඳුනාගෙන ඒවා ඇතුළත් කිරීමෙන් පසු ආපදා ණය වක්‍රලේඛ කෙටුම්පත ඊළඟ විගණන කමිටුවට ඉදිරිපත් කිරීම.

නියාමන කමිටු රැස්වීම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විශේෂිත නියාමන ගැටළු පැනනගින විට සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගැනීම සඳහා "නියාමන කමිටුවක්" පිහිටුවා ඇත. නියාමන කමිටුව නියාමන ගැටළු අවම කිරීමට සහ විසඳීමට මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මෙහෙයුම් හා සුමට ක්‍රියාකාරිත්වයට සහාය වේ.

මෙම කමිටුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන හොබවන අතර වර්ණාවලි, ජාල, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා, තරඟකාරිත්ව, බලපත්‍ර කළමනාකරණ, අනුකූලතා සහ විමර්ශන සහ මූල්‍ය අංශය යන අංශවල අංශ ප්‍රධානීන් සෙසු නියෝජිතයන් වේ. තරඟයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තීරුබදු) කමිටුවේ ලේකම් වේ.

විදුලි සංදේශ නියාමනයට අදාළ කරුණු කමිටුවේ කැඳවුම්කරු වෙත යොමු කර නියාමන කමිටුවට ඉදිරිපත් කරයි. එවිට කමිටුව විසින් අදාළ අංශ හරහා අවශ්‍ය මහ පෙන්වීම සහ කටයුතු සිදු කරයි. අවශ්‍ය වූ විට අදාළ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභා තීරණ ලබා ගනී.

2020 වර්ෂය තුළ, නියාමන කමිටු රැස්වීම් හතරක් 2020 ජනවාරි 08, පෙබරවාරි 17, ජූනි 08 සහ අගෝස්තු 09 යන දිනවල පවත්වන ලදී.

මෙම වර්ෂය තුළ නියාමන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර රැස්වීම්වල කෙටි සාරාංශයක් පහත පරිදි වේ.

නියාමන විෂය ක්ෂේත්‍රය	නියාමන කමිටුවේ තීරණ
අයක්‍රම	නියාමන කමිටුව විසින් අයක්‍රම මාර්ගෝපදේශ සංශෝධනය කරන ලදී.
	අනුකූල නොවන ක්‍රියාකරු සමාගම් සඳහා සෘනාත්මක ණය ක්‍රමයක් / අවාසි කරුණු හඳුන්වා දීමට තීරණය විය.
	“SLT Go” මෘදුකාංගය සඳහා ත්‍රෙපාර්ශවීය සංවාදයේ අවශ්‍යතාවය අවධාරණය කළ අතර වෙනත් රටවල අත්දැකීම් සත්‍යාපනය කිරීමට තීරණය කළේය.
අනුකූලතා	හවිසන් සමාගම හැර අනෙකුත් සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් ප්‍රකාශ කරන ලද දත්ත අනුපාත තීරණයට අනුගත බව වැඩබලන අධ්‍යක්ෂ (අනුකූලතා) ප්‍රකාශ කර ඇත. කිලෝබයිට් 10 පරාස වල ප්‍රකාශිත දත්ත ලබා දෙන ලෙස ඔවුන්ට ලිපියක් යැවීමට තීරණය කළේය.
පාරිභෝගික සබඳතා	FTTH සම්බන්ධතාවය ද්විතීය හා තෘතීය පාරිභෝගිකයින් සඳහා බව පාරිභෝගිකයන්ට නිවේදනය කිරීමට තීරණය විය.
සන්නිවේදන හිමිකරුගේ සංගමය විසින් කරන ලද පැමිණිලි	සන්නිවේදන හිමියන්ගේ සංගමය විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ඔවුන්ගේ ඉල්ලීමේ ඔවුන් මතු කර ඇති සෑම කරුණක් පිළිබඳවම සංගමයට පිළිතුරු දීමට තීරණය විය.
බලපත්‍ර කළමනාකරණ	සමහර විකුණුම්කරුවන් නියමිත වේලාවට තම බලපත්‍රය අලුත් නොකරන බැවින්, ප්‍රමාද වූ වෙළඳ බලපත්‍ර අයදුම්පත් අලුත් කිරීම් ලෙස නොව නව අයදුම්පත් ලෙස සලකා බැලීමට තීරණය කෙරිණි.
නීති	එටිසලාට් සමාගම සමඟ ඒකාබද්ධ වන අවස්ථාවේ දී හවිසන් සමාගම විසින් සිදු කරන ලද ආවරණ බැඳීම් වගකීම් පිළිබඳ ප්‍රගතිය අධ්‍යයනය කර වාර්තා කිරීමට තීරණය විය.
මාදිලි අනුමැති	කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්ප්‍රේෂක දැනට අනුමත මෙහෙයුම් කටයුතු වලට පටහැනිව යොදා ගන්නේද යන්න පරීක්ෂා කිරීමට තීරණය විය.

මූල්‍ය ප්‍රකාශනය

2020 වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2020.12.31 දිනට	2019.12.31 දිනට
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**4**	12,052,545,214	12,142,180,868
අස්පෘශ්‍ය වත්කම්	**4.1**	1	1
කෙරිගෙන යන වැඩ	**5**	22,274,373,401	21,719,123,143
ආයෝජන	**6**	1,500,000,000	354,000,000
මුළු ජංගම නොවන වත්කම්		**35,826,918,616**	**34,215,304,011**
ජංගම වත්කම්			
ලැබිය යුතු ගිණුම්	**7**	2,246,199,611	2,467,771,521
පූර්වගෙවුම් සහ අත්තිකාරම්	**8**	218,359,245	225,504,893
ණය සහ අනෙකුළුහ් ලැබීම්	**9**	2,274,343,557	2,977,579,154
මුදල් සහ මුදල් සමානුපාත	**10**	7,985,067,767	3,624,973,581
මුළු ජංගම වත්කම්		**12,723,970,179**	**9,295,829,149**
මුළු වත්කම්		**48,550,888,795**	**43,511,133,160**
සම කොටස් සහ වගකීම්			
සම කොටස්			
රජයේ දායක මුදල්	**11**	526,214,744	526,214,744
සමුච්චිත අතිරික්තය		26,915,197,200	19,764,217,681
ප්‍රත්‍යාගණන අතිරික්තය		37,380,000	37,380,000
මුළු සම කොටස්		**27,478,791,944**	**20,327,812,426**
ජංගම නොවන වගකීම්			
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		4,317,085,861	5,775,390,598
රඳවා ගැනීම	**12**	62,749,026	46,152,801
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**13**	20,253,726	22,756,459
නාගරික සංවර්ධන අධිකාරිය		9,450,000,000	9,450,000,000
මුළු ජංගම නොවන වගකීම්		**13,850,088,613**	**15,294,299,858**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2020.12.31 දිනට	2019.12.31 දිනට
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	14	133,749,889	138,715,771
අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම්	15	3,758,122,308	4,295,761,430
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු මුදල්	16	1,385,898,515	1,560,142,776
නෙළුම් කුලුනේ ප්‍රමාද හානි වගකීම්		1,944,237,526	1,894,400,900
මුළු ජංගම වගකීම්		**7,222,008,238**	**7,889,020,877**
මුළු වගකීම්		**21,072,096,851**	**23,183,320,735**
මුළු සම කොටස් සහ වගකීම්		**48,550,888,795**	**43,511,133,160**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මඟින් 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

.....
එම්.කේ.ජයන්ත
අධ්‍යක්ෂ - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුවේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....	.....
ජයන්ත ද සිල්වා	**ඕෂද සේනානායක**	**චමින්ද කුමාරසිරි**
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**කොමිෂන් සභා සාමාජික**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2020.12.31 දිනට	2019.12.31 දිනට
ආදායම			
ආදායම	**17**	29,000,860,956	38,575,208,162
මුළු මෙහෙයුම් ආදායම		**29,000,860,956**	**38,575,208,162**
අඩු කළා: නියාමන වියදම්	**18**	(54,779,057)	(78,881,625)
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**28,946,081,898**	**38,496,326,537**
අඩු කළා: වෙනත් වියදම්			
පරිපාලන හා ස්ථාපිත කිරීම	**19**	679,034,945	682,031,488
මූල්‍ය සහ වෙනත් වියදම්	**20**	5,323,930	4,471,433
විදේශ විනිමය ගනුදෙනු (ලාභය) /අලාභය		233,672,260	(73,717,095)
මුළු වියදම		**918,031,136**	**612,785,826**
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පෙර		**28,028,050,762**	**37,883,540,711**
අඩු කළා: ආදායම් බදු		(702,941,276)	0
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු		**27,325,109,486**	**37,883,540,711**
වෙනත් විස්තීර්ණ ආදායම			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ලාභය/(අලාභය)		(2,504,579)	(7,142,875)
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**(2,504,579)**	**(7,142,875)**
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**27,322,604,907**	**37,876,397,836**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**21-1**	(18,817,625,389)	(27,680,970,570)
ඒකාබද්ධ අරමුදලට දායක කිරීමෙන් පසුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**8,504,979,519**	**10,195,427,265**
එකතු කරන්න:			
ඉදිරියට ගෙනා මුළු විස්තීරණ ආදායම		**19,764,217,681**	**10,568,790,416**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**21-2**	(1,000,000,000)	(1,000,000,000)
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණ ලෙස සැලකිය යුතු භාණ්ඩාගාර තැන්පතු ශේෂය		(354,000,000)	0
		18,410,217,681	**9,568,790,416**
ඉදිරියට ගෙන ගිය මුළු විස්තීර්ණ ආදායම		**26,915,197,200**	**19,764,217,681**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2020.12.31 දිනට	2019.12.31 දිනට
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල්	**22**	27,418,445,022	38,034,421,151
බදු ගෙවීම්		0	(4,531,974,300)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම්		(3,429,146)	(3,750,811)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		**27,415,015,876**	**33,498,696,040**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(2,337,147)	(62,791,020)
කෙරිගෙන යන වැඩ යටතේ ඇති ව්‍යාපෘති		(552,571,443)	(3,916,017,664)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය		(1,146,000,000)	0
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම		229,905,799	32,741,587
ස්ථාවර තැන්පතුවල ආයෝජන - පාරිතෝෂික බැඳීම්		(11,250,000)	(7,650,000)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම - පාරිතෝෂික බැඳීම්		5,884,108	6,654,523
දේපල, පිරියත් සහ උපකරණ අළෙවි කිරීම්		39,600	225,836
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල		**(1,476,329,084)**	**(3,946,836,738)**
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම	**23**	294,612	389,770,474
කොටස් වෙළඳපොල ගණුදෙනු වලින් පොළී අදායම		218,844,390	310,471,287
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ		(19,817,625,389)	(28,680,970,570)
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ ලෙස සැලකිය යුතු භාණ්ඩාගාර තැන්පතු ශේෂය		(354,000,000)	0
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙලුම් කුලුන)		(1,647,902,297)	(1,592,699,044)
රඳවා ගැනීම්		16,596,225	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්		**(21,583,792,458)**	**(29,573,427,853)**
මුදල් හා මුදල් සමානුපාත වල ශුද්ධ (අඩුවීම) /වැඩිවීම		**4,354,894,334**	**(21,568,551)**
මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම			
2020 ජනවාරි 01 දිනට	**10**	3,624,973,581	3,647,565,507
(අඩුවීම) /වැඩිවීම		4,354,894,334	(21,568,551)
මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය) /ලාභය		5,199,852	(1,023,374)
2020 දෙසැම්බර් 31 දිනට	**10**	**7,985,067,767**	**3,624,973,581**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	රාජ්‍යදායකවීම්	ප්‍රත්‍යාගණන අතිරික්තය	සමුච්චිත අතිරික්තය / (හිඟය)	මුළු සමානුපාත
2019 ජනවාරි 01 දිනට ශේෂය	526,214,744	37,380,000	10,568,790,416	11,132,385,160
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	(1,000,000,000)	(1,000,000,000)
	526,214,744	**37,380,000**	**9,568,790,416**	**10,132,385,160**
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	10,195,427,265	10,195,427,265
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**526,214,744**	**37,380,000**	**19,764,217,681**	**20,327,812,426**
2020 ජනවාරි 01 දිනට ශේෂය	526,214,744	37,380,000	19,764,217,681	20,327,812,425
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්	-	-	(1,000,000,000)	(1,000,000,000)
අඩු කළා: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ ලෙස සැලකිය යුතු භාණ්ඩාගාර තැන්පතු ශේෂය	-	-	(354,000,000)	(354,000,000)
	526,214,744	**37,380,000**	**18,410,217,681**	**18,973,812,425**
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	8,504,979,519	8,504,979,519
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**526,214,744**	**37,380,000**	**26,915,197,200**	**27,478,791,944**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - **2020.12.31**

(මෙම සටහන්වල සියළුම වටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මීස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.

උක්ත පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ:

කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත්ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

(අ) ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාර්ශ්වීය කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) අත්‍යාවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම. (ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරිගැන්වීම; සහ

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

2. අනුකූලතා ප්‍රකාශනය - පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS” සහ “LKAS”) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ 1995 අංක 19 දරන විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතා අනුව කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

3. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ඉදිරිපත් කළ වර්ෂය සඳහා නිත්‍ය වශයෙන් අදාල වී ඇත.

3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට ("SLFRS" සහ "LKAS") අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

3.1.1 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගණුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

3.2 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

3.2.1 දේපල, පිරියත සහ උපකරණ

(අ) හඳුනාගැනීමේ මිනුම්

සියලුම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානිකරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත සෘජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාව වෙත අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙනයාමට හෝ ගලා ඒම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටස් රැගෙන යන ප්‍රමාණය හඳුනා නොගනී. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඔවුන් දරනු ලබන මූල්‍ය කාල සීමාව තුළ විස්තීරණ ආදායමට අය කෙරේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය විගණකාධිපතිගේ මතයට යටත් ව කොමිෂන් සභාවේ අවසාන සමාලෝචනය යටතේ පවතී. එය අවසන් කර අනුමත වූ පසු, එම ප්‍රතිපත්තියට අනුකූලව එහි ප්‍රත්‍යාගණන වටිනාකම් අනුව දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම් ගණනය කරනු ලැබේ.

එමෙන්ම සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතින ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඉහත ප්‍රතිපත්තිය ප්‍රකාරව කටයුතු කරනු ලබන අතර සමාලෝචිත සහ අනුමත කරන ලද ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය මත ස්ථාවර වත්කම්වල සැබෑ ස්වරූපය ඉදිරි මූල්‍ය වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල විස්තර කෙරේ.

(ආ) ක්ෂය වීම්

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂයකිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

(ඇ) දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය

ගොඩනැගිලි	වසර 20 වැඩි
විදුලි සංදේශ කුලුනු	වසර 10 වැඩි
ලී බඩු සහ සවි කිරීම්	වසර 10 වැඩි
කාර්යාල උපකරණ	වසර 10 වැඩි
පරිගණක	වසර 04 වැඩි
වායුසමීකරණ යන්ත්‍ර	වසර 10 වැඩි
මෝටර් රථ	වසර 08 වැඩි
විදුලි උත්පාදන යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි සෝපාන යන්ත්‍ර	වසර 10 වැඩි
කාර්යාල දුරකථන	වසර 10 වැඩි
කාර්යාල ලී බඩු	වසර 10 වැඩි
කාර්මික උපකරණ	වසර 10 වැඩි
වෙබ් සර්වර්	වසර 04 වැඩි
කාය වර්ධන උපකරණ	වසර 04 වැඩි
මාධ්‍ය ඒකකයේ උපකරණ	වසර 04 වැඩි

(ඈ) අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නිශ්චිත මෘදුකාංගයක් අත්පත් කර ගැනීමට සහ ඒවා භාවිතා කිරීමට ගෙන ඒමට දරන පිරිවැය මත ය. එම වියදම් වසරක කාලයක් තුළ පියවනු ලැබේ.

(ඉ) කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහිලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(ඊ) ශේෂපත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම එහි පරිහරණය මත තවදුරටත් හඳුනාගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම සමඟ පරිහරණය කිරීමේ ලාභ ප්‍රයෝජන සැසඳීමෙන් දේපල, පිරියත සහ පාඩුව තීරණය වන අතර ''වෙනත් ආදායම්'' ලාභය හෝ පාඩුව තුලින් ශුද්ධ ලාභය හඳුනා ගනු ලැබේ.

3.2.2 ආයෝජන

1998 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් රු. 354,000,000.00 මුදලක් ප්‍රේෂණය කර ඇති අතර භාණ්ඩාගාර තැන්පතු වශයෙන් ආයෝජන යටතේ පෙන්වා ඇත.

වසර 22කට පසු, එනම් 2020 වර්ෂයේදී මෙම තැන්පතු ශේෂය විමසා ඇත්තේ පැවැත්ම තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂි ලේඛනයක් නොතිබීම හේතුවෙනි. ඒ අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම්වලදී, භාණ්ඩාගාරයේ සහ ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයන් ද කමිටු සාමාජිකයින් ලෙස සහභාගී වූ අතර, මේ පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී.

2021.01.12 දින පැවති විගණන කමිටු රැස්වීමේදී භාණ්ඩාගාරයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියක් ලෙස භාණ්ඩාගාර ගිණුම්වල වසර දෙකකට වැඩි ආයෝජනයක් පවතී නම් එය භාණ්ඩාගාරයේ ආදායමක් ලෙස සලකන ලෙස මහා භාණ්ඩාගාරයේ අභ්‍යන්තර විගණනය රාජ්‍ය ගිණුම් අංශයට උපදෙස් දෙන බව භාණ්ඩාගාර නියෝජිත එම්.ජී. එම්. ප්‍රේමතිලක මහතා අවධාරණය කළේය. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත කේ.ආර්.ටී මැනිකේ මහත්මිය ද ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රාජ්‍ය ගිණුම් අංශය විසින් සිදු කරන ලද ක්‍රියාමාර්ග වලට අනුකූල වන රුපියල් මිලියන 354 ක ගිණුම්කරණ ක්‍රියාමාර්ග සිය ගිණුම් පොත්වල සලකා බැලිය යුතු බවයි.

මේ අනුව, සමාලෝචිත කාල සීමාව තුළ රුපියල් මිලියන 354 භාණ්ඩාගාර තැන්පතු ගිණුම් වියදම් වලට වඩා ඉදිරියට ගෙන එන ලද/ සමුච්චිත අතිරික්ත ආදායම සන්සන්දනය කර හිලව් කිරීමට තීරණය කරන ලද අතර (සමුච්චිත අතිරික්තයෙන් ගැලපීම) , එය පසුගිය වසරවල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අතිරික්ත ආදායමෙන් ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරන ලද අරමුදල් ලෙස සලකනු ලැබේ.

3.2.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් හඳුනාගෙනෙ පවත්වාගෙන යනු ලබන්නේ එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා අඩුකිරීමෙන් පසුව/ අඩුව සහ මුල් බිල්පත් වටිනාකම් මතය. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ.

3.2.4 පෙර ගෙවුම් සහ අත්තිකාරම්

අත්තිකාරම් ලියාපදිංචි කිරීම

(අ) නෙළුම් කුලුන - මෙම වර්ෂය තුළ 100% ආවරණය කරන ලදී.

(ආ) තොරතුරු තාක්ෂණ උද්‍යානය - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කොන්දේසි ප්‍රකාරව තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියේ බෙරුම්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

3.2.5 මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

3.3 වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

3.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දිනට ඇති ප්‍රාග්ධන ව්‍යදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස අංක 3.7යටතේ හෙළිදරව් කර ඇත.

3.3.2 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

(අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම

වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ.

	2020 (රු.)	2019 (රු.)
මූල්‍යය වර්ෂය ආරම්භයේදී ශේෂය	**80,831,913**	**62,930,515**
ජංගම සේවා පිරිවැය	3,961,342	3,683,105
පොළී පිරිවැය	5,071,456	4,171,706
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස අයකිරීම්	**9,032,798**	**7,854,811**
තථ්‍ය අලාභ / (ලාභ)	2,504,579	7,142,875
ගෙවන ලද ප්‍රතිලාභ	(3,429,146)	(3,750,812)
එකතු කළා: පාරිතෝෂික බැඳීම් ආවරණය කිරීමට ආයෝජන මත උපයාගත් පොලිය	5,884,108	6,654,523
මූල්‍යය වර්ෂය අවසානයේදී ශේෂය	**94,824,253**	**80,831,913**

1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම කොමිෂන් සභාව විසින් සම්මත කර ඇත. විශ්‍රාම ප්‍රතිගාහ සැලැස්ම අරමුදල් සපයනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබාගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති - LKAS 19 : සේවක ප්‍රතිලාභවල නියම කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මගින් පැන නගින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.

වට්ටම් අනුපාතිකය	-	වාර්ෂිකව 8%
වැටුප් වර්ධක අනුපාතය	-	1% - 6.7% දක්වා
විශ්‍රාම ගැනීමේ වයස	-	අවුරුදු 60

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත සහභාගී සැලසුමක් සඳහා සහභාගිත්වය පිළිබඳ බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සිදු කරන ලද ව්‍යදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF)

කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයන් වේ.

කොමිෂන් සභාව විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා සිය මූලික වැටුපෙන් පිළිවෙලින් සියයට 15 සහ සියයට 3 දායක කොමිෂන් සභාව සේවකයින්ගේ මූලික වැටුපෙන් 15%ක් සහ 3%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) පිළිවෙළින් දායක වන අතර සේවකයා සේවක අර්ථසාධක අරමුදල සඳහා 10%කින් දායක වේ.

3.4 ආදායම හඳුනා ගැනීම

3.4.1 සටහන් 3.4.1.2 හා 3.4.1.4 හි ආදායම් අයිතමය හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ආදායම හඳුනාගෙන ඇත.

3.4.1.1 සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යනු යම් කිසි ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් පරිහරණය කිරීම සඳහා සංඛ්‍යාත පරිහරණය කරන්නකු විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුවකි. එබැවින්, 2019 වර්ෂයේ සිට, නැව් මධ්‍යස්ථාන ගාස්තු සහ ගුවන් යානා බලපත්‍ර ගාස්තු ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යටතේ වර්ගීකරණය කර ඇත.

වර්ෂය තුළ එකතු කරන ලද කිසියම් සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුවක බලපත්‍ර කාලය ලබන වසර දක්වා ක්‍රියාත්මක වන්නේ නම්, ඊළඟ වසර සඳහා අදාළ සමානුපාතික මුදල අත්තිකාරම් ආදායම ලෙස හඳුනාගෙන අත්තිකාරම්, නැන්පතු සහ ගෙවිය යුතු වෙනත් ශීර්ෂ යටතේ වර්ගීකරණය කෙරේ.

3.4.1.2 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට නව බලපත්‍ර නිකුත් කිරීමේදී හෝ පවතින බලපත්‍ර වසර 10ක් හෝ අවුරුදු 05ක් සඳහා අලුත් කිරීමේදී මුදල් පදනම මත ක්‍රියාකරු බලපත්‍ර අලුත් කිරීමේදී මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.1.3 වෙළඳ බලපත්‍ර ගාස්තු/රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු/කෙටි සංකේත අංක ගාස්තු/බලපත්‍ර සකස් කිරීමේ ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් කිරීමේදී වෙළෙඳ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.1.4 සෙස් ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (උ) කොන්දේසි ප්‍රකාරව සෙස් ගාස්තු හඳුනාගනු ලැබේ.

3.4.2 විදුලි සංදේශ බදු

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන විදුලි සංදේශ බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර පසුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 2018.11. 05 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 25 සිට සියයට 15 දක්වා අඩු කරන ලද අතර 2019.11.27 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන

ලද පරිදි 2001 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ සංශෝධනයක් සහිතව 2019.12.01 දින සිට බලපවත්වන පරිදි එය නැවත සියයට සියයට 15 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලදී.

ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම, ආස්ක් කේබල් විෂන් (පෞද්ගලික) සමාගම, සුප්‍රීම්සැට් (පෞද්ගලික) සමාගම, ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්(පෞද්ගලික) සමාගම සහ සිටි කේබල් ලින්ක්ස් (පෞද්ලගික) සමාගම විසින් නොගෙවන ලද විදුලි සංදේශ බදු හා සෙස් ගාස්තු අය කර ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම සහ ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම විසින් විදුලි සංදේශ බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නීතීමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3.4.3 විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස යටතේ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායමක් වශයෙන් හඳුනා ගන්නා ලදී. මෙම ආදායමෙන් සියයට 50 ප්‍රතිශතයක් ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

3.4.4 ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කර ඇති රීති යටතේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

2004 අංක 11 දරන මුදල් පනත යටතේ 2019 මැයි 14 දින අතිවිශේෂ ගැසට් අංක. 2123/19 මගින් ප්‍රසිද්ධ කරන ලද 2019 අයවැය තීරණය ප්‍රකාරව 2019.06.01 දින සිට බලපවත්වන පරිදි පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) අවලංගු කරන ලදී.

3.4.5 කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xiii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු පනවන ලද අතර අතිවිශේෂ ගැසට් අංක. 2104/16 හි රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.6 ජංගම දුරකථන කුලුනු බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි ජංගම දුරකථන කුලුනු බදු පනවන ලද අතර අංක. 2104/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.7 අනෙකුත් ආදායම

අනෙකුත් ආදායම කෙටිකාලීන ස්ථාවර තැන්පතු සහ කොටස් වෙළඳපල ආයෝජන, කොකාවිල් බදු කුලී යනාදියෙහි ආයෝජනය කරන ලද අරමුදල් මත ලැබෙන පොලී ආදායමෙන් සමන්විත වන අතර කල්පිරීමේ දිනයේ දී ලාභ හෝ අලාභ එකතු වන බැවින් පොලී ආදායම හඳුනා ගැනේ.

3.5 වියදම්

වැයවූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමයක් උපයා ගැනීම අතර වන ඍජු සම්බන්ධතාවයක පදනම මත විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගැනේ. කොමිෂන් සභාව පවත්වාගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්වයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දරණ ලද සියලු වියදම් වසර සඳහා වන අතිරික්ත ආදායමෙන් අය කරගෙන ඇත.

3.5.1 ආදායම් බදු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට 2006 අංක 10 දරන සංශෝධිත ආදායම් බදු පනත යටතේ ලබා දී ඇති බදුවලින් නිදහස් වීම, 2018/4/1 සිට ක්‍රියාත්මක වන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත බලාත්මක වීමත් සමග අහෝසි කෙරිණි.

ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලට කරනු ලබන ගෙවීම සුදුසුකම් ලත් ගෙවීමක් ලෙස සලකනු ලබන අතර, 2019.04.01 දින සිට බලපවත්වන පරිදි එවැනි සංස්ථාවක ආදායම් බදු ගණනය කිරීමේදී එය අඩු කළ හැකිය. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රඳවාගැනීමේ බදු (WHT) සහිතව ආදායම් බදු ලෙස 2019 වසරේදී වැඩිපුර ගෙවා ඇති රු. 1,077,656,108.00 මුදල 2020.12.31 අවසන් වූ මුදල් වර්ෂය සඳහා බදු බැර ලෙස සලකනු ලැබේ.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බදු කාලය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වේ. ඒ අනුව, 2020 සඳහා වන බදු වගකීම පහත දැක්වේ.

	2020 (රු.)
බදුකරණයට පෙර ගිණුම් ලාභය	**28,028,050,762**
එකතු කළා: බදු අයකළ හැකි ආදායම / (අලාභය) නිරණය කිරීමේදී අනුමත කළ නොහැකි වියදම්වල බදු බලපෑම	328,323,876
අඩුකළා: බදු අයකළ හැකි ආදායම නිරණය කිරීමේදී අනුමත කළ හැකි වියදම්වල බදු බලපෑම	(17,455,356,730)
ආදායම් බදු සඳහා අය කළ හැකි ගැළපුම් කළ ගිණුම් ලාභය / (අලාභය)	**10,901,017,908**
පොලී ආදායම	458,258,462
තක්සේරු කළ හැකි ආදායම	**11,359,276,370**
අඩුකළා: සුදුසුකම් ලබන ගෙවීම	(5,000,000,000)
මුළු බදු අය කළ හැකි ආදායම	**6,359,276,370**
වර්ෂය සඳහා බදු අනුපාතය	28%
වර්ෂය සඳහා බදු බලපෑම	**1,780,597,384**
බදු බැර	
ගෙවීමට වඩා වැඩි ආදායම් බදු (පසුගිය වසර)	1,077,641,864
රඳවා ගැනීමේ බදු (WHT) ගෙවීම	14,244
මුළු බදු බැර	**1,077,656,108**
ගෙවිය යුතු බදු මුදල	**702,941,276**

3.6 ව්‍යාපෘති

3.6.1 කොළඹ නෙළුම් කුලුන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාව) විසින් 2010 ඔක්තෝම්බර් 27 සහ 2011 දෙසැම්බර් 14 දිනැති පිළිවෙලින් යොමු අංක 10/2473/401/301 සහ 11/2262/501/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව "කොළඹ නෙළුම් කුලුන" නමින් මීටර් 350 ක් උසැති බහු කාර්යය රූපවාහිනී සහ විදුලි සංදේශ කුලුන ඉදි කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීමට කටයුතු China National Electronics Importers & Exports Corporation (CEIEC) හා Aeraspace Long March International Trade Co. Ltd. (ALIT) සමාගම්වලට ප්‍රදානය කරන ලදී.

එසේම කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු 2 වන අදියර වශයෙන් සුවිශාල විනෝදාස්වාදය සපයන උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කර ආරම්භ කිරීමට නියමිතය.

මෙම ඉදිකිරීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 104.3 වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් 85% ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ඇපකරුවකු වශයෙන් අත්සන් තබන ලද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ EXIM බැංකුව විසින් අත්සන් කරන ලද අංක BLA-201207 දරන ගැනුම්කරුවන්ගේ ණය ගිවිසුම යටතේ - Export-Import Bank of China (EXIM) බැංකුව විසින් වසර 14 ක ණය ක්‍රමය මත මුදල් සපයන ලදි. ඇමරිකානු ඩොලර් මිලියන 15.645 ක් වන සියයට 15ක් වූ ව්‍යාපෘති පිරිවැය ශේෂය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරනු ඇත.

2020.12.31 වන විට ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය දළ වශයෙන් 95% කි. ඇමරිකානු ඩොලර් 10,430,000 ක සමුච්චිත ප්‍රමාද හානි අතුරු ගෙවීම් සහතික 20, 21 සහ 22 ට පටහැනිව ලබා දී ඇති අතර පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව 2020.12.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම වගකීමක් ලෙස සලකා ඇති අතර සාකච්ඡා සහ හාරදීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින බැවින් එය නිවැරදි සංකල්පයට අනුකූල වේ.

මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයේ (PCU) නිර්දේශය සහ අනුමැතිය මත සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ (CANC) අවධාරණය කිරීම මත කොන්ත්‍රාත්තුව කොන්දේසි ප්‍රකාරව මුදාහරින ලද රඳවා ගැනීම් සහ HSBC මගින් අවලංගු කළ නොහැකි පරිදි ඉල්ලුම් බැංකු ඇපකරය ඉදිරිපත් කිරීම සිදු කර රඳවා ගැනීම් නිකුත් කරන ලදී. 2021.02.28 දින බැංකු ඇපකරය අවසන් වූ අතර CEIEC සමාගමට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය පනවන ලද සම්බාධක හේතුවෙන්, නීතිපතිවරයාගේ මතය සහ එකඟතාවයට අනුව, ත්‍රෛපාර්ශ්වික කොන්ත්‍රාත්තුවේ අනෙක් ප්‍රති පාර්ශවය ක්‍රියාත්මක වෙමින් පවතින බැවින්, දැන් ALIT සමාගම වෙතින් නව ඇපකරයක් ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

එක්සිම් (EXIM) බැංකු ණය ඇඩො 67,259,754 දී කල් ඉකුත් වූ අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් වලින් ඉතිරි කොන්ත්‍රාත් මුදල වන ඇඩො 21,395,247 ක් ගෙවීම සඳහා 2018.01.11 දිනැති යොමු අංක. 17/3004/701/059 යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය ඉදිකිරීම පිණිස ලබා ගන්නා ලද එක්සිම් බැංකු ණය මුදල සියයට සියයක වෙන්කළ ණය මුදලක් වන බැවින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් වන විට මුළු ණය මුදල් පිරිවැය සහ අදාල වියදම් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

නෙළුම් කුලුන මගින් මුදල් ඉපැයීමට අදාළව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලුම මූලික වියදම් (දැනට සටහන් අංක 09 යටතේ " ලැබිය යුතු CLT මුදල් ඉපැයීම්" ලෙස සටහන් කරන ලද - ලැබිය යුතු ණය සහ අනෙකුත් දේ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දෙන ණය වලින් අයකර ගනු ලැබේ. දැනටමත් අනුමත කරන ලද කොමිෂන් සභා තීරණයක් අනුව අනාගතයේදී නව සමාගමක් ස්ථාපනය කිරීමට නියමිතය. එම අවස්ථාවෙහිදී, නෙළුම් කුලුන මුදල් ඉපැයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලුම වියදම් අයකර ගත හැකි වන අතර එබැවින් එය සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ ලැබිය යුතු ශේෂයක් ලෙස සලකනු ලැබේ.

3.6.2 ඉඩම - නෙළුම් කුලුන

2011 දෙසැම්බර් 22 දිනැති යොමු අංක 11/2262/501/026TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අක්කර 7 රූඩ් 2 පර්චස් 8.41 (හෙක්ටයාර 3.0564) ප්‍රමාණයකින් සමන්විතව ‘‘කොළඹ නෙළුම් කුලුන’’ ඉදිවන නෙළුම් කුලුන භූමිය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පොළී රහිතව පවරා දෙනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) හා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් මිලියන 1500 මූලික ගෙවීමක් සහ පැවරීමේ ගිවිසුම අත්සන් කළ දින සිට වසර 34ක් ඇතුලත රුපියල් මිලියන 300 ක් ගෙවීමට එකඟ විය.

ඉඩම භාර දුන් දින සිට අදාල බලධරයා වෙත උපයෝගී බිල්පත් සහ තක්සේරු අනුපාත ගෙවීමට යටත්ව, 2012 ජූලි 18 දිනැති, නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිය මගින් හිස් භෞතික අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාර දෙන ලදි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දැනටමත් නාගරින සංවර්ධන අධිකාරිය වෙත රුපියල් මිලියන 2,250 ක් ගෙවා ඇති නමුත් අවබෝධතා ගිවිසුමට අනුව ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියමන කොමිෂන් සභාව වෙත පැවරීමට නාගරික සංවර්ධන අධිකාරිය අසමත් විය. එබැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තවදුරටත් ගෙවීම් අත්හිටුවා ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉහත කී ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පසුගිය වසර පුරා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

3.6.3 තොරතුරු තාක්ෂණ උද්‍යානය, හම්බන්තොට, සූරියවැව

2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් 2012 ජූලි 04 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ව්‍යාපෘති ඉංජිනේරු වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) පත් කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, ඉදිකිරීමේ පිරිවැය රුපියල් 2,493, 870,318 සහිතව සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

සැලසුම් කර ඇති පරිදි, 2015 ජූනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ආරම්භවී නැති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

ව්‍යාපෘතියේ වැඩ නිම කරන ලද ප්‍රතිශතය 33% ක් වන අතර, එම වැඩබිමේ ඇති ද්‍රව්‍ය ඇතුළුව මුළු වැඩ කටයුතුවල වටිනාකම රුපියල් මිලියන 423.9 කි.2018 .12. 31 දින වනවිට රඳවා තබා ගැනීම සහ අත්තිකාරම් යෙදවීම් අයකර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 46 ක් සහ රුපියල් මිලියන 157 ක් විය.

මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතු වල නිරත වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එලැඹුණු කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉන්ජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා

සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමග වූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි. මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 715 ක් (ආපසු අය කර ගැනීමට ඇති රුපියල් මිලියන 157 අත්තිකාරම් මුදල ඇතුලත්ව) වන අතර සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම නැමැති කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව ආරාවුල් බේරුම්කාර මණ්ඩලය වෙත යොමු කර ඇත.

ආරවුල් බේරුම්කාර මණ්ඩලයේ (DAB) තීරණය සලකා බැලීමෙන් පසු, සමහර පිරිවැය මූලිකාංග සහ රඳවා ගැනීමේ මුදල රු. මිලියන 146 අත්තිකාරම් යෙදවීම්වල රු. මිලියන 157 මුදලින් හිලව් කිරීමට එකඟ විය. ව්‍යාපෘති ඉන්ජිනේරු - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ලබාදුන් උපදෙස් අනුව ඉතිරි මුදල රු. මිලියන 50 ක මුදල බැංකු ඇපකරයක් මගින් ආවරණය කරන ලද අතර මෙම කරුණ යොමු සටහන් අංක.3.7 (ඇ) අනුව බේරුම්කාර විනිශ්චය සභාව වෙත යොමු කරන ලදී. ඉඩමේ වටිනාකම රජයේ තක්සේරුකරු මගින් තක්සේරු කළ විට සුරියවැව ඉඩමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය.

3.7 අවිනිශ්චිත වියදම්

(අ) <u>දිසා අධිකරණ නඩු අංකය 6188/2010</u>

Gewaan Engineering සමාගමේ හිමිකරු වන ගාමිණි රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගඋත්තරකරුවකු කරමින්, අංක 6188/2010 දරන නඩුව දිසා අධිකරණයේ ගොනු කර ඇත.

2007 ජූලි 19 දින පැමිණිලිකරු හා වගඋත්තරකරු අතර එළැඹී ගිවිසුම උල්ලංඝනය කිරීම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඒ සඳහා වූ හානිය අයකර ගැනීම පිණිස පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇති අතර අපේක්ෂිත සහන යටතේ පැමිණිලිකරු හානිය වෙනුවෙන් අපේක්ෂා කරන මුදල රු. මිලියන 1.5 කි.

2019.04.30 දින පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දෙන ලදී. තීන්දුවට අනුව රු. 71,443.31 සහ නීතිමය පිරිවැය පැමිණිලිකරුට ප්‍රදානය කරන ලදී.

(ආ) <u>මහාධිකරණය සිවිල් නඩු අංක 137/2011</u>

නිත්‍යානුකූල මැදිහත්වීම ඇතිව නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් බිලියන 47,345,112,000 සම්පූර්ණ මුදල පියවන තෙක් නඩු තීන්දුවේ මුදල රැස්කර ගැනීමේ නඩු තීන්දුව/නියෝගය සඳහා සීමාසහිත ELECTROTEKS සමාගම විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව අංක HC (Civil) 137/11 දරන නඩුව පවරා ඇත. සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව රු. 172, 500,000 සහ රු. 2,300,000 නොපියවීම මත වගඋත්තරකරු විසින් ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුවක් අයකර ඇත. මෙම නඩුව වැඩිදුර විභාග වෙමින් පවතී.

(ඇ) <u>තොරතුරු තාක්ෂණ උද්‍යානය- හම්බන්තොට (යොමුව. SLNAC/33-10-2018)</u>

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් හම්බන්තොට, සූරියවැව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2013 ජූලි 29 වන දින පැමිණිලිකරු හා විත්තිකරු අතර එළැඹී ගිවිසුම උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් (වගඋත්තරකරු) රු. 736,276,907.47 ක මුදලක හානි අය කර ගැනීම පිණිස සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම විසින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම කරුණ බේරුමකාර විනිශ්චය සභාව ඉදිරියේ විභාග වෙමින් පවතී. නීතිපති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටී. මෙම නඩුව වැඩිදුරටත් විභාග වෙමින් පවතී.

(ඈ) <u>DC/DMR/3277/17</u>

සම්පූර්ණ යාපන අර්ධද්වීපයම සහ යාබද දූපත් සියල්ලම ආවරණය කරන ලද සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයට සිදු වූ හානිය සහ සේවා බිඳ වැටීම මගින් සිදුවූ හානිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අය කරගැනීමට පැමිණිලිකරු විසින් නඩුවක් ගොනු කර ඇති අතර පැමිණිලිකරු හානි වශයෙන් අපේක්ෂා කරනු ලබන මුදල රු. 14,800,000,000 කි. මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා තවමත් පවතී.

4. දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය	2020.01.01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා		2020.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
ඉඩම්	148,863,771	0	0	148,863,771
බද්දට ගත් ඉඩම්	345,502	0	0	345,502
ගොඩනැගිලි	150,381,065	0	0	150,381,065
කොකාවිල් කුලුන	314,933,479	0	0	314,933,479
වවුනියා කුලුන	29,900,741	0	0	29,900,741
වාහන	168,717,224	0	0	168,717,224
වායු සමීකරණ	17,137,804	604,341	0	17,742,145
විදුලි සෝපාන	4,683,848	0	0	4,683,848
විදුලි උත්පාදක යන්ත්‍ර	2,665,428	0	0	2,665,428
පරිගණක	112,778,720	2,554,980	20,500	115,313,200
වෙබ් සර්වර්	34,095,551	0	0	34,095,551
වෙනත් කාර්යාල උපකරණ	46,375,141	374,220	8,600	46,740,761
ජංගම දුරකථන	1,264,049	159,960	0	1,424,009
කාර්යාල ගෘහ භාණ්ඩ	25,137,571	1,322,462	10,500	26,449,533
තාක්ෂණික උපකරණ	73,705,569	0	0	73,705,569
FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන	61,712,127	0	0	61,712,127
FMMS ව්‍යාපෘති උපකරණ	408,303,544	0	0	408,303,544
කායවර්ධන උපකරණ	5,629,707	0	0	5,629,707
මාධ්‍ය ඒකක උපකරණ	12,865,066	0	0	12,865,066
	1,619,495,906	**5,015,962**	**39,600**	**1,624,472,268**
නෙළුම් කුලුන ඉඩම්	11,715,212,127	0	0	11,715,212,127
	13,334,708,033	**5,015,962**	**39,600**	**13,339,684,395**

ක්ෂය කිරීම්	2020.01.01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා		2020.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
ගොඩනැගිලි	129,297,691	3,659,569	0	132,957,260
කොකාවිල් කුලුන	276,030,822	30,808,833	0	306,839,654
වවුනියා කුලුන	26,910,667	2,990,074	0	29,900,741
වාහන	146,481,556	16,242,757	0	162,724,312
වායු සමීකරණ	12,880,703	850,274	0	13,730,977
විදුලි සෝපාන	4,683,848	0	0	4,683,848
විදුලි උත්පාදක යන්ත්‍ර	2,665,428	0	0	2,665,428
පරිගණක	100,499,287	3,563,046	20,500	104,041,833
වෙබ් සර්වර්	7,441,172	7,970,472	0	15,411,645
වෙනත් කාර්යාල උපකරණ	27,918,507	2,900,403	8,600	30,810,310
ජංගම දුරකථන	876,517	76,899	0	953,416
කාර්යාල ගෘහ භාණ්ඩ	17,911,697	1,520,501	10,500	19,421,698
තාක්ෂණික උපකරණ	39,373,931	5,812,020	0	45,185,951
FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන	33,664,514	7,164,016	0	40,828,530
FMMS ව්‍යාපෘති උපකරණ	347,906,076	10,760,214	0	358,666,290
කායවර්ධන උපකරණ	5,629,707	0	0	5,629,707
මාධ්‍ය ඒකක උපකරණ	12,355,043	332,538	0	12,687,581
	1,192,527,165	**94,651,616**	**39,600**	**1,287,139,181**
ශුද්ධ පොත් අගය	**12,142,180,867**			**12,052,545,214**

සටහන්:

ඉඩම සඳහා අගය වන රු. 148,235,572 තුළ මීගමුව කදිරාන පිහිටා ඇති රු. 45,000,000 වටිනා ඉඩම්වල, වටිනාකම් ද ඇතුලත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 112 රූඩ් 02 පර්චස් 10.5කි. ඉඩමේ විශාලත්වයෙන් ආසන්න වශයෙන් සියයට 69 ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. මෙම අත්පත් කර ගැනීමෙන් වූ බලපෑම ගිණුම් වලට ගෙන නැත.

තක්සේරු දෙපාර්තුමේන්තුව 2019.04.02 දිනැති අංක GM/LM/5549 දරණ ලිපිය ප්‍රකාරව ඉහත ඉඩම් කොටසෙන් රු. 3559,375,000 වටිනාකමින් යුතු අක්කර 35 රූඩ් 02 පර්චස් 30 ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව සතුව වර්තමානයේ පවති බව තක්සේරු කර ඇතත්, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ සමස්ථ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ලක්ශ 16 පිළිබඳව මෙතෙක් සැහීමකට පත්නොවන බැවින් එය 2020.12.31 දිනට මූල්‍ය ප්‍රාකාශනයේ සඳහන් නොවේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය කෙටුම්පත සඳහා අදාළ අනුමැතිය ලැබුණ විට සියලුම ඉඩම් සහ ගොඩනැගිලි වල වටිනාකම ගණනය කරනු ලබන අතර එහි ප්‍රත්‍යාගණන කරන ලද වටිනාකම් වාර්තා කරනු ලැබේ. (යොමුව සටහන 3.2.1 (අ))

4.1 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය	2020.01.01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා		2020.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
පරිගණක මෘදුකාංග	21,455,861	0	0	21,455,861
	21,455,861	**0**	**0**	**21,455,861**

විකෘති කිරීම	2020.01.01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා		2020.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත්කිරීම්/ මාරුකිරීම්	
පරිගණක මෘදුකාංග	21,455,860	0	**0**	21,455,860
	21,455,860	**0**	**0**	**21,455,860**
ශුද්ධ පොත් අගය	**1**			**1**

5. කෙරිගෙන යන වැඩ

	2020.01.01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා		2020.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	(මාරු කිරීම්)	
ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල	10,057,910	0	0	10,057,910
නෙළුම් කුලුන ඉදිකිරීම	20,875,389,474	469,392,094	0	21,344,781,569
තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට	684,015,309	0	0	684,015,309
ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම	80,156,376	29,630,056	0	109,786,433
කදිරානා ඉදිකිරීම	47,366,941	30,938,835	0	78,305,776
සංඛ්‍යාත පිරික්සුම් ජාල	249,900	0	0	249,900
කෙරිගෙන යන වැඩ	21,887,232	22,610,458	2,678,815	47,176,505
	21,719,123,143	**552,571,443**	**2,678,815**	**22,274,373,401**

		2020.12.31 දිනට	2019.12.31 දිනට
06. ආයෝජන			
භාණ්ඩාගාර තැන්පතු		0	354,000,000
ස්ථාවර තැන්පතු		1,500,000,000	0
		1,500,000,000	**354,000,000**
07. ලැබිය යුතු ගිණුම්			
ලැබිය යුතු සෙස් ගාස්තු		447,225,777	429,991,796
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු		625,552,710	782,030,936
ලැබිය යුතු විදුලි සංදේශ බදු		695,912,884	772,310,122
අයකර ගත යුතු කොකාවිල් කුලුන		93,087,067	81,776,444
කුලුනෙන් ලැබිය යුතු බදු		332,895,834	339,276,667
ලැබිය යුතු කෙටි පණිවුඩ සේවා බදු		46,957,637	57,540,518
අයකර ගත යුතු හිඟ කාර්ය මණ්ඩල ණය		2,403,352	2,461,716
ලැබිය යුතු කොකාවිල් බදුකුලී		2,093,951	2,138,310
ලැබිය යුතු ගුවන් ටිකට්පත් ගාස්තු		70,400	148,200
වෙළඳ ණය ගැනි	**07 අ**	(0)	96,811
		2,246,199,611	**2,467,771,521**
07 අ. වෙළඳ ණය ගැනි			
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		373,476,732	373,775,691
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු		32,790	32,790
		373,509,522	**373,808,482**
අඩු කළා - බොල්ණය සඳහා වෙන් කිරීම **		(373,509,522)	(373,711,670)
		(0)	**96,811**

සටහන: (1)	***ණය ගැනියන්***		***ප්‍රතිපාදන***
***** බොල් ණය ගැනියන් සඳහා වෙන්කිරීම***			
වසර 02 ට වඩා වැඩි	373,509,522	**100%**	373,700,914
වසර 01 ට වඩා වැඩි වසර 02 ට වඩා අඩු	0	**10%**	10,757
මාස 06 ට වැඩි සහ වසර 01 ට වඩා අඩු	0	**0%**	0
මාස 02 ට වඩා වැඩි සහ මාස 6 ට වඩා අඩු	0	**0%**	0
මාස 01 ට වඩා වැඩි සහ මාස 2 ට වඩා අඩු	0	**0%**	0
මාස 01 ට වඩා අඩු	0	**0%**	0
	373,509,522		**373,711,670**

සටහන: (2)
ඉහත ආකාරයේ පිළිවෙලින් වසරකට වඩා වැඩි බොල් සහ අඩමාන ණය ගැනියන් සඳහා 100% සහ 10% වෙන් කිරීම් ලබාදීමෙන් පසු සාධාරණ අගයකින් යුතුව බොල් ණය ගැනියන් ප්‍රකාශ කෙරේ.

08. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්		
විශේෂ අත්තිකාරම්	575	575
උත්සව අත්තිකාරම්	0	158,000
ගැනුම් අත්තිකාරම්	121,090	77,140
පූර්ව ගෙවීම්	36,750,930	43,487,917
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (නෙළුම් කුලුන)	0	0
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	157,081,430	157,081,430
අත්තිකාරම් ලියාපදිංචි කිරීම් (ප්‍රධාන කාර්යාලය - නව)	18,882,717	13,387,576
අත්තිකාරම් ලියාපදිංචි කිරීම් (කදිරාන)	5,522,503	11,312,256
	218,359,245	**225,504,893**

		2020.12.31 දිනට	2019.12.31 දිනට
09. ණය සහ වෙනත් ලැබීම්			
ආපදා ණය		32,306,602	35,629,277
මෝටර් රථ ණය		184,730,657	193,991,532
දේපල ණය		1,135,746	1,362,749
මෝටර් බයිසිකල් ණය		1,174,995	1,138,315
අයකර ගතයුතු වැටුප් අඩුකිරීම්		439,987	506,643
වෙනත් ලැබීම්		2,030,000	2,210,000
මැකිවරණ රාජකාරි ගෙවීම්		0	398,738
ලං.වි.බ ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)		125,000	125,000
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු)		14,244	0
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (ආදායම් බදු වැඩියෙන් වෙන්කිරීම)		2,036,193,356	2,713,380,890
හිමිකම් ආර්ථික සේවා		0	25,711,011
නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු		3,125,000	3,125,000
කොළඹ නෙළුම් කුලුන මඟින් ලැබිය යුතු මුදල් ඉපැයීම්		13,067,971	0
		2,274,343,557	**2,977,579,154**
10. මුදල් සහ මුදල් සමානුපාත			
බැංකු මුදල්	**10 අ**	304,660,593	246,410,798
අතැනි මුදල්	**10 ආ**	35,000	35,000
කොටස් වෙළඳපොල ඉතුරුම් ගිණුම (අංක 119-2-001-2-3693169)		7,680,372,174	3,378,527,783
		7,985,067,767	**3,624,973,581**
10 අ. බැංකුවේ මුදල්			
මහජන බැංකුව - නාරහෙන්පිට ශාඛාව (තැන්පතු ගිණුම)			
ගිණුම් අංකය 119402113960300 (RFC USD 0032)		114,424,972	106,926,792
මහජන බැංකුව - නාරහෙන්පිට ශාඛාව (එකතු කිරීමේ ගිණුම)			
ජංගම ගිණුම් අංකය 119-1-001-4-3693169		116,459,368	138,726,159
මහජන බැංකුව - නාරහෙන්පිට ශාඛාව, (ජාත්‍යාන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු) ජංගම ගිණුම් අංකය 119-1-001-3-3693264		369,582	258,338
ලංකා බැංකුව - නාරහෙන්පිට ශාඛාව			
ජංගම ගිණුම් අංකය 2323167		73,406,670	499,509
		304,660,593	**246,410,798**
10 ආ. අතැනි මුදල්			
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		10,000	10,000
සුළු මුදල් - පාලන හා මානව සම්පත් අංශය		5,000	5,000
සුළු මුදල් - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය		15,000	15,000
සුළු මුදල් - අනුකූලතා		5,000	5,000
		35,000	**35,000**
11. රජයේ දායකවීම්			
ලෝක බැංකු ණය ගිවිසුම		298,572,434	298,572,434
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන		19,533,906	19,533,906
භාණ්ඩාගාරය විසින් දායක කරන ලද ප්‍රග්ධනය		208,108,404	208,108,404
		526,214,744	**526,214,744**

	2020.12.31 දිනට	2019.12.31 දිනට
12. රඳවාගැනීම්		
රඳවාගැනීම් - තොරතුරු තාක්ෂණ උද්‍යානය	46,152,801	46,152,801
රඳවාගැනීම් - ප්‍රධාන කාර්යාලයීය නව ගොඩනැගිල්ල	9,602,111	0
රඳවාගැනීම් - කදිරාන	6,994,114	0
	62,749,026	**46,152,801**
13. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	94,824,253	80,831,913
ස්ථාවර තැන්පතු (පාරිතෝෂික)	(63,400,000)	(52,150,000)
ප්‍රතිලාභ සඳහා ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළි	(11,170,526)	(5,925,454)
ශුද්ධ ප්‍රතිලාභ වගකීම්	**20,253,726**	**22,756,459**
14. ලැබිය යුතු ගිණුම්		
උපචිත වියදම්		
දුරකථන - කාර්යාලය	1,291,516	717,013
වැටුප් පාලන	1,960,910	99,183
ගෙවිය යුතු වැටුප්	207,884	185,884
ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු	0	99,981
විදුලිය	742,072	933,903
ජලය	52,623	28,560
සනීපාරක්ෂක සේවා	1,137,545	662,593
ආරක්ෂක සේවා	5,347,770	3,428,717
අතිකාල	797,688	1,027,507
සේවා අර්ථසාධක අරමුදල	4,113,678	3,719,311
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	493,640	446,316
අන්තර්ජාල	1,334,800	335,143
වෛද්‍ය රක්ෂණ හිමිකම්	250,995	250,995
ගෙවිය යුතු ගමන් සහ යැපීම් දීමනා	0	2,400
කාර්ය මණ්ඩල සහසාධනය	303,552	88,490
පුවත්පත් සහ නිවේදන	61,125	447,988
විගණන ගාස්තු	4,000,000	2,518,460
ප්‍රසාද දීමනා	46,482,135	39,079,628
රඳවා ගැනීම් - පොදු	603,380	363,965
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු)	0	29,915,560
වැටුප් අඩුකිරීම්	132,139	134,101
අළුත්වැඩියා හා නඩත්තු	9,751,675	17,987,507
ගෙවිය යුතු මුද්දර ගාස්තු	908,574	1,027,622
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු	56,537	56,537
ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු	500,245	0
ගෙවිය යුතු උපදේශන සේවා ගාස්තු	1,915,480	0
ගෙවිය යුතු විවිධ ගැනුම් සහ සැපයුම්	29,626,398	9,140,515
කාර්ය මණ්ඩල ණය වැඩියෙන් අයකර ගැනීම	12,657	12,657
ගෙවිය යුතු ඉන්ධන	149,031	112,224
ගෙවිය යුතු මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	274,043	1,111,771
ගෙවිය යුතු වාර්ෂික දායකත්වීම	878,920	877,920
ගෙවිය යුතු විවිධ දෑ	2,206,886	365,000
හිමිකම් නොකියන ලද රැකියා පාරිශ්‍රමික	0	2,146,762
නඩු ගොනු කිරීම සහ නඩු වලට පෙනී සිටීම	342,250	25,500
විවිධ ණයගැති	17,813,741	21,366,057
	133,749,889	**138,715,771**

		2020.12.31 දිනට	2019.12.31 දිනට
15. <u>අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ</u>			
අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම්		1,997,479,727	2,601,814,402
ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු		1,566,167	1,566,167
ආපසු ගෙවිය යුතු තැන්පතු - සේවක		2,086,843	2,086,843
මෙගාහර්ට්ස් 1800 පරාසය සඳහා ලබුණු අත්තිකාරම්		57,500,000	57,500,000
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඵලදායී ආපදා කළමනාකරණ සමුළුව		34,210	34,210
සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු වැඩියෙන් අයකර ගැනීම		2,177,058	2,158,081
C.T.O විදුලි සංදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය		924,492	924,492
අගය එකතු කිරීමේ බදු පාලන ගිණුම්		85,252,186	18,649,359
ඉදිකිරීමේ ණයගැතියන්		751,650	751,650
අනපේක්ෂිත Vendor - ආපසු ගෙවීම		73,750	0
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		1,610,276,227	1,610,276,227
		3,758,122,308	**4,295,761,430**
16. <u>භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ</u>			
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන අරමුදල 50%		312,776,354	391,015,467
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු		693,268,690	772,310,124
භාණ්ඩාගාරයට ගෙවිය යුතු කෙටි පණිවිඩ බදු		46,957,637	57,540,518
භාණ්ඩාගාරයට ගෙවිය යුතු සෙලියුලර් කුලුනු බදු		332,895,834	339,276,667
		1,385,898,515	**1,560,142,776**
17. <u>ආදායම්</u>			
ආදායම් - බලපත්‍ර ගාස්තු	**17 අ**	12,036,758,914	16,175,312,122
විදුලි සංදේශ බදු		10,826,164,612	15,065,669,041
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	**17 ආ**	4,292,953,440	5,337,850,939
පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු		0	192,765,504
ජංගම කෙටි පණිවිඩ සේවා බදු		418,650,656	419,083,887
සෙලියුලර් කුලුනු බදු		1,426,333,334	1,384,526,669
		29,000,860,956	**38,575,208,162**
<u>17 අ. ආදායම් - බලපත්‍ර ගාස්තු</u>			
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු		5,402,000	168,367,347
සෙස් ගාස්තු		4,674,874,590	4,713,114,906
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		6,724,408,085	7,048,993,937
සංඛ්‍යාත පෙරගෙවුම් ගාස්තුව		0	4,032,142,857
වෙළඳ බලපත්‍ර ගාස්තු		14,392,857	13,726,325
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු		87,692	85,364
රැහැන් රහිත දුරකථන බෙදාහැරීමේ ගාස්තු		94,408,439	116,388,349
විභාග ගාස්තු		202,921	312,140
මාදිලි අනුමැති ගාස්තු		101,852	0
අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු		400,000	1,016,327
කෙටි සංකේත අංක ගාස්තු		34,250,000	31,887,730
අතිරික්ත ආදායම් - 17 අ (1)		488,995,119	369,991,603
		12,037,523,556	**16,496,026,883**
***අඩුකළා:* ජාතිය ගොඩනැගීමේ බදු**		(764,642)	(320,714,761)
		12,036,758,914	**16,175,312,122**

	2020.12.31 දිනට	2019.12.31 දිනට
17 අ (1) . <u>අනෙකුත් ආදායම්</u>		
කාර්ය මණ්ඩල ණය වලින් ලද පොලී ආදායම්	9,508,272	9,438,934
ස්ථාවර තැන්පතු මත ආදායම්	229,905,799	32,741,587
කොටස් වෙළඳපල ගනුදෙනු මත පොළී ආදායම	218,844,390	310,471,287
කොකාවිල් බදු කුලී	7,267,229	16,700,091
මඩුකන්ද බදු කුලී	22,097,446	0
වෙනත් ආදායම් - විවිධ	1,130,235	406,009
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	39,600	225,836
බොල් ණය අයකර ගැනීම	202,148	7,859
	488,995,119	**369,991,603**
17 ආ. <u>විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)</u>		
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම	4,292,953,440	5,337,850,939
	4,292,953,440	**5,337,850,939**
18. <u>නියාමන වියදම්</u>		
ITU වාර්ෂික සාමාජික මුදල	31,369,540	28,697,136
APT වාර්ෂික සාමාජික මුදල	2,931,154	2,753,480
SAFIR වාර්ෂික සාමාජික මුදල	0	877,920
වාර්ෂික පුස්තකාල සාමාජික මුදල	181,540	81,042
CTO වාර්ෂික සාමාජික මුදල	5,894,134	5,566,525
නියාමන කටයුතු සඳහා සහභාගී වීම	46,454	17,891,406
පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම	1,480,000	20,000
නඩු ගොනුකිරීම සහ නඩු වලට පෙනීසිටීම	8,515,248	3,538,600
නෙළුම් කුලුන ව්‍යාපෘතිය	0	14,153,285
නියාමන කටයුතු සඳහා ප්‍රවාහන හා යැපීම් දීමනා	141,323	1,198,978
ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය	251,590	95,410
දේශීය පුහුණු වැඩසටහන - ITU/APT	305,266	3,452,612
විවිධ නියාමන වියදම්	51,036	48,021
ආධුනික ගුවන්විදුලි විභාග පැවැත්වීම	503,505	49,750
සංඛ්‍යාත බලපත්‍ර PYT	0	189,880
පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ (CTO) වාර්ෂික රැස්වීම	0	249,500
ජාත්‍යන්තර විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය	0	18,080
APT-SATRC සඳහා දායකත්වය	2,801,100	0
ශිෂ්‍යයන් දැනුවත් කිරීමේ වැඩසටහන	307,167	0
	54,779,057	**78,881,625**

	2020.12.31 දිනට	2019.12.31 දිනට
19. <u>පරිපාලන හා ආයතන වියදම්</u>		
වැටුප්	192,300,524	185,045,114
සේ.අ.අ. (15% දායකත්වය)	27,606,344	26,246,905
සේ.හා.අ. (3% දායකත්වය)	5,521,269	5,249,381
ප්‍රවාහන දීමනා	22,247,722	21,084,665
ගෙවල් කුලී දීමනාව	17,865,282	16,080,690
වෙනත් දීමනා	5,481,731	6,340,833
කාර්ය සාධනය දිරිදීමනා	44,901,610	39,840,973
විශේෂ දීමනා	340,979	367,785
අතිරේක දීමනා	0	358,689
ප්‍රසාද දීමනා	64,302,534	59,735,832
අතිකාල	7,767,971	16,360,234
සභාපතිගේ වේතනය	903,333	1,106,667
පාවිච්චි නොකළ විවේක නිවාඩු	14,854,604	10,830,714
විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය	1,191,254	1,254,606
සන්නිවේදන දීමනාව	2,732,716	2,566,493
නිල ඇඳුම්	685,527	752,428
කාර්ය මණ්ඩල සුභසාධනය	4,225,241	4,629,803
කාර්ය මණ්ඩලය වෘත්තීය සාමාජික මුදල් දායකත්වය	616,100	595,016
දේශීය පුහුණු	48,706	1,102,863
කොමිෂන් සභා සාමාජිකයින්ගේ දීමනාව	295,000	113,500
විගණන කමිටු දීමනා	197,500	171,750
2/3 නිවාස ණය පොලිය ප්‍රතිපූරණය කිරීම	3,521,759	4,942,774
පාරිතෝෂික	3,961,342	3,683,105
විදුලිය	10,005,235	12,894,921
ජලය	428,314	526,342
සනීපාරක්ෂක සේවා	6,994,990	6,409,796
ආරක්ෂක සේවා	17,158,628	13,657,530
වරිපනම් හා බදු	901,649	885,207
පුස්තකාල පොත්	21,631	109,979
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	5,872,429	14,139,701
ඉන්ධන	2,430,937	3,756,142
තැපැල්	603,470	797,618
දුරකථන, ෆැක්ස් සහ පි.ඒ.බී.එක්ස්	3,002,042	4,687,070
රක්ෂණය (දේපල හා වෛද්‍ය)	55,256,869	16,334,036
අන්තර්ජාල ගාස්තු	6,790,646	6,684,363
පුවත්පත් හා නිවේදන	3,576,905	2,761,495
උපදේශන ගාස්තු	500,000	356,003
වැඩමුළු හා සම්මන්ත්‍රන	454,576	376,283
වෘත්තීය දීමනා	9,927,473	6,525,690

		2020.12.31 දිනට	2019.12.31 දිනට
විගණන ගාස්තු		1,481,540	2,500,000
නීති වියදම් / විනය පරීක්ෂණ/ මූලික විමර්ශන		198,900	574,296
ක්ෂයවීම		94,651,616	96,131,988
ණය හිලව් කිරීම		0	2,277,255
විවිධ පාලන වියදම්		2,868,218	3,484,240
විවිධ මිලදී ගැනීම් හා සැපයීම්		1,346,192	1,996,474
විවිධ මෙහෙයුම් පිරිවැය		406,117	658,840
කාර්යාල උපකරණ නඩත්තුව		3,500,291	18,260,969
වාහන නඩත්තුව		5,025,095	5,839,317
ගොඩනැගිලි සහ ව්‍යුහ නඩත්තුව		587,971	3,638,485
තාක්ෂණික උපකරණ නඩත්තුව		1,869,371	10,979,766
මෘදුකාංග නඩත්තුව සහ සංවර්ධනය		21,018,295	24,554,235
කුලුනු නඩත්තුව		106,064	20,667
විදුලි ජනක යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තුව		90,190	123,729
අලුත්වැඩියාව හා නඩත්තුව - විවිධ		1,574,463	17,143
විදුලි සෝපාන නඩත්තුව		654,300	0
CCTV නඩත්තු කිරීම		7,500	3,170
බද්දට ගත් පරිශ්‍ර සඳහා කුලී		0	648,000
ක්‍රීඩා සංවර්ධනය		(1,384,417)	3,063,696
පිරික්සුම් මධ්‍යස්ථාන නඩත්තුව		(461,605)	7,896,225
		679,034,945	**682,031,488**
20. <u>මූල්‍ය හා අනෙකුත් වියදම්</u>			
බැංකු ගාස්තු		252,474	299,727
පාරිතෝෂික මුදල් වෙන්කිරීම මත පොලිය		5,071,456	4,171,706
		5,323,930	**4,471,433**
21. <u>ඒකාබද්ධ අරමුදලට දායකවීම</u>	**21-1**		
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකත්වය		4,000,000,000	7,950,000,000
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකත්වය			
ගෙවන ලද විදුලි සංදේශ බදු		10,826,164,679	15,065,669,041
50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු		2,146,476,720	2,668,925,470
ගෙවන ලද පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු		0	192,765,504
භාණ්ඩාගාරයට ගෙවන ලද කෙටි පණිවුඩ සේවා බදු		418,650,655	419,083,887
භාණ්ඩාගාරයට ගෙවන ලද ජංගම කුලුනු බදු		1,426,333,334	1,384,526,669
		18,817,625,389	**27,680,970,570**
<u>විදුලි සංදේශ පනත යටතේ දායකත්වය</u>	**21-2**		
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායමෙන්		**1,000,000,000**	**1,000,000,000**

		2020.12.31 දිනට	2019.12.31 දිනට
22. මෙහෙයුම් තුළින් උත්පාදන වූ මුදල්			
බදුවලට පෙර ශුද්ධ ලාභය		**27,325,109,486**	**37,883,540,711**
ගැලපුම් සඳහා			
දේපල, පිරියත හා උපකරන ක්ෂයවීම		94,651,616	96,131,988
අස්පෘශ්‍ය වත්කම් ණය හිලව්කිරීම		0	2,277,255
බොල් ණය අයකර ගැනීම		202,148	(7,859)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම		3,961,342	3,683,105
ස්ථාවර තැන්පතු වලින් පොළි		(229,905,799)	(32,741,587)
කොටස් වෙළඳපල ගනුදෙනු වලින් පොළී ආදායම		(218,844,390)	(310,471,287)
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත පොළී පිරිවැය		5,071,456	4,171,706
විදේශ මුදල් ගනුදෙනු මත ලාභය		228,472,409	(73,717,095)
ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ලාභය		(39,600)	(225,836)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්			
ලැබිය යුතු ගිණුම්	**22-1**	221,774,058	1,346,072,763
පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	**22-2**	6,851,037	(40,851,154)
ණය සහ වෙනත්ලැබීම්	**22-3**	703,235,597	(1,286,345)
ස්ථාවර පාරි		(5,245,072)	(1,537,022)
ගෙවිය යුතු ගිණුම්	**22-4**	(4,965,882)	23,198,978
අත්තිකාරම්, තැන්පතු හා වෙනත් ගෙවිය යුතු දෑ		(537,639,121)	(926,796,097)
භාණ්ඩාගාරයට ගෙවිය යුතු		(174,244,262)	62,978,927
මෙහෙයුම් තුළින් උත්පාදනය වන මුදල්		**27,418,445,022**	**38,034,421,151**

22-1. ලැබිය යුතු ගිණුම්		
ලැබිය යුතු සෙස් ගාස්තු	447,225,777	429,991,796
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	625,552,710	782,030,936
ලැබිය යුතු විදුලි සංදේශ බදු	695,912,884	772,310,122
අයවිය යුතු කොකාවිල් කුලුන	93,087,067	81,776,444
ලැබිය යුතු කුළුණු බදු	332,895,834	339,276,667
ලැබිය යුතු කෙටි පණිවිඩ සේවා බදු	46,957,637	57,540,518
හිඟ කාර්ය මණ්ඩල ණය අයවීම	2,403,352	2,461,716
ලැබිය යුතු කොකාවිල් බදු කුලී	2,093,951	2,138,310
ලැබිය යුතු ගුවන් ටිකට්පත්	70,400	148,200
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු	373,476,732	373,775,691
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු	32,790	32,790
	2,619,709,133	**2,841,483,191**
	221,774,058	

22-2. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්		
විශේෂ අත්තිකාරම්	575	575
උත්සව අත්තිකාරම්	0	158,000
ගැනුම් අත්තිකාරම්	121,090	77,140
පූර්ව ගෙවීම්	36,750,930	43,487,917
	36,872,595	**43,723,632**
	6,851,037	

	2020.12.31 දිනට	2019.12.31 දිනට
22-3. ණය සහ වෙනත් ලැබීම්		
ආපදා ණය	32,306,602	35,629,277
මෝටර් රථ ණය	184,730,657	193,991,532
දේපල ණය	1,135,746	1,362,749
මෝටර් බයිසිකල් ණය	1,174,995	1,138,315
ලැබිය යුතු වැටුප් අඩු කිරීම්	439,987	506,643
අනෙකුත් ලැබීම්	2,030,000	2,210,000
මැතිවරණ රාජකාරි ගෙවීම්	0	398,738
ලංකා විදුලිබල මණ්ඩලයේ ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	125,000	125,000
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවාගැනීමේ බදු)	14,244	0
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (ආදායම් බදු වැඩියෙන් වෙන් කිරීම)	2,036,193,356	2,713,380,890
හිමිවිය යුතු ආර්ථික සේවා ගාස්තු	0	25,711,011
නෙළුම් කුලුන විදුලි ආරක්ෂණ තැන්පතු	3,125,000	3,125,000
ලැබිය යුතු කොළඹ නෙලුම් මුලුන ණය හිලව් කිරීම	13,067,971	0
	2,274,343,557	**2,977,579,154**
	703,235,597	
22-4. ගෙවිය යුතු ගිණුම්		
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රකාරව	133,749,889	138,715,771
	133,749,889	**138,715,771**
	(4,965,882)	
23. අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම		
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (නෙළුම් කුලුන)	0	0
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	157,081,430	157,081,430
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (නව ප්‍රධාන කාර්යාලය)	18,882,717	13,387,576
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම (කදිරාන)	5,522,503	11,312,256
	181,486,650	**181,781,262**
	294,612	

විගණකාධිපතිගේ වාර්තාව

2020 වර්ෂය සඳහා

මගේ අංකය CMJ/ZA/TRC/01/20/17 | මෙම අංකය உமது இல. Your No. | දිනය 2021 සැප්තැම්බර් 06

සභාපති
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු වගකීම රු.43,145,810ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ගිවිසුම්වලට එළඹීමෙන් තොරව මඩුකන්ද සංනිවේදන කුලුන භාවිතාකරන කරන ක්‍රියාකරුවන් 05 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබුණු රු.22,097,446 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඔවුන්ගෙන් ලැබිය යුතු රු.2,678,603ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(iii) පෞද්ගලික සමාගමක් 2012 පෙබරවාරි සිට 2020 දෙසැම්බර් දක්වා මඩුකන්ද සංනිවේදන කුලුනෙන් ලබාගත් පහසුකම් සඳහා 2021 වර්ෂයේ ලැබී තිබුණු රු.7,089,343 ක් උපචිත ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(iv) හිමිකම් ඔප්පුවක් සහිත හම්බන්තොට විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද රු.45,000,000 ක් වටිනා අක්කර 112 රූඩ් 01 පර්වස් 10.5 ක ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 69 ක් ප්‍රාදේශීය සභාවක් අත්පත් කරගෙන තිබුණද ඊට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(v) කොමිෂන් සභාවේ දේපල පිරියත හා උපකරණවල පිරිවැය රු.13,339,684,395 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(vi) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා රු.12,978,983 ක ස්ථාවර වත්කම් ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(vii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.103,863,771 ක් වටිනා ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හෝ වෙනත් අනුශාංගික ලිඛිත සාක්ෂි හෝ ඉදිරිපත්කර නොතිබුණි.

(viii) ණයගැතියන් 07 දෙනෙකුගේ රු.4,125,687 ක්වූ ණයගැති ශේෂ තහවුරු කර ගැනීමට ලිපි යවා තිබුණද කිසිදු ණයගැතියෙකුගෙන් ශේෂ තහවුරු කිරීමේ ලිපි 2021 ජූලි මාසය වන විටත් විගණනය වෙත ලැබී නොතිබූ අතර වෙනත් විගණන පරිපාටිවලින්ද එම ශේෂ තහවුරු කර ගත නොහැකි විය

(ix) මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයතන 04 කින් අයවිය යුතු රු.161,033,612 ක ණය ශේෂ පැවතියද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එක් ආයතනයක පමණක් ණයහිමි ශේෂය රු.4,435,922 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර අනෙක් ආයතනවල ණයහිමි ශේෂ නොපැවතුණු බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (i) , (v) හා (vi) දරන නිරීක්ෂණ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	2020 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාව විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු. මිලියන 1,500 ක මුදල සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ)	2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	(i) 9.3 වගන්තිය	මාස 03 නොඉක්මවන කාලසීමාවකට වැඩබලන තනතුරකට පත්කිරීම් සිදුකළ යුතු වුවද ඊට පටහැණිව වැඩ බැලීමේ පත්කිරීම් 08 ක් සිදුකර තිබුණි.
	(ii) 9.12 වගන්තිය	කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වෛද්‍ය රක්ෂණාවරණය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණ වාරික ලෙස රක්ෂණ සමාගමකට රු.55,256,869 ක් ගෙවා තිබුණු අතර කොමිෂන් සභා නිලධාරීන් වෙත රු.26,176,701 ක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.
	(iii) 9.14.2 වගන්තිය	බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබූ අතර කොමිෂන් සභාව විසින් පමණක් අනුමත කර ඒ අනුව කටයුතු කර තිබුණි.
(ඇ)	2007 ජූනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය	මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා අනුමත මාසික ප්‍රවාහන දීමනාවක් වූ රු.2,000 ඉක්මවා රු.6,000 බැගින් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු8,764,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.
(ඇ)	2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය	වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොගෙන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා, ගෙවල් කුලී දීමනා හා භාවිතයට නොගත් නිවාඩු සඳහා දීමනා ලෙස රු.77,621,496 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු.1,266,700,000 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 06 ක් අවශ්‍යතාවයක් නොමැතිවීම හා අධ්‍යක්ෂ ජනරාල් අත්හිටුවීම නිසා සමාලෝචිත වර්ෂයේ සිදුකර නොතිබුණු අතර අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා නොගෙන සැලසුම් සකස් කිරීම නිසා ප්‍රතිපාදන වෙනත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා යෙදවීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණි. එසේම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.1,140,550 ක් වටිනා ප්‍රසම්පාදන 06 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර රු. 1,083,495,000 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 34 ක් ක්‍රියාත්මක නොවීමට හේතු හෝ ක්‍රියාත්මක කළ බව හෝ දක්වා නොතිබුණි.

(ආ) නෙළුම් කුලුන ව්‍යාපෘතිය

2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර 2012 ජනවාරි 03 දින කොමිෂන් සභාව මෙම සමාගම් සමඟ ඇ.ඩො. 104,300,000 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණද කොමිෂන් සභාව 2017 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

මෙම ඉදිකිරීම් සඳහා අරමුදල් සපයා ගැනීමට 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව, EXIM බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 ලබා දීමට එකඟ වී තිබුණ අතර 2016 අගෝස්තු 18 දින වන විට ණය මුදල ලබාගෙන අවසන් කළ යුතු විය. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අදාල කාලසටහනට අනුව නිම නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ණය මුදල නියමිත පරිදි ලබාගැනීමට නොහැකිවී තිබුණ අතර අදාල කාලය තුළදී ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කොමිෂන් සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 ජනවාරි 23 වන දින එළඹී අවබෝධතා ගිවිසුමට අනුව නෙලුම් කුලුන ඉදිකරන ලද ඉඩම අක්කර 7 රූඩ් 2 පර්චස් 8.41 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් ප්‍රමාණය අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ක් බව කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ii) මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා වර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමටත්, එමගින් පලමු වර්ෂ 5 සඳහා වර්ෂයකට රු. මිලියන 1,685 ක ආදායමක් ද දෙවන වර්ෂ 5 සඳහා වර්ෂයකට රු. මිලියන 1,918 ක ආදායමක් ද ඉපැයීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම මත එම වාර්ෂික ආදායම අහිමි වී තිබුණි. මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව ඉපැයීමට අපේක්ෂා කළ ආදායම මත ගණනය කළ විට 2020 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබූ ආදායම රු.9,639,408,102 ක් වී තිබුණි.

(iii) මූලික සැලසුම් අනුව ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 7,877 ක් ණය වාරික හා පොලී වශයෙන් කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. මෙසේ ණය හා වාරික ගෙවීම හේතුවෙන් විදුලි සංදේශ පනත අනුව ඒකාබද්ධ අරමුදලට කරන ලද ප්‍රේෂණ 2016 වර්ෂයට සාපේක්ෂව 2017, 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 5,200 ක්, රු. මිලියන 6,150 ක්, රු. මිලියන 19,050 ක් හා රු.මිලියන 23,000 වශයෙන් එකතුව රු. මිලියන 53,400 ක් අඩු වී තිබුණි.

(iv) 2019 සැප්තැම්බර් 16 දින රු.11,325,012 ක වියදමක් දරා නෙළුම් කුලුන නිල වශයෙන් විවෘත කළද මේ දක්වාම කොමිෂන් සභාවට පවරා ගෙන ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි.

(v) කොමිෂන් සභා තීරණ අනුව නෙළුම් කුලුන වාණිජ්‍යකරණය කිරීමේ කටයුතු සඳහා අනුමත කාර්යමණ්ඩලයට බාහිරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණු නිලධාරීන් වෙත

සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.13,067,971 ක දීමනා මෙතෙක් ස්ථාපනය නොකරන ලද සමාගමකින් අයකර ගැනීමේ පදනම මත ලැබිය යුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) නෙළුම් කුලුන ව්‍යාපෘතිය සඳහා උපදේශන ගාස්තු ගෙවීම

අංක 10/2473/401/031 හා 2010 ඔක්තෝබර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, 2K13.DC.199H හා 2013 පෙබරවාරි 06 දිනැති කොමිෂන් සභා තීරණය අනුව නෙළුම් කුලුන ඉදිකිරීම වෙනුවෙන් උපදේශන සේවා ලබාගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමග ගිවිසුම්ගත වීමට අනුමැතිය හිමිවී තිබුණි. ඒ අනුව 2013 පෙබරවාරි 15 දින උපදේශන සේවා ලබාගැනීම සඳහා දෙපාර්ශවය අතර අත්සන් කරන ලද ගිවිසුම් උපදේශන ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් එනම් රු.198,691,500 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම මුදලින් රු.150,000,000 ක් පමණක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි.

අංක 2k15.219.13(ii) හා 2015 නොවැම්බර් 26 දිනැති කොමිෂන් සභා තීරණය මත උපදේශන සේවා ගිවිසුම 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබූ අතර මාසිකව රු.මිලියන 03 බැගින් රු.මිලියන 72 ක් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවීම් කර තිබුණි. එකී ගිවිසුම දීර්ඝ කළ කාලය අවසාන වීමෙන් පසු ද 2017 නොවැම්බර් 01 දින සිට 2019 සැප්තැම්බර් 16 දින දක්වාවූ කාලය සඳහා රු.මිලියන 59.8 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. 2019 සැප්තැම්බර් 16 දින නෙළුම් කුලුන විවෘත කිරීමෙන් පසු නෙළුම් කුලුන කොමිෂන් සභාව වෙත පවරා නොදීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු. මිලියන 28.6 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණු සමස්ත උපදේශන ගාස්තු වටිනාකම රු.මිලියන 310.4 ක් විය

(ඈ) කොමිෂන් සභාවේ සේවක සංයුතිය, සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය ප්‍රතිසංශෝධනය කර ගැනීම සඳහා උපදේශක සේවාවන් ලබාගැනීමට 2020 ඔක්තෝබර් 20 දින කොමිෂන් සභාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ එළඹී රු.2,992,330 ක් වටිනා ගිවිසුමේ කාලය 2021 ජනවාරි අවසන් වී, සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු.1,490,166 ක් ගෙවා තිබුණද 2021 ජූනි වන විටද අදාළ කාර්යය නිමකර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්වස් 6.21 ක ඉඩමෙහි අයිතිය පවරා ගැනීම සඳහා 1999 හා 2010 වර්ෂවලදී එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු.345,502 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂයේදී ද ලබාගෙන නොතිබුණි. තවද ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු හෝ බදු ගිවිසුම් හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ලබාගෙන නොතිබුණි.

(ආ) කොකාවිල් සන්නිවේදන කුලුන භාවිතා කරන රාජ්‍ය ආයතන 03 කින් 2012 වර්ෂයේ සිට අයවියයුතු රු.91,929,931 ක් මුදල සමාලෝචිත වර්ෂයේදීද අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු 70 ක් වූ අතර කොමිෂන් සභාවේ ලේකම් තනතුර වර්ෂ 09 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. එසේම අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප්, නිවාස කුලී දීමනා, දිරි දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස රු.1,873,503 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
276 ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකා
දුරකථන: +94 11 268 9345 / 1900 | ෆැක්ස්: +94 11 268 9341

www.trc.gov.lk twitter.com/TRCSL facebook.com/trcsl